

කොළඹ විශ්වවිද්‍යාලයීය
පරිගණක අධ්‍යයනායතනය

වාර්ෂික වාර්තාව

2021

දැක්ම

ඉගෙනුම්, ඉගැන්වීම් සහ පර්යේෂණ මගින්
දැනුමෙහි සීමා මායිම් අතික්‍රමණය කරමින්,
පරිගණක අධ්‍යාපනයේ
ගෝලීය නායකයෙකු බවට පත්වීම.

මෙහෙවර

ගෝලීය උපායමාර්ගික සබඳතා වර්ධනය කිරීම,
අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ ප්‍රවර්ධනය කිරීම,
ව්‍යවසායකත්ව කුසලතාවෙන්, නායකත්ව
ගුණාංගවලින් සහ අවංකබවින් පිරිපුන්
සමාජයීය වගකීමක් සහිත වෘත්තිකයන්
නිර්මාණය කිරීම හා
අප දේශය කලාපීය දැනුම් කේන්ද්‍රස්ථානයක්
බවට පත්කිරීම කෙරෙහි දායක වීම ද හරහා
පරිගණක අධ්‍යාපනය වැඩි දියුණු කිරීම හා එහි
ප්‍රගමනය උදෙසා කටයුතු කිරීම.

අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය



කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ 2021 වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් සේ සලකමි. එය මා ඉදිරිපත් කරනුයේ ඉමහත් සතුටින් සහ සාඩම්බරයෙනි. පරිගණක විද්‍යාව ඉගැන්වීමේ හා ඉගෙනීමේ අතිවිශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පත්කිරීම අපගේ ප්‍රධාන අරමුණයි. මෙම වාර්තාව මඟින් 2021 වර්ෂයේදී පවත්වන ලද උපාධි අපේක්ෂක, පශ්චාත් උපාධි හා බාහිර උපාධි පාඨමාලාවල දී ඇති වූ සාර්ථකත්වය මෙන්ම අභියෝග ද, 2021 වර්ෂයේ දී සිදු කරන ලද සාමාන්‍ය පරිපාලන කටයුතු පිළිබඳව ද ඉදිරිපත් කෙරේ. 2021 වර්ෂය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කෙටි ඉතිහාසය තුළ අභියෝගාත්මකම වසර විය. ඊට හේතු වූයේ රටෙහි ඇති වූ කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සියලු ක්‍රියාකාරකම් හදිසියේම නව මුහුණුවරකින් ක්‍රියාත්මක කිරීමට සිදු වීමයි. සියලුම ක්‍රියාකාරකම් පාහේ අභියෝගයට ලක් වූ අතර බොහෝ වැඩ කටයුතු අවලංගු කිරීමට ද අපට සිදු විය. එමෙන්ම ක්‍රියාත්මක කිරීමේ ස්වභාවය සැලකිල්ලට ගෙන හොඳම දේ කිරීමට කාර්යක්ෂම කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීමට ද අපට සිදු විය. කෙසේ වෙතත්, මාර්ගගත ක්‍රමයෙන් සිදු වූ අන්තර් ක්‍රියාකාරිත්වය හරහා බොහෝ ක්‍රියාකාරකම් සිදු කිරීමේ හැකියාව පරිගණක අධ්‍යයනායතනය සතු වීම එහි පැවැත්මට රුකුළක් විය. නව සාමාන්‍ය පරිසරයක් තුළ අපගේ ක්‍රියාකාරකම් බහුතරයකින් 80% ට වඩා ප්‍රමාණයක් සාර්ථකව සිදු කිරීමට අපට හැකි විය.

2021 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ තේරීම් ක්‍රියාවලිය හරහා බඳවා ගැනීමට අවස්ථාව ලබා ගත් අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් 347 දෙනෙක්, 2021 මැයි මාසයේ දී ඔවුන්ගේ පළමු වසරේ අධ්‍යයන කටයුතු ආරම්භ කළහ. එය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ඉතිහාසයේ විශාලතම බඳවා ගැනීම වූ අතර, විභාග හැර අධ්‍යාපන කටයුතු සියල්ල ඔන්ලයින් මාදිලියෙන්ම දිගටම කරගෙන යෑමට සිසුන්ට බල කෙරුණි. මීට අමතරව, කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ උපාධි අපේක්ෂකයන් 1157 දෙනෙකුට පරිගණක විද්‍යා පාඨමාලා හැදෑරීමට අවස්ථාව සලසන ලදී. සියලු දුෂ්කරතා මධ්‍යයේ, වසර අවසානයේදී පරිගණක විද්‍යාව සහ තොරතුරු පද්ධති පිළිබඳ උපාධිධාරීන් 267ක් බිහි කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සමත් වූ අතර මෙම සිසුන්ගෙන් 90% කට වඩා වැඩි පිරිසක් ඔවුන්ගේ උපාධියට පෙර සේවයේ නියුක්තව සිටියහ. සිසුන් සම්බන්ධයෙන් එකතු කරන ලද සංඛ්‍යාලේඛන ඇතුළත් මෙම වාර්තාව උපාධි අපේක්ෂක අධ්‍යාපනයේ ප්‍රගතිය විස්තර කරයි. වසංගත තත්ත්වය හේතුවෙන්, ප්‍රමාණවත් ප්‍රාග්ධන අරමුදල් නොලැබුණත්, 2022 වසරට කල් දැමූ ක්‍රියාකාරකම් කිහිපයක් හැර සැලසුම් කළ ක්‍රියාකාරකම් රැසක් කළමනාකරණය කිරීමට පරිගණක අධ්‍යයනායතනයට හැකි විය. අනෙක් අතට, වසංගත තත්ත්වය නිසා බොහෝ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට අපට නිඛූ නිදහස සීමා විය.

පරිගණක අධ්‍යාපනය සඳහා විශාල ඉල්ලුමක් පවතින බැවින්, තොරතුරු තාක්ෂණ (BIT) බාහිර උපාධි වැඩසටහන පැවැත්වීමේ වඩාත් නීරණාත්මක ජාතික සේවාව පරිගණක අධ්‍යයනායතනය මගින් දිගටම කරගෙන යයි. වසංගත තත්ත්වය සහ උසස් පෙළ ප්‍රතිඵල ප්‍රමාද වීම හේතුවෙන් මාස අටකින් පමණ ප්‍රමාද වුවත්, 2021 වසරේ දී නවක සිසුන් 2158 දෙනෙකුට මේ සඳහා ලියාපදිංචි වීමට අවස්ථාව හිමි විය. තොරතුරු තාක්ෂණ (BIT) උපාධි පාඨමාලාවෙහි සියලුම අධ්‍යයන වාර විභාග, 2021 පෙබරවාරි සහ මාර්තු මාසවල දී පැවැත්වීමට පරිගණක අධ්‍යයනායතනයට හැකි වූ අතර ප්‍රමාද වූ සියලුම අධ්‍යයන කටයුතු

2021 ජූලි මාසයට පෙර අවසන් කරන ලදී. ඒ අනුව, අවසන් වසරේ සිසුන්ගේ ප්‍රතිඵල නිකුත් කිරීමට අප ආයතනය සමත් වූ අතර, මේ දක්වා වැඩිම උපාධිධාරී සංඛ්‍යාව ලෙස සිසුන් 350ක් තොරතුරු තාක්ෂණවේදී (BIT) උපාධිය හිමි කර ගත්හ. ඒ සමගම, 2021 වසර තුළ සිසුහු 575 දෙනෙක් තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව ද, සිසුහු 312 දෙනෙක් තොරතුරු තාක්ෂණ උසස් ඩිප්ලෝමාව ද හිමි කර ගත්හ.

2021 මාර්තු මාසයේ දී විද්‍යාපති උපාධි පාඨමාලාව සඳහා ප්‍රවේශ පරීක්ෂණයක් පැවැත්වීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට හැකි වූ අතර අදාළ ක්‍රියාවලිය ඔන්ලයින් මෙහෙයුම් ක්‍රමයක් හරහා සම්පූර්ණ කිරීමට හැකි විය. 280 දෙනෙකුගෙන් යුත් නව කණ්ඩායම 2021 සැප්තැම්බර් මස මුල දී ඔවුන්ගේ අධ්‍යයන කටයුතු ආරම්භ කළේය. සාමාන්‍ය තත්ත්වයේ පැවති කෙටි කාලය ඇතුළත ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි සිසුන් සඳහා 2021 මැයි මාසයට පෙර විශ්වවිද්‍යාලය තුළ දී විභාග පැවැත්වීමට පරිගණක අධ්‍යයනායතනය සමත් වුවත් කොවිඩ්-19 වසංගතයේ හදිසි රැල්ල හේතුවෙන් විද්‍යාපති විභාග සම්පූර්ණ කිරීමට අපොහොසත් විය. එබැවින්, විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා මාර්ගගත පරීක්ෂක විභාග පවත්වන ලද අතර 2021 අවසන් වීමට පෙර විද්‍යාපති පාඨමාලාවේ අවසාන ප්‍රතිඵල නිකුත් කිරීමට හැකි විය.

පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් පශ්චාත් උපාධි සහ බාහිර උපාධි වැඩසටහන් මඟින් ජනනය කරන ලද ආදායම ආයතනයේ තිරසාරභාවය සඳහා සැලකිය යුතු දායකත්වයක් සැපයීය. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් ඇතැම් කටයුතු ප්‍රමාද කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට සිදු වුව ද, උපයන ලද ආදායම මෙහෙයුම් ක්‍රියාවලියේ සාමාන්‍ය මට්ටමට ආසන්නව පවත්වා ගෙන යෑමට හැකි විය. මාර්ගගත ක්‍රමය සහ ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් භාවිතයෙන් නිවසේ සිට තම රාජකාරි කරගෙන යාමට UCSC කාර්ය මණ්ඩලය සතු හැකියාව මේ සඳහා ප්‍රධාන හේතුව විය.

ඔන්ලයින් ඉගැන්වීම් සහ ඉගෙනුම් කාලය තුළ දී ශිෂ්‍ය සුභසාධන ආධාර (ශිෂ්‍යත්ව සහ ණය පහසුකම්) ලබා දුන්න ද, විෂය බාහිර ක්‍රියාකාරකම් ඇතුළත් බොහෝ භෞතික ක්‍රියාකාරකම් කල් දැමීමට හෝ අවලංගු කිරීමට සිදු විය. කෙසේ නමුත්, කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා බොහෝ මාර්ගගත වැඩසටහන් සහ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. අවාසනාවන්ත ලෙස, පිටත දී සිදු කරන පුහුණු වැඩසටහන වැනි කාර්ය මණ්ඩල භෞතික ක්‍රියාකාරකම් කිහිපයක් 2021 වර්ෂය තුළ අවලංගු කරන ලදී. කාර්ය මණ්ඩලයේ මෙන්ම සිසුන්ගේ ද අභිප්‍රේරණය ඉහළ නැංවීම සඳහා විධිමත් රැස්වීම් මෙන්ම මාර්ගගත රැස්වීම් පැවැත්වීම සඳහා Zoom මූලික කොට ගත් මාර්ගගත ක්‍රමය භාවිත කෙරිණි.

වසංගත තත්ත්වය සියලු යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලට, බලපෑ අතර එය 2021 වර්ෂය තුළ ක්‍රියාකාරකම් නිම කිරීමට සැලකිය යුතු ප්‍රමාදයක් ඇති කළේය. මෙහෙයුම් ක්‍රියාවලියේ ඇති වන ගැටලු හේතුවෙන් යටිතල පහසුකම් සංවර්ධනය සඳහා සැලසුම් කරන ලද ඇතැම් කටයුතු ද 2022 වර්ෂය දක්වා කල් දමන ලදී. රජය විසින් අයවැයෙන් වෙන්කොට ලබා දෙන ප්‍රතිපාදන නොලැබුණත්, 2021 තුළ අධ්‍යයන කටයුතු ප්‍රධාන වශයෙන් අන්තර්ජාලය හරහා සිදු කළ බැවින්, එම තත්ත්වය මෙහෙයුම් කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකළේය. මාර්ගගත සන්නිවේදනය ආයතනයේ ඉදිරි පැවැත්මේ කොදු නාරටිය වූ බැවින්, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල පෙර සංවර්ධනය 2021 වසරෙහි මෙහෙයුම් කටයුතුවල තිරසාරභාවය සඳහා ලද සම්පතක් විය. කෙසේ වෙතත්, ඉහළ යන ඉල්ලීම් සපුරාලීම සඳහා UCSC ආයතනයේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම්වල තිරසාරභාවය පවත්වා ගැනීම වෙනුවෙන් බොහෝ ක්‍රියාමාර්ග ගත යුතු බව අපි තේරුම් ගනිමු.

පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා වසංගත තත්ත්වය බලපෑමක් සිදු කළ ද, ආයතනයේ ප්‍රගතිය කෙරෙහි එය සැලකිය යුතු සෘණාත්මක බලපෑමක් සිදු කර නැත. ඊට හේතුව, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් 2021 වසර තුළ සම්මන්ත්‍රණ සහ ශාස්ත්‍රීය සඟරා පත්‍රිකා 65ක් පමණ ප්‍රකාශයට පත් කර ඇති බැවිනි. වාර්ෂිකව පැවැත්වෙන ICTer සමුළුව සම්පූර්ණ මාර්ගගත සමුළුවක් ලෙස සංවිධානය කරන ලද අතර එය සමස්ත කාර්ය මණ්ඩලයට නව අත්දැකීමක් විය. එමෙන්ම, සියලු ඉදිරිපත් කිරීම් YouTubeහි UCSC නාලිකාව හරහා ප්‍රකාශයට පත් කළ බැවින්, සමුළුව බොහෝ දෙනෙකුට නොමිලේ ලද අධ්‍යාපනික අවස්ථාවක් බවට පත් විය. මේ අතර, 2021 වර්ෂයේ දී ICTer සඟරාවේ ද කලාප තුනක් ප්‍රකාශයට පත් විය.

ප්‍රාග්ධන සංවර්ධනය සඳහා රජයේ ප්‍රදානය (මිලියන 60ක්) වුව ද, පුනරාවර්තන වියදම් (මිලියන 392) සඳහා ප්‍රමාණවත් අරමුදල් UCSC වෙත ලැබිණි. වසංගත තත්ත්වය හේතුවෙන්, බොහෝ පුනරාවර්තන වියදම්හි පිරිවැය අඩු කිරීමට අපට හැකි වූ අතර, එමගින් සමස්ත අවශ්‍යතාවයෙන් පුනරාවර්තන වියදම් (81%) කළමනාකරණය කිරීමට හැකි විය. UCSC විසින් උපයන ලද ආදායමෙන් අමතර මිලියන 13 ප්‍රාග්ධන සංවර්ධනය සඳහාද තවත් මිලියන 90ක් පුනරාවර්තන වියදම් සඳහාද වැය කරන ලදී. පසුගිය වසර කිහිපය තුළ, රජයේ ප්‍රදානය මෙන්ම උපයන ලද ආදායම ප්‍රමාණවත් නොවූ බැවින් වියදම් පියවා ගැනීම සඳහා පරිගණක අධ්‍යයනායතනය විසින් එහි සංචිත යොදා ගනිමින් සිටියි. 2021 දී, ප්‍රමාණවත් අරමුදල් නොමැතිකම හේතුවෙන් UCSCහට සිය සංචිතවලින් මිලියන 46ක් වියදම් කිරීමට සිදු වූ අතර සැලසුම් කරන ලද කටයුතු වෙනුවෙන් පසුගිය වසර තුන තුළ (2020-2018) UCSC සංචිතවලින් මිලියන 199.58ක් වැය කොට ඇත.

අවසාන වශයෙන්, 2022 වර්ෂයේ දී ඵලදායී ප්‍රස්තා බවට පරිවර්තනය කළ හැකි අභියෝග රැසකට මුහුණ දුන් 2021 වර්ෂය, UCSC ඉතිහාසයේ තවත් අමතක නොවන වසරක් බවට පත් කිරීමට දායක වීම වෙනුවෙන් පාලක සභාව, විශ්වවිද්‍යාල සනාතන සභාව, උපකුලපතිවරයා, කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන පාලක මණ්ඩලය, අධ්‍යයන මණ්ඩල සහ කළමනාකරණ කමිටුව මෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ අනෙකුත් සියලුම කාර්ය මණ්ඩලය වෙත මගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

මහාචාර්ය කේ. පී. හේවාගමගේ
අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC).

අරමුණු

1. පරිගණක අධ්‍යාපනය ඉගැන්වීමේ සහ ඉගෙනීමේ විශිෂ්ට කේන්ද්‍රස්ථානයක් බවට පත්වීම [අධ්‍යාපන]

2. අන්තර් ක්ෂේත්‍ර පර්යේෂණ පිළිබඳ විශේෂ අවධානයක් යොමු කරමින් පරිගණකය ආශ්‍රිත පර්යේෂණ ප්‍රවර්ධනය හා සංවර්ධනය [පර්යේෂණ]

3. සිසුන්ගේ / කාර්ය මණ්ඩලයේ ගුණාත්මකභාවය, වගකීම් සහ වෘත්තීය නිපුණතාව වැඩි දියුණු කිරීම [ගුණාත්මකභාවය]

4. භෞතික සම්පත් හා මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම තුළින් ඉහළ ඵලදායීතාව සඳහා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම [සංවර්ධනය]

5. යහපාලනය තුළින් ආයතනික ප්‍රතිරූපය වැඩි දියුණු කිරීම [පාලනය]

6. සමාජයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවට දායක වීම [වගකීම]

පටුන

දැක්ම i

මෙහෙවර i

අධ්‍යක්ෂතුමාගේ සමාලෝචනය ii

අරමුණු v

පටුන vi

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පිළිබඳ හැඳින්වීම x

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සංවිධාන ව්‍යුහය - 2021 xi

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි ප්‍රධාන කාර්යසාධක දර්ශක (2017-2021) පිලිබඳ සටහනක් xiv

1. **පාලනය** **3**

1.1 *කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි නිලධාරීන්* 3

1.2 පාලන අධිකාරීන් 4

1.2.1 කළමනාකරණ මණ්ඩලය (BOM) 4

1.2.2 මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC) 6

1.2.3 විගණන කමිටුව (AC) 6

1.2.4 අධ්‍යයන පාලක මණ්ඩලය 7

1.2.5 අධ්‍යයන මණ්ඩල 9

1.2.5.1 අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය (BOS-IUD) 9

1.2.5.2 පර්යේෂණ හා පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය (BOS-RHD) 12

1.2.5.3 බාහිර සහ විස්තාරිත වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය (BOS - EEP) 13

1.2.6 අධ්‍යයන අංශ 15

1.2.6.1 පරිගණක සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS) 15

1.2.6.2 සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය (CMT) 15

1.2.6.3 තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE) 15

1.2.7 මධ්‍යස්ථාන 16

2. **අධ්‍යාපනය** **27**

2.1 *ප්‍රථම උපාධි අධ්‍යාපනය* 27

2.1.1 අභ්‍යන්තර උපාධි පාඨමාලා වැඩසටහන් 27

2.1.2 අධ්‍යයන වර්ෂය – 2018/2019 සඳහා සිසුන් බඳවා ගැනීම 29

2.1.3 ඇගයීම්වලදී ශිෂ්‍ය කාර්යසාධනය 31

2.1.4 ආයතනික පුහුණුව සඳහා ස්ථානගත කිරීම 32

2.1.5 උපාධි අපේක්ෂක ශිෂ්‍ය සුභසාධනය....33
2.1.5.1 උපාධි අපේක්ෂක ශිෂ්‍ය සුභසාධනය....33
2.1.6 UCSC ශිෂ්‍ය සංගමය....39
2.1.7 ශිෂ්‍ය ක්‍රියාකාරකම්....40
2.1.8 ශිෂ්‍ය ජයග්‍රහණ....41
2.1.8.1 විෂය බාහිර ක්‍රියාකාරකම්....41
2.1.9 උපාධි ප්‍රදානෝත්සවය - 2021....42
2.1.10 උපාධි අපේක්ෂක සම්මාන නිළිණ....44
2.1.11 සේවා නියුක්තිය....46
2.2 *පශ්චාත් උපාධි වැඩසටහන*....46
2.2.1 විද්‍යාපති උපාධි වැඩසටහන....46
2.2.1.1 විද්‍යාපති උපාධි....46
2.2.1.2 බඳවාගැනීම....48
2.2.1.3 කාර්ය මණ්ඩල සහභාගිත්වය....50
2.2.1.4 විද්‍යාපති උපාධි ප්‍රදානෝත්සවය....50
2.2.1.5 විද්‍යාපති උපාධි පාඨමාලා සංවර්ධනය....51
2.2.1.6 පර්යේෂණ උපාධි – දර්ශනපති සහ දර්ශනශූරී පාඨමාලා....52
2.3 *බාහිර උපාධි සහ විස්තාරිත පාඨමාලා*....53
2.3.1 තොරතුරු තාක්ෂණවේදී (බාහිර) උපාධි වැඩසටහන....53
2.3.1.1 ශිෂ්‍ය කාර්යසාධනය – 2021....54
2.3.1.2 BIT ඉගැන්වුම් ආයතන....54
2.3.1.3 BIT බාහිර උපාධි සහ ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය....55
2.3.1.4 උපාධි ප්‍රදානෝත්සව සම්මාන....56
2.3.1.5 සේවා නියුක්තිය....56
2.3.2 විස්තාරිත පාඨමාලා....56
2.3.3 මාර්ගගත විස්තාරිත වැඩසටහන්....58
2.3.4 විදේශීය සිසුන්....59
3. **පර්යේෂණ** **63**
3.1 *පර්යේෂණ, නවෝත්පාදන සහ ප්‍රකාශන*....63
3.1.1 ප්‍රථම උපාධි මට්ටමේ පර්යේෂණ ව්‍යාපෘති....63
3.1.2 විද්‍යාපති උපාධි මට්ටමේ ව්‍යාපෘති....64
3.1.3 පර්යේෂණ උපාධි ව්‍යාපෘති....65
3.1.4 අරමුදල් සැපයෙන පර්යේෂණ ව්‍යාපෘති....65

3.1.4.1 අභ්‍යන්තර පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති....65
3.1.4.2 බාහිර පාර්ශ්වයන් විසින් අරමුදල් සපයන ලද පර්යේෂණ ව්‍යාපෘති....67
3.1.5 පශ්චාත් උපාධි පාඨමාලා හරහා පර්යේෂණ ව්‍යාපෘති සඳහා වෙන් කිරීම සහ එහි උපයෝගීතාව....68
3.1.6 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ පර්යේෂණ කණ්ඩායම්....69
3.1.7 පර්යේෂණ ප්‍රකාශන සහ සම්මාන....73
3.1.7.1 2021 ඇතුළත පර්යේෂණ සඳහා සම්මාන 74
3.1.7.2 UCSC කාර්ය මණ්ඩලය විසින් සිදු කළ ප්‍රධාන දේශන / ආරාධිත දේශන පිළිබඳ විස්තර....75
3.1.7.3 UCSCහි ආරාධිත පර්යේෂකයන්....76
3.1.8 ජාත්‍යන්තර සම්මන්ත්‍රණය - ICTER 2021....77
3.1.9 ICTER ජාත්‍යන්තර සඟරාව....81
3.1.10.1 ශාස්ත්‍රීය සඟරා ප්‍රකාශන – 2021....83
3.1.10.2 සම්මන්ත්‍රණ ප්‍රකාශන – 2021....86
4. **මානව සම්පත් - අධ්‍යයන සහ අනධ්‍යයන** **91**
4.1 *කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය*....91
4.2 *කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන කාර්ය මණ්ඩලයේ සමස්ත පැතිකඩ*....94
4.3 *කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය හඳුනාගැනීම*....94
4.4 *කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව*....95
4.4.1 වෛද්‍ය පහසුකම් යෝජනා ක්‍රමය....97
4.4.2 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සුභසාධක සංගමය 97
5. **ආයතනික සංවර්ධනය** **101**
5.1 *තත්ත්වාරක්ෂණය සහ පිළිගැනීම*....101
5.2 *යටිතල පහසුකම් සංවර්ධනය*....104
5.2.1 ප්‍රධාන ව්‍යාපෘති – 2021....104
5.3 *ආයතනික පිළිගැනීම වැඩිදියුණු කිරීම*....107
5.4 *තිරසාර සංවර්ධන අභිමතාර්ථ* (SDG) *සඳහා* UCSC *දායකත්වය* – 2021....113
5.4.1 තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDG)....113
5.4.2 2021 වසර සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SGD) වෙත UCSC දායකත්වය....114

6. **මූල්‍ය පාලනය** **129**

6.1 *පුනරාවර්තන වියදම්*.....129

6.2 *ප්‍රාග්ධන වියදම්*.....130

6.3 *උපදේශන සහ පර්යේෂණ ව්‍යාපෘති (බාහිරින් අරමුදල් ලද)*.....131

6.4 *මූල්‍ය ආධාර සහ උත්පාදනය කළ ආදායම් විශ්ලේෂණය*.....132

6.4.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය.....133

6.4.2 උපාධි අපේක්ෂක වැඩසටහනේ මූල්‍ය විස්තර විශ්ලේෂණය.....133

6.4.3 මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....134

6.4.4 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය.....135

6.4.5 *හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය*.....135

6.4.6 **මුදල් ප්‍රවාහ ප්‍රකාශය**.....137

7. 2021 **වසරේ** UCSC **ආයතනයේ විශේෂ අවස්ථා – දෘශ්‍යතාව, සිදුවීම් සහ ක්‍රියාකාරකම්** **191**

7.1 *මාසික විශේෂ අවස්ථා - ක්‍රියාකාරකම්, සිදුවීම්, සහ වැඩසටහන්*.....191

8. විගණන වාර්තාව **201**

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය පිළිබඳ හැඳින්වීම

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24 ඍ (1) වගන්තිය යටතේ පරිගණක විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය පිළිබඳ උසස් අධ්‍යාපනය ලබා දීම, ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීමේ අරමුණින් අවසන් වරට සංශෝධනය කරන ලද 1995 අංක 1 දරන විශ්වවිද්‍යාල (සංශෝධන) පනතෙහි නියෝගයක් ප්‍රකාරව කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක විද්‍යා අධ්‍යයනාංශය (DCS) සහ පරිගණක තාක්ෂණායතනය (ICT) ඒකාබද්ධ කිරීමෙන් 2002 සැප්තැම්බර් මස 1 වන දින උසස් අධ්‍යාපන ආයතනයක් ලෙස කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) [http://www.ucsc.cmb.ac.lk] ස්ථාපනය කෙරිණි. එය මෙරට පරිගණක අධ්‍යාපනය සංවර්ධනය කිරීමට සහ ප්‍රවර්ධනය කිරීමට මෙන්ම අන්තරජාතිකව පරිගණක දැනුම් කේන්ද්‍රස්ථානයක් ලෙස ද කොළඹ විශ්වවිද්‍යාලය තුළ පිහිටුවා ඇති උසස් අධ්‍යාපන අයතනයකි. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට මූල්‍ය ස්වාධීනත්වය හිමිව ඇති අතර එහි ක්‍රියාකාරිත්වය 2002 නොවැම්බර් මස 15 වන දින ගැසට් කරන ලද (අංක1262/32 දරන) ව්‍යවස්ථාවෙහි විස්තර කොට තිබේ. ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය ඊට ඇතුළත් කිරීම සඳහා 2011 ජූලි 22 (ගැසට් පත්‍ර අංක 1715/32 මඟින්) දින එය සංශෝධන කෙරිණි.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ව්‍යවස්ථාවට අනුව අධ්‍යයනායතනයේ ප්‍රධාන අධ්‍යයනාංශ 3කි. එනම්;

පරිගණක සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)
සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය (CMT)
තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)

ව්‍යස්ථාවට අනුව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සතුව මධ්‍යස්ථාන හයකි.:


උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (ADMTC);
පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC);
ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය (CDF)
බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC);
විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය (e LC);
වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC);

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරියට මේ අධ්‍යයනාංශ පිළිබඳ විස්තාරාත්මකව ඉදිරිපත් කෙරේ.

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය- සංවිධාන ව්‍යුහය - 2021

ව්‍යස්ථාවේ සඳහන් ව්‍යුහය හා මෙහෙයුම් කටයුතුවල කාලීන අවශ්‍යතා පදනම් කර ගනිමින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කළමනාකරණ කටයුතු සිදු කිරීම සඳහා ආයතනයේ සංවිධාන ව්‍යුහය ස්ථාපිත කොට තිබේ. පහත රූප සටහනේ දක්වා ඇති ධුරාවලියට අනුව අධිකාරියේ ගලායාම සහ කාර්ය මණ්ඩලය වෙන් කිරීම සම්බන්ධීකරණය කර ඇත.

University of Colombo School of Computing – Organizational Structure



කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යනායතනයෙහි ප්‍රධාන කාර්යසාධක දර්ශක (2017-2021) පිලිබඳ සටහනක්

		2021	2020	2019	2018	2017
අධ්‍යාපනය (ලියාපදිංචි/ උපාධිධාරී)						
අභ්‍යන්තර ප්‍රථම උපාධි	සියලු	997	929	899	857	809
	ඇතුළු වූ	347	293	297	301	261
	පිට වූ	267	250	237	244	193
විද්‍යා ප්‍රථම උපාධි		1157	972	1043	924	1060
තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව (DIT) (බාහිර)	සියලු	2933	2649	2373	1975	2109
	ඇතුළු වූ	2158	2416	2142	1461	1631
	පිට වූ	575	651	436	337	403
තොරතුරු තාක්ෂණ උසස් ඩිප්ලෝමාව (HDIT) (බාහිර)	සියලු	1128	1804	1634	1240	1259
	ඇතුළු වූ	1361	1548	1365	463	511
	පිට වූ	313	274	120	110	151
තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) (බාහිර)	සියලු	1034	1248	862	1230	1282
	ඇතුළු වූ	987	1142	795	187	233
	පිට වූ	350	284	177	133	217
පශ්චාත් උපාධි	සියලු	478	501	426	556	533
	ඇතුළු වූ	280	270	258	232	243
	පිට වූ	184	126	185	139	150
විස්තාරිත වැඩසටහන්		220	347	551	317	296
විදේශීය සිසුන්		14	14			
පර්යේෂණ						
පර්යේෂණ (දර්ශනපති/දර්ශනශූරී)	සියලු	23/08	28/08	35/08	35/06	37/06
	ඇතුළු වූ	04/02	02/00	03/03	04/00	11/02
	පිට වූ	02/01	03/00	03/01	00/01	03/04
පර්යේෂණ ව්‍යාපෘති	සියලු	18	12	21	20	27
	New	12	02	09	10	14
ප්‍රකාශන		65	61	56	64	53

ප්‍රකාශන සංඛ්‍යාව කාර්ය මණ්ඩල සමාජිකයන් සංඛ්‍යාව	65:61	61:46			
උපහරණ සංඛ්‍යාව	6205	4829			
උපදේශන සේවා /ප. සහ සං. ව්‍යාපෘති					
දේශීය	13	7	15	15	21
සමාජ වගකීම් වැඩසටහන්	5	13	11	12	10

		2021	2020	2019	2018	2017
පාලනය						
ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලය	සියලු	58	46	47	49	47
	මහාචාර්ය	05	03	03	02	03
	ආචාර්ය	29	28	27	26	27
	විද්‍යාපති උපාධි	10	09	06	09	09
ස්ථිර අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය		15	06	06	07	08
තාවකාලික අධ්‍යයන කාර්ය මණ්ඩලය (උපදේශක සහ සහකාර කථිකාචාර්ය)		32	39	43	30	27
ස්ථිර පරිපාලන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල		62	62	52	54	46
කොන්ත්‍රාත් පදනමේ කාර්ය මණ්ඩලය (අනියම් සහ අභ්‍යාසලාභීන් ඇතුළුව)		25	41	56	35	25
පර්යේෂණ/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය		23	17	16	26	18
මූල්‍ය						
වාර්ෂික පුනරාවර්තන වියදම (ශ්‍රී ලංකා රු. මිලියන)		555	520	586	488	415
භාණ්ඩාගාර ප්‍රදාන (පුනරාවර්තන) (ශ්‍රී ලංකා රු. මිලියන)		392	358	337	199	165
භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) (ශ්‍රී ලංකා රු. මිලියන)		60	23	69	112	107
උපයාගත් ආදායම		299	249	289	274	263
ප්‍රථම උපාධි සඳහා UCSC දායකත්වය (ශ්‍රී.ල.රු. මිලියන) (උපයන ලද %)		22 (5%)	30 (7%)	91 (18%)	126 (29%)	131 (50%)

UCSC අයවැය (ශ්‍රී ලංකා රු. මිලියන)	917	903	679	498	424
පර්යේෂණ/ව්‍යාපෘති (ශ්‍රී ලංකා රු. මිලියන)	12.8	9.3	9.8	9	11
සේවකයෙකු සඳහා වසරකට පිරිවැය (ශ්‍රී ලංකා රුමිලියන '000s)	1,640	1,564	1,692	1,275	1,081
ශිෂ්‍යයෙකු සඳහා පිරිවැය (ශ්‍රී ලංකා රු. මිලියන '000s) - භාණ්ඩාගාර පුනාරාවර්තන	386	507	450	356	310
යටිතල පහසුකම්					
පුස්තකාල පොත්	8,780	8,825	9,073	8,948	8,810
පරිගණක: කාර්ය මණ්ඩලය	1:1	1:1	1:1	1:1	1:1
පරිගණක: ශිෂ්‍යයන් (සාමාන්‍ය සිසුන්) (විශේෂ සිසුන්)	1:4 1:1	1:4 1:1	1:4 1:1	1:4 1:1	1:4 1:1
ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (සේවක) (වර්ග මී.)	11.09	11.1	10.9	11.70	15.24
ඉඩකඩ ප්‍රයෝජ්‍යකරණය (ශිෂ්‍ය) (වර්ග මී.)	4.20	3.39	4.5	4.77	4.39

1. පාලනය

1. පාලනය

2021 වර්ෂය තුළ ආයතනික ක්‍රියාකාරකම් මෙම වාර්තාව ආරම්භයේ දී සඳහන් අරමුණු හය (6) කෙරෙහි අවධානය යොමු කරමින් 2021-2025 සඳහා වූ උපායමාර්ගික සැලැස්ම මත පදනම්ව සිදු කරන ලදී. 2021 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ ඉදිරි වසර පහ සඳහා සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් මත පදනම්ව උපායමාර්ගික සැලැස්ම සකස් කරන ලදී. කෙසේ වෙතත්, කොවිඩ්-19 හේතුවෙන් වර්ෂය තුළ වරින් වර මෙහෙයුම් කටයුතු අත්හිටුවීම නිසා බොහෝ අධ්‍යයන වැඩසටහන් සහ 2021 වසර සඳහා කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම නැවත අනුක්‍රමිකතා ගත කිරීමට කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයට සිදු විය. ප්‍රවාහන ගැටලු, නිරෝධායනය, ස්වයං-නිරෝධායනය සහ ජනාධිපති ලේකම්වරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හරහා රජය විසින් අනුමත කරන ලද රාජකාරී ලැයිස්තුව හේතුවෙන් කාර්ය මණ්ඩලය සේවයේ යෙදවීමේ දී UCSC ආයතනය බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දුන්නේය. මෙම සියලු දුෂ්කරතා මධ්‍යයේ UCSC ආයතනය විසින් සිය ප්‍රථම උපාධි පරීක්ෂණ පැවැත්වීම, ප්‍රතිඵල නිකුත් කිරීම, අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සැලසුම් කර ඇති සියලුම දේශන මාර්ගගතව පැවැත්වීම, පශ්චාත් උපාධි පරීක්ෂණ අවසන් කිරීම මෙන්ම ඒවායෙහි ප්‍රතිඵල නිකුත් කොට විද්‍යාපති උපාධි වැඩසටහන් සඳහා නව බඳවා ගැනීම් ද සිදු කරන ලදී. සැලසුම් කළ පරිදි, ICTer ජාත්‍යන්තර සම්මන්ත්‍රණය මාර්ගගත ක්‍රමයට පවත්වන ලද අතර කළමනාකරණ මණ්ඩලය ඇතුළු රැස්වීම් කිහිපයක් මාර්ගගතව පැවැත්විණි. සැලසුම් කළ ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සමහරක් 2022 වෙත ගෙන යන ලදී.

UCSC ආයතනයෙහි කළමනාකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යයනාංශ ප්‍රධානීන්, නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන් සහ නියෝජ්‍ය මූල්‍යාධිකාරී, මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන්, වැඩසටහන් සම්බන්ධීකාරකවරුන්, සහ විවිධ අංශයන්හි පරිපාලන කාර්ය මණ්ඩල සාමාජිකයින් යන පාර්ශ්වයන්ගේ සහය ඇතිව UCSC ආයතනයෙහි අධ්‍යක්ෂතුමන් විසින් සම්බන්ධීකරණය කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා විගණන කමිටුව හැර අනෙකුත් සියලුම UCSCහි ව්‍යවස්ථාපිත සහ තේරීම් කමිටුවල මුලසුන දැරීය. මෙම ව්‍යවස්ථාපිත ආයතනවල ව්‍යුහය සහ ප්‍රගතිය පහත දැක්වේ.

1.1 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි නිලධාරීන්

අධ්‍යක්ෂ	මහාචාර්ය කේ.පී. හේවාගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල
ප්‍රධානීන්	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල - පරිගණක සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)

ආචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න - සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ

අධ්‍යයනාංශය (CMT) 10/12/2021 දක්වා

කේ.පී.එම්.කේ. සිල්වා මහතා - 10/12/2021 සිට (වැඩබලන)

ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක - තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)

නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු කේ.කේ.කේ. ධර්මතිලක මහතා - (ජූලි 2 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි කැලණිය විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී ලෙස වැඩ භාර ගන්නා ලදී)

එච්.පී. හේනේගම මිය - (මාර්තු දක්වා සජ්ත වාර්ෂික නිවාඩු)

නියෝජ්‍ය මූල්‍යාධිකාරී ඊ.එම් ගුණරත්න මහතා

සම්බන්ධීකාරකවරුන් ආචාර්ය එස්.එස්.පී. මාතර ආරච්චි - උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (ADMTC)

ජී. පී. එන්. බොතේජු මහතා - පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC)

ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා - ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය (CDF)

ඩබ්ලිව්. වී. වෙල්ගම මහතා - බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC)

ආචාර්ය ටී. ඒ. වීරසිංහ - විද්‍යුත්- ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC)

ආචාර්ය එල්.එන්.සී. ද සිල්වා - වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)

1.2 පාලන අධිකාරීන්

UCSC ව්‍යවස්ථාවෙහි විස්තර කර ඇති පරිදි කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ පාලන අධිකාරීන් වන්නේ කළමනාකරණ මණ්ඩලය, අධ්‍යයන පාලන මණ්ඩලය, අධ්‍යයන මණ්ඩල, අධ්‍යයනාංශ සහ මධ්‍යස්ථානයි.

1.2.1 කළමනාකරණ මණ්ඩලය (BOM)

2021 වසරේ දී කළමනාකරණ මණ්ඩල රැස්වීම් මාසිකව පවත්වන ලදී. සාමාන්‍යයෙන් සෑම මසකම පළමු බ්‍රහස්පතින්දා BOM රැස්වීම් සඳහා වෙන් කරනු ලැබේ. රැස්වීම ආරම්භ කිරීමට පෙර කළමනාකරණ මණ්ඩලයේ ලේකම් ධුරය හොබවන නියෝජ්‍ය ලේඛකාධිකාරීතුමා/පරිපාලනය විසින් පසුගිය මස පවත්වන ලද සභා වාරයේ වාර්තා සහ

සටහන් බෙදා හරිනු ලැබේ. සභා වාරයන් සඳහා සහභාගී වීම පිළිබඳ සංඛ්‍යාලේඛන සමඟ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ. (P - පැමිණි, E- නොපැමිණීම දැන්වූ, A- නොපැමිණි). මූල්‍ය ප්‍රකාශන, 2020 UCSC වාර්ෂික වාර්තාව සහ 2020 සමීක්ෂණ මණ්ඩල වාර්තාව විගණකාධිපති සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා 2021.02.23 දින පැවැත්වූ එක් විශේෂ BOM රැස්වීමක් ඇතුළුව UCSC කළමනාකරණ මණ්ඩල රැස්වීම් 13ක් මිශ්‍ර මාදිලියෙන් පවත්වා ඇත.

නිල සාමාජිකයන්	
• අධ්‍යක්ෂ	මහාචාර්ය කේ.පී. හේවාගමගේ (P-13)
• නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ CIS ප්‍රධානී	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල (P-13)
• නාමික, උසස් අධ්‍යාපන ලේකම්	එල්. වඩුගේ මහතා (P-12 & E-01)
• නාමික, මුදල් අමාත්‍යාංශය	කේ. ඒ. රම්‍යකාන්ති මිය (P-13)
• පීඨාධිපති, විද්‍යා පීඨය	ජෝෂ්ඨ මහාචාර්ය උපුල් සොන්නාදර (P-10 & E-03)
• CMT ප්‍රධානී	මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න (P-11 & E-02)
• ISE ප්‍රධානී	ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක (P-12 & E-01)
පත් කළ සාමාජිකයන්	
• කොළඹ විශ්වවිද්‍යාලයීය පාලක සභාවේ සාමාජිකයින් (02)	මහාචාර්ය එස්. කරුණාරත්න (P-13) ජේ.එම්.යූ.බී. ජයසේකර මහතා (P-09, E-03 & A-01)
• කොළඹ විශ්වවිද්‍යාලයීය සනාථන සභාවේ සාමාජිකයින් (02)	ජෝෂ්ඨ මහාචාර්ය ජේ.කේ.ඩී.එස්. ජයනෙත්ති (P-11, E-01 & A-01) මහාචාර්ය පවිත්‍රා කයිලාසපති (P-11 & E-02)
• නාමික, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (02)	සී. මුබාරක් මිය (P-13) ආචාර්ය උපාලි මාම්පිටිය (P-11 & E-02)
• නියෝජිතයින්, තොරතුරු තාක්ෂණ කර්මාන්තය (02)	සමන් පෙරේරා මහතා (P-12 & E-01) ආචාර්ය රොමේෂ් රණවන (P-10, E-02 & A-01)
• නාමික, අධ්‍යයන පාලක සභිකයින් (03)	මහාචාර්ය එන්.ඩී. කොඩිකාර (P-05 - till 01.04.2021) ආචාර්ය එච්.ඒ. කල්දේරා (P-05 - till 01.04.2021) ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු (P-05 - till 01.04.2021) ආචාර්ය ටී.ඒ. වීරසිංහ (P-07 & E-01 - from 06.05.2021) කේ.පී.එම්.කේ. සිල්වා මහතා - (P-08 - from 06.05.2021) ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා - (P-05 & E-03 - from 06.05.2021)

1.2.2 මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC)

මූල්‍ය හා කළමනාකරණ කමිටුව (FMC) යනු කළමනාකරණ මණ්ඩලයේ දී අදාළ තීරණ ගැනීමට පෙර මූල්‍ය ක්‍රියාකාරකම් විස්තරාත්මකව සාකච්ඡා කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයට සහාය වන අනුකමිටුවකි. 2021 වර්ෂය තුළ 3 වතාවක් රැස්වීමට කමිටුවට හැකි වූ අතර අධ්‍යක්ෂ/UCSC රැස්වීම්වල මුලසුන දැරීය.

සභාපති	මහාචාර්ය කේ.පී. හේවාගමගේ (P-3)
නියෝජ්‍ය අධ්‍යක්ෂ	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල (P-3)
මණ්ඩල නාමිතයින්	මහාචාර්ය උපුල් සොන්නාදර (P-2) (E-1) සී. මුබාරක් මිය (P-3) මහාචාර්ය පවිත්‍රා කයිලාසපති (P-2) (E-1)
නියෝජ්‍ය ලේඛකාධිකාරී	කේ.කේ.කේ. ධර්මතිලක මහතා (P-1) එස්.ඩී. චන්ද්‍රලතා මිය (P-2)
නියෝජ්‍ය මූල්‍යාධිකාරී	ඊ.එම්. ගුණරත්න මහතා (P-3)

P- පැමිණි , E- නොපැමිණීම දැන්වූ

1.2.3 විගණන කමිටුව (AC)

කළමනාකරණ මණ්ඩලයේ දී අදාළ තීරණ ගැනීමට පෙර අභ්‍යන්තර විගණන වාර්තා සහ අවසන් විගණන වාර්තා සම්බන්ධ ගැටලු සාකච්ඡා කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලයට සහයවීම සඳහා ඇති උප කමිටුවක් ලෙස විගණන කමිටුව හැඳින්විය හැකි ය. සාමාන්‍යයෙන් එහි මුලසුන හොබවනු ලබන්නේ කළමනාකරණ මණ්ඩලයේ විශේෂ නාමිතයෙකු විසිනි. පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂතුමා සහ නියෝජ්‍ය අධ්‍යක්ෂතුමා මෙම කමිටුවේ ආරාධිතයෝ වෙති. විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිතයින් ද, කොළඹ විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණකවරයා ද මෙම රැස්වීමට ඇරයුම් ලබති. Ernst and Youngහි නියෝජිතයන්ට (කළමනාකරණ මණ්ඩලය විසින් පත් කරන ලද අභ්‍යන්තර විගණකවරුන්ට) ද ආරාධනා කරනු ලැබේ. 2021 වර්ෂයේ පවත්වන ලද රැස්වීම් 04 සඳහා සහභාගී වීමේ සංඛ්‍යාලේඛන එක් එක් සාමාජිකයාට අදාළව දක්වා ඇත.

2

සභාපති	ජේ.එම්.යූ.බී. ජයසේකර මහතා (P-4)
මණ්ඩල නාමිතයින්	එල්.පී.එච්.වඩුගේ මහතා (P-4) කේ.ඒ. රම්‍යාකාන්ති මිය (P-4)
විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්	කේ.වී.ටී.එන්. සිංහගෝෂා මිය (P-2) එස්.එම්.සී. ඉන්දිකා මිය (P-2)
අභ්‍යන්තර විගණක/විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	එම්.එම්.ජේ.ආර්. බෝගමුව මහතා (P-1 & E-3)
අභ්‍යන්තර විගණක/කොළඹ විශ්වවිද්‍යාලය	කේ.ඊ.ඩබ්ලිව්. ජයසිරි මහතා (P-2) එස්.පී.ජී. නිහාල් මහතා (P-2)
Ernst &Young සමාගම් විගණක නියෝජිතයන්	රන්දිකා සිල්වා මිය (P-4)
අධ්‍යක්ෂ (අධීක්ෂක)	මහාචාර්ය කේ.පී. හේවාගමගේ (P-4)
නියෝජ්‍ය අධ්‍යක්ෂ (අධීක්ෂණක)	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල (P-4)

P- පැමිණි, E- නොපැමිණීම දැන්වූ

1.2.4 අධ්‍යයන පාලක මණ්ඩලය

2021 වර්ෂයේ දී සෑම මසකටම වරක් අධ්‍යයන පාලක මණ්ඩල රැස්වීම් පවත්වන ලදී. අධ්‍යයන පාලක මණ්ඩලයේ සංයුතිය කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන ව්‍යවස්ථාවෙහි පැහැදිලිව සඳහන් කර ඇත. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යයන මණ්ඩලය (IUD), පර්යේෂණ සහ ද්විතීක උපාධි අධ්‍යයන මණ්ඩලය (RHD), බාහිර සහ විස්තාරිත උපාධි අධ්‍යයන මණ්ඩලය (EEP) යන අධ්‍යයන මණ්ඩල තුනෙහි නිර්දේශයෙන් අධ්‍යයන පාලන මණ්ඩලය විසින් තීරණ ගනු ලබයි. අධ්‍යයන මණ්ඩලයේ (Board of Study) වැදගත් අධ්‍යයන ආශ්‍රිත කරුණු අධ්‍යයන පාලක මණ්ඩලය (Acadamic Syndicate) විසින් අනුමත හෝ නිර්දේශ කරනු ලැබේ. අධ්‍යයන හා පරිපාලන කාර්ය මණ්ඩලයට අදාළ අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත පදනම් වූ විශේෂ කරුණු අධ්‍යක්ෂතුමා විසින් සභාගත කිරීම ද මෙහි දී සිදු කරයි.

අධ්‍යයන පාලක මණ්ඩලය විසින් නිර්දේශිත ඇතැම් වැදගත් තීරණ කොළඹ විශ්වවිද්‍යාලයීය නීති හා රෙගුලාසිවලට යටත්ව පාලක සභාව, කළමනාකරණ මණ්ඩලය සහ සනාථන සභාවෙන් අනුමත කිරීම අවශ්‍ය වේ. 2021 වර්ෂයේ දී පවත්වන ලද සියලුම සභා වාරයන්හි වාර්තා අනුමත කර ලේඛනගත කරනු ලැබේ. අධ්‍යයන පාලක මණ්ඩලයේ නිල සාමාජිකයන් සහ ඔවුන්ගේ සහභාගිත්වය පිළිබඳ සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

S.N.	නම	පාලක මණ්ඩල සභා වාර 11 සඳහා පැමිණීම			
		සම්මුඛ	නොපැමිණි	නොපැමිණීම	නිවාඩු
1	මහාචාර්ය කේ.පී. හේවාගමගේ, අධ්‍යක්ෂ (සභාපති)	11			
2	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ප්‍රධානී/CIS, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
3	මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න, ප්‍රධානී/CMT, මහාචාර්ය	11			
4	ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය, ප්‍රධානී /ISE, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	09			2
5	මහාචාර්ය එන්.ඩී. කොඩිකාර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය (විශ්‍රාමික)	10			
6	මහාචාර්ය. ජී.කේ.ඒ. ඩයස්, මහාචාර්ය	11			
7	මහාචාර්ය. කේ.එල්. ජයරත්න, මහාචාර්ය				11
8	මහාචාර්ය. ඩී.ඩී. කරුණාරත්න, මහාචාර්ය	10	1		
9	ආචාර්ය ඒ.ආර්. වීරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
10	ආචාර්ය ඩී.එන්. රණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	09		2	
11	ආචාර්ය ටී. ශ්‍රී ධරන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
12	ජී.පී. සෙනවිරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1	

13	ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	09		2	
14	ආචාර්ය සී.අයි. කැප්පෙටියාගම, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
15	ආචාර්ය එච්.ඒ. කල්දේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
16	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1	
17	ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10	1		
18	ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
19	කේ.ජී.එම්.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
20	එම්.ඩබ්ලිව්.ඒ.සී.ආර්. විජේසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
21	ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
22	ආචාර්ය එච්.ඊ.එම්.එච්.බී. ඒකනායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
23	ආචාර්ය ටී.ඒ. වීරසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය	11			
24	ආචාර්ය එම්.අයි.ඊ. වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	09	1	1	
25	ආචාර්ය කේ.එච්.ඊ.එල්.ඩබ්ලිව්. හෙට්ටිආරච්චි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
26	ආචාර්ය ජී.වී.කේ.ජී. ගුණවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
27	ආචාර්ය බී.එච්.ආර්. පුෂ්පානන්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10			
28	ආචාර්ය එච්.එන්.ඩී. නිළිණි මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
29	ආචාර්ය එල්.එන්.සී. ද සිල්වා මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
30	ආචාර්ය එස්.එස්.පී. මානරආරච්චි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක / ADMTC	11			
31	ආචාර්ය එච්.කේ.ටී.සී. හල්ලොළුව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10			
32	ආචාර්ය කසුන් කරුණානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
33	ආචාර්ය එම්.ජී.ඩී.කේ. ප්‍රනාන්දු මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
34	ආචාර්ය ඒ.පී. සායක්කාර, කථිකාචාර්ය (ආධුනික) (2021 අප්‍රේල් සිට)	8			
35	පී.ජී.එම්.පී. ගමගේ, පුස්තකාල සහකාර (2021 පෙබරවාරි සිට)	9		1	

36	ජී.ජී.එන්. බොතේජු මහතා, උපදේශක, සම්බන්ධීකාරක/CSC (ආරාධිත)	10	1		
37	මහාචාර්ය ආර්.ඩී. විජේසේකර, නාමිත/විද්‍යා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය	10		1	
38	එච්.පී. හේනෙගම මිය, නියෝජ්‍ය ලේකඛාධිකාරී/විභාග	09	2		
39	ඩී.කේ.එම්.රත්නායක මිය, ජෙෂ්ෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග (විශ්‍රාමික)	03	1	1	
40	ජේ.ඒ.එම්.එස්. විජේරත්න මිය, ජෙෂ්ෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ පශ්චාත් උපාධි අංශය	10		1	
41	එස්.එෆ්. ඉමාම් මිය, සහකාර ලේඛකාධිකාරී/විභාග	11			
42	කේ. ප්‍රදායිනී මිය, සහකාර ලේඛකාධිකාරී/අධ්‍යයන සහ ප්‍රකාශන	11			
43	ඩබ්ලිව්.එම්.එන්.කේ. වීරසූරිය මිය, සහකාර ලේඛකාධිකාරී බාහිර උපාධි පිළිබඳ මධ්‍යස්ථානය	09		2	

1.2.5 අධ්‍යයන මණ්ඩල

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ව්‍යස්ථාවට අනුව අධ්‍යයන මණ්ඩල තුනක් පවතින අතර ඒවා ප්‍රථම උපාධිය සඳහා අභ්‍යන්තර අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය (BOS/IUD), පර්යේෂණ හා ද්විතික උපාධි සඳහා වන අධ්‍යයන මණ්ඩලය (BOS/RHD), බාහිර සහ විස්තාරිත වැඩසටහන් සඳහා වන අධ්‍යයන මණ්ඩලය (BOS/EEP) යනාදී වශයෙන් වේ. මෙහි මුලසුන දරන්නේ පරිගණක අධ්‍යයනායතනයේ අධ්‍යක්ෂවරයා විසිනි. ලේකම්ධුරය සඳහා අධ්‍යයන කාර්යමණ්ඩල සාමාජිකයෙක් ද සභාවාර සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයෙක් ද මෙහි වෙයි.

1.2.5.1 අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ අධ්‍යයන මණ්ඩලය (BOS-IUD)

2021 වසරේ දී, අභ්‍යන්තර උපාධිය සඳහා පෙනී සිටින අපේක්ෂක අධ්‍යයන මණ්ඩල (BOS/IUD), නිල වශයෙන් සභා වාර 11ක් පැවැත්වූ අතර පරිපාලන කාර්යමණ්ඩල සාමාජිකයෙකුගේ සහය ඇතිව අධ්‍යයන නියෝජිතයෙකු විසින් එම සභාවාරයන්හි වාර්තා ලේඛන ගත කරන ලදී. ඉගෙනුම්, ඉගැන්වීම්, පැවරුම් සහ පරිපාලනය ආදී අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන් මුහුණපාන සියලු ගැටලු සම්බන්ධයෙන් මෙම සභාවන්හි (BOS/IUD) දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරේ. සභා වාරයේ ප්‍රථම අදියරට පමණක් ශිෂ්‍ය නියෝජිතයන් 9 දෙනෙකුට පමණක් සහභාගී විය හැකි ය. අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක අධ්‍යයන මණ්ඩල සාමාජිකයන්ගේ සංයුතිය සහ සභා වාරයන්හි සහභාගීත්ව සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

S.N	නම	IUD සඳහා වාර 11 සඳහා පැමිණීම			
		පැමිණි	නොපැමිණි	නොපැමිණීම දැන්වූ	නිවාඩු
1	මහාචාර්ය කේ.පී. හේවාගමගේ, අධ්‍යක්ෂ (සභාපති)	11			
2	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රධානී/CIS අධ්‍යයනාංශය	9	2		
3	ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය) ප්‍රධානී/ISE අධ්‍යයනාංශය	10			1
4	කේ.පී.එම්.කේ. සිල්වා මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) ප්‍රධානී/ CMT	11			
5	ආචාර්ය බී.එච්.ආර්. පුෂ්පානන්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ලේකම් BOS/ IUD	10		1	
6	මහාචාර්ය එන්.ඩී. කොඩිකාර, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය	8	විශ්‍රාමික		
7	මහාචාර්ය ජී.කේ.ඒ. ඩයස්, මහාචාර්ය (සප්ත වාර්ෂික නිවාඩු)	7			3
8	මහාචාර්ය ඩී.ඩී. කරුණාරත්න, මහාචාර්ය	10	1		
9	මහාචාර්ය ජී.පී.එස්.පී. විමලරත්න, මහාචාර්ය	10	1		
10	ආචාර්ය ඒ.ආර්. වීරසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1	
11	ආචාර්ය ඩී.එන්. රණසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	8	2	1	
12	ආචාර්ය ටී. ශ්‍රී ධරන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10	1		
13	ජී.පී. සෙනවිරත්න මයා,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
14	ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
15	ආචාර්ය ඕ.අයි. කැප්පෙටියාගම, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	11			
16	ආචාර්ය එච්.ඒ. කල්දේරා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1	
17	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය), සම්බන්ධීකාරක/ පරිගණක විද්‍යා වැඩසටහන	11			
18	ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	9	1	1	
19	ආචාර්ය එම්.ඩී.ආර්.එන්. දයාරත්න, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
20	එම්.ඩබ්ලිව්.ඒ.සී.ආර්. විජේසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	9			2
21	ඩබ්ලිව්.වී. වෙල්ගම මයා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
22	ආචාර්ය එච්.ඊ.එම්.එච්.බී. ඒකනායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/ තොරතුරු පද්ධති වඩසටහන	11			
23	ආචාර්ය ටී.ඒ. වීරසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			

24	ආචාර්ය කේ.එච්.ඊ්.එල්.ඩබ්ලිව්. හෙට්ටිආරච්චි මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
25	ආචාර්ය ජී.වී.කේ.ජී. ගුණවර්ධන,ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
26	ආචාර්ය එච්.එන්.ඩී. නිළිණි මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
27	ආචාර්ය එල්.එන්.සී. ද සිල්වා මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
28	ආචාර්ය එම්.අයි.ඊ්. වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	8	2	1	
29	ආචාර්ය එස්.එස්.සී. මාතරආරච්චි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
30	ආචාර්ය කසුන් කරුණානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
31	ආචාර්ය එම්.ජී.ඩී.කේ. ප්‍රනාන්දු මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	11			
32	ආචාර්ය එච්.කේ.ටී.සී. හල්ලොලුව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	10		1	
33	ආචාර්ය ඒ.පී. සායක්කාර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) (2021 පෙබරවාරි සිට රාජකාරි භාරගත්)	10			
34	ආර්.එම්.පී.එන්. සෝමරත්න මිය, කථිකාචාර්ය (ආධුනික)	3	Resigned		
35	ආර්.එම්.යූ.ඒ. රත්නායක මයා, කථිකාචාර්ය (ආධුනික)	10		1	
36	කේ.වී.ඩී.ජේ.පී. කුමාරසිංහ මයා, කථිකාචාර්ය (ආධුනික)	10		1	
37	ආචාර්ය කේ.ඩී. සඳරුවන්, කථිකාචාර්ය (ආධුනික)	9	1	1	
38	ආර්.ජේ. අමරවීර මයා, කථිකාචාර්ය (ආධුනික)	9	1	1	
39	ඒ.එල්. නානායක්කාර මිය, කථිකාචාර්ය (ආධුනික)	11			
40	සී.එල්. ඉෂානි ෆොන්සේකා මිය, කථිකාචාර්ය (ආධුනික)	10	1		
41	ජී.කේ.කේ. පෙරේරා මිය, කථිකාචාර්ය (ආධුනික)	11			
42	කේ.එම්. නිලකරත්න මයා, කථිකාචාර්ය (ආධුනික)	10		1	
43	ඩී.ටී. බමුණුආරච්චි මයා, කථිකාචාර්ය (ආධුනික)	10		1	
44	එස්.එස්. ත්‍රීමහවිතාන මිය, කථිකාචාර්ය (ආධුනික)	10	1		
45	බී.එස්. වික්‍රමතිලක මයා, කථිකාචාර්ය (ආධුනික)	9	2		
46	එම්.ඒ.අයි. පෙරේරා මිය, කථිකාචාර්ය (ආධුනික)	10	1		
47	එම්.ඒ.පී.පී. මාරසිංහ මයා, කථිකාචාර්ය (ආධුනික)	9	2		
48	එන්.එච්.පී.අයි. මධුරංග මයා, කථිකාචාර්ය (ආධුනික)	6	5		
49	ටී.පී.ඩබ්ලිව්. සෙනෙවිරත්න මිය, කථිකාචාර්ය (ආධුනික)	10		1	
50	ඩබ්ලිව්.ආර්.එන්.එස්. අබේවීර මයා, කථිකාචාර්ය (ආධුනික) (2021 මාර්තු සිට වැඩ භාරගත්)	9			
51	ඒ.එම්.කේ.බී. අතපත්තු මයා, කථිකාචාර්ය (ආධුනික)	9	2		
52	එම්. ක්‍රිෂ්නදාසන් මිය, කථිකාචාර්ය (ආධුනික) (2021 නොවැම්බර් 1 වන දින පත්වීම් ලද)	2			
53	ජේ.ඊ්.ජී. චතුරංගනී මිය, කථිකාචාර්ය (ආධුනික) (2021 දෙසැම්බර් 1 වන දින පත්වීම් ලද)	2			
54	පී.ජී.එම්.පී. ගමගේ මිය, පුස්තකාල සහකාර (2021 පෙබරවාරි සිට)	10			
55	ජී.පී.එන්. බොතේජු මයා, උපදේශක දෙවන ශ්‍රේණිය	10	1		

94	එච්.පී. හේනේගම මිය, නියෝජ්‍ය ලේකඛාධිකාරී / අධ්‍යයන සහ ප්‍රකාශන (In Attendance) (සප්ත වාර්ෂික නිවාඩුවෙන් පසු මාර්තු 21 දින නැවත රාජකාරී ආරම්භ කරන ලදී)	8			
95	ඩී.කේ.එම්.රත්නායක මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / විභාග සහ ලියාපදිංචි කිරීම් (In Attendance) (විශ්‍රාමික)	4			
96	එස්.එෆ්. ඉමාම් මිය, සහකාර ලේඛකාධිකාරී / විභාග සහ ලියාපදිංචි කිරීම් (In Attendance)	10		1	
97	කේ. ප්‍රදායිනී මිය, සහකාර ලේඛකාධිකාරී/අධ්‍යයන සහ ප්‍රකාශන (In Attendance)	11			

1.2.5.2 පර්යේෂණ හා පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය (BOS-RHD)

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ව්‍යස්ථාවට අනුව පිහිටුවන ලද විධිමත් කමිටුවක් වන පර්යේෂණ හා පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලය 2021 වර්ෂය තුළ සභාවාර 11ක් පවත්වන ලදී. මෙම කමිටුවෙන් පර්යේෂණ සහ පශ්චාත් උපාධි පාඨමාලා සම්බන්ධ සියලු කරුණු සවිස්තරාත්මකව සාකච්ඡා කෙරෙන අතර අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය කරුණු අධ්‍යයන පාලක මණ්ඩලයට ඉදිරිපත් කරනු ලැබේ.

No	නම	Attendance of 11 BOS/ RHD Meetings		
		පැමිණි	නොපැමිණි	නොපැමිණීම දැන්වූ
1	මහාචාර්ය කේ.පී. හේවාගමගේ, අධ්‍යක්ෂ (සභාපති)	11		
2	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ප්‍රධානී/CIS, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1
3	ජී.පී. සෙනවිරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය), CIS නියෝජනය	11		
4	මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න, ප්‍රධානී/CMT සහ RHD, මහාචාර්ය	9		2
5	ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය, ප්‍රධානී /ISE, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	10		1
6	ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා, සම්බන්ධීකාරක/සයිබර්ආරක්ෂණ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය)	9		2
7	ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/MIT	11		
8	කේ.පී.එම්.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/MCS නියෝජනය/CMT, (RHD ලේකම්)	11		
9	ආචාර්ය එම්.අයි.ඊ. වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/MBAnalytics	9		2
10	ආචාර්ය පී.වී.කේ.ජී. ගුණවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක /MIS	10		1

11	ආචාර්ය ටී.ඒ. වීරසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය	9		2
12	ආචාර්ය එස්.එස්.පී. මාතරආරච්චි, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක / ADMTC	11		
13	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (I ශ්‍රේණිය), නියෝජනය/ISE	9		2
14	එම්.ඩබ්ලිව්.ඒ.සී.ආර්. විජේසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක/MSc in Bioinformatics, සම්බන්ධීකාරක/QAC	10		1
15	මහාචාර්ය එන්.ඩී. කොඩිකාර, ප්‍රධානී/තත්ත්ව ආරක්ෂණ කමිටුව (ඔක්තෝබර් සිට විශ්‍රාම ගිය)	2		1
16	ආචාර්ය එල්.එන්.සී. ද සිල්වා මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ව්‍යාපෘති සම්බන්ධීකාරක /MSc in CS	9		2
17	ආචාර්ය එච්.එන්.ඩී. නිළිණි මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ව්‍යාපෘති සම්බන්ධීකාරක/MIT	11		
18	කේ.එම්. තිලකරත්න මයා, කථිකාචාර්ය (ආධුනික), ව්‍යාපෘති සම්බන්ධීකාරක/MIS	10		1
19	ආචාර්ය බී.එච්.ආර්. පුෂ්පානන්ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ව්‍යාපෘති සම්බන්ධීකාරක/MCS	9		2
20	ආචාර්ය කසුන් කරුණානායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ව්‍යාපෘති සම්බන්ධීකාරක/සයිබර් ආරක්ෂණ	10		1
21	ආචාර්ය එච්.කේ.ටී.සී. හල්ලොළුව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), ව්‍යාපෘති සම්බන්ධීකාරක/MB Analytics	11		
22	පී. හේනෙගම මිය, නියෝජ්‍ය ලේකඛාධිකාරී/විභාග (සප්ත වාර්ෂික නිවාඩු, මාර්තු දක්වා)	8		
23	එම්.එස්. විජේරත්න මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/පශ්චාත් උපාධි, පර්යේෂණ සහ ව්‍යාපෘති (In attendance)	11		
24	ඩී.කේ.එම්.රත්නායක මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/විභාග සහ ලියාපදිංචි කිරීම් (ජූනි සිට විශ්‍රාම ගිය) (In attendance)	3		1

1.2.5.3 බාහිර සහ විස්තාරිත වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය (BOS - EEP)

බාහිර සහ විස්තාරිත වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය ද පරිගණක අධ්‍යයනායතනයේ ව්‍යවස්ථානුකූලව පිහිටුවන ලද කමිටුවකි. මාසිකව 12 වතාවක් රැස්වූ මෙම කමිටුව මගින් අධ්‍යයනායතනය මඟින් පවත්වන බාහිර සහ විස්තාරිත අධ්‍යයන වැඩසටහන් සම්බන්ධ සියලු කරුණු සාකච්ඡා කිරීම සිදු කෙරිණි. මෙම කමිටුවෙහි සභාපතිත්වය දරනු ලබන්නේ අධ්‍යක්ෂතුමා විසිනි. අධ්‍යයන කාර්යාල මණ්ඩල සාමාජිකයෙකු නිල වශයෙන් මෙහි ලේකම් ධුරය හොබවන අතර සභා වාර්තා සහ කටයුතු කළමනාකරණය කිරීම පරිපාලන කාර්ය මණ්ඩල නිලධාරියෙක් විසින් සිදු කරනු ලබයි.

No	Name	Attendance of 12 EEP Meetings		
		Present	Absent	Excused
1	මහාචාර්ය කේ.පී. හේවාගමගේ, අධ්‍යක්ෂ (සභාපති)	12		
2	ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල, ප්‍රධානී/EEP and CIS අධ්‍යයනාංශය	12		
3	මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න, ප්‍රධානී/CMT සහ පශ්චාත් උපාධි	9		3
4	ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය, ප්‍රධානී /ISE	11		1
5	ආචාර්ය එම්.ජී.එන්.ඒ.එස්. ප්‍රනාන්දු, CS පාඨමාලාව සඳහා නම් කළ	12		
6	ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා, EEP ලේකම්	12		
7	ආචාර්ය ටී.ඒ. වීරසිංහ මිය, සම්බන්ධීකාරක/විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය	12		
8	Dr. (Ms) K.H.E.L.W. Hettiarachchi, Academic Coordinator -BIT	12		
9	ආචාර්ය කේ.එච්.ඊ්.එල්.ඩබ්ලිව්. හෙට්ටිආරච්චි මිය, සම්බන්ධීකාරක/ PDC	11		1
10	ආචාර්ය එස්.එස්.පී. මාතරආරච්චි, සම්බන්ධීකාරක - ADMTC	12		
11	ජී.පී.එන්. බොතේජු මයා - සම්බන්ධීකාරක - CSC	11		1
12	ආචාර්ය එච්.කේ.ටී.සී. හල්ලොළුව, BIT ව්‍යාපෘති සම්බන්ධීකාරක	10		2
13	ආචාර්ය එච්.එන්.ඩී. නිළිණි මිය, BIT විෂයමාලා කමිටු ආරාධිත	11		1
14	ආර්.පී. බාලසූරිය මිය, උපදේශක–විභාග අංශය	12		
15	ජී.එස්. හෙට්ටිආරච්චි මයා, BIT VLE සමායෝජක	11	1	
16	කේ.එම්.ජී.බී. නිශාකුමාරි මිය, BIT VLE නියාමක	11		1
17	ටී.සී. ගලහේන මයා, වෙබ් මාස්ටර් – BIT අඩවිය	11		1
18	සී.ඕ.ඩී. පද්මපෙරුම මිය, ව්‍යාපෘති සම්බන්ධීකාරක සහකාර/BIT	11		1
19	ඩී.කේ.එම්. රත්නායක මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / විභාග (ජූනි මස විශ්‍රාම ගිය)	3	1	
20	එච්.පී. හේනෙගම මිය - නියෝජ්‍ය ලේකඛාධිකාරී/විභාග (ජූනි සිට)	6		
21	කේ.සී. සෙනරත්, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී / නීති	12		
22	එස්.එෆ්. ඉමාම් මිය, සහකාර ලේඛකාධිකාරී/විභාග	12		
23	ඩබ්ලිව්.එම්.එන්.කේ. වීරසූරිය මිය, සහකාර ලේඛකාධිකාරී / EDC	12		
24	පී.එම්.කේ. ජයරත්න, සහකාර ලේඛකාධිකාරී / අධ්‍යක්ෂ කාර්යාලය	11		1

1.2.6 අධ්‍යයන අංශ

1.2.6.1 පරිගණක සහ බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)

පරිගණක බුද්ධිමය පද්ධති කෙරෙහි සෘජු උනන්දුවක් දක්ෂතාවක් ඇති ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් පරිගණක හා බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය සැකසී ඇත. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් බොහෝමයක් අභ්‍යන්තර උපාධි පාඨමාලාවල මෙන්ම පශ්චාත් උපාධි වැඩසටහන්හි ද ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. ආචාර්ය ඩී.එස්.අතුකෝරල මහතා 2021 වසරේ මෙම අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කරන ලදී. වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා (https://ucsc.cmb.ac.lk/department-of-computation-and-intelligent-systems/) වෙබ් අඩවියට පිවිසෙන්න.

1.2.6.2 සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය (CMT)

සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය ග්‍රැෆික් නිර්මාණය සහ ඒ ආශ්‍රිත තාක්ෂණය පිළිබඳ සෘජු උනන්දුවක් හා දක්ෂතාවක් දක්වන ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත වේ. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් බොහොමයක් අභ්‍යන්තර උපාධි පාඨමාලාවල මෙන්ම පශ්චාත් උපාධි වැඩසටහන්හි ද ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. 2021 වර්ෂයේ එම අධ්‍යයනාංශයේ ප්‍රධානියා ලෙස මහාචාර්ය ජී.ඩී.එස්.පී විමලරත්න මහතා කටයුතු කරන ලදී. මහාචාර්ය ජී.ඩී.එස්.පී විමලරත්න සප්ත-වාර්ෂික නිවාඩු ලබා ගැනීම නිසා මලික් සිල්වා මහතා 2021 දෙසැම්බර් සිට වැඩ බලන අංශ ප්‍රධාන ලෙස වැඩ බාර ගන්නා ලදී. වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා (https://ucsc.cmb.ac.lk/department-of-communication-and-media-technologies/) වෙබ් අඩවියට පිවිසෙන්න.

1.2.6.3 තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)

තොරතුරු පද්ධති ඉංජිනේරු විද්‍යාව පිළිබඳ සෘජු උනන්දුවක් හා දක්ෂතාවයක් දක්වන ස්ථිර කාර්ය මණ්ඩලයකින් තොරතුරු පද්ධති ඉංජිනේරු අංශය සමන්විත වේ. මෙම කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් බොහොමයක් අභ්‍යන්තර උපාධි පාඨමාලාවල මෙන්ම පශ්චාත් උපාධි වැඩසටහන්හි ද ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලබයි. 2021 වසරේ ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මහත්මියගේ ප්‍රධානත්වයෙන් මෙම අධ්‍යයනාංශයේ කටයුතු සිදු විය. වැඩිදුර තොරතුරු ලබා ගැනීම සඳහා (https://ucsc.cmb.ac.lk/department-of-information-systems-engineering/) වෙබ් අඩවියට පිවිසෙන්න.

1.2.7 මධ්‍යස්ථාන

උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය **(ADMTC)**

උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය (ADMTC) https://ucsc.cmb.ac.lk/admtc/, 2002 ජූනි මස සිට 2005 මැයි මස දක්වා ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියේ (JICA) සහයෙන් ("Project for Human Resource Development in Information Technology through Capacity Building of UCSC") ''UCSC ආයතනයෙහි ධාරිතාව ගොඩනැඟීම හරහා තොරතුරු තාක්ෂණයේ මානව සම්පත් සංවර්ධනය සඳහා වූ ව්‍යාපෘතිය" ක්‍රියාවට නැංවීම සඳහා ස්ථාපිත කරන ලදී.

පහත දැක්වෙන්නේ **202**1 වසරේදී **ADMTC** මධ්‍යස්ථානය මගින් සිදු කළ ප්‍රධාන ක්‍රියාකාරකම් වේ**:**

- UCSC ආයතනයේ ශ්‍රවණාගාරය කළමනාකරණය සහ නඩත්තු කිරීම
- UCSC ආයතනයේ ඩිජිටල් පටිගත කිරීම් මැදිරිය කළමනාකරණය සහ නඩත්තු කිරීම
- UCSC ආයතනයට අවශ්‍ය ඩිජිටල් සහ මුද්‍රිත ද්‍රව්‍ය සැපයීම
- UCSC ආයතනයේ වෙබ් අඩවිය පවත්වාගෙන යෑම
- ග්‍රැෆික් නිර්මාණ සහ නිර්මාණශීලීත්ව සංවර්ධනය සහ උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණ සහ සංවර්ධනය පිළිබඳ පාඨමාලා පැවැත්වීම
- UCSC ආයතනයේ ප්‍රවෘත්ති පත්‍රිකාව සකස් කිරීම සඳහා දායක වීම
- UCSC ආයතනයේ පර්යේෂණ සමුළුව: ICTer 2021 (www.icter.org/conference) පැවැත්වීම සඳහා පහසුකම් සැපයීම
- UCSC ආයතනය මගින් පළ කෙරෙන ජාත්‍යන්තර ශාස්ත්‍රීය සඟරාව පළ කිරීම – (International Journal on Advances in ICT for Emerging Regions) "නැගී එන කලාප සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සඟරාව" (ICTer - 2021) – www.icter.org/journal

ADMTC මගින් දැනුම බෙදා හැරීම අරමුණු කර ගනිමින්, 2021 වර්ෂයේ දී සිසුන් 32 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් තුනක් සඳහා ග්‍රැෆික් නිර්මාණ හා නිර්මාණශීලීත්ව සංවර්ධන පාඨමාලාව ද සිසුන් 56 දෙනෙකුගෙන් යුත් කණ්ඩායම් තුනක් සඳහා උසස් බහු මාධ්‍ය වෙබ් නිර්මාණය හා සංවර්ධනය පිළිබඳ පාඨමාලාව ද ආරම්භ කරන ලදී (සම්පූර්ණයි හෝ පවත්වා ගෙන යයි). 2021 වර්ෂයේ දී සියලු සිසු කණ්ඩායම් සඳහා මාර්ගගත ක්‍රමයට පාඨමාලා පැවැත්විණි.

UCSC ආයතනයේ ශ්‍රවණාගාරය 2021 වසරේ දී සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක නොවිණි, මන්ද UCSC බාහිර පාර්ශ්වයන් විසින් සංවිධානය කරන ලද උත්සව සඳහා සහභාගී වන්නන්ගේ සෞඛ්‍ය තත්ත්වය සහතික කිරීමට නොහැකි වීම හේතුවෙනි. කෙසේ වෙතත්, පහත සඳහන් පර්යේෂණ සම්මන්ත්‍රණ කිහිපය සඳහා ADMTC තාක්ෂණික සහාය ලබා දුන්නේය.

Symposium	සම්මන්ත්‍රණය සඳහා මුළු වියදම	ආදායම	UCSC අනුග්‍රහය දැක්වූ ප්‍රමාණය
ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනය (NILIS) විසින් 2021 ජනවාරි 23 වැනි දින සංවිධානය කරන ලද සම්මන්ත්‍රණය	300,000/-	150,000/-	150,000/-
ජාතික අධ්‍යාපන පර්යේෂණ හා ඇගයීම් මධ්‍යස්ථානය (NEREC) විසින් 2021 ජූලි 22 වැනි දින අධ්‍යාපන අමාත්‍යාංශයේ සහයෝගයෙන් සංවිධානය කරන ලද "ජාත්‍යන්තර ඇගයීම් සඳහා ශ්‍රී ලංකා සිසුන්ගේ සූදානම" පිළිබඳ ජාතික අධ්‍යයනය	40,000/-	20,000/-	20,000/-
කාන්තා පර්යේෂණ මධ්‍යස්ථානය විසින් සංවිධානය කරන ලද 2021 නොවැම්බර් 24 වන දින පැවති CENWOR මාර්ගගත සම්මන්ත්‍රණය	600,000/-	600,000/-	N/A
කොළඹ විශ්වවිද්‍යාලයීය අධ්‍යාපන පීඨය විසින් සංවිධානය කරන ලද 2021 නොවැම්බර් 26 වැනි දින පැවති පර්යේෂණ සම්මන්ත්‍රණය	147,000/-	73,500/-	73,500/-
කොළඹ විශ්වවිද්‍යාලයීය නීති පීඨය විසින් සංවිධානය කරන ලද 2021 නොවැම්බර් 27 වැනි දින පැවති පර්යේෂණ සම්මන්ත්‍රණය	300,000/-	150,000/-	150,000/-

ඉහත කරුණුවලට අමතරව, ADMTC කණ්ඩායම ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය (NASSL) සඳහා වෙබ් පාදක ඡන්ද ක්‍රමයක් සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, පරීක්ෂා කිරීම සහ නඩත්තු කිරීම සඳහා මාර්ගෝපදේශනය භාර ගත්හ. ඒ සඳහා අය කරන ලද සම්පූර්ණ සහ අවසාන පිරිවැය රු. 205,000/= කි.

පරිගණක සේවා මධ්‍යස්ථානය (CSC)

1990 දී පිහිටුවන ලද පරිගණක සේවා මධ්‍යස්ථානය මඟින් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ රාජ්‍ය සහ පුද්ගලික ආයතන සඳහා උපදේශන සැපයීම සිදු කරනු ලබයි.

CSC මධ්‍යස්ථානය යටතේ සිදු කරනු ලබන ක්‍රියාකාරකම් තෙයාකාර වේ.

- කෙටි කාලීන පුහුණු පාඨමාලා පැවැත්වීම
- මෘදුකාංග සංවර්ධන හා උපදේශන සේවා සැපයීම
    - ටෙන්ඩර් විශ්ලේෂණය
    - පද්ධති නිර්දේශය
    - මෘදුකාංග ව්‍යාපෘති උපදේශනය සහ සංවර්ධනය
    - ශක්‍යතා අධ්‍යයන
    - පරිගණක දෘඪාංග සහ මෘදුකාංග සඳහා තත්ත්ව පරීක්ෂාව
    - විවිධ ආයතන සඳහා බඳවා ගැනීමේ පරීක්ෂණ සැලසුම් කිරීම සහ පැවැත්වීම
- UCSC සම්පත්වලින් සේවය ලබා ගැනීම සඳහා බාහිර පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම

CSC විසින් පවත්වනු ලබන කෙටිකාලීන පුහුණු පාඨමාලා

UCSC ආයතනය විසින් කාලීන අවශ්‍යතාව අනුව වඩාත්ම දියුණු සහ යාවත්කාලීන මානෘකා යටතේ විශේෂිත කෙටිකාලීන පුහුණු පාඨමාලා පවත්වනු ලැබේ. කුඩා කණ්ඩායම් වශයෙන් සමීප අධීක්ෂණය යටතේ විශේෂිත ක්‍රමලේඛන භාෂාවක්, සැලසුම් ක්‍රමවේදයක්, නව තාක්ෂණයන් හෝ විශේෂිත පැකේජ භාවිතය ආදිය ඉගෙනීමට සහභාගීවන්නන්ට අවස්ථාව ලබා දීමේ අරමුණින් මෙම පාඨමාලා සකස් කොට තිබේ. UCSC කාර්ය මණ්ඩලය මඟින් සැලසුම් කරන මෙම සියලුම පාඨමාලා නියමිත ප්‍රමිතීන් සහ කර්මාන්ත අවශ්‍යතා අනුව සැලසුම් කෙරේ. මෙම පාඨමාලා බොහොමයක් දින 5 සිට දින 10 දක්වා පවත්වනු ලැබේ. විවිධ ආයතනයන්හි ඉල්ලීම පරිදි සමාගම්වල තනි කණ්ඩායම් සඳහා විශේෂිත පුහුණු පාඨමාලා ද මේවාට අමතරව පැවැත්වේ. මෙම පාඨමාලා අවසානයේ දී නිකුත් කරන සහතික පත්‍රවල නිරවද්‍යතාව http://www.ucsc.lk/verify හරහා වෙබ් අඩවිය වෙත පිවිස සහතික පතේ අනුඅංකය භාවිතයෙන් සනාථ කර ගත හැක.

CSC මගින් බාහිර පාර්ශ්ව වෙත පවත්වනු ලබන පරීක්ෂණ

CSC මගින් 2021 වර්ෂයේ දී බාහිර පාර්ශ්වයන් සඳහා පහත සඳහන් බඳවා ගැනීම් සහ තහවුරු කිරීමේ පරීක්ෂණ පවත්වන ලදී.

විස්තරය	සහභාගී වූ සංඛ්‍යාව	මුළු ආදායම	වට්ටම	වට්ටම හැර ආදායම
මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) සඳහා පරිගණක උපදේශකයින් බඳවා ගැනීමට මාර්ගගත යෝග්‍යතා පරීක්ෂණය - 2021 ජූලි 22 වන දින	12	48,000/-	24,000/-	24,000/-
කොළඹ විශ්වවිද්‍යාලය සඳහා පද්ධති ඉංජිනේරු (II ශ්‍රේණියේ) තනතුර සඳහා බඳවා ගැනීමේ මාර්ගගත පරීක්ෂණය - 2021 නොවැම්බර් 1 වන දින	7	28,000/-	14,000/-	14,000/-
ක්‍රමලේඛක සහ පද්ධති විශ්ලේෂක තනතුර සඳහා බඳවා ගැනීමේ මාර්ගගත පරීක්ෂණය - 2021 දෙසැම්බර් 14 වන දින	9	36,000/-	18,000/-	18,000/-
ජාතික පුස්තකාල සහ විඥාපන විද්‍යා ආයතනයේ (NILIS) කළමනාකරණ සහකාර (III ශ්‍රේණියේ) තහවුරු කිරීමේ පරීක්ෂණය	1	2,500/-	500/-	2,000/-

මීට අමතරව, විශේෂයෙන්ම UCSC ආයතනයෙහි පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පහත සඳහන් වැඩමුළු සංවිධානය කිරීමට CSC පියවර ගන්නා ලදී. මෙම වැඩමුළු Zoom හරහා පවත්වන ලද අතර කාර්ය මණ්ඩලයෙන් ධනාත්මක ප්‍රතිචාර ලැබිණි.

1. ඵලදායී ඉ-තැපැල් සන්නිවේදනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව (I කොටස) - 2021 සැප්තැම්බර් 8 වැනි දින

2. ඵලදායී ඉ-තැපැල් සන්නිවේදනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව (II කොටස) - 2021 සැප්තැම්බර් 15 වැනි දින
3. ගූගල් දින දර්ශනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව - 2021 සැප්තැම්බර් 22 දින
4. ගූගල් දින දර්ශනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව - 2021 ඔක්තෝබර් 08 දින
5. Google Drive සහ Documents (I සහ II කොටස) පිළිබඳ මාර්ගගත වැඩමුළුව - 2021 ඔක්තෝබර් 13 දින
6. Google Documents පිළිබඳ මාර්ගගත වැඩමුළුව - 2021 නොවැම්බර් 10 දින

බාහිර උපාධි මධ්‍යස්ථානය **(EDC)**

සාමාන්‍ය ජනතාවට වඩාත් ඵලදායී හා කාර්යක්ෂම සේවාවක් සැපයීම අරමුණු කර ගනිමින් UCSC මඟින් පවත්වනු ලබන බාහිර හා විස්තාරිත වැඩසටහන් කළමනාකරණය කිරීම සඳහා බාහිර උපාධි මධ්‍යස්ථානය (EDC) පිහිටුවනු ලැබිණි. දැනට, මෙමඟින් කොළඹ විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි වැඩසටහනක් ලෙස තොරතුරු තාක්ෂණ උපාධිය (BIT) සහ එම උපාධි පාඨමාලාවට ලියාපදිංචි වීමට අවම සුදුසුකම් නොමැති සිසුනට සහයක් වශයෙන් පැවැත්වෙන තොරතුරු තාක්ෂණයෙහි පදනම (FIT) විස්තාරිත වැඩසටහන ද සම්බන්ධීකරණය කරනු ලබයි.

2021 වර්ෂය තුළ **EDC** ක්‍රියාකාරකම්**:**

නව BIT සිසුන් ලියාපදිංචි කිරීම (2450කට වැඩි), වත්මන් සිසුන් නැවත ලියාපදිංචි කිරීම (5000කට වැඩි), අධ්‍යාපන ආයතන සමඟ රැස්වීම් පැවැත්වීම (අධ්‍යාපන ආයතන 20කට වැඩි), ශික්ෂණ ආයතන සමඟ ආයතන රැස්වීම් 2ක් පැවැත්වීම, BIT පළමු සමාසිකයේ සිට හය වැන්න දක්වා විභාග (සිසුන් 3000 කට වැඩි)කොළඹ, මහනුවර, යාපනය සහ ගාල්ල යන නගරවල දී පැවැත්වීමට සැලසුම් කිරීම. EDC විසින් BIT උපාධි වැඩසටහන ප්‍රවර්ධනය කිරීම සම්බන්ධ බොහෝ ක්‍රියාකාරකම් ද සිදු කරයි. EDC පිළිබඳ වැඩිදුර තොරතුරු පහත වෙබ් අඩවියෙහි පළ කර ඇත. http://ucsc.cmb.ac.lk/academic-programmes/edc/

විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය **(eLC)**

විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC), https://ucsc.cmb.ac.lk/elc/, යනු කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ මධ්‍යස්ථාන හයෙන් එකකි. එහි ප්‍රධාන ඉලක්කය වන්නේ විද්‍යුත්-ඉගෙනුම් ක්‍රම අනුකලනය කරමින් ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියෙහි ඩිජිටල් පරිවර්තනය සඳහා පහසුකම් සැලසීමයි. එය උපාධි, පශ්චාත් උපාධි, බාහිර හා විස්තාරිත උපාධි වැඩසටහන්වලට සහය වීම සඳහා වන පරිගණක අධ්‍යයනායතනයේ සේවා මධ්‍යස්ථානයක් වුව ද, පසු ගිය දශකයේ දී එය දේශීය මෙන්ම ජාත්‍යන්තර සංවිධානවලට සේවා සැපයෙන ජාතික මධ්‍යස්ථානයක් බවට පත්ව තිබේ (www.e-learning.lk). විද්‍යුත්-ඉගෙනුම්හි පර්යේෂණ හා සංවර්ධන කටයුතු මෙහෙයවීමට දක්ෂ හා කැපවූ කාර්ය මණ්ඩලයක් විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය සතු වේ.

eLC මඟින් සකස් කරන ලද ජාතික සහ ජාත්‍යන්තර පාඨමාලා

1. මාර්ගගත අධ්‍යාපනය පිළබඳ ජාත්‍යන්තර ආයතනය (IIOE) සඳහා විද්‍යුත් ඉගෙනුම් සහ b-ඉගෙනුම්, වීඩියෝ පාඨමාලා ඉගෙනුම් අන්තර්ගත සැකසීම.
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සඳහා ඉංග්‍රීසි භාෂා පුහුණු වැඩසටහන.

2021 දී සිදු කරන ලද ක්‍රියාකාරකම්

- 2021 පෙබරවාරි මස 8, 9, 10, 11, 12, 15, 16, 17 යන දිනවල දී FIT e-ටෙස්ට් පැරණි විෂය නිර්දේශය I කොටස පවත්වන ලදී.
- 2021 පෙබරවාරි මස 18, 19, 22, 23, 24, 25 යන දිනවල FIT e-ටෙස්ට් පැරණි විෂය නිර්දේශය II කොටස පවත්වන ලදී.
- ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය (NILIS) සහ කොළඹ විශ්වවිද්‍යාලය සඳහා 2021 මාර්තු 02 දින තහවුරු කිරීමේ පරීක්ෂණය පවත්වන ලදී.
- FIT විද්‍යුත් පරීක්ෂණය (නව විෂය නිර්දේශය) 2021 මාර්තු 4, 5, 8, 9 සහ 10 යන දිනවල පවත්වන ලදී.
- BIT තක්සේරු ලකුණු කිරීමේ සැසිය (EN2106) 2021 මාර්තු 9 වැනි දින පැවැත්විණි.
- 2021 මාර්තු 24 වැනි දින ELT වැඩසටහනේ ප්‍රගතිය සමාලෝචනය කිරීමේ රැස්වීම පැවැත්විණි.
- FIT විද්‍යුත් පරීක්ෂණය (නව විෂය නිර්දේශය) නැවත සැලසුම් කරන ලද විභාගය 2021 මාර්තු 29 සහ අප්‍රේල් 01 වැනි දින පවත්වන ලදී.
- IIOE සඳහා පාඨමාලාවක් සකස් කිරීමේ නව ව්‍යාපෘතියක් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා UNESCO (UNESCO-ICHEI) හි අනුග්‍රහය යටතේ උසස් අධ්‍යාපන නවෝත්පාදන සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය සමඟ රැස්වීම මැයි මස 12 වැනි බදාදා පෙ.ව. 11.00 ට පැවැත්විණි.
- FIT සහ BIT පාඨමාලා සංවර්ධනය කිරීම අඛණ්ඩව සිදු විය.
- ELT වැඩසටහනෙහි පරීක්ෂණ දියත් කිරීම UCSCහි පළමු වසරේ සිසුන් සමඟ 2021 මැයි 7 වන දින සිදු කෙරිණි.
- ELT වැඩසටහනෙහි සංවර්ධන කටයුතු නොකඩවා සිදු විය.
- ADMTC සමග එක්ව IIOE (https://www.iioe.org/) සඳහා "මිශ්‍ර සහ විද්‍යුත් ඉගෙනුම් පාඨමාලා සඳහා වීඩියෝ පදනම් කරගත් ඉගෙනුම් අන්තර්ගත සකස් කිරීම" යන නව පාඨමාලාව සඳහා පූර්ව ප්‍රචාරක (ප්‍රවර්ධන) වීඩියෝවක් සකස් කෙරිණි.
- ELT අන්තර්ගත සකස් කිරීමේ පළමු අදියර සම්පූර්ණ කරන ලදී.
- UNESCO-ICHEI විසින් සංවිධානය කරන ලද IIOE ආසියා-ශාන්තිකර කලාපීය 2021 වසර මැද රැස්වීමේ දී "විද්‍යුත්-ඉගෙනුම් සහ b-ඉගෙනුම් සඳහා වීඩියෝ මත පදනම් වූ ඉගෙනුම් අන්තර්ගත සකස් කිරීම" පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝව 2021 ජූලි 27 වන දින ඉදිරිපත් කරන ලදී.
- විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානයෙහි පද්ධති සංවර්ධක පිළිබඳ උපදේශක පුරප්පාඩුව සඳහා සම්මුඛ පරීක්ෂණය 2021 අගෝස්තු 21 වන දින පවත්වන ලදී.
- ELT ව්‍යාපෘතියේ ප්‍රගති සමාලෝචන රැස්වීමක් UGC විසින් පත් කරන ලද විෂය ප්‍රවීණයන් සමඟ 2021 සැප්තැම්බර් 17 වැනි දින පවත්වන ලදී.
- පාඨමාලා බෙදා හැරීමේ කාලසටහන සංශෝධනය කිරීම සඳහා වන රැස්වීමක් UNESCO-ICHEI සමඟ 2021 සැප්තැම්බර් 29 වැනි දින පවත්වන ලදී.
- සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය සඳහා කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් දෙකක් සැලසුම් කිරීම සඳහා වන රැස්වීමක් 2021 සැප්තැම්බර් 30 වන දින ඔවුන් සමඟ පැවැත්විණි.
- සීමාවාසික සම්මුඛ පරීක්ෂණ: විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම් වෙනුවෙන් 2021 ඔක්තෝබර් 13 වන දින පැවැත්විණි.
- නාවික හමුදාව සඳහා අවශ්‍යතා රැස්කිරීමේ පුහුණුව සඳහා වන රැස්වීම 2021 ඔක්තෝබර් 06 දින පැවැත්විණි.
- වීඩියෝ පාදක මාර්ගගත පාඨමාලාවේ සම-සංවර්ධනය පිළිබඳ UNESCO-ICHEI සමඟ රැස්වීම 2021 ඔක්තෝබර් 29 වැනි දින පැවැත්විණි.
- ELT පාඨමාලාව සැකසීමේ කටයුතු අවසන් කෙරිණි.

- IIOEහි සමාජ්ති සීමා දෙකක් සපුරා ඇති අතර ඊට අදාළ ඉදිරිපත් කිරීම් පිළිවෙළින් 2021 නොවැම්බර් 4 සහ නොවැම්බර් 29 යන දිනවල භාර දෙන ලදී.
- FIT ප්‍රායෝගික පරීක්ෂණය 2021 දෙසැම්බර් 27, 28 සහ 29 යන දිනවල පවත්වන ලදී.

ඉහත සඳහන් ක්‍රියාකාරකම්වලට අමතරව විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය විසින් 2021 වර්ෂය තුළ දී පහත සඳහන් ක්‍රියාකාරකම්වලද නිරත විය.

- UCSC ආයතනයෙහි ප්‍රථම උපාධි මෙන්ම විද්‍යාපති උපාධි වැඩසටහන්වල ඉගෙනුම් කළමනාකරණ පද්ධති පවත්වා ගෙන යෑම සහ පරිපාලනය කිරීම,
- BIT උපාධි වැඩසටහන සහ FIT වැඩසටහන මාර්ගගතව ඉගෙන ගන්නා පිරිසට විද්‍යුත් පහසුකම් සැපයීම,
- ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් රසවත්, කාර්යක්ෂම සහ සමකාලීන කිරීම සඳහා විවිධාංගීකරණය කිරීම,
- UCSC ආයතනය තුළ මෙන්ම රට තුළ ද උසස් අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා විද්‍යුත් ඉගෙනුම් පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කිරීම,
- උසස් තත්ත්වයේ මිශ්‍ර ඉගෙනුම් පාඨමාලා නිර්මාණය කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික අධ්‍යාපනයේ සංස්කෘතිය ස්ථාපිත කිරීම
- UCSCහි විද්‍යුත් ඉගෙනුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමට සහාය වීම

තව ද, විද්‍යුත් ඉගෙනුම් මධ්‍යස්ථානය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා එක්ව "පූර්ව-විශ්වවිද්‍යාල, ඉංග්‍රීසි භාෂා පුහුණු මාර්ගගත වැඩසටහන" (ELT) වැනි බාහිර පාර්ශ්වයන්ගෙන් ව්‍යාපෘති කිහිපයක් සිදු කරන ලද අතර යුනෙස්කෝ (UNESCO- ICHEI) සමඟ මාර්ගගත අධ්‍යාපනය පිළිබඳ ජාත්‍යන්තර ආයතනය සඳහා පාඨමාලාවක් සම-සංවර්ධනය කරන ලදී.

වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය **(PDC)**

වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC) පරිගණක අධ්‍යයනායතනයෙහි තවත් එක් මධ්‍යස්ථානයක් වන අතර එය තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කර්මාන්ත හා ශාස්ත්‍රීය හවුල්කාරිත්වය තුළින් අධ්‍යයන කටයුතු වැඩිදියුණු කිරීම සහ ඒ සඳහා තොරතුරු තාක්ෂණ කර්මාන්තය සමඟ සමීප සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා පිහිටුවා ඇත. වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානයේ පරමාර්ථය වන්නේ ව්‍යවසායකත්ව කුසලතා, නායකත්ව ගුණාංග සහ අවංකභාවය සහිත සමාජ වගකීමකින් හෙබි වෘත්තිකයන් බිහි කිරීමයි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ මෙන්ම ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ ද වෘත්තීය කුසලතා වැඩි දියුණු කිරීමේ පුහුණු වැඩසටහන් සඳහා මෙම මධ්‍යස්ථානය පහසුකම් සපයයි. තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වර්තමාන ප්‍රවණතා, කාර්මික භාවිතයන්, විවිධ අංශවල වෘත්තීය මාර්ග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට PDC විසින් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ ආයතනවලට ආරාධනා කරනු ලැබේ. මෙමඟින් සමස්ත උපාධිධාරීන්ගේ ගුණාත්මක භාවය සහ සේවා නියුක්තිය ඉහළ නැංවීම හේතුවෙන් එය ඔවුන්ට වටිනාකම් එක් කිරීමක් බවට පත් වේ.

2021 වර්ෂය තුළ සිදු කරන ලද කටයුතු

- 2020/2021 අධ්‍යයන වර්ෂය සඳහා අවසාන ආයතනනික පුහුණු ස්ථානගත කිරීම්වලට අදාළ ඇගයීම් සිදු කරන ලදී.
- "ආයතනනික පුහුණු ස්ථානගත කිරීම්හි හොඳම කාර්ය සාධනය - 2020" සම්මානය සඳහා හොඳම අපේක්ෂකයා තෝරා ගැනීම සඳහා තේරීම් කමිටුවක් පත් කර ඇගයීම් කටයුතු සඳහා පහසුකම් සපයන ලදී.

- 2020 දී සිදු කරන ලද ආයතනික පුහුණු ස්ථානගත කිරීම් සම්බන්ධයෙන් සිසුන්ගේ සහ ආයතනවල අදහස් හා යෝජනා එකතු කරන ලදී.
- අභ්‍යන්තර සහ බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා කර්මාන්තායතන සමඟ එක්ව වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සැසි කිහිපයක් සංවිධානය කරන ලදී.
- UCSC සීමාවාසික වැඩසටහන යටතේ අලුතින් ලියාපදිංචි වූ සමාගම් Zoom හරහා සම්මුඛ පරීක්ෂණයට ලක් කරන ලදී (2021 වසර සඳහා නව සමාගම් ගණන 32කි).
- 2021/2022 අධ්‍යයන වර්ෂය සඳහා උපාධි අපේක්ෂක සීමාවාසික වැඩසටහන යටතේ තොරතුරු තාක්ෂණ සමාගම් 73ක්, රජයේ ආයතන 2ක් සහ UCSC ව්‍යාපෘති 7ක් සඳහා සිසුන් දෙසිය හැත්තෑ නවයක් (279) බඳවා ගන්නා ලදී.
- 3 වන වසරේ උපාධි අපේක්ෂකයින් සඳහා තාක්ෂණික සාකච්ඡා පැවැත්වීම සඳහා තොරතුරු තාක්ෂණ කර්මාන්තයෙන් විවිධ වෘත්තිකයන් විසිහතර (24) දෙනෙකුට ආරාධනා කරන ලදී. වසංගත තත්ත්වය හේතුවෙන් තාක්ෂණික සාකච්ඡා Zoom තාක්ෂණය හරහා සිදු කරන ලදී.
- සීමාවාසික පුහුණුකරුවන්ගේ ප්‍රගතිය නිරීක්ෂණය කිරීමට සහ සීමාවාසික වැඩසටහනට අදාළ ඕනෑම ගැටළුවක් සාකච්ඡා කිරීමට ආයතනික පුහුණු ස්ථානගත කිරීම් අධීක්ෂණ වැඩසටහනක් පවත්වන ලදී.
- අධ්‍යයන හා කර්මාන්ත අතර ඇති පරතරය අවම කිරීම සහ සහයෝගීතාව වර්ධනය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා Wiley technology (PVT) LTD, LSEG (PVT) LTD, John Keels (PVT) LTD, VIRTUSA (PVT) LTD යන ආයතනවල අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රධානීන් සමඟ තනි තනි රැස්වීම් සංවිධානය කරන ලදී.
- UCSC අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පර්යේෂණ සහ සංවර්ධනය පිළිබඳ සැසියක් සංවිධානය කොට පහසුකම් සැලසීය. LSEG මෙම සැසිය පවත්වන ලදී.
- තොරතුරු තාක්ෂණ කර්මාන්තය විසින් සංවිධානය කරන ලද වෙබ් බැනර්, තරඟ, මාර්ගගත සැසි කිහිපයක් ප්‍රකාශයට පත් කරන ලද අතර ඒවාට සහභාගී වීමට සිසුන් දිරිමත් කරන ලදී.
- Huawei ජංගම සේවා (HMS) විසින් පවත්වනු ලබන 'ජංගම යෙදුම් සංවර්ධන පුහුණුව පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව' සංවිධානය කොට ඊට පහසුකම් සැලසීය. UCSC හි අභ්‍යන්තර/බාහිර උපාධි අපේක්ෂකයින් සහ කාර්ය මණ්ඩලය සඳහා මාර්ගගත සැසි හයක් (6) පවත්වන ලදී.
- PDC විසින් අතථ්‍ය වැඩසටහන සංවිධානය කිරීම සඳහා UCSC රැකියා පොළ සංවිධායක කමිටුව - 2021 ට සහාය විය.
- කර්මාන්ත-ශාස්ත්‍රාල හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ කර්මාන්තයේ වෘත්තිකයන් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන ලදී.
- වසර පුරාම ශිෂ්‍ය ගැටලු සහ විමසීම් විසඳීමෙහි නිරත විය.

ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය **(CDF)**

ඩිජිටල් අධිකරණ වෛද්‍ය කටයුතු සඳහා ඊට අදාළ නීතිය හා සාමය පිළිබඳ ආයතනවලට සහය වන ලෙස පරිගණක අධ්‍යයනායතනය වෙතින් කළ ඉල්ලීමකට අනුව විශේෂ නිවේදනයක් මඟින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි ව්‍යස්ථාව වෙනස් කරමින් 2011දී (Digital Forensics) ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය (CDF)https://ucsc.cmb.ac.lk/cdf/ පිහිටුවන ලදී. පසුගිය වසර 19ක කාලය තුළ රටෙහි මේ සඳහා නිසි ක්‍රමවේදයක් නොතිබූ බැවින් විමර්ශන කටයුතු සිදු කරන ලෙස බලධාරීන් විසින් පරිගණක අධ්‍යයනායතනයෙන් ඉල්ලීමක් කර ඇත. බොහෝ අපහසුතාවන් මධ්‍යයේ වුව ද මේ ආයතන සඳහා UCSC සහය ලබා දෙයි. මෙම සේවා ඉල්ලුම් කරන ප්‍රධාන ආයතන වනුයේ විවිධ අධිකරණ, අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව සහ ත්‍රස්ත විමර්ශන ඒකකයි.

ඩිජිටල් ආක්‍රමණශීලී අපරාධ ක්‍රියාකාරකම්වල සාක්ෂි සොයා ගැනීම සංවේදී මෙන්ම දුෂ්කර ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා පර්යේෂණ හා සංවර්ධන ප්‍රවේශයක් අවශ්‍ය වේ. පසුගිය කාලයේ මෙම පරීක්ෂණ සිදු කිරීම සඳහා UCSC අධ්‍යයන හා අධ්‍යයන සහයක කාර්ය මණ්ඩලය විසින් ආධාරක මෙවලම් කිහිපයක් සකස් කර සංවර්ධනය කර ඇති අතර ඒවායින් සමහරක් ජාත්‍යන්තර සම්මන්ත්‍රණවල දී ප්‍රකාශයට පත් විය.

පසුගිය දශක දෙක තුළ පරිගණක අධ්‍යයනායතනය වෙත විවිධ නීති සංවිධානවලින් ඉල්ලීම් 650කට වඩා ලැබී ඇති නමුත්, සංකීර්ණත්වය සහ අරමුදල් හා යටිතල පහසුකම් නොමැතිකම හේතුවෙන් අවශ්‍ය සහය ලබා දීම ඉතා අපහසු විය. මෙම මෙහෙයුම් කටයුතු වෙනුවෙන් වෙනම ඒකක පිහිටුවීම සඳහා රජයේ විශ්ලේෂණ දෙපාර්තමේන්තුවේ සහ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ ධාරිතාව පුළුල් කිරීමට පරිගණක අධ්‍යයනායතනය කොරියානු රජයේ සහය ඇතිව රජයට සහය දැක්වීය. මෙය CDF වෙත වාර්තා වන සිද්ධීන් විශාල වශයෙන් අඩු කරන මුත් 2021 දෙසැම්බර් 31 වන දින වන විට 250ක් විමර්ශනය කිරීමට නියමිත අතර අප දැනටමත් නඩු 427ක් සම්පූර්ණ කර ඇත.

2020 සිට තොරතුරු ආරක්ෂණය සහ ඩිජිටල් වෝහාරික තාක්ෂණ උපාධි පාඨමාලා පැවැත්වීමේ වගකීම CDF විසින් භාරගෙන තිබේ. ඊට අමතරව UCSC හි විවිධ පශ්චාත් උපාධි වැඩසටහන් පැවැත්වීම සඳහා ද CDF සහාය වේ.

2020 සිට 2021 අවසානය දක්වා CDF මඟින් ආදායම ලෙස රුපියල් 950,000.00ක් උපයා ඇත. කෙසේ වෙතත්, CDF විසින් මෙම කාල සීමාව සඳහා මුළු වියදම ලෙස රුපියල් මිලියන 4.5ක් වියදම් කොට ඇත. මේ අනුව, CDF හි ආදායම එහි වියදම් පියවා ගැනීමට මුළුමනින්ම ප්‍රමාණවත් නොවන අතර එය මධ්‍යස්ථානයේ ක්‍රියාකාරිත්වයට සෘජුවම බලපා ඇත.

CDF ආයතනය සිය යටිතල පහසුකම් පුළුල් කරමින් 2021 වසරේ සිට ඩිජිටල් අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතන, විවිධ අධිකරණ, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මෙන්ම පෞද්ගලික ආයතන සඳහා උපදේශන සේවා සපයයි. ඒ අනුව, රජයට සහ පුද්ගලික අංශයට ඩිජිටල් අධිකරණ වෛද්‍ය ක්ෂේත්‍රයෙහි අතිරේක සේවා සපයමින් 2022 වසරේ දී වැඩි ආදායමක් උපයා ගැනීමට CDF බලාපොරොත්තු වෙයි.

2. අධිෂ්ඨානය

2. අධ්‍යාපනය

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ආයතනික සැලසුමට අනුව, ආයතනයේ ප්‍රධාන වගකීම වන්නේ කොළඹ විශ්වවිද්‍යාලය යටතේ අදාළ ප්‍රමිතීන්ට අනුකූලව පරිගණක අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමයි. එබැවින් අධ්‍යයනායතනය මඟින් අභ්‍යන්තර උපාධි පාඨමාලා, පශ්චාත් උපාධි පාඨමාලා හා බාහිර හෝ විස්තාරිත වැඩසටහන්වලට අදාළව පරිගණක අධ්‍යාපනය නිසියාකාරව කළමනාකරණය කරනු ලැබේ. මෙම වැඩසටහන් සියල්ල අධීක්ෂණය කිරීම සහ මෙහෙයවීමේ වගකීම ඉහත සඳහන් කළ අධ්‍යයන මණ්ඩල තුනට පැවරී ඇත.

2.1 ප්‍රථම උපාධි අධ්‍යාපනය

කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය විසින් පිරිනමනු ලබන පාඨමාලාවල කොටසක් ලෙස උපාධි මට්ටමේ පරිගණක අධ්‍යාපනය ප්‍රථම වරට 1967 දී හඳුන්වා දෙන ලදී. කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක පීඨය වන UCSC ආයතනය තවමත් විද්‍යා පීඨයේ පාඨමාලා දිගටම කරගෙන යන අතර විද්‍යා පීඨයේ සිසුහු 972ක් UCSC විසින් පවත්වනු ලබන පාඨමාලා හදාරති. පරිගණක විද්‍යාව පිළිබඳ උපාධි පාඨමාලාව 1990 දී කොළඹ විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨය යටතේ ආරම්භ කරන ලද නමුත් UCSC ආයතනය පිහිටුවීමෙන් පසු පරිගණකකරණය පිළිබඳ උපාධි අපේක්ෂකයන් බිහිකිරීම UCSC ආයතනයෙහි ප්‍රධාන වගකීම බවට පත්විය. 2021 දී, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තෝරාගත් සිසුන් 350 දෙනෙකුට UCSC ආයතනය පරිගණක විද්‍යා (CS) උපාධිය, තොරතුරු පද්ධති (IS) උපාධිය සහ මෘදුකාංග ඉංජිනේරු (SE) උපාධි පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙන ලදී.

2.1.1 අභ්‍යන්තර උපාධි පාඨමාලා වැඩසටහන්

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද SLQF මට්ටම 5 සහ SLQF මට්ටම 6 යන දෙකම සැලකිල්ලට ගනිමින් UCSC මඟින් පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු සහ තොරතුරු පද්ධති පිළිබඳ උපාධි පාඨමාලා පහක් වර්තමානයේ දී ප්‍රදානය කෙරේ. මෙම උපාධි පාඨමාලාවල විෂයමාලාව සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලබන්නේ උපාධි ගණනය කිරීම සඳහා වන IEEE / ACM ජාත්‍යන්තර මාර්ගෝපදේශ මත ය. UCSCහි අධ්‍යාපනය නිම කරන උපාධිධාරීන්ගේ සේවා නියුක්ති අනුපාතය 90% ට වඩා පවත්වා ගෙන යාම සඳහා සියලුම උපාධි පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම හා දේශීය කර්මාන්තයන් පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම සඳහා අධ්‍යාපන හා වෘත්තීය උපදේශන මණ්ඩලයක් ද පිහිටුවා තිබේ. UCSC මඟින් පවත්වන උපාධි පාඨමාලා පහ SLQF මට්ටම් අනුව පහත දැක්වේ.

Table: 2.1.1. - A: අභ්‍යන්තර උපාධි පාඨමාලාවල ***SLQF*** මට්ටම්

උපාධි පාඨමාලාව	කාලය (අධ්‍යයන වසර)	**SLQF** මට්ටම
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in CS)	වසර 3කි	5 වන මට්ටම
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BSc Hons. in CS)	වසර 4කි	6 වන මට්ටම
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BSc Hons. in SE)	වසර 4කි	6 වන මට්ටම
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය (BSc in IS)	වසර 3කි	5 වන මට්ටම
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (BSc Hons. in IS)	වසර 4කි	6 වන මට්ටම

උපාධි වැඩසටහනේ සිව් වන වසර සඳහා සිසුන් තෝරා ගැනීම සිදු කරනු ලබන්නේ පළමු හා දෙවන වසරේ දී සිසුන්ගේ කාර්යසාධනය මත පදනම්ව ය. GPA අගය 2.75ට වැඩි සිසුන් ගෞරව උපාධිය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබන නමුත් පරිගණක විද්‍යා විෂය ධාරාව සඳහා සිසුන් 50 දෙනෙකු සහ තොරතුරු පද්ධති විෂය ධාරාව සඳහා සිසුන් 25 දෙනෙකු පමණක් මේ සඳහා ඇතුළත් වීමට අවස්ථාව හිමි කර ගනී. පරිගණක විද්‍යා සිසුනට පරිගණක විද්‍යා හෝ පද්ධති ඉංජිනරු විද්‍යාවේදී ගෞරව උපාධිය තෝරා ගැනීමට අවස්ථාව හිමි වේ. පළමු වසර දෙක තුළ පවත්වනු ලබන විභාගයන්හි ප්‍රතිඵල තෙවන වසර අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පෙර නිකුත් කරනු ලැබේ. සියලුම උපාධි පාඨමාලාවල සංශෝධිත විෂයමාලා මේ වන විට ක්‍රියාත්මකව පවතී. අ.පො.ස (උ/පෙ) විභාගයේ දී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව හෝ උසස් ගණිතය විෂයන්ට අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් ද (C) සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය හෝ ගණිතය යන විෂයන්ගෙන් දෙකක් සඳහා අවම වශයෙන් සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබාගත් සිසුහු පරිගණක විද්‍යා විෂය ධාරාව සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් ලබති. 2021 අගෝස්තු මාසයේ දී තොරතුරු පද්ධති උපාධි පාඨමාලාව සඳහා තෝරා ගැනීමේ අභියෝග්‍යතා පරීක්ෂණයෙන් අයදුම්කරුවන් 2426ක් අතරින් 349 දෙනෙක් (IS) විෂය ධාරාවට අයදුම් කිරීම සඳහා සුදුසුකම් ලැබූහ. උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි වූ සිසුන්ගේ දත්ත පහත වගුවේ දැක්වේ.

2.1.2 අධ්‍යයන වර්ෂය – 2018/2019 සඳහා සිසුන් බඳවා ගැනීම

වගුව 2.1.2. - A: සිසුන් බඳවා ගැනීම - UCSC ඇතුළුවීම සහ විෂයයන් සඳහා බෙදී යෑම – 2021

අධ්‍යයන විෂය ධාරාව	අනුමත ප්‍රමාණය	ඇතුළත් වූ ප්‍රමාණය	පිරිමි	ගැහැණු
පරිගණක විද්‍යා විෂය ධාරාව (CS)	230	224 (97.4%)	152 (68%)	72(32%)
තොරතුරු පද්ධති විෂය ධාරාව (IS)	127	123 (97%)	44 (36%)	79 (64%)
එකතුව	**357**	**347 (97%)**	**196 (56%)**	**151 (44%)**

අධ්‍යයන වර්ෂයක් සාමාන්‍යයෙන් සමාසික දෙකකින් සමන්විත වන අතර එක සමාසිකයක් සඳහා සති පහලොවක කාලසීමාවක් ඇතුළත් වෙයි. සමාසිකයක මධ්‍ය නිවාඩු කාලය සතියක් වන අතර සමාසික අවසන් පරීක්ෂණ ආරම්භ කිරීමට ප්‍රථම සතියක අධ්‍යයන නිවාඩුවක් ලබා දේ. 2021 අධ්‍යයන වර්ෂය සඳහා අදාළ දින දර්ශනය පහත දැක්වේ. පරිගණක අධ්‍යයනායතනය සඳහා තෝරාගත් නවක සිසුන් පිළිගැනීමේ සමාරම්භක උළෙල 2021 අප්‍රේල් මස 27 වැනි දා පැවැත්වූ අතර අධ්‍යයන වර්ෂය ආරම්භ කිරීමට පෙර 2021 අප්‍රේල් මස 28 වැනි දා සිට 2021 මැයි මස 07 වැනි දා දක්වා විශ්වවිද්‍යාල පද්ධතිය හඳුන්වා දීම සහ එම පරිසරයට සිසුන් හුරු කිරීමේ වැඩසටහන් (orientation programme) පැවැත්විණි.
https://ucsc.cmb.ac.lk/events/inauguration-ceremony-undergraduate-academic-year-20182019/

2021 වසර සඳහා අධ්‍යයන කාල සටහන

කාලය		සති	16/17	17/18	18/19	19/20
2021 අප්‍රේල් 26	2021 මැයි 09	2	සිසුන් පිළිගැනීමේ සමාරම්භක උළෙල - 2019/2020 Batch (2021 අප්‍රේල් මස 27 වැනි දින) විශ්වවිද්‍යාල පද්ධතිය හඳුන්වා දීම ඊට සිසුන් හුරු කිරීම - 2021 අප්‍රේල් 28 වැනි දා සිට මැයි 07 වැනි දා දක්වා			
2021 මැයි 10	2021 ජූලි 04	8	4S1	3S1	2S1	1S1
2021 ජූලි 05	2021 ජූලි 11	1	සමාසික විවේකය - 1			
2021 ජූලි 12	2021 අගෝ 15	5	4S1	3S1	2S1	1S1
2021 අගෝ 16	2021 අගෝ 29	2	සමාසික විවේකය - 2			
2021 අගෝ 30	2021 සැප් 12	2	4S1	3S1	2S1	1S1
2021 සැප් 13	2021 සැප් 26	2	පළමු සමාසිකයේ නිමාව (නෙවන වසර ව්‍යාපෘති ඇගයීම)			
2021 සැප් 27	2021 නොවැ 28	9	4S2	3S2	2S2	1S2

2021 නොවැ 29	2021 දෙසැ 05	1	සමාසිකය මැද විවේකය (ICTer සම්මන්ත්‍රණය)			
2021 දෙසැ 06	2021 දෙසැ 19	2	4S2	3S2	2S2	1S2
2021 දෙසැ 20	2022 ජන 02	2	නත්තල් සහ අලුත් අවුරුදු නිවාඩු			
2022 ජන 03	2022 ජන 23	3	4S2	3S2	2S2	1S2
2022 ජන 24	2022 ජන 30	1	අධ්‍යයන නිවාඩු			
2022 ජන 31	2022 පෙබ 13	2	1වන, 2වන සහ 4වන වර්ෂ සඳහා දෙවන සමාසික පරීක්ෂණය (මාර්ගගත/භෞතික විභාග)			
2022 පෙබ 14	2022 පෙබ 27	2	අධ්‍යයන නිවාඩු			
2022 පෙබ 28	2022 මාර්තු 27	4	1වන, 2වන, 3වන සහ 4වන වර්ෂ සඳහා පළමු සමාසික පරීක්ෂණය (මාර්ගගත/භෞතික විභාග)			
2022 මාර්තු 28	2022 අප්‍රේල් 10	2	දෙවන වසර කණ්ඩායම් ව්‍යාපෘතිය			
2022 අප්‍රේල් 11	2022 අප්‍රේල් 17	1	සිංහල - හින්දු අලුත් අවුරුදු නිවාඩුව			
2022 අප්‍රේල් 18	2022 අප්‍රේල් 24	1	සිව්වන වසර අවසන් වාචික පරීක්ෂණය + නව බඳවා ගැනීම් ලියාපදිංචිය			
2022 අප්‍රේල් 25	2022 මැයි 08	2	විභාග ප්‍රශ්න පත්‍ර ඇඟයීම			
2022 මැයි 09	2022 මැයි 15	1	සමාරම්භක උත්සවය - 2020/2021 (10th May 2022) ආයතනනික පුහුණු ස්ථානගත කිරීම පිළිබඳ ඉදිරිපත් කිරීම (2022 මැයි 11 වන දා සිට)			
2022 මැයි 16	2022 මැයි 29	2	විභාග මණ්ඩලය (4 වන වසර සඳහා තෝරා ගැනීම) (2020 මැයි 16 වන දා) විශ්වවිද්‍යාල පද්ධතිය හඳුන්වා දීම (මැයි 16 වන දා සිට ඉදිරියට)			
2022 මැයි 30			නව අධ්‍යයන වර්ෂයේ ආරම්භය			

විද්‍යා පීඨයේ සහ UCSC යන දෙඅංශයේම ඉගැන්වීම් පාඨමාලා සමගාමීව කිරීමේ දී UCSC ආයතනය පරිපාලන ගැටලු කිහිපයකට මුහුණ දෙයි. කෙසේ වෙතත්, මාර්ගගත ක්‍රමයට දේශන සිදුකිරීම නිසා, එම ගැටළු කිහිපයක් විසඳා ගැනීමට හැකි විය.

2.1.3 ඇගයීම්වලදී ශිෂ්‍ය කාර්යසාධනය

Table 2.1.3. - A: Study Programme: CS Stream

අධ්‍යයන වර්ෂය	ලියාපදිංචි සිසුන්	විභාග සඳහා පෙනී සිටි සිසුන් ගණන	**GPA>=2.00** වන ශිෂ්‍ය සංඛ්‍යාව	**2.0>GPA>=1.5** වන ශිෂ්‍ය සංඛ්‍යාව	**GPA<1.5**	සමත් ප්‍රතිශතය % ශිෂ්‍ය සංඛ්‍යාව **>=1.5** / විභාග සඳහා පෙනී සිටි සිසුන් ගණන
2019/2020 (1 වන වසර)	226	සකස් කරමින් සිටී				
2018/2019 (2 වන වසර)	194					
2017/2018 (3 වන වසර සාමාන්‍ය)	143					
2017/2018 (3 වන වසර විශේෂ)	50					
2016/2017 (4 වන වසර)	50					

Table 2.1.3. - B: අධ්‍යයන වැඩ සටහන***: IS*** විෂය ධාරාව

අධ්‍යයන වර්ෂය	ලියාපදිංචි සිසුන්	විභාග සඳහා පෙනී සිටි සිසුන් ගණන	**GPA>=2.00** වන ශිෂ්‍ය සංඛ්‍යාව	**2.0>GPA>=1.5** වන ශිෂ්‍ය සංඛ්‍යාව	**GPA<1.5**	සමත් ප්‍රතිශතය % ශිෂ්‍ය සංඛ්‍යාව **>=1.5** / විභාග සඳහා පෙනී සිටි සිසුන් ගණන
2019/2020 (1 වන වසර)	123	සකස් කරමින් සිටී				
2018/2019 (2 වන වසර)	96					
2017/2018 (3 වන වසර සාමාන්‍ය)	65					
2017/2018 (3 වන වසර විශේෂ)	25					
2016/2017 (4 වන වසර)	25					

උපාධි වැඩසටහන්වල විෂය මාලා පදනම් කර ගෙන අදාළ උපාධි පාඨමාලා සමත් වීම සඳහා සෑම සිසුවෙක්ම අඛණ්ඩ පැවැරුම් නිසි පරිදි සම්පූර්ණ කර සමාසික පරීක්ෂණවලින් ද සමත් විය යුතු ය. සෑම උපාධි අපේක්ෂක වැඩසටහනක් සඳහාම අතථ්‍ය ඉගැනුම් පරිසරය (Virtual Learning Environment) සහිත මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේද උපයෝගී කර ගනී. http://ugvle.ucsc.cmb.ac.lk

2.1.4 ආයතනික පුහුණුව සඳහා ස්ථානගත කිරීම

කාලීන අවශ්‍යතාවන් පිළිබඳ සැලකිලිමත් වෙමින් උපාධි පාඨමාලාවේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනික පුහුණුව පරිගණක අධ්‍යාපනායතනයේ උපාධි අපේක්ෂක සියලුම සිසුන්ට අනිවාර්ය අංගයක් බවට පත්කර ඇත. මෙම අවශ්‍යතා නිසියාකාරව සපුරාලීමටත් තොරතුරු තාක්ෂණික ආයතන සමඟ සමීප සම්බන්ධතා පවත්වා ගැනීමටත් ඒවායේ සහයෙන් අධ්‍යයන පාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමටත් වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය ආයතනය තුළ පිහිටුවා ඇත. නෙවන වර්ෂයේ දෙවන සමාසිකය ආයතනික පුහුණුව සඳහා වෙන් කරනු ලැබේ. අප ආයතනය මඟින් පිටවන උපාධිධාරීන්ගේ රැකියා අනුපාතය 90% ඉක්මවා පවත්වාගෙන යා හැකි වන පරිදි එහි පරිගණක උපාධි සියල්ලෙහිම ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ කර්මාන්තයන්හි ප්‍රතිපෝෂණය ලබා ගැනීමට අධ්‍යයන-කර්මාන්ත උපදේශ මණ්ඩලයක්ද පිහිටුවා තිබේ. 2021 වසරේ ආයතනික පුහුණුවෙහි සංඛ්‍යාලේඛන පහත දැක්වේ.

Table 2.1.4. - A: ආයතනික පුහුණුව සඳහා අදාළ ආයතනවලට සිසුන් විසිර යෑම

ආයතනවල ස්වභාවය – පත්වීම	ස්ථානගත කළ සිසුන් සංඛ්‍යාව	ආයතන සංඛ්‍යාව
IT සමාගම්	253	73
රාජ්‍ය ආයතන	2	2
පරිගණක අධ්‍යයනායතනයේ පර්යේෂණ සහ උපදේශන ව්‍යාපෘති	24	7
මුළු ගණන	**279**	**82**

ආයතනික පුහුණුවට අමතරව, PDC මගින් විවිධ සමාගම්වලින් තාක්ෂණික සාකච්ඡා සහ ආරාධිත දේශන මාලාවක් සංවිධානය කරනු ලබයි. වසංගත තත්ත්වය හේතුවෙන් මෙවර මෙම සාකච්ඡා Zoom තාක්ෂණයෙන් සංවිධානය කෙරිණි. උපාධි අපේක්ෂකයින් උපාධිය ලැබීමෙන් පසු වෘත්තිකයන් ලෙස ඉටු කළ යුතු කාර්යභාරය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම සඳහා මෙම සැසි සකස් කරන ලදී. මීට අමතරව, සිසුන්ට වඩා හොඳ රැකියා අවස්ථා ලබා දීම සඳහා ආයතන සමඟ සහයෝගයෙන් වෘත්තීය කුසලතා සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණ සැසි මාලාවක් PDC විසින් සංවිධානය කරන ලදී.

2.1.5 උපාධි අපේක්ෂක ශිෂ්‍ය සුභසාධනය

2.1.5.1 උපාධි අපේක්ෂක ශිෂ්‍ය සුභසාධනය

(a) නේවාසිකාගාර පහසුකම්

2021 වර්ෂයේ දී, UCSC ආයතනය විසින් එහි ප්‍රතිපත්තිවලට අනුකූලව සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ (UGC) ප්‍රගතියට අනුකූලව නේවාසිකාගාර පහසුකම් අත්‍යවශ්‍ය පළමු වසර මෙන්ම අවසාන වසර උපාධි අපේක්ෂකයින්ට නේවාසික පහසුකම් ලබා දෙන ලදී. වෙන්කළ නේවාසිකාගාර පහසුකම් නොමැති බැවින්, UCSC ආයතනය විසින් පිරිමි ශිෂ්‍යයන් සඳහා නේවාසිකාගාරයක් (ශිෂ්‍යයන් 35 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසිය හැකි) බත්තරමුල්ලෙන් ද සහ ශිෂ්‍යාවන් සඳහා නේවාසිකාගාරයක් (ශිෂ්‍යාවන් 36 දෙනෙකුට නේවාසික පහසුකම් සැලසිය හැකි) කොහුවලින් ද ලෙස පුද්ගලික දේපල දෙකක් කුලියට ගෙන ඇත. නේවාසිකාගාර කළමනාකරණය අධීක්ෂණය කිරීම සඳහා UCSC හි කාර්ය මණ්ඩල සාමාජිකයින් වන පාලිකාවන් සහ උප-පාලකවරුන් පත් කොට ඇති අතර අධ්‍යයන ප්‍රකාශන සහ ශිෂ්‍ය සුභසාධන අංශය නේවාසිකාගාර දෙකම කළමනාකරණය කරයි. 2021 වසරේ සවිස්තරාත්මක සංඛ්‍යාලේඛන පහත වගුවේ දක්වා ඇත.

කෙසේ වෙතත්, covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් සමාජ දුරස්ථභාවය සහ අනෙකුත් සෞඛ්‍ය මාර්ගෝපදේශ සැලකිල්ලට ගනිමින් සිසුන් සංඛ්‍යාව අඩු කිරීමට (කාන්තා නේවාසිකාගාරය 10 සහ පිරිමි නේවාසිකාගාර 12 ලෙස) UCSC ආයතනයට සිදු විය. එබැවින් නේවාසිකාගාරයේ රැඳී සිටීමට අවසර නොලැබුණු සිසුන් සඳහා විශේෂ නේවාසිකාගාර ශිෂ්‍යාධාරයක් ගෙවීමට කළමනාකරණ මණ්ඩලය තීරණය කළේ ය.

පිරිමි නේවාසිකාගාරය:

නේවාසිකාගාර ලිපිනය: 474/B, කඩුවෙල පාර, දෙනියවත්ත, බත්තරමුල්ල
නේවාසිකාගාර පාලක (අධ්‍යයන): ආචාර්ය එම්.අයි.ඊ. වික්‍රමසිංහ
නේවාසිකාගාර උප-පාලක (අධ්‍යයන): ආර්.ජේ. අමරවීර මහතා
ධාරිතාව: 35

කාන්තා නේවාසිකාගාරය:

නේවාසිකාගාර ලිපිනය: 76/16A, සුනේත්‍රාදේවී මාවත, කොහුවල, නුගේගොඩ
නේවාසිකාගාර පාලක (අධ්‍යයන): ආචාර්ය ටී.ඒ.වීරසිංහ මිය
නේවාසිකාගාර උප-පාලක (අධ්‍යයන): එම්.ජී.ඒ. ශ්‍රීමලී මිය
ධාරිතාව: 36

Table 2.1.5.1. – A: 2021 වසර තුළ ඉල්ලුම් කරන ලද සහ ප්‍රදානය කරන ලද නේවාසිකාගාර පහසුකම්

නේවාසිකාගාරය	නේවාසිකාගාර පහසුකම් සඳහා ඉල්ලුම් කළ	1 වන වසර සිසුන්		අවසන් (3 වන සහ 4 වන) වසර සිසුන්			එකතුව
		CS විෂය ධාරාව	**IS** විෂය ධාරාව	**CS** විෂය ධාරාව	**IS** විෂය ධාරාව	**SE** විෂය ධාරාව	
පිරිමි නේවාසිකාගාරය	72	46	26				72
කාන්තා නේවාසිකාගාරය	77	48	29				77
එකතුව	**149**	**94**	**55**				**149**

Table 2.1.5.1. - B: නේවාසිකාගාර පහසුකම් වෙනුවෙන් වැය කළ මුදල්

නේවාසිකාගාරය	ධාරිතාව	මාස 12 සඳහා කුලිය	උපයෝජ්‍යතා පිරිවැය	කළමනාකරණ පිරිවැය	ලියාපදිංචි සිසුන්	එක් ශිෂ්‍යයෙක් සඳහා පිරිවැය
පිරිමි නේවාසිකාගාරය	35	217,500.00	වෙනත්: 29,640.32 ජලය: 8,400.00 විදුලිය:9,600.00	නේවාසිකාගාර පාලක (අධ්‍යයන) දීමනාව 6,000.00 නේවාසිකාගාර උප-පාලක (අධ්‍යයන) දීමනාව 9,000.00 භාරකරුගේ වැටුප: 35,398.80	35	**9,015.40.**
කාන්තා නේවාසිකාගාරය	36	900,000.00	වෙනත්: 32,450.45 ජලය: 24,000.00 විදුලිය:36,000.00 දුරකථන: 6,000.00	නේවාසිකාගාර පාලක (අධ්‍යයන) දීමනාව 6,000.00 නේවාසිකාගාර උප-පාලක (අධ්‍යයන) දීමනාව = 12,750.00 භාරකරුගේ වැටුප: 468,000.00	36	**27,734.73**
එකතුව					**71**	**36,750.13**

(b) ආපනශාලා පහසුකම්

UCSC පරිශ්‍රයෙන් තරමක් දුරින් අනෙත් පීඨයන්හි ආපනශාලා පැවතීමත් දිවා ආහාර වේලාවට එම ආපනශාලාවන්හි අධික තදබදයක් පැවැතීමත් නිසා අප ආයතනයේ සිසුන්ට ආපනශාලා පහසුකම් සැලසීමට අපට සිදු වේ. ආහාර පිළියෙල කිරීම සඳහා මුළුතැන්ගෙයක් නොමැතිවීම නිසා ආපනශාලාවෙහි ක්‍රියාකාරීත්වය සම්බන්ධ ගැටලු කිහිපයක් මතු විය. කෙසේ වෙතත් මුළුතැන්ගෙය සඳහා වූ තාවකාලික පිළියම් මත ආපනශාලාව පවත්වාගෙන ගියේය.

UCSC ආපනශාලාව සාමාන්‍යයෙන් පෙ.ව. 7.00ට විවෘත කරන අතර අධ්‍යයන කටයුතු පවත්වන දිනයන්හි ප.ව. 6 දක්වා එහි සේවාවන් විවෘතව පවතියි. ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්, පරිපාලන කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය නියෝජිතයන්ගෙන් සැදුම්ලත් කමිටුවක් මඟින් ආපනශාලාව කළමනාකරණය සහ අධීක්ෂණය සිදු කරනු ලබයි. ආපනශාලා සේවා වැඩිදියුණු කිරීමේ කටයුතු සඳහා ආපනශාලා කමිටුව නිතර රැස්වේ.

2019 වසරේ රජයේ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ වසරක කාලයක් සඳහා ශිෂ්‍ය ආපනශාලාවේ ආපනශාලා කොන්ත්‍රාත්කරු ලෙස එස්.අමරසිංහ මහතා තෝරා ගන්නා ලද අතර වර්තමානයේ රටෙහි පවතින වසංගත තත්ත්වය හේතුවෙන් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය යටතේ 2021 වසරේ දී එම කොන්ත්‍රාත්තුව කිහිප වතාවක් දීර්ඝ කරන ලදී. UCSC මගින් මුළුතැන්ගෙය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විදුලිය, ජලය සහ උපයෝගිතා නොමිලේ සපයයි. ගිවිසුමට අනුව ආපන ශාලාවේ හිමිකරු ඔවුන්ගේ සේවය ලබා දිය යුතුය. වසංගත තත්ත්වය හේතුවෙන් UCSC ආපනශාලාව 2021 වසර පුරාවට වසා දැමුණි. විශ්වවිද්‍යාලයේ සාමාන්‍ය කටයුතු නැවත ආරම්භ කරන තෙක් ආපනශාලාවේ ටෙන්ඩර් කිරීමේ ක්‍රියාවලිය කල් දමන ලදී.

කාර්ය බහුල වේලාවන්හි ශිෂ්‍ය ආපනශාලාවේ දැඩි තදබදයක් පවතින හෙයින් UCSC සුබසාධක සංගමය හරහා පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය සහ විශේෂිත අමුත්තන් සඳහා කුඩා ආපනශාලාවක් ගොඩනැඟිල්ලේ ඉහළ මාලයේ පවත්වා ගෙන යනු ලැබේ. ආයතනයේ කාර්ය මණ්ඩලයට සහ අමුත්තන්ට දිවා ආහාරය ගැනීම සඳහා ද මෙහි ස්ථානයක් වෙන්කර ඇත.

(c) උපාධි අපේක්ෂකයන් සඳහා උපදේශනය

සියලුම උපාධි අපේක්ෂකයන් සඳහා උපදේශන කටයුතු පරිගණක අධ්‍යයනායතනය මඟින් නොමිලේ සැපයේ. පසුගිය වසර දහයක අපගේ අත්දැකීම් අනුව පවුල් ප්‍රශ්න, ආදර සබඳතා, ඉගෙනුම්, සමාජීය ප්‍රශ්න සහ වෘත්තීයමය ගැටලු ආදී සිසුන් මුහුණපාන විවිධ ගැටලු නිසා සිසුන්ගේ ආතති මට්ටම සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. තමන් මුහුණ පා සිටින සාමාජීය සහ මානසික ප්‍රශ්න සඳහා විසඳුම් සොයන සිසුන්ට ඒ සඳහා උපකාර කිරීම සඳහා මිත්‍රශීලී පරිසරයක් නිර්මාණය කර දීමට අපගේ උපදේශන සේවාව සෑම විටම උත්සහ දරයි. සිසුන්ගේ ගැටලු හඳුනාගැනීමට ඒවාට සවන්දීමට සහ විසඳුම් ලබාදීමට උපදේශනය සැපයීම සඳහා පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් ආයතනය සතු වන අතර ඇතැම් ප්‍රශ්න සඳහා වැඩිදුර උපදේශන අවශ්‍ය වන්නේ ද යන්න පිළිබඳ සොයා බලා ආයතනයට පැමිණෙන වෘත්තීයවේදී උපදේශකවරියක් වෙත අදාළ සිසුන් දිනකට පැය කීපයක් යොමු කෙරෙයි. 2016 වසරේ සිට උපදේශන සේවා සිදුකිරීම සඳහා වෙන ම

කාමරයක් වෙන්කර ඇති අතර අවශ්‍ය ඕනෑම ශිෂ්‍යයෙකුට එම ස්ථානයෙන් පෞද්ගලිකව සේවය ලබා ගත හැක.

ශිෂ්‍ය උපදේශකයන් සමඟ සිසුන් සන්නිවේදනය කරන සියලු තොරතුරු රහසිගතව තබා ගන්නා අතර ශිෂ්‍යයා එකඟ වුවහොත් පමණක් වෘත්තීයවේදී උපදේශකවරයා වෙත දැනුම් දෙනු ලැබේ. එමෙන්ම අදාළ ශිෂ්‍යයා සම්බන්ධ වන අධ්‍යයන වැඩසටහන පිළිබඳ කවර හෝ බලපෑමක් හේතුකොට ගෙන පරිගණක අධ්‍යයනායතනයෙන් පියවරක් ගත යුතු වන්නේ නම් පමණක් ඊට අදාළ වෘත්තියවේදී උපදේශකවරු නැවත ආයතනය දැනුවත් කරයි. වෘත්තීයවේදී උපදේශකවරු අදාළ ශිෂ්‍යයාට වැඩිදුර උපකාර අවශ්‍ය වන්නේ යැයි නිශ්චය කරන්නේ නම් ඔහුගේ හෝ ඇයගේ එකඟතාව මත සායනික මනෝ වෛද්‍යවරයෙකු හෝ මනෝ චිකිත්සකවරයෙකු වෙත යොමු කෙරේ.

2021 දී සියලුම සිසුන් සඳහා ආචාර්ය මණ්ඩලයේ දෙදෙනෙකු, එනම්, ආචාර්ය ටී.ඒ. වීරසිංහ මහත්මිය සහ ජී.පී සෙනවිරත්න මහතා ශිෂ්‍ය උපදේශකවරු ලෙස සේවය ලබා දී ඇත. උපදේශනය අවශ්‍ය සිසුන්ට පහසුකම් සැලසීම සඳහා වෘත්තීය උපදේශිකා නිලනි තුෂාන්තිකා මහත්මියගේ සේවය 2021 වසරේ දී දිනකට පැය 2-3 ක කාලයක් සඳහා ලබා ගනී. වෘත්තීය ශිෂ්‍ය උපදේශකවරුන්ට ආයතනය මඟින් පැය ගණන පදනම්ව ගෙවීම් සිදුකරනු ලබයි. සාමාන්‍යයෙන් සිසුන් 30-40 ක් පමණ මෙම උපදේශකවරුන්ගෙන් නිරන්තර උපදේශන ලබාගනී.

2021 වසර තුළ දී, කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් විශ්වවිද්‍යාලය තුළට පැමිණීම සිදු කළ නොහැකි වූ බැවින්, දුරකථන සහ මාර්ගගත රැස්වීම් හරහා මාර්ගගත උපදේශන ලබා දෙන ලදී. සිසුන්ගේ පොදු ගැටළු සහ කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති විශේෂිත ගැටළු සොයා බැලීම සඳහා මාර්ගගත සමීක්ෂණ කිහිපයක් පවත්වන ලදී. එම විශේෂිත ගැටලු පිළිබඳ පසු විපරමක් කිරීමට වෘත්තීය ශිෂ්‍ය උපදේශකවරයාගෙන් ඉල්ලා සිටි අතර වසංගතය හේතුවෙන් මූල්‍ය දුෂ්කරතා සම්බන්ධ ගැටලුවලට මුහුණ දුන් සිසුන්ට UCSCහි ආදි ශිෂ්‍ය සංගමයේ සහාය ඇතිව විශේෂ සහයෝගයක් ලබා දෙන ලදී.

(d) ප්‍රථම උපාධි අපේක්ෂකයන් සඳහා මූල්‍ය සහය

මහපොළ ශිෂ්‍යත්වය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාදෙන ශිෂ්‍යාධාර, වෘත්තීය ආයතන මගින් ලබා දෙන ශිෂ්‍යත්ව සහ ශිෂ්‍ය සුභසාධන ආපදා අරමුදල යනාදී වශයෙන් ශිෂ්‍යයන් සඳහා මූල්‍ය සහය ලබාදෙන ලදී. 2021 වසර තුළ අධ්‍යයන කටයුතු අන්තර්ජාලය හරහා සිදු කළ බැවින්, මෙම ශිෂ්‍යත්ව සියල්ල සැලසුම් කළ පරිදි අඛණ්ඩව සිදු කිරීමට තීරණය විය.

මහපොළ ශිෂ්‍යත්ව

වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මහපොළ භාර අරමුදලේ අනුග්‍රහකත්වය යටතේ මහපොළ ශිෂ්‍යත්වය 2021 වසරේ දී ශිෂ්‍යයන් 317 දෙනෙකුට ලබා දෙන ලදී. කුසලතා සහ සාමාන්‍ය ශිෂ්‍යත්වවල මුළු වටිනාකම පිළිවෙලින් රු. 5,050 හා රු 5000 වෙයි. (පරිගණක විද්‍යාව [CS] + තොරතුරු පද්ධති [IS]).

Table 2.1.5.1. – C: ශිෂ්‍ය සංඛ්‍යාව - මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය – ***2021***


ඇතුළත් වූ වසර	අධ්‍යයන වර්ෂය	කුසලතා ශිෂ්‍යත්ව **(CS+IS)**	සාමාන්‍ය ශිෂ්‍යත්ව **(CS+IS)**	එකතුව
2019/2020	1 වන වසර			
2018/2019	2 වන වසර	6(6+0)	116(95+21)	122 (101+21)
2017/2018	3 වන වසර	13(13+0)	117(91+26)	130 (104+26)
2016/2017	4 වන වසර	10(10+0)	15(07+8)	25 (17+8)
මුළු	**එකතුව**	**29**	**248**	**277**

ශිෂ්‍යාධාර

ශිෂ්‍යාධාර සඳහා සිසුන් තෝරා ගැනීම පාලනය කරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ චක්‍රලේඛවලට අනුකූලව ශිෂ්‍යාධාර ප්‍රදානය කරන ලදී. 2021 තුළ සිසුන් 49 දෙනෙකුට ශිෂ්‍යාධාර ප්‍රදානය කරන ලදී. 2021 වසර සඳහා ශිෂ්‍යාධාර ලබන්නන් පිළිබඳ සටහන පහත වගුවේ දක්වා ඇත (පරිගණක විද්‍යාව [CS] + තොරතුරු පද්ධතිය [IS]). 2021 දී ශිෂ්‍යාධාර ගෙවීම සිදු කරන ලද්දේ සිසුන්ට මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනයේ නිරත වීමට පහසුකම් සැලසීම සඳහා ය.

Table 2.1.5.1. – D: ශිෂ්‍ය සංඛ්‍යාව - ශිෂ්‍යාධාර ප්‍රදානය – ***2021***

ඇතුළත් වූ වසර	අධ්‍යයන වර්ෂය	පූර්ණ-ශිෂ්‍යාධාර (Rs. 4000) **(CS+IS)**	අර්ධ-ශිෂ්‍යාධාර (Rs. 3900) **(CS+IS)**	එකතුව
2019/2020	1 වන වසර	122(74+48)		122 (74+48)
2018/2019	2 වන වසර	12(3+9)		12 (3+9)
2017/2018	3 වන වසර	24(10+14)		24 (10+14)
2016/2017	4 වන වසර	4(2+2)	2(2+0)	6 (4+2)
මුළු	**එකතුව**	**162**	**2**	**164**



ආයතනික ශිෂ්‍යත්ව

සෑම වසරකම විවිධ දුෂ්කරතා සහිත සිසුන් සඳහා ශිෂ්‍යත්ව සඳහා අනුග්‍රහය දැක්වීමට පෞද්ගලික ආයතනවලට ඇරයුම් කෙරේ. සීමාසහිත IFS R&D ආයතනය මසකට රු 5000/= බැගින් වසරක් සඳහා ශිෂ්‍යත්ව 8ක් පිරිනමන ලදී. මෙම සිසුන් සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගැනීම සඳහා නියෝජ්‍ය අධ්‍යක්ෂ, අධ්‍යයනාංශ ප්‍රධානීන්, උපාධි පාඨමාලා සම්බන්ධීකාරකවරුන්, ශිෂ්‍ය උපදේශකවරුන් සහ පරිපාලන නිලධාරීන් සෘජුව සම්බන්ධ වේ.

Table 2.1.5.1. – E: ආයතනික ශිෂ්‍යත්ව ***2021***

ශිෂ්‍යත්ව ගණන සහ වටිනාකම	පළමු වසර සිසුන් සංඛ්‍යාව	දෙවන වසර සිසුන් සංඛ්‍යාව
ශිෂ්‍යත්ව **08**කි – මාස්පතා රු. **5,000**/- බැගින්	ශිෂ්‍යයින් 4යි	ශිෂ්‍යයින් 4යි

ශිෂ්‍ය සුභසාධන සහ ආපදා අරමුදල

වසර කිහිපයකට පෙර අප ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් මූල්‍ය දුෂ්කරතා, දෙමව්පියන් අහිමි වීම, සෞඛ්‍ය ගැටලු යනාදී අනපේක්ෂිත පුද්ගල ගැටලුවලින් පීඩා විඳින සිසුන්ට සහනයක් වීම පිණිස මෙම අරමුදල පිහිටුවීමේ අවශ්‍යතාව හඳුනා ගන්නා ලදී. එබැවින් පශ්චාත් උපාධි සහ බාහිර උපාධි පාඨමාලාවලින් ලැබෙන ආදායමෙන් 2%ක ප්‍රමාණයක් ශිෂ්‍ය ආපදා සහ සුභසාධන අරමුදලට බැර කිරීමට අධ්‍යයන කාර්ය මණ්ඩලය තීරණය කරන ලදී. 2021 වසරේ දී මෙම අරමුදලින් සිදුකරන ලද ක්‍රියාකාරකම් පහත දැක්වේ.

පහත සඳහන් ඇගයීම් නිර්ණායක මත පදනම්ව වඩාත් සුදුසු ශිෂ්‍යයන් තෝරා ඔවුන් සඳහා විශේෂ මූල්‍ය ආධාර පිරිනමන ලදී:

a) දෙමාපියන්ගේ වාර්ෂික ආදායම
b) සහෝදර සහෝදරියන් සංඛ්‍යාව (පාසල් යන සහ උසස් අධ්‍යාපනය ලබන)
c) නිවස සහ විශ්වවිද්‍යාලය අතර දුර
d) වෙනත් ශිෂ්‍යත්ව / මූල්‍ය ආධාර
e) පවුල තුළ විශේෂ තත්වයන්
f) තේරීම් මණ්ඩලයේ නිර්දේශය

2021 වසරේ දී සිසුන් 14 දෙනෙකුට ශිෂ්‍ය හා ආපදා අරමුදලෙන් ශිෂ්‍යත්ව පිරිනමන ලදී. මසකට රු. 5000 බැගින් ශිෂ්‍යත්ව 13ක් සහ රු. 3000 බැගින් එක් ශිෂ්‍යත්වයක් මාස 10ක කාලයක් සඳහා ලබා දෙන ලදී. මේ අනුව ආයතනය උපයාගත් මුදලින් රුපියල් මිලියන 0.6කට වැඩි මුදලක් විශේෂ අවශ්‍යතා ඇති සිසුන්ට මූල්‍යාධාර ලබා දීම සඳහා පසුගිය වසර තුළ යොදවා ඇත.

Table 2.1.5.1. – F (A): විශේෂ මූල්‍යාධාර ***2021***

සම්පූර්ණ ශිෂ්‍යත්ව ගණන සහ ශිෂ්‍යත්ව මුදල	අර්ධ ශිෂ්‍යත්ව ගණන සහ ශිෂ්‍යත්ව මුදල	2021 වසර සඳහා මුළු මුදල
මසකට රු. **5000**/= බැගින් ශිෂ්‍යත්ව **13**ක්	මසකට රු. 3000 බැගින් එක් ශිෂ්‍යත්වයක්	රු. 68,000/- *10 රු.680,000/-

Table 2.1.5.1. – F (B): විශේෂ මූල්‍යාධාර ***2021***

භාවිත කිරීමේ ප්‍රවර්ගය	අවස්ථාව	ශිෂ්‍ය සංඛ්‍යාව	ගෙවූ මුදල (රු.)
ශිෂ්‍ය සුබසාධන හා ආපදා අරමුදල භාවිත කිරීම	Due to death of the Bread Winner.	1	15,000/-

විදේශීය පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයන ශිෂ්‍යත්ව

පුද්ගලික පරිත්‍යාගශීලියෙකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව, UCSC විසින් මෙම ශිෂ්‍යත්වය පිහිටුවීම සඳහා එක් ශිෂ්‍යයෙකු තෝරා ගත් අතර අවශ්‍යතා ඇති සිසුන්ට උපකාර කිරීමට සහ ඔවුන්ගේ වැඩිදුර අධ්‍යයන කටයුතු සඳහා දිරිගැන්වීමට මෙය උපකාරී වේ.

Table 2.1.5.1. – G: විදේශීය පරිත්‍යාගශීලීන් විසින් අරමුදල් සපයන ශිෂ්‍යත්ව ***2021***

ශිෂ්‍යත්ව සංඛ්‍යාව	ශිෂ්‍යත්වයේ වටිනාකම	කාලය
ශිෂ්‍යත්ව 1යි	මාස්පතා රු. 5000/=කි	ශිෂ්‍යභාවය ඇති තාක්

Table 2.1.5.1. – G (I): Shorea Robusta ශිෂ්‍යත්ව ***- 2021 (***4 වන වසර ශිෂ්‍යත්ව***)***

ශිෂ්‍යත්ව සංඛ්‍යාව	ශිෂ්‍යත්වයේ වටිනාකම	කාලය
ශිෂ්‍යත්ව 3යි	පූර්ණ ශිෂ්‍යත්ව 2යි (මාස්පතා රු. 3,000/- බැගින්) අර්ධ ශිෂ්‍යත්ව 1යි (මාස්පතා රු. 2,000/- බැගින්)	මාස 10යි

2.1.6 UCSC ශිෂ්‍ය සංගමය

2002 අංක 01 දරන කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයන ආයතන ආඥාපනතේ 25 සහ 26 යන උප ඡේද අනුව 2021 වර්ෂය සඳහා ශිෂ්‍ය සංගම් නිලවරණය පවත්වන ලද අතර ශිෂ්‍ය සංගමය සඳහා පහත සඳහන් සාමාජිකයන් තේරී පත් විය.

ශිෂ්‍යයාගේ නම	ලියාපදිංචි අංකය	තනතුර
B.H.R. කුරේ	2018/CS/026	සභාපති
A.A.N. නිෂාමාල්	2019/IS/052	උප සභාපති
R.M.S.B.V. රත්නායක	2019/CS/140	ලේකම්
N.S. විමලවීර	2019/CS/196	සංස්කාරක
S.A.A.D. මෛත්‍රීපාල	2019/IS/043	කනිෂ්ඨ භාණ්ඩාගාරික
N.G.W.W. බාලසූරිය	2019/IS/009	කමිටු සාමාජික
D.M.A.A. දිසානායක	2019/CS/039	කමිටු සාමාජික
M.N.M. රෂීන්	2019/IS/070	කමිටු සාමාජික
J.P.M. දාස්	2019/CS/028	කමිටු සාමාජික
V.G.A. ඉඳුවර	2020/IS/048	කමිටු සාමාජික
A.A. කිවි	2020/IS/057	කමිටු සාමාජික
T.A.D. චානුක	2020/CS/023	කමිටු සාමාජික
M.S.M. සුරායිෆ්	2020/CS/182	කමිටු සාමාජික

ශිෂ්‍ය සමාජ සහ සංගම් කිහිපයක් තිබුණ ද සිසුන්ගේ බොහෝ ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කරනු ලබන්නේ ශිෂ්‍ය සංගමය මගිනි. කෙසේ වෙතත්, වසංගත තත්ත්වය හේතුවෙන් භෞතික ක්‍රියාකාරකම් සිදු කිරීමට නොහැකි වුව ද 2021 වසර තුළ දී මාර්ගගත සිංහල-දෙමළ අලුත් අවුරුදු සැමරුම ඇතුළු බොහෝ මාර්ගගත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

2.1.7 ශිෂ්‍ය ක්‍රියාකාරකම්

ප්‍රධාන වශයෙන් සංස්කෘතික හා විනෝදාත්මක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් UCSC ශිෂ්‍ය සංගමය හරහා ශිෂ්‍ය ක්‍රියාකාරකම් සිදු කෙරේ. අදාළ විස්තර පහත දැක්වේ.

Table 2.1.7.: A: ප්‍රධාන ශිෂ්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ කාල රාමුව – ***2021***

සිදුවීම	දිනය
IEEE Student Branch of UCSC - IEEE Student Branch of UCSC – Induction - 7LinesOfCode - MadHack - RevolUX - ReidXtreme	 14/05/2021 22/05/2021 01/06/2021 05/06/2021 26/09/2021

- IEEE Day	07/10/2021
IEEE Computer Society Chapter of UCSC - TECHNORION - TECHZEN - Induction - DesignX - Intellihack2.0	 24/04/2021 29/05/2021 10/07/2021 18/08/2021 27/08/2021
IEEE Women In Engineering - Hackaholics 4.0 - Induction - WebHex	 02/05/2021 13/06/2021 08/08/2021
Computer Society of UOC - Ezkaype - CompSoc Tech Talks	 06/08/2021 02/10/2021
UCSC ISACA Student Group - Annual General Meeting - Career Guidance Session - FreshHack 2.0 - iCS 2.0 Cyber Security Workshop - iCS 2.0	 29/04/2021 10/07/2021 09/10/2021 27/11/2021 11/12/2021
UCSC Exploration Club - Exploration Club Induction - First year mentoring program	 14/11/2021 27/11/2021

මෙම වැඩසටහන් පිළිබඳ වැඩිදුර තොරතුරු http://ucsc.cmb.ac.lk/events/ අඩවියෙහි ඇති අතර ඒවා http://ucsc.cmb.ac.lk/ucsc-calendar/ හි ඇති UCSC දින දර්ශනය භාවිත කොට නිවේදනය කෙරිණි.

2.1.8 ශිෂ්‍ය ජයග්‍රහණ

2.1.8.1 විෂය බාහිර ක්‍රියාකාරකම්

සිසුන්ගේ දැනුම, කුසලතා, ආකල්ප සහ මානසිකත්වය වැඩි දියුණු කිරීම සඳහා බොහෝ විෂය බාහිර ක්‍රියාකාරකම්වලට සහභාගී වීමට සිසුන් දිරිමත් කරනු ලැබේ. ඒ අතරම, එවන් සහභාගීත්වයන් මගින් UCSC ආයතනය සහ එහි සිසුන් සඳහා වඩා හොඳ කීර්තියක් ලැබේ. 2021 වසරේ ජයග්‍රහණ පිළිබඳ පහත ලැයිස්තුව විස්තර සපයයි.

තරඟාවලිය	ජයග්‍රහණය
Hacktitutude 2020 organised by 99x technology	ජයග්‍රාහකයා, අවසන් වටය
RevolUX 2021 (Inter University Designathon) organized by IEEE Student Branch of UCSC	ජයග්‍රාහකයා
MadHack 2021 Mobile Application Development Hackathon organized by IEEE Student Branch of UCSC	3 වන ස්ථානය

2.1.9 උපාධි ප්‍රදානෝත්සවය - 2021

වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වසර සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය කල් දැමූ අතර අවසානයේ 2021 දෙසැම්බර් 17, 18 සහ 19 යන දිනවල BMICH හිදී පැවැත්විණි. ඒ අනුව 2021 වසර සඳහා වන උපාධි ප්‍රදානෝත්සවය 2022 වර්ෂයේ දී පැවැත්වීමට බොහෝ දුරට ඉඩ ඇත. පරිගණක විද්‍යාව, තොරතුරු පද්ධති සහ මෘදුකාංග ඉංජිනේරු විෂය ධාරාවන්හි උපාධි වැඩසටහන් 5කට අයත් සිසුන් 267 දෙනෙක් උපාධි ලබා ගත්තේය. තොරතුරු පද්ධති පිළිබඳ BSc උපාධිය සහ තොරතුරු පද්ධති පිළිබඳ BSc Hons උපාධි වැඩසටහන හදාරන සිසුන් ඔවුන්ගේ උසස් පෙළ අධ්‍යයන විෂය ධාරාවට අදාළව විශ්ලේෂණය කරනු ලැබේ (වගුව 2.1.9 B සහ 2.1.9 C).

Table 2.1.9. – A: උපාධිධාරී ***UCSC*** සිසුන්ගේ අවසන් අධ්‍යයන කාර්යසාධනය – ***2021***

අධ්‍යයන වැඩ සටහන	ප්‍රධාන / නැවත	අවසන් පරීක්ෂණයට පෙනී සිටි සිසුන් ගණන		උපාධිධාරී මුළු සිසුන් ගණන											
				පළමු පන්තිය		දෙවන පෙළ ඉහළ		දෙවන පෙළ පහළ		සමත්		එකතුව		සමත් ප්‍රතිශතය %	
		පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු	පිරිමි	ගැහැනු
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2016/2017)	ප්‍රධාන	132	59	1		29	13	11	15	46	14	87	42	66	71
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2016/2017)	ප්‍රධාන	37	59		1	13	17	6	17	5	9	24	44	65	75
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (A/Y 2015/2016)	ප්‍රධාන	18	14	9	9	7	4	1	1			17	14	94	100
මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (A/Y 2015/2016)	ප්‍රධාන	3	5	1	1	1	4	1				3	5	100	100
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය (A/Y 2015/2016)	ප්‍රධාන	10	10	6	8	3	2			1		10	10	100	100
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2012/2013)	නැවත	2								2		2		100	
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2013/2014)	නැවත	1								1		1		100	

පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2015/2016)	නැවත	3								3		3		100	
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2011/2012)	නැවත	1								1		1		100	
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී උපාධිය (A/Y 2015/2016)	නැවත	2	2							2	2	2	2	100	100




Table 2.1.9. – B: අ.පො.ස (උසස් පෙළ) අධ්‍යයන විෂය ධාරාව සමඟ තොරතුරු පද්ධති පිළිබඳ විශේෂවේදී උපාධිලාභීන්ගේ කාර්යසාධනය

පන්තිය		පළමු පන්තිය			දෙවන පෙළ ඉහළ			දෙවන පෙළ පහළ			සමත්			එකතුව
ස්ත්‍රී /පුරුෂ භාවය		පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	
විෂය ධාරාව	පි				11	7	18	5	7	12	3	2	5	35
	ගැ				2	8	10	1	4	5		2	2	17
	C		1	1		2	2		5	5	3	5	8	16
	A										2	2	4	4
	T								1	1				1
එකතුව			**1**	**1**	**13**	**17**	**30**	**6**	**17**	**23**	**5**	**9**	**14**	**73**

M – ගණිතය, B – ජීව විද්‍යාව, C- වාණිජ, A – කලා, T - තාක්ෂණ

Table 2.1.9. – C: අ.පො.ස (උසස් පෙළ) අධ්‍යයන විෂය ධාරාව සමඟ තොරතුරු පද්ධති පිළිබඳ විශේෂවේදී (ගෞරව) උපාධිලාභීන්ගේ කාර්යසාධනය

පන්තිය		පළමු පන්තිය			දෙවන පෙළ ඉහළ			දෙවන පෙළ පහළ			සමත්			එකතුව
ස්ත්‍රී /පුරුෂ භාවය		පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	පි	ගැ	එකතුව	
විෂය ධාරාව	**M**	2	4	6	2	1	3							9
	B	3	2	5	1		1							6
	C	1	2	3							1		1	4
	A					1	1							1
	T													
එකතුව		**6**	**8**	**14**	**3**	**2**	**5**				**1**		**1**	**20**

M – ගණිතය, B – ජීව විද්‍යාව, C- වාණිජ, A – කලා, T - තාක්ෂණ

2.1.10 උපාධි අපේක්ෂක සම්මාන නිළිණ

UCSC ආයතනයෙහි සියලුම උපාධි වැඩසටහන් සඳහා උපාධි සම්මාන නිළිණ කිහිපයක් ප්‍රකාශයට පත් කෙරේ. මෙම සම්මාන නිළිණ සඳහා පූර්ව නිශ්චිත නිර්ණායකයක් ඇති අතර, සියලුම තේරීම් කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාව විසින් අනුමත කරනු ලැබේ.

Table 2.1.10. – A: තොරතුරු පද්ධති උපාධි වැඩසටහනේ උපාධි සම්මාන නිළිණ – ***2021***

සම්මානයේ නම	සම්මාන ලාභියාගේ නම
තුන් අවුරුදු උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වන සෙබ්‍රා ටෙක්නොලොජීස් අධ්‍යයන විශිෂ්ටතා සම්මානය - 2020	Piyadasa J.D.K.V
සිවි අවුරුදු උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වන IFS අධ්‍යයන විශිෂ්ටතා සම්මානය - 2020	Bandara R.M.V.G
අවසන් වසර හොඳම ව්‍යාපෘතිය සඳහා වන සම්පත් බැංකු සම්මානය - 2020	Kurukulasuriya A.D.N. Peiris S.C.P. Pooliadda T.M.H.S.M
ආයතනික පුහුණුවෙහි හොඳම කාර්ය සාධනය සඳහා ඩේවිඩ් පීරිස් සමූහ රන් පදක්කම – 2020	Rajanayake K.K.

Table 2.1.10. – B: පරිගණක විද්‍යා උපාධි වැඩසටහනේ උපාධි සම්මාන නිළිණ – ***2021***

සම්මානයේ නම	සම්මාන ලාභියාගේ නම
තුන් අවුරුදු උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වන වර්චුසා අධ්‍යයන විශිෂ්ඨතා සම්මානය – 2020	Aksshar R.
පරිගණක විද්‍යාව සඳහා වන මහාචාර්ය මොහාන් මුණසිංහ සම්මානය - 2020	Jayasekara T.K.
අවසන් වසර හොඳම ව්‍යාපෘතිය සඳහා වන ICTA සම්මානය - 2020	Dehigama D.N.W.
ආයතනික පුහුණුවෙහි හොඳම කාර්ය සාධනය සඳහා ඩේවිඩ් පීරිස් සමූහ රන් පදක්කම – 2020	De Almeida P.D.S.R.

Table 2.1.10. – C: මෘදුකාංග ඉංජිනේරු උපාධි වැඩසටහනේ උපාධි සම්මාන නිළිණ – ***2021***

සම්මානයේ නම	සම්මාන ලාභියාගේ නම
මෘදුකාංග ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වන IFS අධ්‍යයන විශිෂ්ටතා සම්මානය – 2020	Kariyawasam S.N.
මෘදුකාංග ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාවේ අවසන් වසර හොඳම ව්‍යාපෘතිය සඳහා වන සෝමා ගුණතිලක අනුස්මරණ සම්මානය – 2020	Daluwatta W.W De Silva L.R.S. Kariyawasam S.N.
මෘදුකාංග ඉංජිනේරු ගෞරව උපාධි පාඨමාලාවේ හොඳම කාර්යසාධනය සඳහා වන විමලා ජයරත්න අනුස්මරණ සම්මානය - 2020	Daluwatta W.W. Tharaka D.D.

Table 2.1.10. – D: සියලු විෂය ධාරා සඳහා උපාධි සම්මාන නිළිණ – ***2021***

සම්මානයේ නම	සම්මාන ලාභියාගේ නම
කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වඩාත් කැපී පෙනෙන උපාධිධාරියාට හිමි මහාචාර්ය වී.කේ සමරනායක අනුස්මරණ සම්මානය - 2020	Jayasekara T.K.





UCSC සම්මානලාභීන් - උපාධි අපේක්ෂක උපාධි ප්‍රධානෝත්සවය 2021

2.1.11 සේවා නියුක්තිය

තෙවන වසරේ ආයතනික පුහුණුව සඳහා ස්ථානගත බොහෝ සිසුන් තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් සමාගම් විසින් ඵලදායී ගිවිසුම් මත බඳවාගෙන ඇති බව නිරීක්ෂණය වෙයි. කුඩා ප්‍රශ්නාවලියක් භාවිතා කරමින් උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ තොරතුරු රැස්කිරීම උපාධි ප්‍රදානෝත්සව අවස්ථාවේ දී සිදුකරන ලදී. එක් එක් අධ්‍යයන විෂය ධාරාවට අදාළව UCSC උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ. UCSCහි සියලුම අධ්‍යයන වැඩසටහන්වල සේවා නියුක්ති අනුපාතය 90% ඉක්මවයි.

Table 2.1.11. – A: *ප්‍රථම උපාධි අපේක්ෂකයන්ගේ සේවා නියුක්තිය* ***- 2021***

පාඨමාලාව	උපාධිධාරී සංඛ්‍යාව	ප්‍රතිචාර දැක්වූ සංඛ්‍යාව	රැකියාලාභීන්	ස්වයං රැකියාවක නියැලී	රැකියා අපේක්ෂිත / උනන්දුවක් නොදැක්වූ
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී	159	144	94%	4%	1%
තොරතුරු පද්ධති පිළිබඳ විද්‍යාවේදී	91	84	94%	2%	3%
එකතුව	**250**	**228**	**94%**	**4%**	**2%**

2.2 පශ්චාත් උපාධි වැඩසටහන

2.2.1 විද්‍යාපති උපාධි වැඩසටහන

ක්‍රෙඩිට් 15ක පර්යේෂණ ව්‍යාපෘතියක් ඇතුළත් SLQF 10 වන මට්ටමේ ලා සැලකෙන පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය හැර UCSC විසින් පිරිනැමෙන සෙසු විද්‍යාපති උපාධි සියල්ල SLQF 9 වන මට්ටමේ ලා සැලකේ. මීළඟ කොටස් කිහිපයෙන් 2021 වසරේ කාර්ය සාධනය සමඟ මෙම උපාධි පිළිබඳ විස්තර ඉදිරිපත් කෙරේ.

2.2.1.1 විද්‍යාපති උපාධි

UCSC ආයතනය මගින් 2021 වසරේ දී විද්‍යාපති උපාධි පාඨමාලා හයක් ඉදිරිපත් කෙරිණි. සුදුසු අපේක්ෂකයන් තෝරා ගැනීම සඳහා තෝරා ගැනීමේ පරීක්ෂණයක් පවත්වන ලද අතර ව්‍යුහාත්මක සලකුණු ක්‍රමයක් භාවිතා කරමින් වඩාත් සුදුසු අපේක්ෂකයන් හඳුනා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් සියලුම විද්‍යාපති උපාධි පාඨමාලාවල තේරීම් සම්මුඛ පරීක්ෂණ මාර්ගගත

ක්‍රමයට පවත්වන ලද අතර තේරීම් පරීක්ෂණයෙන් මූලිකව තෝරාගත් අපේක්ෂකයින් 450කට අධික සංඛ්‍යාවක් අතරින් සුදුසුකම් ලත් අපේක්ෂකයින් 280 දෙනෙකු සම්මුඛ පරීක්ෂණයෙන් තෝරා ගන්නා ලදී.

- **පරිගණක විද්‍යාපති උපාධිය (MCS)**
  පරිගණක උපාධි පාඨමාලා සඳහා මූලික පාඨමාලා සැලකිල්ලට ගනිමින් විෂය මාලාව සැලසුම් කර ඇති බැවින් පරිගණක උපාධියක් හෝ ඊට සමාන සුදුසුකම් ඇති අය මෙම උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබේ. 2021 වර්ෂයේ වැඩසටහන සඳහා බඳවා ගැනීමේ ප්‍රමාණය සිසුන් 100 කි. පළමු උපාධියේ සුදුසුකම්, තේරීම් පරීක්ෂණයේ කාර්යසාධනය සහ තේරීම් සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව සිසුන් තෝරා ගන්නා ලදී.

- **පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය (MSc in CS)**
  පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය සැලසුම් කර ඇත්තේ පර්යේෂණ අරමුණු කොට ගත් පරිගණක විද්‍යා උපාධියක් ලබා ගැනීමට කැමති අය සඳහා ය. පරිගණක විද්‍යාපති උපාධියේ පළමු සමාසික දෙකෙහි නිශ්චිත අවම අධ්‍යයන කාර්යසාධනය සඳහා ළඟා වන සිසුවෙකු දෙවන වසරේ දී පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාවට (තෙවන හා සිව්වන සමාසික) ලියාපදිංචි වීමට සුදුසුකම් ලබයි.

- **තොරතුරු නාක්ෂණ විද්‍යාපති උපාධිය (MIT)**
  තම වෘත්තීය මාර්ගය පරිගණක සම්බන්ධ ක්ෂේත්‍රයකට වෙනස් කිරීමට හෝ පරිගණකකරණය සම්බන්ධ පශ්චාත් උපාධියක් ලබා ගැනීමට උනන්දුවක් ඇති පිරිසට මෙම උපාධි පාඨමාලාව හඳුන්වා දී ඇත. යම් පරිගණක දැනුමක් ඇති ඕනෑම ක්ෂේත්‍රයක උපාධිධාරියෙකුට මෙම වැඩසටහන සඳහා අයදුම් කිරීමට හැකියාව ඇත. 2021 වර්ෂය සඳහා අදාළ පාඨමාලාවට බඳවා ගැනීමේ ප්‍රමාණය සිසුන් 100කි.

- **තොරතුරු ආරක්ෂණ විද්‍යාපති උපාධිය (MIS)**
  තොරතුරු ආරක්ෂණ ක්ෂේත්‍රය පිළිබඳ පශ්චාත් උපාධි සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන උපාධිධාරීන් සඳහා තොරතුරු ආරක්ෂණ විද්‍යාපති උපාධි පාඨමාලාව හඳුන්වාදී ඇත. තොරතුරු නාක්ෂණය, තොරතුරු පද්ධති විගණනය සහ තොරතුරු ආරක්ෂණය යන ක්ෂේත්‍රයන්හි වෘත්තීන්වල නියැලෙන පුද්ගලයන්ට මෙමඟින් අතරමැදි වෘත්තීය අවස්ථා අත්කර දෙනු ලැබේ. 2021 වර්ෂය සඳහා අදාළ පාඨමාලාවට බඳවා ගැනීමේ ප්‍රමාණය සිසුන් 30කි.

- **සයිබර් ආරක්ෂණ විද්‍යාපති උපාධිය**
  ජාල ආරක්ෂණය සහ සයිබර් අපරාධ විමර්ශනය යන විෂයයන්හි පුළුල් පරාසයක් ආවරණය කෙරෙන සයිබර් අරක්ෂණ විද්‍යාපති උපාධි පාඨමාලාව යනු 2018 වසරේ දී යුරෝපා කොමිසමේ Asi@Connect TEIN සහයෝගීතා මධ්‍යස්ථානය සමඟ එක්ව ආරම්භ කරන ලද දුරස්ථ ජාත්‍යන්තර විද්‍යාපති පාඨමාලාවකි. මෙම වැඩසටහන මාර්ගගතව (දුරස්ථ ඉගෙනීම හරහා) පරිපාලනය කරන අතර ප්‍රායෝගික සැසිවාර සහ සමාස පරීක්ෂණ සඳහා සිසුන් UCSC වෙත පැමිණිය යුතුය. පළමු කණ්ඩායම ඇෆ්ගනිස්ථානය, බංග්ලාදේශය, භූතානය, කාම්බෝජය, ලාඕසය, මියන්මාරය, නේපාලය සහ අනෙකුත් අග්නිදිග ආසියානු රටවල ජාතික පර්යේෂණ හා අධ්‍යාපන

ජාලයට (NREN) සම්බන්ධ විදේශීය සිසුන් 16 දෙනෙකුගෙන් සමන්විත වෙයි. වසංගත තත්ත්වය හේතුවෙන් සිසුන්ට ප්‍රායෝගික සැසි සහ සමාසික වාර පරීක්ෂණ සඳහා ශ්‍රී ලංකාවට පැමිණීමට නොහැකි විය. එබැවින් ප්‍රායෝගික සැසි සහ 3 වන / 4 වන සමාසික වාර පරීක්ෂණ මාර්ගගතව පවත්වන ලදී. පාඨමාලාවෙහි නව කණ්ඩායමක් ද 2021 දී ආරම්භ කර නොමැත.

- [ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විද්‍යාපති උපාධිය]
  UCSC විසින් ව්‍යාපාර විශ්ලේෂණ යන්න තේරුම් ගන්නේ, ව්‍යාපාර කාර්ය-සාධනය අවබෝධ කර ගැනීම සහ දත්ත මත පදනම්ව නව උපාය මාර්ග සංවර්ධනය කිරීම මූලික අරමුණ කර ගනිමින් කාලීන ව්‍යාපාරවල අවශ්‍යතා සමඟ දත්ත විද්‍යාව මුසු කෙරෙන, නැගී එන සහ අනාගතවාදී ක්ෂේත්‍රයක් ලෙස ය. ඒ අනුව, දත්ත විශ්ලේෂණයේ නැගී එන ප්‍රවණතා සපුරාලීම සඳහා ව්‍යාපාර විශ්ලේෂණ උපාධි පාඨමාලාව නිර්මාණය කර ඇත. 2021 වර්ෂයට පාඨමාලාව සඳහා බඳවා ගැනීමේ ප්‍රමාණය සිසුන් 50 කි.

පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති පාඨමාලාව හැර, සියලුම විද්‍යාපති පාඨමාලා වසර දෙකකින් එනම්, අධ්‍යයන සමාසික හතරකින් සමන්විත වේ. පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය වසර දෙක හමාරක් එනම්, අධ්‍යයන සමාසික පහකින් සමන්විත වේ. තොරතුරු ආරක්ෂණ පාඨමාලාවේ දේශන හැර අනෙකුත් දේශන පැවැත්වෙන්නේ සති අන්තයේ පමණි. බඳවා ගන්නා සිසුන් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවල පූර්ණ කාලීන සේවකයින් වුව ද, වැඩ ප්‍රමාණය සහ වැඩසටහන සඳහා ලැබෙන ක්‍රෙඩිට් ගණන අනුව, ඒවා පූර්ණ කාලීන වැඩසටහන්වලට සමාන වේ. පාඨමාලාව වාර්ෂිකව ආරම්භ වන බැවින්, වසරේ ඕනෑම කාලයක ශිෂ්‍ය කණ්ඩායම් දෙකක් සිටී. එක් ශිෂ්‍ය කණ්ඩායමක් පළමු වසරෙහි පාඨමාලා හදාරන අතර අනෙක් කණ්ඩායම දෙවන වසරෙහි අධ්‍යාපනය ලබයි.

රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසරේ බොහොමයක් වැඩසටහන් මාර්ගගත ක්‍රමයට බෙදා හැරිණි. පන්තිවල සජීවී සැසි zoom තාක්ෂණය හරහා පවත්වන ලද අතර එක් එක් සැසියේ වීඩියෝ පටිගත කිරීම් පශ්චාත් උපාධි අතථ්‍ය ඉගෙනුම් පරිසරය (pgvle.ucsc.cmb.ac.lk) හරහා ආචාර්යවරුන්ගේ යූ ටියුබ් නාලිකා හරහා සිසුන් සමඟ බෙදා ගන්නා ලදී.

2.2.1.2 බඳවාගැනීම

2020/2021 බඳවා ගැනීම් සඳහා තොරතුරු තාක්ෂණය, පරිගණක විද්‍යාව, තොරතුරු ආරක්ෂණය සහ ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ විද්‍යාපති පාඨමාලා 2021 සැප්තැම්බර් මාසයේ දී ආරම්භ කරන ලද නමුත් සිසුන් බඳවා ගැනීම 2020 දී ආරම්භ විය. බඳවා ගැනීමේ සමාරම්භය අතථ්‍ය උත්සවයක් ලෙස පැවැත්විණි. වසංගත තත්ත්වය හේතුවෙන් සියලු සමාසිකවල අධ්‍යයන කටයුතු මාර්ගගත ක්‍රමයට සිදු කරන ලදී. පාඨමාලා ආරම්භයේ දී ම වැඩසටහන් සඳහා වන අධ්‍යයන කාල සටහන නිවේදනය කරන ලද අතර සියලුම පාඨමාලා සඳහා (http://pgvle.ucsc.cmb.ac.lk) අතථ්‍ය ඉගෙනුම් පරිසරය හරහා මිශ්‍ර ඉගෙනුම් ක්‍රමවේදය ප්‍රවර්ධනය කෙරිණි. පන්තිවල සජීවී සැසි Zoom තාක්ෂණයෙන් පවත්වන ලද අතර සෑම සැසියකම වීඩියෝ පටිගත කිරීම් LMS හරහා කථිකාචාර්යවරුන්ගේ යූ ටියුබ් නාලිකා ඔස්සේ සිසුන් සමඟ බෙදා ගන්නා ලදී.

විද්‍යාපති උපාධි පාඨමාලාවේ ශිෂ්‍ය අත්පොත 2021 දී ප්‍රකාශයට පත් කරන ලද අතර එහි සබැඳි අනුවාදය UCSC වෙබ් අඩවියෙන් (http://www.ucsc.cmb.ac.lk/pg) ලබා ගත හැකිය.

Table 2.2.1.2. – A: පශ්චාත් උපාධි සඳහා බඳවා ගැනීම ***2021***

උපාධි වැඩසටහන	**2020/2021** බඳවාගැනීම	පළමු වසර සිසුන්		දෙවන වසර සිසුන්		එකතුව
		නව	නැවත ඉදිරිපත්වන	නව	නැවත ඉදිරිපත්වන	
පරිගණක විද්‍යා විද්‍යාපති	100	101	5	53	36	**195**
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති				14		**14**
තොරතුරු තාක්ෂණය පිළිබඳ විද්‍යාපති	100	102	1	71	42	**216**
තොරතුරු ආරක්ෂණය පිළිබඳ විද්‍යාපති	30	28	1	26	3	**58**
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	50	49		33	1	**83**
සයිබර් ආරක්ෂණ විද්‍යාපති				14		**14**
එකතුව	**280**	**280**	**7**	**211**	**82**	**580**

විද්‍යාපති උපාධි පාඨමාලාවේ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු, UCSC ආයතනය විසින් උත්පාදනය කරන ප්‍රධාන ආදායම් මාර්ගය වේ. එබැවින් නියමිත කාලයට පාඨමාලාව සංවිධානය කොට ගුණාත්මක සේවාවක් ලබා දීම සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සක්‍රීය සහභාගීත්වය සහ දායකත්වය ඉතා වැදගත් වේ. පෞද්ගලික ආයතන කිහිපයක් ද මීට සමාන විද්‍යාපති වැඩසටහනක් ආරම්භ කොට තිබේ. එම සංවිධාන සම්පත් දායකයින් සඳහා ඉහළ දේශන ගාස්තු පිරිනැමීම නිසා UCSC පශ්චාත් උපාධි පාඨමාලා සඳහා එය තර්ජනයක් වී තිබේ. එබැවින්, සම්පත් දායකයින් සඳහා වෙළඳපල මිල ගණන්, පර්යේෂණ හා සංවර්ධන සඳහා සහය, කාර්ය මණ්ඩල පුහුණුව, සුභසාධනය සහ ආයතනික සංවර්ධනය සලකා බැලීමෙන් වැඩසටහනට සහ UCSC ක්‍රියාකාරකම් සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ දායකත්වය ලබා ගැනීමට ඔවුන් උනන්දු කරවීම සඳහා වැඩසටහන් අයවැය සකස් කරන ලදී. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ වත්මන් නියාමයන් හා රෙගුලාසිවලට අනුව පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා සහභාගී වීම අධ්‍යයන කාර්ය මණ්ඩලයට අනිවාර්ය කටයුත්තක් නොවේ.

2.2.1.3 කාර්ය මණ්ඩල සහභාගිත්වය

Table 2.2.1.3. – A: විද්‍යාපති උපාධි වැඩසටහන සඳහා කාර්ය මණ්ඩලයේ සෘජු සහභාගිත්වය ***2021***

උපාධි වැඩසටහන	අධ්‍යයන දේශන			අධීක්ෂණ		පරිපාලන	අනධ්‍යන
	UCSC	ආරාධිත (දේශීය)	ආරාධිත (විදේශීය)	**UCSC**	ආරාධිත		
MCS	33	6		30	1	2 (Exams/ Postgraduate)	5
MIT		10					
MIS		6	1				
MBAnalytics		8					
MC	4	1					
එකතුව	**37**	**31**	**1**	**30**	**1**	**2**	**5**


2.2.1.4 විද්‍යාපති උපාධි ප්‍රදානෝත්සවය

රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසර සඳහා පශ්චාත් උපාධි උපාධි ප්‍රදානෝත්සවය නොපැවැත්විණි. 2021 වසර සඳහා උපාධි ප්‍රදානෝත්සවය 2022 දී පැවැත්වීමට ඉඩ තිබේ. නැවත පෙනීසිටි සිසුන්ගෙන් ඇතැමෙකු ද උපාධි ලබා ඇති අතර තවත් සමහර සිසුන් සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම අවශ්‍යතා සපුරා ඇත්නම් පශ්චාත් උපාධි ඩිප්ලෝමාව ඉල්ලා සිටියහ. විස්තර පහත දැක්වේ.

Table 2.2.1.4. – A: උපාධි ප්‍රදානෝත්සව දත්ත විශ්ලේෂණය ***2021***

පාඨමාලාව	**2018/ 2019** බඳවා ගැනීම	උපාධිධා ලබා ගත්						එකතුව
		2018/ 2019	**%**	**2017/ 2018**	**2016/ 2017**	**2015/ 2016**	පෙර	
පරිගණක විද්‍යා විද්‍යාපති	100	33	33	14	10	1		58
තොරතුරු නාක්ෂණය පිළිබඳ විද්‍යාපති	100	36	36	12	7			55
තොරතුරු ආරක්ෂණය පිළිබඳ විද්‍යාපති	30	22	73	1				23
ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ විද්‍යාපති	40	16	40					16
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති		2		1				3
පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		1		3	3	3	5	15
තොරතුරු නාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව					1	2		3
තොරතුරු ආරක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව		2		4		3	2	11

එකතුව	270	112		35	21	9	7	184



2021 වැඩසටහනේ දී ඔවුන් විසින් පෙන්වන ලද දක්ෂතා මත පදනම්ව විශේෂ සම්මාන ලබා ගැනීමට සුදුසුකම් ලැබූ පශ්චාත් උපාධි සිසුන්ගේ ලැයිස්තුව. වැඩි විස්තර පහත දැක්වේ.

සම්මානයේ/පදක්කමේ නම	සම්මාන ලාභියාගේ නම
පරිගණක විද්‍යාපති උපාධි පාඨමාලාවේ හොඳම ශිෂ්‍යයාට හිමි Kingslake සම්මානය – 2020	D.R.P.P. Hettiarachchi
පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාවේ හොඳම ශිෂ්‍යයාට හිමි සම්මානය – 2020	L.G.U.P. Gunawardhana
තොරතුරු තාක්ෂණ විද්‍යාපති උපාධි පාඨමාලාවේ හොඳම ශිෂ්‍යයාට හිමි JICA සම්මානය – 2020	M.K.A.M. Jayarathna
තොරතුරු ආරක්ෂණ විද්‍යාපති උපාධි පාඨමාලාවේ හොඳම ශිෂ්‍යයාට හිමි ආසිරියල් ද සොයිසා අනුස්මරණ සම්මානය - 2020	W.K.B.A.K. Fernando
මහාචාර්ය ජී.එන්. වික්‍රමනායක අනුස්මරණ සම්මානය - 2020	P.G. Sudasinghe

2.2.1.5 විද්‍යාපති උපාධි පාඨමාලා සංවර්ධනය

18	එරංග බණ්ඩාර, ෂුඑපිංග් ලියැංග්, පීටර් ෆොය්ටික්, සචින් ශෙට්ටි, ක්‍රිසී හෝල්, ඩැනියෙල් බවුඩන්, නලීන් රණසිංහ, කසුන් ද සොයිසා, *"A blockchain empowered and privacy preserving digital contact tracing platform",* Information Processing & Management, Volume 58, Issue 4, July 2021, 102572, DOI: https://www.sciencedirect.com/science/article/pii/S030645732100073X
19	එරංග බණ්ඩාර, ෂුඑපිංග් ලියැංග්, පීටර් ෆොය්ටික්, සචින් ශෙට්ටි, නලීන් රණසිංහ, කසුන් ද සොයිසා, *"Rahasak—Scalable blockchain architecture for enterprise*

	applications”, Journal of Systems Architecture, Volume 116, June 2021, 102061, DOI: https://www.sciencedirect.com/science/article/pii/S1383762121000503
20	එරංග බණ්ඩාර, දීපක් ටොෂ්, පීටර් ෆොය්ටික්, සචින් ශෙට්ටි, නලීන් රණසිංහ, කසුන් ද සොයිසා, *“Tikiri—Towards a lightweight blockchain for IoT”*, Future Generation Computer Systems, Volume 119, June 2021, Pages 154-165 DOI: https://www.sciencedirect.com/science/article/pii/S0167739X21000583
21	තේජා කේ. ආරච්චි, ලව්රියේන් සිට්බොන්, ජිංලන් ෂැන්ග්, රුවන් ගමගේ, ප්‍රියන්ත හේවාගමගේ, “*Enhancing internet search abilities for people with intellectual disabilities in Sri Lanka*”, ACM Transactions on Accessible Computing (TACCESS), Volume 14, Issue 2, July 2021, Article No.: 10, pp 1–36, DOI: https://doi.org/10.1145/3460202
22	රුක්මලී ගුණපාල සහ අතුල ගිනිගේ ජනගන් සිවඥානසුන්දරම්, ජීවනී ගුණතිලක, රිෆානා බුහාරි, තුෂාර ධර්මවර්ධන, රේණුකා වීරක්කොඩි, *“Digitally-Enabled Crop Disorder Management Process Based on Farmer Empowerment for Improved Outcomes: A Case Study from Sri Lanka”,* Sustainability, Volume-13, Issue-14, Publisher-MDPI, DOI: https://doi.org/10.3390/su13147823
23	ජීවනී ගුණතිලක, අචිනි හෙට්ටිආරච්චි, අනුෂා ඉන්දිකා වැලිසඳීර, *“A hybrid approach towards optimisation of data and knowledge management through cooperation of database and ontology*”, International Journal of Knowledge Management Studies, Volume-12, Issue-03, Publisher, Inderscience Enterprises Ltd, DOI: https://www.inderscienceonline.com/doi/abs/10.1504/IJKMS.2021.116406
24	ක්ෂිතිජ ලියනගේ, තරිඳු විජේතිලක, කසුන් ගුණවර්ධන, කෙනෙත් තිලකරත්න, ප්‍රිමාල් විජේසේකර, චමත් කැප්පෙටියාගම, *“User-Controlled Subflow Selection in MPTCP: A Case Study*”, International Journal on Advances in ICT for Emerging Regions (ICTer), Volume-14, Issue-2, DOI: https://icter.sljol.info/articles/10.4038/icter.v14i2.7225/galley/5586/download/
25	රංගන ජයශංක, ඉ හෙට්ටිආරච්චි, කේ.ජී. හේවාගමගේ, *“Technology Enhanced Learning Analytics Dashboard in Higher Education”* , Journal of Electronic Journal of e - Learning, ISSN / eISSN: 1479-4403, Publisher: ACAD CONFERENCES & PUBL INT LTD , CURTIS FARM, KIDMORE END, NR READING, ENGLAND, RG4 9AY, Vol No: 20, Issue No: 01, Web of Science Core Collection: Emerging Sources Citation Index https://academic-publishing.org/index.php/ejel
26	මදුරප්පෙරුම, ඩිලාන්, වැලිසඳීර, අනුෂා ඉන්දිකා, ගුණතිලක, ජීවනී, (2021), *" A Keyword Driven Hybrid Model for Web Application Testing"* , in Rajarata University Journal , Volume 6 , Issue 1 , p56 – 63 ISSN: 2362-0080

3.1.10.2 සම්මන්ත්‍රණ ප්‍රකාශන – 2021

01	රිෆත් ඈරා ෂැම්ස්, මොජ්ටාබා ෂහීම්, ගිලියන් ඔලිවර්, වකාර් හුසේන්, හර්ෂ පෙරේරා, ඇරිෆ් නුර්විද්‍යන්තෝරෝ, ජෝන් වයිට්ල්, *"Measuring Bangladeshi Female Farmers' Values for Agriculture Mobile Applications Development"*, Accepted to 54th Hawaii International Conference on System Sciences, January 2021, Maui, Hawai.
02	ජනුක ධර්මප්‍රිය, ළහිරු දයාරත්න, ටිකිරි දයාසේන, ශිරෝමි අරුණාතිලක, නිහාල් සහ ප්‍රිමාල් විජේසේකර, *Music Emotion Visualization through Colour"*, International Conference on Electronics, Information, and Communication, ICEIC 2021, (http://www.iceic.org), Jan. 31st(Sun) - Feb. 3rd(Wed), 2021 / Jeju Shinhwa World, Republic of Korea.
03	ටී.එම්.එච්.එස්.එම්. පූලියද්ද, ඒ.ඩී.එන්. කුරුකුලසූරිය, එස්.සී.පී. පීරිස්, ඊ හෙට්ටිආරච්චි, කේ පී හේවාගමගේ (2021), *Gamifying The Early Learning Capabilities of Students During Covid-19*, 15th Annual International Technology, Education and Development Conference (INTED2021), https://iated.org/inted/ , 08th - 09th March 2021, Valencia, Spain.
04	ආර් එස් අයි විල්සන්, එම් ඩී ජේ එස් ගුණතිලක, අතුල ගිනිගේ, ඩබ්ලිව් ඒ ඉන්දිකා, (2021). "*Analysis of Information Quality for a usable information system in agriculture domain a study in Sri Lankan Context*", 12th International Conference on Ambient Systems, Network and Technologies (ANT-2021), http://cs-conferences.acadiau.ca/ant-21, 23rd - 26th March 2021, Radisson Blu Sobieski Hotel, Poland.
05	කේ ටී පෙරේරා, ඒ අයි යූ ගමගේ, එම් එච් ජවාහිර්, ඩී එස් ආර් සඳරුවන්, ජී කේ ඒ ඩයස්, "*Augmented Reality Supported Self-Help Interventions For Psychological and Physiological Acute Stress*", Future Technologies Conference - 2021, https://saiconference.com/FTC, 28th October to 29th October 2021, Vancouver, Canada.
06	කසුන් කරුණානායක, ඇන්ටන් නිජොල්ට්, නිමේෂා රණසිංහ, මංජුශ්‍රී වික්‍රමසිංහ, එච් කේ ටී සී හල්ලොලුව, ධවාල් ව්‍යාස්, "*Multisensory Augmented Reality".* 18th IFIP TC. 13 International Conference on Human-Computer Interaction – INTERACT 2021, https://www.interact2021.org , 30th August 2021, Bari, Italy. (Karunanayaka K., Nijholt A., Halloluwa T., Ranasinghe N., Wickramasinghe M., Vyas D. (2021) "*Multisensory Augmented Reality".* In: Ardito C. et al. (eds) Human-Computer-Interaction – INTERACT 2021. INTERACT 2021. Lecture Notes in Computer Science, vol 12936. Springer, Cham. https://doi.org/10.1007/978-3-030-85607-6_77)
07	චමෝදි ජයමිණි, අසංගිකා සඳමිණි, තිසර පන්නල, ප්‍රභාෂ් කුමාරසිංහ, දුෂානි පෙරේරා, කසුන් කරුණානායක, "*The use of Augmented Reality to Deliver Enhanced User Experiences in Fashion Industry"*, Workshop on Multisensory Augmented Reality, INTERACT 2021, https://usehci.org/mar2021/ , 30th August 2021, Bari,Italy.
08	රංගන ජයශංක, කේ.පී. හේවාගමගේ, ඉනෝෂා හෙට්ටිආරච්චි, *Learning Analytics for Quality Assurance in Higher Education*, INQAAHE Conference 2021, https://events.qaa.ac.uk/qaaevents/frontend/reg/thome.csp?pageID=117591&ef_sel_menu=2008&eventID=339, 06th June - 10th June 2021, University of Glasgow,UK.
09	එස්. එන්. කේ. රාජකරුණා, රංගන ජයශංක, එච්. ඒ. එස්. ජී. ධර්මරත්න, "*Machine Learning Approach to Detect Tea Plant Diseases in Sri Lanka"*, International Conference in Data Science (ICDS2021), 29th June - 30th June 2021, Colombo, Sri Lanka.
10	වකාර් හුසේන්, හර්ෂ පෙරේරා, ජෝන් වයිට්ල්, Arif Nurwidyantoro, Rashina Hoda, Rifat Ara Shams, Gillian Oliver, *"Human Values in Software Engineering: Contrasting Case Studies of Practice"*, Accepted as Journal First to ACM Joint European Software Engineering Conference and Symposium on the Foundations of Software Engineering (ESEC/FSE), August 2021, Athens, Greece.
11	ඉෂික ගොඩගේ, දමිත සඳරුවන්, ඒ ආර් වීරසිංහ (2021), " *Sign Language Recognition for Sentence Level Continuous Signings*", 10th International Conference on Natural Language

	Processing (NLP 2021), https://cst2021.org/nlp/index , 23rd - 24th December 2021, Werrington Park Corporate Centre, Australia.
12	විජේන්ද්‍ර ඩී., හේවාගමගේ කේ., *"Software Complexity Reduction through the Process Automation in Software Development Life Cycle"*, Fourth IEEE International Conference on Electrical, Computer and Communication Technologies (ICECCT 2021) , September 2021, India http://icecct.com/#:~:text=After%20three%20successful%20editions%20at,Salem
13	ටී කේ ජයසේකර, ඒ ආර් වීරසිංහ, ඩබ්ලිව් වී වෙල්ගම, "*Aspect Oriented Suggestion Extraction from Online Reviews*", 20th IEEE International Conference on Machine Learning And Applications,https://www.icmla-conference.org/ic mla21, 13th - 16th December 2021, USA
14	ඉසුරි අනුරාධා නනෝම් ආරච්චිගේ, විහඟි හිමායා ජයසූරිය සහ රුවන් වීරසිංහ (2021). '*A Dataset for Research on Modelling Depression Severity in Online Forum Data*". In Proceedings of Recent Advances in Natural Language Processing (RANLP) 2021. Held online, September 1st to 3rd 2021. Bulgaria
15	උත්පලා සමරකෝන්, තුෂානි වීරසිංහ, "*Usability Heuristics for Early Primary Children: A Case Study in Sri Lanka*", International Conference on Computational Science and Computational Intelligence, http://www.american-cse.org/csci2021, 15th - 17th December 2021, USA
16	සී.ඩී.පද්මපෙරුම සහ ඒ.ආර්.වීරසිංහ (2021). "*A Decision Making Aid for Organizations during Epidemic Situations*". Proceedings of the International Conference on Advances in ICT for Emerging Regions, 2nd – 3rd December 2021, Online from Colombo, Sri Lanka.
17	දිනිති වික්‍රමසිංහ, රුෂිකා විජේසිංහ සහ රුවන් වීරසිංහ (2021). *"Human Gut Microbiome Data Analysis for Disease Likelihood Prediction Using Autoencoders*". Proceedings of the International Conference on Advances in ICT for Emerging Regions, 2nd – 3rd December 2021, Online from Colombo, Sri Lanka.
18	චතුරිකා එස් සිල්වා, ප්‍රසාද් විමලරත්න, *"Vision based Indoor Localization using Color Code, Identification*", IEEE International Conference on Electrical, Computer and Energy Technologies (ICECET), 9th-10th December 2021, Cape Town, South Africa
19	දනුෂ්ක, එස්.ඒ.එන්. සහ වීරසිංහ, ටී.ඒ. (2021). "*Theoretical and Instructional Strategy Framework of Blended Learning*". 5th International Conference on TVET in the Caribbean, http://www.caribbeantvet.com/, May 12th – 14th, 2021, Jamaica
20	දනුෂ්ක, එස්.ඒ.එන්. සහ වීරසිංහ, ටී.ඒ. (2021). "*Measuring Self-Regulation and Self-Direction in Flipped Classroom Learning*", (Accepted). 18th International Conference on Business Management, https://icbm.sjp.ac.lk/, 9th-10th December 2021, University of Sri Jayawardenapura, Nugegoda, Sri Lanka.
21	උපුල් අනුරාධ රත්නායක, නිළිණ හල්ලොලුව, ප්‍රදීපා බණ්ඩාර, මේධානි නරසිංහ, සහ ධවාල් දයාස්. 2021. "*Exploring Entrepreneurial Activities in Marginalized Widows: A Case from Rural Sri Lanka"*. Proceedings of the ACM on Human-Computer Interaction, Volume 5, Issue CSCW1, Article 142 (April 2021), 24 pages. DOI:https://doi.org/10.1145/344921
22	ජයදරන්, කේ., ඒකනායක, එච්.ඊ.එම්.එච්.බී., සහ සඳරුවන්, කේ.ඩී. (2021). *"Behavior Based Tracking for Human Following Robots'"*, Proceedings of the IEEE 16th International Conference on Industrial and Information Systems (ICIIS), 9-11 December, Peradeniya, Sri Lanka.
23	එම්. ක්‍රිෂ්නදාසන් (2021). "Movie Recommendation System Using Concurrent Hybrid Variational Autoencoders", 21st International Conference on Advances in ICT for Emerging Regions (ICTer), 1-4 December, University of Colombo School of Computing , Sri Lanka

24	බුද්ධි ගමගේ, රන්දිල් පුෂ්පානන්ද, තිළිණි නැදුන්ගොඩගේ, රුවන් වීරසිංහ, *"Improve Sinhala Speech Recognition Through e2e LF-MMI Model",* ICON 2021: 18th International Conference on Natural Language Processing, Place: National Institute of Technology, City: Silchar, Country: India, http://icon2021.nits.ac.in/index.html
25	ආකර්ෂනී අමරසිංහ, ලක්ෂ්මන් ජයරත්න සහ විරාජ් බී විජේසූරිය (2021): "*Drone Technology for Rice Agriculture at the Fertilizer Spraying Process"*, Proceedings of 10th IEEE International Conference on Information & Automation for Sustainability (ICATC 2021), Sri Lanka.
26	ආකර්ෂනී අමරසිංහ, විරාජ් බී විජේසූරිය සහ ලක්ෂ්මන් ජයරත්න (2021): "*A Path Planning Drone Solution to Safe Pesticide Usage in Arable Lands"*, Proceedings of IEEE International Conference on Advanced Research in Computing (ICARC 2022), Sri Lanka.
27	ඩිල්කි එන්. ෆෙල්සිංගර්, තිළිණ හල්ලොලුව, ඉෂාන් ෆොන්සේකා, කසුන් කරුණානායක, (2021), "*Towards a Framework for Online Exam Proctoring in Resource-Constrained Settings Focusing on Preserving Academic Integrity*", The 21st International Conference on Advances in ICT for Emerging Regions (ICTer2021), Sri Lanka https://www.icter.org/conference/
28	කේ ෂී හේවාගමගේ, (2021), "*Digital Transformation of Future Library Services; A New Role of Academic Libraries in Higher Education System"*, Library Research Symposium 2021, University of Colombo, 9th December 2021.
29	මීපගනිතගේ, ඒ. බී., ෆර්නැන්ඩො, එම්ජීඑන්ඒඅස්, *"Investigating the Chest Imaging Features of Covid-19 Patients using Deep Neural Networks"*, International Conference in Data Science 2021 (ICDS2021), ISBN 978-624-5873-02-9, https://science.cmb.ac.lk/icds2021/wp-content/uploads/2021/07/ICDS2021_Proceedings-_Web.pdf , 29th - 30th June 2021.
30	රාජේන්තිරම්, කේ., ෆර්නැන්ඩො, එම්ජීඑන්ඒඅස්, *"Shopping Assistant: A Fashion Suggesting Intelligent System using Natural Language Processing (NLP): An Aspect Based Opinion Mining Approach"*, Research Abstracts — Colombo SIGCHI Research Showcase, 26th, June 2021.
31	උදේනි ජයසිංහ, ඒ.එස්. අතුකෝරල, "*Application of Edutainment Concepts and Tracking Emotions Based on Transient Emotion Peak in Online Education Systems*", Proceedings of the Annual Research Symposium 2021 University of Colombo, ISSN 2815-0481, November 2021.
32	එම්.ජී. ගුණසේකර, ඒ.එස්. අතුකෝරල, *"Role of Facebook as a tool for Information Dissemination during the COVID-19 outbreak in Sri Lanka"*, Proceedings of the Annual Research Symposium 2021 University of Colombo, ISSN 2815-0481, November 2021
33	ජේ.ඒ.වී.එම්.කේ. ජයකොඩි, අජන්ත එස්. අතුකෝරල, *"Evaluating the Usability of Sri Lankan University Websites"*, in 5th International Research Conference of Uva Wellassa University (IRCUWU), p118, Badulla, Sri Lanka , 978-624-5856-04-6, July 2021.
34	එල්.ඩී.ජී.එස්. සේනාරත්න, ටී. නැදුන්ගොඩගේ, ඒ.එච්. මාගල්ල, *"Improving Bank-Customer Efficiency through Automatic Speech Recognition"*, Proceedings of the International Conference in Data Science 2021 (ICDS2021), ISBN 978-624-5873-02-9, June 2021.
35	වයි. විමුක්ති, එන්. කොඩිකාර, එල්. නානායක්කාර, "*A Deep Learning Based Approach for the Classification of Diabetic Retinopathy in Human Retina*", 10th IEEE International Conference on Information & Automation for Sustainability (ICIAfS 2021), ISBN 978-1-6654-4428-6, 11th to 13th August 2021. Sri Lanka
36	යොහානි එස්. රණසිංහ, අනුජා ධර්මරත්න, වී මී චින්, *" The State of the Art in Affect State Identification"*, Graduate Research Symposium, Monash University, Malaysia. September, 2021

4. මානව සම්පත් - අධ්‍යයන සහ අනධ්‍යයන

4.මානව සම්පත් - අධ්‍යයන සහ අනධ්‍යයන

සංවිධානයක මානව සම්පත් යනු එහි සංවර්ධනය සඳහා ප්‍රධාන පදනම මෙන්ම වැදගත්ම සම්පතයි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව (DMS) ආයතනයේ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩල වැඩ ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් සැබෑ මානව සම්පත් අවශ්‍යතා හඳුනා ගැනීම සඳහා 2015 දී ශූන්‍ය සේවක සංඛ්‍යා සමාලෝචනය සිදු කරන ලදී. එබැවින්, වර්තමාන සේවක සංඛ්‍යා සඳහා වන අනුමැතිය 2017 සංශෝධිත සේවක සංඛ්‍යා අත්පොත මත පදනම් වේ. ඉල්ලා සිටිනු ලැබුවත්, 2021 වසරේ ලැබුණු අධ්‍යයන සේවක සංඛ්‍යාව 8 දෙනෙකු හැර 2017 න් පසු UCSC ආයතනයට නව සේවක සංඛ්‍යා අනුමත කිරීම් ලැබී නැත.

4.1 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය

2015 දී, සත්‍ය සේවක සංඛ්‍යා සමාලෝචනය සිදු කරන විට, උපාධි පාඨමාලා දෙකම සඳහා UCSCහි බඳවා ගැනීමේ ප්‍රමාණය සිසුන් 260ක් විය. 2020 දී, උපාධි පාඨමාලා දෙකම සඳහා බඳවා ගන්නා සිසුන් ප්‍රමාණය 300ක් විය. මේ අතර UGC මඟින් 2021 දී UCSC සඳහා බඳවා ගන්නා සිසුන් 357 දක්වා වැඩි කර ඇති අතර අමතර අධ්‍යයන කාර්ය මණ්ඩල 8ක් වෙන් කර ඇත.

විශාලතම ගැටලුව වන්නේ කාර්ය මණ්ඩලයේ පවතින තනතුරු සඳහා උචිත, සුදුසුකම් ලත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම වන අතර UCSCහි අධ්‍යයන සේවක තනතුරුවල සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පවතී. පරිගණක කර්මාන්තයේ ඇති ඉල්ලුම සහ පෞද්ගලික අංශයේ ඉහළ වැටුප් මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ. අධ්‍යයන වැඩසටහන් සාර්ථක ලෙස කළමනාකරණය කිරීම සඳහා සුදුසුකම්වලට වඩා කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ හැකියාව ඉතා වැදගත් වේ. 2020 දී, UCSC ජ්‍යෙෂ්ඨ සහ කනිෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීම සඳහා දැන්වීමක් පළ කරන ලද අතර සුදුසුකම් සහ ඔවුන්ගේ පළපුරුද්ද මත පදනම්ව කාර්ය මණ්ඩල සාමාජිකයන් 17 දෙනෙකු බඳවා ගැනුණි. ඒ අතරම, අධ්‍යයන නිවාඩු සඳහා අයදුම් කිරීමේ දී බැඳුම්කර/ගිවිසුම අත්සන් කිරීමට ඇති අකමැත්ත නිසා පරිවාසික මට්ටමේ කාර්ය මණ්ඩල සාමාජිකයින් කිහිපදෙනෙක්ම උසස් අධ්‍යයන කටයුතු සඳහා ඔවුන් පිටත්වන වර්ෂයේ දී ඉල්ලා අස්විය. නව කාර්ය මණ්ඩල සාමාජිකයන් බඳවා ගනු ලැබුව ද, සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයක් නොමැති වීමේ ගැටළුව තවමත් ඉතිරි වී තිබේ.

*වගුව **4.1.** අ: කොළඹ විශ්වවිද්‍යලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩල සාරාංශය*

තනතුර අධ්‍යයනාංශය / අංශය / ඒකකය / මධ්‍යස්ථානය	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සේවයේ නියුතු සේවක සංඛ්‍යාව	
		ස්ථිර	කොන්ත්‍රාත් / තාවකාලික / පැවරුම් *
(1) අධ්‍යක්ෂක කාර්යාලය	5	5	
(2) ආයතන අංශය	8	5	2
(3) සාමාන්‍ය පරිපාලන අංශය	11	5	3
(4) අධ්‍යයන හා ප්‍රකාශන අංශය (උපාධි අපේක්ෂක)	15	7	1
(5) තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය	58	24	29
(6) පරිගණක හා බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය	43	17	
(7) සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය	53	16	
(8) මූල්‍ය අංශය	14	12	2
(9) විභාග අංශය	11	9	3
(10) උසස් ඩිජිටල් මාධ්‍ය හා තාක්ෂණ මධ්‍යස්ථානය(**ADMTC)**	7	2	
(11) ඩිජිටල් වෝහාර තාක්ෂණ මධ්‍යස්ථානය (**CDF)**	4	3	1
(12) පුස්තකාලය	6	3	
(13) පශ්චාත් උපාධි අධ්‍යයනාංශය	3	3	1
(14) ඉංජිනේරු සහ නඩත්තු අංශය	11	7	1
(15) පරිගණක ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය (**NOC)**	15	6	3
(16) බාහිර උපාධි මධ්‍යස්ථානය (**EDC)**	12	9	3
(17) වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (**PDC)**	2	1	1
(18) පරිගණක සේවා මධ්‍යස්ථානය (**CSC)**	2	1	1
(19) තත්වාරක්ෂණ මණ්ඩලය **(QAC)**		1	
එකතුව	280	136	51

*වගුව **4.1.** ආ: වැටුප් පරිමාණයට සාපේක්ෂව සේවක තනතුරු ව්‍යාප්තිය - **2021** දෙසැම්බර් **31***

කාර්ය මණ්ඩල කාණ්ඩය	සේවා කාණ්ඩය	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
1. ප්‍රාථමික මට්ටම				
ප්‍රාථමික ශ්‍රේණිය - නුපුහුණු	U- PL 1	16	15	1
ප්‍රාථමික ශ්‍රේණිය - අර්ධ පුහුණු	U- PL 2	3	2	1
ප්‍රාථමික ශ්‍රේණිය - පුහුණු	U- PL 3	5	5	0
2. ද්විතීයික මට්ටම				
කළමණාකරණ සහකාර - තාක්ෂකණික නොවන	U- MN 1	53	37	8

කාර්ය මණ්ඩල සහායක/ ඉහළ සහ ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සහායක	U- MN 4		8	
කළමණාකරණ සහකාර - තාක්ෂණික	U- MT 1/U-MN4	10	4	6
3. තෘතීයික මට්ටම				
තාවකාලික නිබන්ධක / ප්‍රදර්ශක / උපදේශක / සහකාර කථිකාචාර්ය / පර්යේෂණ සහායක / කථිකාචාර්ය	Fixed	53	29	24
අධ්‍යයන සහායක – 2 ඛණ්ඩය	U-AS 1	14	14	0
කනිෂ්ඨ විධායක / කළමණාකාරවරු	U-EX 1	7	6	1
අධ්‍යයන සහායක – 1 ඛණ්ඩය	U-AS 2	5	4	1
4. ජ්‍යෙෂ්ඨ මට්ටම				
මධ්‍යම මට්ටමේ විධායකවරු	U-EX 2	10	5	3
මධ්‍යම මට්ටමේ විධායකවරු	U- EX 2(a)		2	
කථිකාචාර්යවරු	U AC 3	99	58	41
සහාය මහාචාර්යවරු	U- AC 4			
මහාචාර්යවරු / ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරු	U- AC 5			

2021 දී, තාවකාලික උපදේශකවරුන්, තාවකාලික සහකාර කථිකාචාර්යවරුන් සහ කොන්ත්‍රාත් පදනම මත ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් සහ පරිවාසික කථිකාචාර්යවරුන් පත්කිරීම හරහා අධ්‍යයන සේවක සංඛ්‍යාවේ ඇතැම් පුරප්පාඩු සම්පූර්ණ කරන ලදී. 4.1.අ වගුවට අනුව ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයින් 183ක් සේවය කළ අතර සේවක සංඛ්‍යා ලේඛනයට අනුව පුරප්පාඩු 82ක් පවතී.

කාර්ය මණ්ඩලය	ස්ථිර			තාවකාලික/කොන්ත්‍රාත් /පැවරුම්		
	පිරිමි	ගැහැනු	එකතුව	පිරිමි	ගැහැනු	එකතුව
ජ්‍යෙෂ්ඨ මහාචාර්ය						
මහාචාර්ය	5		5			
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	19	8	27			
කථිකාචාර්ය	1	1	02			
පරිවාසික කථිකාචාර්ය	12	11	23			
සහකාර පුස්තකාලාධිපති		1	1			
තාවකාලික කථිකාචාර්ය / සහකාර කථිකාචාර්ය				3	8	11
තාවකාලික උපදේශක				4	14	18
එකතුව	32	14	46	13	29	42

4.2 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන කාර්ය මණ්ඩලයේ සමස්ත පැතිකඩ

අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් පරිගණක විද්‍යාවට අදාළව ලබා ඇති ඉහළම සුදුසුකම්

කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව	දර්ශනශූරී උපාධි	දර්ශනපති උපාධි	විද්‍යාපති උපාධි	විද්‍යාවේදී (ගෞරව)උපාධි
58	29	6	4	19

පරිපාලන හා මූල්‍ය කාර්ය මණ්ඩලයේ ඉහළම අධ්‍යයන සුදුසුකම්

කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව	දර්ශනශූරී උපාධි	දර්ශනපති උපාධි	විද්‍යාපති උපාධි/ව්‍යාපාර පරිපාලන ශාස්ත්‍රපති උපාධිය	ශාස්ත්‍රවේදී උපාධිය	ඩිප්ලෝමා
12		1	3	7	1

2021 දී අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් දෙදෙනෙක් විදේශීය විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධි හැදෑරීම සඳහා අධ්‍යයන නිවාඩු ලබා ගත්හ. එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක් සප්තවාර්ෂික නිවාඩු ලබා ගත්තේය.

4.3 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ කාර්ය මණ්ඩලය හඳුනාගැනීම

2021 දී, විශ්වවිද්‍යාල පද්ධතියේ වසර 25ක් වැඩි හෝ ඊට වැඩි සේවා කාලයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලය ඇගයීම සඳහා සංවිධානය කරන ලද දීර්ඝ කාලීන සේවා සම්මාන ප්‍රදාන උළෙලේ සම්මානලාභීන් ලෙස පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයින් නම් කෙරිණි.

කාර්ය මණ්ඩල සමාජිකයා	තනතුර	පළමු පත්වීම ලබාගත් දිනය	වසර **25**ක් හෝ ඊට වැඩි කාලයක් සම්පූර්ණ කළ දිනය	**2020.12.31** දිනට විශ්වවිද්‍යාල පද්ධතිය තුළ සම්පූර්ණ කරන ලද සමස්ත සේවා කාලය
මහාචාර්ය ජී. ඩී. එස්. පී. විමලරත්න	මහාචාර්ය	09.05.1996	08.05.2021	වසර **25**

ආචාර්ය එම්. ඩී. ජෙ. එස්. ගුණතිලක මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (**1** ශ්‍රේණිය)	15.05.1996	14.05.2021	වසර **25**
ආචාර්ය එස්. එම්. කේ. ඩී. අරුණතිලක මෙය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය)	15.05.1996	14.05.2021	වසර **25**
ආචාර්ය එච්. ඒ. කල්දේරා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (**1** ශ්‍රේණිය)	02.12.1991	01.12.2021	වසර **30**
ආචාර්ය ඩී. එන්. රණසිංහ	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (**1** ශ්‍රේණිය)	08.09.1986	07.09.2021	වසර **35**
කේ. පී. සී. රත්නලතා මෙය	සහකාර කාර්ය මණ්ඩල කළමණාකාර	01.02.1996	01.02.2021	වසර **25**
එස්. එෆ්. ඉමාම් මිය	සහකාර ලේඛකාධිකාරී	05.02.1991	04.02.2021	වසර **30**

4.4 කාර්ය මණ්ඩල සංවර්ධනය හා පුහුණුව

කාර්ය මණ්ඩල සංවර්ධනය සහ පුහුණුව සංවිධානයේ මානව සම්පත් සංවර්ධනයේ වැදගත් ප්‍රතිපත්තියක් ලෙස සැලකේ. කාර්ය මණ්ඩල ශ්‍රේණිය සහ රැකියා අවශ්‍යතා මත පදනම්ව, ආදායම් උත්පාදන අරමුදල් මෙන්ම රජයේ ප්‍රදාන යන දෙකම භාවිත කරමින් අදාළ කාර්ය මණ්ඩලයට සහය විය. කෙසේ වෙතත්, රටේ වත්මන් වසංගත තත්ත්වය හේතුවෙන් වසරේ අග භාගයේ දී පුහුණු වැඩසටහන්වලට භෞතිකව සහභාගී වීමට කාර්ය මණ්ඩලය යොමු නොකරන ලද නමුත් අන්තර්ජාලය හරහා සහභාගී වීමට ඔවුන් දිරිමත් කරන ලදී. **2019** දී කළමනාකරණ මණ්ඩලය විසින් කාර්ය මණ්ඩලයේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා කාර්ය මණ්ඩල සංවර්ධනය සහ පුහුණුව පිළිබඳ නව ප්‍රතිපත්තියක් අනුමත කරන ලදී.

1. කාර්ය මණ්ඩල සාමාජිකයාගේ ජ්‍යෙෂ්ඨත්වය මත පදනම්ව තීරණය කරන ලද සීමාවකට යටත්ව ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු සහ අනෙකුත් සම්මන්ත්‍රණ සඳහා සහභාගී වීමට පර්යේෂණ සහ සංවර්ධන ප්‍රතිපාදන මඟින් ස්ථිර අධ්‍යයන කටයුතු සඳහා සහය විය. එවැනි කටයුතු සඳහා සහභාගී වූ සියල්ලන්ගේ විස්තර මෙම වාර්තාවේ පර්යේෂණ අංශයේ දක්වා ඇත
2. රැකියා අවශ්‍යතා මත පදනම්ව, **2021** දී කාර්ය මණ්ඩලයට දේශීය සංවිධානවල විශේෂ පුහුණුවක් ලබා දෙන ලදී. **2021** වර්ෂය තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් **12** දෙනෙකුට එම අවස්ථාව ලබා දී ඇති අතර එම පුහුණු අවශ්‍යතා සඳහා රු.**588,000/-** ක් වැය කරන ලදී.
3. **2021** වර්ෂයේ දී සමූහ මාර්ගගත පුහුණුවක් ලෙස මාර්ගගත පුහුණු වැඩසටහන් පවත්වන ලදී.
4. ස්ථිර නොවන අධ්‍යයන කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ පර්යේෂණ සහ සංවර්ධන දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා අන්තර්ජාලය හරහා පවත්වන ලද **ICTer**2021 සහ **NICT**2021 සම්මන්ත්‍රණවලට සහභාගී වීමට අවස්ථාව සැලසීය.
5. රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් පිටත දී සිදු කිරීමට නියමිතව තිබූ පුහුණු වැඩසටහනක් අවලංගු කරන ලදී.

පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූ **UCSC** කාර්ය මණ්ඩලයේ විස්තර පහත පරිදි වේ.

Sn	වැඩසටහන	සහභාගී වූ කාර්ය මණ්ඩල අයත් කාණ්ඩය	සහභාගීවූවන් සංඛ්‍යාව	වියදම් කළ මුදල (රුපියල්)
01	මූල්‍ය නොවන කළමනාකරුවන් සඳහා මූල්‍ය පිළිබඳ වැඩමුළුව - PWC Academy (Pvt)Ltd විසින් 2021 ජුනි 8, 9 සහ 11 යන දිනවල පවත්වන ලදී	විධායක කාර්ය මණ්ඩලය	2	20,000.00
02	ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂණ ආයතනය විසින් පවත්වනු ලබන MEP ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ වැඩමුළුව.	තාක්ෂණික කාර්ය මණ්ඩලය	1	20,000.00
03	ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන් විසින් පවත්වනු ලබන සයිබර් ආරක්ෂණ මූලධර්ම පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	විධායක - මූල්‍ය	1	9,000.00
04	"ඉංග්‍රීසි භාෂා වැඩසටහනේ ඉහළ සහතිකය" NIBM.	ලිපිකරු	1	41,000.00
05	"මූල්‍ය කටයුතු පිළිබඳ ව්‍යාපාර පරිපාලන පශ්චාත් උපාධිය, කොළඹ විශ්වවිද්‍යාලය".	විධායක - මූල්‍ය	1	450,000.00
06	සම්මන්ත්‍රණ ගාස්තුව - ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ "මූල්‍ය ආකෘතිකරණය සහ පුරෝකථනය පිළිබඳ එක්සෙල් පාඨමාලාව" පිළිබඳ සම්මන්ත්‍රණය. (2021 අප්‍රේල් 6 දින සිට දින 10ක සම්මන්ත්‍රණය	විධායක - මූල්‍ය	2	15,000.00
07	ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන "විදුලි කාර්මිකයන් / කාර්මික ශිල්පීන් / කාර්මික නිලධාරීන් සහ ක්ෂේත්‍රයට උනන්දුවක් දක්වන අය සඳහා ගොඩනැගිලි විදුලි සැලසුම් කිරීම, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ වැඩමුළුව	තාක්ෂණික	1	16,000.00
08	ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ 42 වැනි ජාතික සමුළුව සඳහා සම්මන්ත්‍රණ ගාස්තු	විධායක - මූල්‍ය	2	17,000.00
එකතුව				588,000.00

4.4.1 වෛද්‍ය පහසුකම් යෝජනා ක්‍රමය

අප ආයතනයේ කාර්ය මණ්ඩලයේ සෞඛ්‍ය හා ආරක්ෂාව ආයතනික ප්‍රතිපත්තියේ කොටසක් ලෙස සලකා වෛද්‍ය ආධාර ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම වෛද්‍ය ආධාරක යෝජනා ක්‍රමයේ දී, වෛද්‍ය වියදම් දැරීම සඳහා විවිධ සීමාවන් ඇති යෝජනා ක්‍රම තුනක් හඳුන්වා දී ඇති අතර ඉන් එකකට දායක වීමට කාර්ය මණ්ඩලයට අවස්ථාව ලබා දී ඇත. වෛද්‍ය කඳවුරු පැවැත්වීමෙන් සහ වෛද්‍ය වියදම් සඳහා අර්ධ වශයෙන් ආධාර කිරීමෙන් ඔවුන්ගේ සෞඛ්‍ය තත්ත්වය මනාව පවත්වා ගැනීමට කාර්ය මණ්ඩලයට සහය වීම මෙහි අරමුණ වේ. සේවා ස්ථානයේ ඵලදායිතාව ඉහළ නැංවීමටත්, විශේෂයෙන් වැඩ කරන වේලාවන්හි දී සංවිධානයට අමතර ආදායමක් උපයා ගැනීමට පූර්ණ සහයෝගය ලබා දීමටත් මෙමඟින් සිය සේවකයන් පොළඹවනු ඇතැයි කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනාංශය විසින් අපේක්ෂා කෙරේ. තම ජීවිතයේ ඛේදනීය තත්ත්වයන්ට මුහුණ දීමේ දී, විශේෂයෙන්ම අනපේක්ෂිත අසාධ්‍ය රෝගාබාධවල දී අග්‍රාහාර රක්ෂණ යෝජනා ක්‍රමය ලබා ගැනීමට උනන්දුවක් දක්වන සේවකයින්ට UCSC ආයතනය අර්ධ වශයෙන් සහය ලබා දී ඇත.

4.4.2 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සුභසාධක සංගමය

අප ආයතනයෙහි සුභසාධක සංගමය, සේවක ප්‍රවර්ගය සහ ශ්‍රේණිය නොසලකා සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා ස්වේච්ඡා සේවයක් ලෙස ක්‍රියාත්මක කරනු ලබයි. UCSCහි අවම වශයෙන් වසරක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියලුම කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා සුභසාධක සංගමයේ සාමාජිකත්වය විවෘත වන අතර සාමාජිකයෙකු වීම සඳහා ඔවුන් සාමාජික ගාස්තුවක් ගෙවිය යුතුය. UCSCහි සියලුම සාමාජිකයින් අතර සුහදතාව, සහයෝගීතාව සහ එකමුතුකම පෝෂණය කිරීමෙහි ලා සුබසාධන සංගමය කටයුතු කරයි.

කොවිඩ්-19 වසංගතය පැතිරීමත් සමඟ සාමූහික කටයුතු නැවැත්වීම හේතුවෙන් සුභසාධන ප්‍රජාවේ සාමූහික ක්‍රියාකාරකම් බොහොමයක් අත්හිටුවන ලදී.

සුභසාධක සංගමය මඟින් සපයනු ලබන පහත සඳහන් සමාජ සේවා තවදුරටත් ක්‍රියාත්මක විය.

1. 2021 ජනවාරි 1 වන දින 2021 නව වසර උදාව සැමරීම.
2. 2021 දෙසැම්බර් 17 වන දින "තෑගි වවුචර් බෙදාදීම" සංවිධානය කරන ලදී.
3. විශ්‍රාමික සහ ස්ථාන මාරුවීම් ලද කාර්ය මණ්ඩල සාමාජිකයින් ඇඟයීම සඳහා සුබසාධන උත්සව සංවිධානය කරන ලදී.
4. තම පවුලේ සමීපතමයන් අභාවප්‍රාප්ත වූ කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා මූල්‍ය ආධාර ලබා දෙන ලදී.

5. ආයතනික සංවර්ධනය

5.ආයතනික සංවර්ධනය

5.1 තත්ත්වාරක්ෂණය සහ පිළිගැනීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ලබා දී ඇති මාර්ගෝපදේශයන්ට අනුව, කොළඹ විශ්වවිද්‍යාලය විසින් විශ්වවිද්‍යාලයේ සියලුම පීඨවල සහ ආයතනවල තත්ත්වාරක්ෂණය සම්බන්ධීකරණය කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස අභ්‍යන්තර තත්ත්වාරක්ෂණ ඒකකය (IQAU) පිහිටුවන ලදී. අප තත්ත්වාරක්ෂණ කමිටුව 2015 ජූනි මාසයේ දී නිල වශයෙන් සිය කටයුතු ආරම්භ කරන ලදී. එහි අරමුණ වන්නේ ආයතනයේ සියලුම අධ්‍යයන සහ අනෙකුත් ක්‍රියාකාරකම්වල ගුණාත්මකභාවය අඛණ්ඩව වැඩිදියුණු කිරීමට යත්න දරන සංස්කෘතියක් ආයතනය තුළ නිර්මාණය කිරීමයි.

තත්ත්වාරක්ෂණ කමිටුවේ සමාජිකයන් - **2021**

i. අධ්‍යක්ෂ - මහාචාර්ය කේ.පී. හේවාගමගේ, අධ්‍යක්ෂ/UCSC
ii. සභාපති/ආයතන QA කමිටු ප්‍රධානී - ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එන්.ඩී. කොඩිකාර,/ සී. ආර්. විජේසිංහ මිය/ සම්බන්ධීකාරක/QAC
iii. ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/QAC - ජේ.ඒ.එම්.එස්. විජේරත්න මිය, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරි/ PRP
iv. විෂයමාලා හා අධ්‍යයන සංවර්ධන කමිටුවේ සභාපති - ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය, ප්‍රධානී/ තොරතුරු හා පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE), ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (Iශ්‍රේණිය)
v. අධ්‍යයනාංශ ප්‍රධානීන්
    - ආචාර්ය ඩී.ඒ.එස්. අතුකෝරල - පරිගණක හා බුද්ධිමය පද්ධති අධ්‍යයනාංශය (CIS)
    - මහාචාර්ය ජී.ඩී.එස්.පී. විමලරත්න - සන්නිවේදන හා මාධ්‍ය තාක්ෂණ අධ්‍යයනාංශය (CMT)
    - ආචාර්ය එම්.ඩී.ජේ.එස්. ගුණතිලක මිය - තොරතුරු පද්ධති ඉංජිනේරු අධ්‍යයනාංශය (ISE)
vi. **උපාධි / පශ්චාත් උපාධි / බාහිර උපාධි පාඨමාලා සම්බන්ධීකාරකවරු**
    - ආචාර්ය එම්. ජී. එන්. ඒ. එස්. ප්‍රනාන්දු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1 ශ්‍රේණිය) සම්බන්ධීකාරක / පරිගණක විද්‍යා (CS) උපාධි පාඨමාලාව
    - ආචාර්ය එච්. ඊ. එම්. එච්. බී. ඒකනායක, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය), සම්බන්ධීකාරක / තොරතුරු පද්ධති (IS) උපාධි පාඨමාලාව
    - ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / මෘදුකාංග ඉංජිනේරු (SE) උපාධි පාඨමාලාව
    - එම්.ඩබ්ලිව්.ඒ.සී.ආර්. විජේසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / CS - විද්‍යා පීඨය
    - ආචාර්ය ටී.එන්.කේ. ද සොයිසා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (1 ශ්‍රේණිය) සම්බන්ධීකාරක / සයිබර් ආරක්ෂණ විද්‍යාපති (MC) උපාධි පාඨමාලාව
    - ඩබ්ලිව්.වී. වෙල්ගම මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) තොරතුරු තාක්ෂණ විද්‍යාපති (MIT) උපාධි පාඨමාලාව

- කේ.පී.එම්.කේ. සිල්වා මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / පරිගණක විද්‍යාව පිළිබඳ විද්‍යාපති (MCS) උපාධි පාඨමාලාව සහ පරිගණක පද්ධති පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
- ආචාර්ය පී.වී.කේ.ජී. ගුණවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / තොරතුරු සුරක්ෂිතතා (MIS) විද්‍යාපති උපාධි පාඨමාලාව
- ආචාර්ය එම්.අයි.ඊ. වික්‍රමසිංහ, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / ව්‍යාපාර විශ්ලේෂණ විද්‍යාපති (MBAnalytics) පාඨමාලාව
- ආචාර්ය කේ.එච්.ඊ.එල්.ඩබ්ලිව්. හෙට්ටිආරච්චි මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) අධ්‍යයන සම්බන්ධීකාරක / තොරතුරු තාක්ෂණවේදී බාහිර උපාධි පාඨමාලාව

vii. **මධ්‍යස්ථාන සම්බන්ධීකාරකවරුන් (විද්‍යුත්-ඉගෙනුම් හා වෘත්තීය සංවර්ධනය)**
   - ආචාර්ය ටී.ඒ. වීරසිංහ මිය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) සම්බන්ධීකාරක / විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය (eLC)
   - ආචාර්ය එල්.එන්.ඒ. ද සිල්වා මිය, කථිකාචාර්ය, සම්බන්ධීකාරක / වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානය (PDC)

viii. ආචාර්ය එස්.එම්.කේ.ඩී. අරුණතිලක මිය, ආයතනික සමාලෝචන 2021 සඳහා UCSCහි නියෝජිත

ix. අධ්‍යයනායතනයේ නියෝජ්‍ය ලේඛකාධිකාරීවරු/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරු, උපාධි පාඨමාලා සහ විභාග නියෝජනය කරන

x. ආර්.එම්.යූ.ඒ.රත්නායක මහතා, නියෝජිත/UCSC ආදි ශිෂ්‍ය සංගමය

xi. පද්ධති සංවර්ධක - ආර්.ජේ. අමරවීර මහතා, කථිකාචාර්ය (පරිවාස) / එස්.බී. වික්‍රමනිලක මහතා, තාවකාලික සහය කථිකාචාර්ය

xii. කළමනාකරණ සහකාර - එන්.එස්. ගජසිංහ මිය

2021 වර්ෂයේ දී තත්ත්වාරක්ෂණ කමිටුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්:

1. 2020 වැඩසටහන් සමාලෝචනය සඳහා අවශ්‍ය සාක්ෂි එකතු කර QAC කාර්යාලයේ ගබඩා කරන ලදී.
2. 2021 ජූනි 1 වන දින සිට QACහි නව සම්බන්ධීකාරක ලෙස UCSCහි ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එම්. ඩබ්ලිව්. සී. ඒ. ආර්. විජේසිංහ මහත්මිය පත්කරන ලදී.
3. ආයතනික සමාලෝචනය 2021 සඳහා සාක්ෂි එකතු කිරීම ආරම්භ කරන ලදී.
4. තොරතුරු තාක්ෂණ උපාධි පාඨමාලාවේ (බාහිර) විෂයමාලා සංශෝධනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන ලදී.
5. උපාධි අපේක්ෂක වැඩසටහනේ විෂයමාලා සංශෝධනයේ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන ලදී.
6. UCSCහි ට්‍රෙසර් අධ්‍යයනය සකස් කිරීම අධීක්ෂණය කරන ලදී.
7. UCSCහි විභාග අත්පොත සකස් කිරීම අධීක්ෂණය කරන ලදී.
8. 2021 සේවා නියුක්තතා සමීක්ෂණය අධීක්ෂණය කරන ලදී.
9. UCSCහි ගෞරව කේතය සකස් කිරීම අධීක්ෂණය කරන ලදී.
10. මිශ්‍ර ඉගෙනීම සඳහා පාඨමාලා සැලසුම් කිරීම සහ සංවර්ධනය පිළිබඳ යෝජිත රාමුවට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම

11. පශ්චාත් උපාධි පාඨමාලාවල යෝජිත වැඩසටහන් අත්පොත සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩලයේ ප්‍රතිපෝෂණ එකතු කර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) සමඟ බෙදා ගැනීම
12. ශිෂ්‍ය ක්‍රියාකාරකම් පර්යේෂණ කිරීම සහ UCSC පරිපාලනය කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක පෙළගැස්වීම පිළිබඳ විස්තර රැස් කිරීමට සූදානම් කරන ලදී.
13. 2021 පෙබරවාරි මාසයේ පැවති උපාධි අපේක්ෂක පාඨමාලාවල 2 අධ්‍යයන වාරයේ විභාග සඳහා සකස් කළ සෞඛ්‍ය මාර්ගෝපදේශය පරීක්ෂා කර නිර්දේශ කරන ලදී.
14. උපාධි පාඨමාලාවල පළමු අධ්‍යයන වාරයේ එකතු කරන ලද ප්‍රතිපෝෂණ ආකෘතිවල සාරාංශ වාර්තා යවන ලදී.
15. 2021 අගෝස්තු/ඔක්තෝබර් මාසවල පවත්වන ලද මාස්ටර් ඔන්ලයින් විභාග සඳහා ප්‍රතිපෝෂණ පෝරමයක් සකස් කිරීම අධීක්ෂණය කරන ලදී
16. UCSCහි මැසිවිලි කමිටුවට අදාළ ක්‍රියාකාරකම් අධීක්ෂණය කරන ලද අතර සිසුන්ට/ කාර්ය මණ්ඩලයට ඔවුන්ගේ දුක්ගැනවිලි QAC හරහා කමිටුවට ඉදිරිපත් කිරීමට ඉඩ ලබා දෙමින් කමිටුවේ TOR යාවත්කාලීන කිරීමට කටයුතු කරන ලදී.
17. උපාධි අපේක්ෂකයන්ගේ VLEහි පැවරුම් ඉදිරිපත් කිරීමේ දින දර්ශනය සකස් කිරීම අධීක්ෂණය කරන ලදී.
18. 18. UCSC හි විභාග කටයුතුවලට අදාළ රහස්‍ය තොරතුරු අනවසරයෙන් හෙළිදරව් කිරීම වැළැක්වීම සඳහා NDA කෙටුම්පත් කිරීමේ සූදානම අධීක්ෂණය කරන ලදී.
19. 2018/2019 කණ්ඩායමේ අධ්‍යක්ෂ ලැයිස්තුව සහ පීඨ සම්මාන සඳහා සිසුන් තෝරා ගන්නා ලදී.
20. 2016/2017 සහ 2017/2018 කාණ්ඩායම්වල අධ්‍යක්ෂ ලැයිස්තුව සහ පීඨ සම්මාන සඳහා සිසුන් තෝරා ගැනීම ආරම්භ කරන ලදී.
21. සාහිත්‍ය චෞර්යය හඳුනාගැනීමේ මෙවලම 'Turnitin' භාවිතය අධීක්ෂණය කරන ලදී.
22. CQA, UoCහි උපායමාර්ගික සැලැස්ම සැලසුම් කිරීම සඳහා සහභාගී විය
23. අධ්‍යක්ෂ/ CQA හරහා UGC එකඟතාවය සඳහා මාස්ටර් ඔෆ් සයිබර් ආරක්ෂණ වැඩසටහන, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ සයිබර් ආරක්ෂණ වැඩසටහන් පිළිබඳ සහතිකය අවසන් කරන ලද ආකෘති පත්‍ර ඉදිරිපත් කරන ලදී.
24. 24. අධ්‍යක්ෂ/ CQA හරහා UGC එකඟතාව සඳහා මාස්ටර් ඔෆ් බිස්නස් විශ්ලේෂණ වැඩසටහන, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/ ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ සහතිකය පිළිබඳ අවසන් ආකෘති පත්‍ර ඉදිරිපත් කරන ලදී.
25. ගූගල් පෝරම භාවිතයෙන් සයිබර් ආරක්ෂණ විද්‍යාපති පාඨමාලාවේ (2021) 3 වන සහ 4 වන අධ්‍යයන වාරවලට අදාළව ප්‍රතිපෝෂණ පෝරම එකතු කරන ලදී.
26. ගූගල් පෝරම භාවිතයෙන් MCS/MIT/MIS/MBA වැඩසටහන්වල (2021) 2 වන සහ 4 වන අධ්‍යයන වාරවලට අදාළව ප්‍රතිපෝෂණ පෝරම එකතු කරන ලදී.
27. ගූගල් පෝරම භාවිතයෙන් CS සහ IS උපාධි අපේක්ෂක උපාධි වැඩසටහන්වල (2021) 01 වන සහ 2 වන අධ්‍යයන වාරවලට අදාළව ප්‍රතිපෝෂණ පෝරම එකතු කරන ලදී.

28. ගූගල් පෝරම භාවිතයෙන් 2018/2019 කාණ්ඩයේ MCS/MIT/MIS/MBA වැඩසටහන්වල තනි පුද්ගල ව්‍යාපෘති සහ සමස්ත වැඩසටහන පිළිබඳ ප්‍රතිපෝෂණ පෝරම එකතු කරන ලදී.
29. MCS/MIT/MIS/MBA වැඩසටහන්වල 1 වන / 3 වන (2020) සහ 2 වන / 4 වන (2021) අධ්‍යයන වාරවල සහ සයිබර් ආරක්ෂණ විද්‍යාපති පාඨමාලාවේ 3 වන අධ්‍යයන වාරවලට අදාළව ශිෂ්‍ය ප්‍රතිපෝෂණ සාරාංශ වාර්තා සකස් කිරීම

5.2 යටිතල පහසුකම් සංවර්ධනය

5.2.1 ප්‍රධාන ව්‍යාපෘති – 2021


2021 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් ආරම්භ කරන ලද සහ නිම කරන ලද ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත.

ව්‍යාපෘතියේ නම	ව්‍යාපෘති පිරිවැය (රුපියල්)	ආරම්භක දිනය	නිම කිරීමට නියමිත වූ දිනය	සම්පූර්ණ කරන ලද දිනය	සටහන්
UCSCහි පර්යේෂණ මහල ප්‍රදේශය (බටහිර පැත්ත / 4 වන මහල) ප්‍රතිසංස්කරණය කිරීම. ප්‍රසම්පාදන අංකය: UCSC/PROC/W/2019/002	6,069,649.75	23/10/2019	01/04/2020	02/03/2020	අර්ධ වශයෙන් නිම කර ඇත
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ පර්යේෂණ ඉඩකඩ සඳහා ගෘහ භාණ්ඩ සහ අනෙකුත් උපාංග නිෂ්පාදනය, සැපයීම, භාරදීම සහ ස්ථාපනය කිරීම (UCSC/NCB/G/PRP/2020/001)	3,477,683.04	08.12.2020 සති 16	30.03.2021	30.11.2021	නිම කර ඇත
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (UCSC/ W/NCB/ENG/2021/01) [පස්වන මහල] උතුර, නැගෙනහිර සහ බටහිර කොටස්වල වහල ප්‍රදේශය සඳහා යෝජිත ප්‍රතිසංස්කරණය කිරීම.	12,951,210.81	05.07.2021	05.01.2022		දැනට ක්‍රියාත්මක වෙමින් පවතී
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ පරිගණක විද්‍යාගාරයේ [බිම් මහල] සඳහා යෝජිත [විශේෂ වර්ගයේ චංචල භාණ්ඩ කොටස් කිරීම සහ සිවිලිමේ වැඩ] පුළුල් කිරීම සහ යථා තත්වයට පත්කිරීම - II අදියර (UCSC/W/NCB ENG/2021/02)	2,998,949.65	05.07.2021 දින 120	05.11.2021		දැනට ක්‍රියාත්මක වෙමින් පවතී

කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය සඳහා යෝජිත ගැලරිය සහ ලොබි අභ්‍යන්තර කටයුතු: කෞතුකාගාර අදියර II (UCSC/W/NCB/ENG/2021/07)	3,624,414.00	23/07/2021 දින 45	06.09.2021	30.11.2021	නිම කර ඇත
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ [බිම් මහල] සඳහා ගෘහ භාණ්ඩ නිෂ්පාදනය, සැපයීම, භාරදීම සහ සවි කිරීම - III අදියර (UCSC/G/NCB/ENG/2021/006)	5,335,600.00	20/07/2021 සති 12	18.10.2021	30.11.2021	නිම කර ඇත
ආයතන අංශය (SE-302 කාමරය) සඳහා යෝජිත ඇලුමිනියම් චංචල නොවන ගබඩා කබඩ් (UCSC/W/NSP-2/ADM/2021/16)	435,000.00	26/04/2021 දින 30	22.05.2021	12.07.2021	නිම කර ඇත
UCSCහි යෝජිත ප්‍රධාන යතුරු රැඳවුම් මැදිරිය (UCSC/W/NSP-1/ENG/2021/18)	225,000.00	දින 30			දැනට ක්‍රියාත්මක වෙමින් පවති
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ (UCSC/W/NSP-2/ENG/2021/17) සේවා කොටසේ ගිනි නිවාරණ මාර්ගය (පඩිපෙළ) සඳහා යෝජිත අභ්‍යන්තර වර්ණ ගැන්වීම	274,377.00	20.02.2021 දින 30	19.03.2021	27.02.2021	නිම කර ඇත
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ පරිගණක කෞතුකාගාරයෙහි ප්‍රදර්ශන භාණ්ඩ දෙකක් ආවරණය වන පරිදි ටෙම්පර්ඩ් වීදුරු ස්ථාපනය කිරීම (UCSC/G/NSP-1/ENG/2021/0041)	249,300.00	2021.10.23 දින 21	2021.10.24	2021.11.10	නිම කර ඇත
UCSCහි නැගෙනහිර කොටසේ පළමු මහල සඳහා යෝජිත අලුත්වැඩියා කිරීම සහ යථා තත්ත්වයට පත්කිරීම (UCSC/W/NCB/ENG/2021/011)	59,260,576.05	06.01.2022 දින 150	05.06.2022		දැනට ක්‍රියාත්මක වෙමින් පවති
කොළඹ විශ්ව විද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ ප්‍රධාන ශ්‍රවණාගාරයේ පිටත බිත්තිවල ජල ආරක්ෂණ යෙදීම (UCSC /W/NCB/ENG/2021/08)	2,869,380.08	10.01.2022 දින 45	09.12.2021		දැනට ක්‍රියාත්මක වෙමින් පවති







UCSC පරිගණක කෞතුකාගාරය විවෘත කිරීම







පර්යේෂණ මහල විවෘත කිරීම

5.3 ආයතනික පිළිගැනීම වැඩිදියුණු කිරීම

මූලාරම්භයේ සිටම, අප ආයතනය විසින් රාජ්‍ය හා පෞද්ගලික ආයතන සඳහා උපදේශන සේවා සපයනු ලැබීය. මෙම උපදේශන වැඩසටහන් හරහා, අනෙකුත් රජයේ සහ රාජ්‍ය නොවන ආයතනවලට සේවාවක් සැපයීමට අපේක්ෂා කරන අතරම, ශ්‍රී ලංකාවේ පරිගණක අධ්‍යයන කටයුතු සඳහා උසස් අධ්‍යාපන ආයතනයක් වීමට අමතරව අපගේ හැකියාවන් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම ද අපේක්ෂා කෙරේ. ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2021 වර්ෂයේ දී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි පහත සඳහන් කාර්ය මණ්ඩල සාමාජිකයෝ සිය දායකත්වය සැපයූහ.

5.3.1 කාර්ය මණ්ඩල සාමාජිකයන් සඳහා විශිෂ්ට සම්මාන ප්‍රදානය

සංවිධායක	සම්මානයේ නම	සම්මානය ලැබූවන්
රීඩිං විශ්වවිද්‍යාලය, එක්සත් රාජධානිය	2021හි **IEEE BSN** හොඳම පෝස්ටරය සඳහා සම්මානය	කේ.පී.යූ. ජයසිංහ මිය

5.3.2 කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ දායකත්වය

නම	සංවිධානය
අතුකෝරල ඩී.ඒ.එස්. (ආචාර්ය)	• බාහිර කථිකාචාර්ය - කළමනාකරණ සහ මූල්‍ය පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය • තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික - ▪ ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP පද්ධතිය) සැපයීම, ස්ථාපනය කිරීම, පුහුණු කිරීම සහ පවත්වාගෙන යාම: කොළඹ විශ්වවිද්‍යාලය සඳහා මානව සම්පත් කළමනාකරණ මෘදුකාංග පද්ධතිය ▪ ශ්‍රී ලංකා ACT නියෝජිතායතනයේ සම-ස්ථාන සේවා සැපයීම සඳහා සේවා සපයන්නෙකුගේ ප්‍රසම්පාදනය ▪ ශ්‍රී ලංකා ACT නියෝජිතායතනයේ ලංකා රජයේ Cloud 2හි 2 වැනි කලාපය සඳහා බෙයා-මෙටල් සර්වර් සහ යෙදුම් තොගය සැපයීම, ස්ථාපනය කිරීම, වින්‍යාස කිරීම සහ කොමිස් කිරීම ▪ UDA තුළ සංවර්ධන අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා එක් නැවතුම් ඒකකයක් සඳහා මාර්ගගත යෙදුම් පද්ධතිය

	සැලසුම් කිරීම, සැපයීම, ස්ථාපනය කිරීම, කොමිස් කිරීම සහ නඩත්තු කිරීම ▪ ශ්‍රී ලංකා ACT නියෝජිතායතනය මගින් රාජ්‍ය ආයතන සඳහා ඩිජිටල් ආකෘති පත්‍ර සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සහාය දීම ▪ ශ්‍රී ලංකා රේගු ප්‍රවේශ ජාල යටිතල පහසුකම් සහ ආරක්ෂාව වැඩිදියුණු කිරීම සඳහා ප්‍රසම්පාදනය • උපදේශක • උපදේශක කමිටු රැස්වීම - ශ්‍රී ලංකා ACT නියෝජිතායතනය මගින් පරිවර්තන වැඩසටහන හෝ තොරතුරු තාක්ෂණ නොවන උපාධිධාරීන් • අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රතීතනය සහ තත්ත්ව සහතිකය (SCAQA) පිළිබඳ ස්ථාවර කමිටුවේ සාමාජික • NSBMහි විද්‍යාවේදී උපාධි යෝජනා සඳහා SCAQA විසින් පත් කරන ලද තාක්ෂණික උපදේශක කමිටුවේ සාමාජික • තේරීම් කමිටු සාමාජික - පද්ධති ඉංජිනේරු තනතුර II ශ්‍රේණිය - ජාල මෙහෙයුම් මධ්‍යස්ථානය - කොළඹ විශ්වවිද්‍යාලය • තේරීම් කමිටු සාමාජික - පරිගණක තාක්ෂණ II ශ්‍රේණියේ උපදේශක තනතුර - පරිගණක ඒකකය - කලා පීඨය සහ පීඨාධිපති කාර්යාලය - අධ්‍යාපන පීඨය • UCSCහි IEEE පරිගණක සංගමයේ ශිෂ්‍ය ශාඛාව විසින් සංවිධානය කරන ලද Intellihack 2.0හි විනිශ්චය මණ්ඩලයේ සාමාජික • IEEE IEEEXtreme 15.0 ක්‍රමලේඛන තරඟයේ විනිශ්චයකරු • බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් ජාතික ලේඛනාගාරයේ විශ්වාසනීය ඩිජිටල් ගබඩාවක් පිහිටුවීම සඳහා වූ මෙහෙයුම් කමිටුවේ සාමාජික • ශ්‍රී ලංකාවේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) වෘත්තිකයන් නියෝජනය කරන ඉහළම ආයතන වන ශ්‍රී ලංකා පරිගණක සංගමයේ (CSSL) උප සභාපති • CSSL නියෝජනය කරමින් තොරතුරු සැකසීම සඳහා වූ ජාත්‍යන්තර සම්මේලනයේ (IFIP) මහා සභා රැස්වීමේ දී ශ්‍රී ලංකාව නියෝජනය කිරීම • CSSL නියෝජනය කරමින් UGCහි පරිගණකකරණය පිළිබඳ ස්ථාවර කමිටුව සහ තාක්ෂණය පිළිබඳ ස්ථාවර කමිටුව නියෝජනය

ද සිල්වා එල්.එන්.සී. (ආචාර්ය)(මිය)	• තාක්ෂණික ඇගයීම් කමිටුවේ සාමාජික - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව • උපදේශක - ගොවි නැණ ව්‍යාපෘතිය, රුහුණු විශ්වවිද්‍යාලය • විමර්ශක - • රුහුණු විශ්වවිද්‍යාලයේ ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව (RISTCON) 2021 • පරිගණකකරණය පිළිබඳ උසස් පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2022: ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය • 2021 පරිගණකකරණයේ දියුණුව පිළිබඳ 3 වැනි ජාත්‍යන්තර සමුළුව: SLIIT • ව්‍යාපාර සහ තොරතුරු පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය 2021: කැලණිය විශ්වවිද්‍යාලය • CSSL පර්යේෂණ පරිසංවාදය 2021 • ICT/BPM අංශයේ EDB උපදේශක කමිටුවේ සාමාජික • කොළඹ විශ්ව විද්‍යාලයේ ස්ත්‍රී-පුරුෂ සමානාත්මතා මධ්‍යස්ථානයේ (CGE) මෙහෙයුම් කමිටු සාමාජික
හල්ලොළුව ටී. (ආචාර්ය)	• TEC සාමාජික - ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය • TEC සාමාජික - සීමාසහිත ලංකා නැව් සංස්ථාව. • මෘදුකාංග සංවර්ධන උපදේශක- ඖෂධ නිෂ්පාදන, සැපයුම් සහ නියාමන රාජ්‍ය අමාත්‍යාංශය • මෘදුකාංග සංවර්ධන උපදේශක: සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය • මෘදුකාංග සංවර්ධන උපදේශක - ශ්‍රී ලංකා රේගුව • මෘදුකාංග සංවර්ධන උපදේශක-වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනය • උපාධි පාඨමාලා සමාලෝචන මණ්ඩලයේ සභාපති - අධ්‍යාපන අමාත්‍යාංශය • ICT විෂයමාලා සංවර්ධන උපදේශනය - ජාතික අධ්‍යාපන ආයතනය • විෂයමාලා සංවර්ධන උපදේශනය - තොරතුරු තාක්ෂණ පීඨය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය.
හේවාගමගේ කේ.පී. (මහාචාර්ය)	• විද්‍යුත් ඉගෙනුම් සහ ශිෂ්‍ය තොරතුරු පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා උපදේශක සහ අනුශාසක - කෘෂිකර්ම පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය • අධ්‍යක්ෂක- LEARN - කොවිවි. නියෝජනය කරයි • ස්ථාවර කමිටු සාමාජික, UGC -පරිගණක ස්ථාවර කමිටුව -තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ මාර්ගගත අධ්‍යාපන සංවර්ධනය

	- ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සහ පරීක්ෂා කිරීම • උසස් අධ්‍යාපනය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ සාමාජික • නව මුල පිරීම් සඳහා සංවර්ධන කණ්ඩායමේ සාමාජික - ශ්‍රී ලංකා අතථ්‍ය විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකා පරිගණක විශ්ව විද්‍යාලය • මූලසුන, මිශ්‍ර ඉගෙනුම් කමිටුව, කොෝ.වී.වී. • සභා සාමාජික - සෙනෙට් නියෝජිත, කොළඹ විශ්වවිද්‍යාලය • IBMBB, NILISහි අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
හෙට්ටිආරච්චි කේ.එච්.ඊ.එල්.ඩබ්ලිව්. (ආචාර්ය) (මිය)	• 2021 ජනවාරි 19 වන දින කොළඹ විශ්ව විද්‍යාලයේ මිශ්‍ර ඉගෙනුම් කණ්ඩායම විසින් කොළඹ විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා සංවිධානය කරන ලද "H5P භාවිතයෙන් අන්තර්ක්‍රියාකාරී ඉගෙනුම් අන්තර්ගතයන් නිර්මාණය කිරීම" යන මාතෘකාව යටතේ මිශ්‍ර ඉගෙනීම පිළිබඳ මාර්ගගත පුහුණුව සඳහා සම්පත් දායකයා • විභාග ප්‍රශ්නපත්‍රය ප්‍රමිත කිරීම සහ දෙවන පරීක්ෂක - ICT4D උපාධි පාඨමාලාව, ICT2112: ඉදිරිපත් කිරීමේ කුසලතා සහ වීඩියෝ සංස්කරණය - පරිගණක ඒකකය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය • විභාග ප්‍රශ්නපත්‍රය ප්‍රමිත කිරීම සහ දෙවන පරීක්ෂක - ICT4D උපාධි පාඨමාලාව, ICT2216: දත්ත ගබඩා කළමනාකරණය - පරිගණක ඒකකය, කලා පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය • බහුමාධ්‍ය සහ වෙබ් තාක්ෂණ උපාධි පාඨමාලාවේ B.Tech (ගෞරව)හි විෂයමාලා සංවර්ධන මණ්ඩලයේ සාමාජික - තොරතුරු තාක්ෂණ පීඨය - වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය • පර්යේෂණ පත්‍රිකා විමර්ශන කමිටුව - CSSL පර්යේෂණ පරිසංවාදය (CSSLRC) 2021, ශ්‍රී ලංකා පරිගණක සංගමය - 2021 ඔක්තෝබර් 12 - 13
කැප්පිටියාගම සී. අයි. (ආචාර්ය)	• බාහිර විමර්ශක - තොරතුරු තාක්ෂණ විද්‍යාවේදී උපාධි පාඨමාලාව, පරිගණක පීඨය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය. • උපදේශක - සංවර්ධන ලොතරැයි මණ්ඩලය • විනිශ්චය මණ්ඩල සාමාජික - NBQSA • සම්පත් දායක - ගුරුවරුන් සඳහා උසස් පෙළ වැඩමුළුව, කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සංවිධානය කරන ලදී - කොළඹ • MSc විභාග පරීක්ෂක - මොරටුව විශ්වවිද්‍යාලය

	• මූලාසනය, ආචාර්ය උපාධි ප්‍රගති සමාලෝචන මණ්ඩලය - මොරටුව විශ්වවිද්‍යාලය • පර්යේෂණ පත්‍රිකා විමර්ශක - * ICTer 2021- UCSC විසින් සංවිධානය කරන ලදී * iPURSE 2021 - පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන ලදී • විභාග ප්‍රශ්න පත්‍ර ප්‍රමිතකරු - රුහුණු විශ්වවිද්‍යාලය
මාතරආරච්චි එස්.එස්.පී. (ආචාර්ය)	• බාහිර කථිකාචාර්ය: පරිගණක පීඨය, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය • තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජික - කම්කරු දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සංවර්ධනය - කම්කරු දෙපාර්තමේන්තුව • සාකච්ඡා කමිටුවේ සාමාජික, 55 වැනි DB වාර්ෂික රැස්වීමේ වෘත්තීය කොන්ග්‍රස් සංවිධායක (PCO) තෝරා ගැනීම සහ රැකියාව - මුදල් අමාත්‍යාංශය • තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් කමිටු සාමාජික - 55 වැනි ආසියානු සංවර්ධන බැංකුවේ වාර්ෂික රැස්වීම- මුදල් අමාත්‍යාංශය • සම්බන්ධීකාරක සහ විනිශ්චය සාමාජික- තරුණ පරිගණක විද්‍යාඥ (YCS 2021), FITIS සහ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලදී • ආසියා - පැසිෆික් ICT Alliance සම්මාන (APICTA) විනිශ්චය මණ්ඩලයේ සාමාජික 20201- මැලේසියාව • විනිශ්චය සාමාජික, නිර්මාණශීලී ගුරු තරගය - අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මෙහෙයවනු ලබන සහ සංවිධානය කරන ලද ආරාධිත කථිකාචාර්ය - ශ්‍රී පාලී මණ්ඩපය • විභාග ප්‍රශ්නපත්‍රය ප්‍රමිත කිරීම සහ දෙවන පරීක්ෂක - ICT2113 - ඊ-වාණිජ්‍යය, කලා පීඨය • විභාග ප්‍රශ්නපත්‍රය ප්‍රමිත කිරීම සහ දෙවන පරීක්ෂක -ICT2112-ඉදිරිපත් කිරීමේ කුසලතාව සහ වීඩියෝ සංස්කරණය, කලා පීඨය

	• උපදේශක-විද්‍යුත් ඡන්ද ක්‍රමය සංවර්ධනය කිරීම - ශ්‍රී ලංකා ජාතික විද්‍යා ඇකඩමිය • උපදේශක සෞඛ්‍ය තොරතුරු පිළිබඳ කෙටුම්පත් රැකියා විස්තරය සඳහා වන තාක්ෂණික සාකච්ඡාව - සෞඛ්‍ය අමාත්‍යාංශය • උපදේශක - විශ්වවිද්‍යාල ඉංග්‍රීසි භාෂා පරීක්ෂණය (UTEL) සඳහා වෙබ් අඩවියක්/වෙබ් අයදුම්පතක් සංවර්ධනය කිරීම
සෙනෙවිරත්න ජී. පී.	• බාහිර ප්‍රසම්පාදන උපදේශක - මහජන බැංකුව • අධ්‍යයන කමිටුවේ සාමාජික - NILIS • බාහිර කථිකාචාර්ය - විද්‍යා පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
නිලකරත්න කේ.එම්.	• බාහිර කථිකාචාර්ය - කැලණිය විශ්වවිද්‍යාලය • උපදේශක - සංවර්ධන ලොතරැයි මණ්ඩලය • උපදේශක - නීතිපති දෙපාර්තමේන්තුව • විමර්ශක - ICTer සම්මන්ත්‍රණය
වීරසිංහ ටී.ඒ.(මිය) (ආචාර්ය)	• නියෝජ්‍ය අධ්‍යක්ෂ-පුහුණු, සයිබර් කැම්පස්, කොළඹ විශ්වවිද්‍යාලය • සම්බන්ධ වීමේ කේන්ද්‍රස්ථානය- ස්මාර්ට් පන්තිකාමර ව්‍යාපෘතිය, ප්‍රධාන පුස්තකාලය, කොළඹ විශ්වවිද්‍යාලය • ප්‍රධාන කණ්ඩායමේ සාමාජික සහ ආයතන මට්ටමේ සම්බන්ධීකාරක, මිශ්‍ර ඉගෙනුම් කමිටුව, කොළඹ විශ්වවිද්‍යාලය • සාමාජික- තොරතුරු තාක්ෂණ කමිටුව, කොළඹ විශ්වවිද්‍යාලය
වීරසිංහ ඒ.ආර්. (ආචාර්ය)	• බාහිර කථිකාචාර්ය - o ජෛව තොරතුරු පිළිබඳ විද්‍යාපති උපාධිය, IBMBB, කොළඹ විශ්වවිද්‍යාලය o බහු දත්ත විශ්ලේෂණය පිළිබඳ විද්‍යාපති, Informatics Institute of Technology • 3 වන SLASSCOM AI ආසියා සමුළුව 2021 දී "ශ්‍රී ලංකාවේ AI හැකියාවන් ගොඩනැගීම" පිළිබඳ මණ්ඩලයේ උපපරිපාලක • මණ්ඩල සාමාජික - ▪ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (FITIS) විසින් සංවිධානය කරන ලද 2021 ශ්‍රී ලංකා අන්තර්ජාල දිනය වන "ඩිජිටල් ඇතුළත් කිරීම" හි දී "ශ්‍රී ලංකාවේ අන්තර්ජාලයේ පරිණාමය" ▪ තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය (FITIS) විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා අන්තර්ජාල දින "ඩිජිටල් ඇතුළත් කිරීම" 2021හි "භාෂා බාධක බිඳ

	දැමීමෙන් අන්තර්ජාල භාවිතය වැඩිදියුණු කිරීම" ▪ ICIIS 2021 සමුළුවේ දී "වඩා හොඳ අවබෝධයක් සඳහා ගැඹුරු ඉගෙනීම: යන්ත්‍ර පරිවර්තන සඳහා ගැඹුරු ඉගෙනීම උත්තේජනය කිරීම" පිළිබඳ පූර්ව සම්මන්ත්‍රණ වැඩමුළුව ▪ LIRNEasia සංවාද සංසදය වැරදි තොරතුරුවලට මුහුණ දීම ▪ ප්‍රධාන දේශනය "ඉගෙනීමේ විශ්ලේෂණ: ඉගෙන ගන්නන් ජනනය කරන ලද පාඨමය අන්තර්ගතයෙන් අපට උකහා ගත හැක්කේ කුමක්ද?" 2021 ජූනි 1 සිට 3 දක්වා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සහ ඔන්ලයින් ක්‍රමයට පැවති ආසියානු විවෘත විශ්ව විද්‍යාල සංගමයේ (AAOU 2021) 34 වැනි වාර්ෂික සමුළුවේ දී. • පුද්ගලික අංශයේ හවුල්කරුවෙකු වන GeneLabs සමඟ තරුණයින්ගේ පරිණත ආරම්භක දියවැඩියාව (MODY) හඳුනා ගැනීම සඳහා, මීළඟ පරම්පරාවේ අනුපිළිවෙල (NGS) පදනම් කරගත් පරීක්ෂණයක් සංවර්ධනය කිරීමට ශ්‍රී ලංකා ජාතික පර්යේෂණ කවුන්සිලය විසින් පිරිනමන NRC රාජ්‍ය පෞද්ගලික හවුල්කාරිත්ව ප්‍රදානයක ප්‍රධාන විමර්ශකයා
ද සොයිසා ටී.එන්.කේ. (ආචාර්ය)	• උපදේශක - සංවර්ධන ලොතරැයි මණ්ඩලය • උපදේශක - සම්පත් බැංකුව පිළිල්සී • බාහිර කථිකාචාර්ය - රුහුණු විශ්වවිද්‍යාලය

5.4 තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDG) සඳහා UCSC දායකත්වය – 2021

5.4.1 තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDG)

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් මානවයාගේ ජීවන තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ලෝකයේ ආර්ථික සංවර්ධනය සමඟ හරිත පරිසරයක් සහතික කිරීම සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDG) 17 හඳුනාගෙන ඇත. UNDPහි තිරසාර සංවර්ධන අභිමතාර්ථ 17ට අනුකූලව, ශ්‍රී ලංකා රජය ශ්‍රී ලංකා ආර්ථිකය, සමාජය සහ පරිසරය නඟා සිටුවීම සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ ක්‍රියාත්මක කර ඇත. UCSC කළමනාකාරිත්වය 2021-2025 උපායමාර්ගික සැලැස්ම සහ 2021 ක්‍රියාකාරී සැලැස්ම කෙරෙහි අවධානය යොමු කරමින් SDG සඳහා වන දායකත්වය පිළිබඳව සාකච්ඡා කළේය.

5.4.2 2021 වසර සඳහා තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SGD) වෙත UCSC දායකත්වය

පළමු අභිමතාර්ථය : දුප්පත්කම තුරන් කිරීම

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
01	සෑම තැනකම සෑම ආකාරය කින්ම පවතින දරිද්‍රතාවය පිටුදකිමු	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය අඩු ආදායම්ලාභී පවුල්වල උපාධි අපේක්ෂකයන් පිළිගන්නා අතර මේ රටේ දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණ ඇතිව නිදහස් අධ්‍යාපන ක්‍රමයට දායකත්වය සපයයි. රජයේ අරමුදල් සහ උපයන ආදායම යන දෙකම UCSCහි උපාධි අපේක්ෂක අධ්‍යාපනය වැඩිදියුණු කිරීම සඳහා යොදා ගැනේ. අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන් මෙම පාඨමාලා හදාරන අතර කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් නේවාසිකාගාර පහසුකම් සැපයීම ඇතුළු ඔවුන්ගේ යහපැවැත්මට අදාළ ක්‍රියාකාරකම් රැසක් සිදු කරනු ලැබේ. එමෙන්ම ඔවුන්ගේ උසස් අධ්‍යාපනයට පහසුකම් සැලසීම සඳහා ආපදා අරමුදල් භාවිත කරනු ලැබේ.	නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය යටතේ උපාධි අපේක්ෂකයින්ගෙන් උපකාරක පන්ති ගාස්තු අය නොකෙරේ. රජයේ අරමුදල් යොදා ගනිමින් මහපොළ සහ ශිෂ්‍යාධාර ලබා දෙනු ලැබේ. උත්පාදනය කරන ලද ආදායමෙන් විශේෂ ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබේ. ආදි ශිෂ්‍ය සංගමය හරහා විශේෂ මුල්‍ය ආධාර සපයනු ලැබේ. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් මූල්‍ය ගැටලු හමුවේ පීඩාවට පත් වූවන්ට උපකාර කිරීම සඳහා සුබසාධක සංගමය විසින් ක්‍රියාකාරකම් රැසක් සිදු කරන ලදී.	සිසුන් 500කට වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීම

දෙවන අභිමතාර්ථය: කුසගින්න තුරන් කිරීම

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
02	කුසගින්න තුරන් කිරීම, ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය වැඩිදියුණු කිරීම සහ තිරසාර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම	• සිසුන් සඳහා අඩු මිලට හොඳ තත්ත්වයේ ආහාර ලබා දෙනු පිණිස සහනදායී ආපන ශාලාවක් ස්ථාපිත කිරීම. ආහාරවල ගුණාත්මකභාවය සහතික කිරීම සහ අධීක්ෂණය කිරීම සඳහා UCSC විසින් ආපනශාලා කමිටුව පිහිටුවන ලදී. • ආපනශාලා හිමිකරුට එරෙහිව සිසුන් විසින් මතු කරන ලද ගැටලු විසඳීම සඳහා රැස්වීම් පැවැත්වීම සහ කාර්ය මණ්ඩලයේ සහ සිසුන්ගේ දැනුවත්භාවය වැඩි දියුණු කිරීම. • ඈත අපද්‍රව්‍ය අවම කිරීම සඳහා කඩදාසි රහිත පරිසරයක් ප්‍රවර්ධනය කිරීම සහ භාවිත කරන ප්ලාස්ටික් අපද්‍රව්‍ය දිනපතා කළමනාකරණය කිරීම.	මවුපියන් අහිමි වූ සිසුන් වෙනුවෙන් විශේෂ මූල්‍ය ආධාර පිරිනැමිණි. මාර්ගගත ඉගැන්වීම් සහ ඉගෙනීම අතරතුර පවා ජීවත්වීම සඳහා ශිෂ්‍යත්ව ලබා දෙන ලදී. UCSCහි හරිත පරිසරය වැඩි කිරීම සඳහා භූමි අලංකරණ කටයුතු සිදු කරන ලදී. නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය යටතේ විද්‍යුත් අත්සන සහ විද්‍යුත් සන්නිවේදනය වැනි ක්‍රියාකාරකම් සහිත කඩදාසි පරිභෝජනය අඩු කරන ලදී. බලශක්ති පරිභෝජනය අඩු කිරීමට අදාළ ප්‍රතිපත්තිය පුහුණු කිරීම කාර්ය මණ්ඩලය සඳහා ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම සඳහා විශේෂ ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. බරපතල මූල්‍ය ගැටලුවලට මුහුණ දුන් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට සුබසාධන සමිතිය හරහා සහයෝගය ලබා දෙන ලදී. WFH කාලය තුළ, ගෙවතු වගා කටයුතුවල නිරත වීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරන ලදී.	පවතින ආපනශාලා පහසුකම් වැඩිදියුණු කිරීම සහ සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා උසස් තත්ත්වයේ ආහාර සැපයීම. අඩු ආදායම්ලාභී සහ ආපදා තත්ත්වයන්ට මුහුණ දුන් සිසුන් සඳහා මූල්‍ය ආධාර ලබා දීම. විපතට පත් කාර්ය මණ්ඩලය සඳහා ණය පහසුකම් ලබා දීම කාර්ය මණ්ඩල සුබසාධනය සම්බන්ධයෙන් වන කටයුතු වැඩිදියුණු කිරීම. කඩදාසි රහිත සංවිධානයක් බවට පත්වීම (අවම වශයෙන් 90%) සංවිධානයේ හරිත පරිසරය වැඩිදියුණු කිරීම. විද්‍යුත් - කෘෂිකර්මයට අදාළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පර්යේෂණ සිදු කිරීම.

තෙවන අභිමතාර්ථය: යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
03	සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සහතික කිරීම සහ සියලු වයස්වල සැමට යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	• UCSC විසින් එහි කාර්ය මණ්ඩලය සඳහා වෛද්‍ය යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කර දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කර ඇත. • වෛද්‍ය මධ්‍යස්ථානය විසින් කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ සිසුන්හට නොමිලේ වෛද්‍ය ආධාර ලබා දෙන අතර ආයතනය විසින් කොළඹ ජාතික රෝහල දක්වා සිසුන්ට අවශ්‍ය ප්‍රවාහන පහසුකම්ද සපයනු ලැබේ. • ආපදා ණය යෝජනා ක්‍රමය මඟින් කාර්ය මණ්ඩලය විපතට පත් වූ විට අරමුදල් සෙවීමට පහසුකම් සපයනු ලැබේ. • ඩෙංගු මදුරුවන්ගෙන් තොර පරිසරයක් සහතික කිරීම සඳහා පිරිසිදු පරිසරයක් පවත්වා ගනිමින් සුරක්ෂිත අයුරින් එය වැඩිදියුණු කිරීම. • සෞඛ්‍ය සම්පන්න පිළිවෙත් සහ ජීවන රටාව පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීම සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම සහ කොළඹ විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨය සමඟ සහයෝගයෙන් වෛද්‍ය වැඩමුළු 5ක් පවත්වන ලදී. • කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා උපදේශන සේවාව	වෛද්‍ය ආධාර යෝජනා ක්‍රමය භාවිත කරමින්, කාර්ය මණ්ඩලයට සහ ඔවුන්ගේ සමීපතම පවුලේ සාමාජිකයින්ට 2020 තුළ සහාය ලබා දෙන ලදී. කොවිඩ්-19 වෛරසය පැතිරීම අවම කිරීම සඳහා සියලුම කාර්ය මණ්ඩලය අතර WFH ක්‍රියාත්මක විය. සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීම සහ වැඩ කරන වේලාවන්හිදී අත් සේදීම සහ මුහුණු ආවරණ පැළඳීම වැනි සෞඛ්‍ය පුරුදු පවත්වා ගැනීම සඳහා මාර්ගෝපදේශ රැසක් නිකුත් කරන ලදී. කොවිඩ්-19 ආසාදනය හේතුවෙන් සෑක කටයුතු කාර්ය මණ්ඩල සාමාජිකයින්ට නිවසේ රැඳී සිටීමට වැටුප් සහිත නිවාඩු ලබා දෙන ලදී. කොවිඩ්-19 පැතිරීම අවම කිරීම සඳහා රජයේ සහ විශ්වවිද්‍යාල මාර්ගෝපදේශ අනුගමනය කරන ලදී. කාර්ය මණ්ඩලය සහ සිසුන් ආරක්ෂා කිරීම සඳහා දැඩි සෞඛ්‍ය රෙගුලාසි යටතේ සියලුම විභාග සිදු කරන ලදී. කාර්ය මණ්ඩලය සහ සිසුන් යන දෙපිරිසටම වෘත්තීය උපදේශන ලබා දෙන ලදී.	කාර්ය මණ්ඩල යේ සහ සිසුන්ගේ තෘප්තිමත් භාවය වැඩි දියුණු කිරීම. 2030 වන විට සියලුම සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පවතින සෞඛ්‍ය සේවා පහසුකම් වැඩිදියුණු කිරීම. උපදේශන සේවාව වැඩිදියුණු කිරීම සහ උපදේශන පහසුකම් ලබා ගන්නා සිසුන් සහ කාර්ය මණ්ඩල සංඛ්‍යාව අඩු කිරීම.

සිව්වන අභිමතාර්ථය: ගුණාත්මක අධ්‍යාපනය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
04	සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සැමට ජීවිත කාලය පුරාම ඉගෙනීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම	කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය විසින් නිදහස් මෙන්ම සාධාරණ හා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දෙයි. ඒ සඳහා පහත සඳහන් වැඩසටහන් පිරිනමනු ලැබේ. **1.** සහතිකපත්‍ර, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමා පාඨමාලා **2.** බාහිර සිසුන් සඳහා පිරිනමන BIT උපාධිය **3.** තම ICT දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීමට කැමති අය සඳහා පදනම් වැඩසටහන ලෙස පිරිනමන FIT වැඩසටහන **4.** පරිගණනය පිළිබඳ විද්‍යාවේදී උපාධි වැඩසටහන් (උපාධි පාඨමාලා 5) **5.** විශේෂීකරණය වූ අංශ **6**ක් සඳහා පශ්චාත් උපාධි වැඩසටහන් UCSCහි සිසුන්ට උසස් තත්ත්වයේ ඉගැන්වීම් සහ පර්යේෂණ ලබා දීම සඳහා පූර්ණ කාලීන මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩලයක් සිටින අතර එහි සිසුන් අතර 90%කට වැඩි රැකියා අනුපාතයක් ඇත. බොහෝ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෝ ආචාර්ය උපාධිලාභීහු වෙති.	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන්, UCSC විසින් කිසිදු අධ්‍යයන කටයුත්තක් අත්හිටුවා නොමැති අතර, මාර්ගගත ඉගෙනුම් පරිසරය හරහා ඉගැන්වීම්/ඉගෙනීම්/ඇගයුම් කටයුතු සිදු කරන ලදී. සමමුහුර්ත සහ අසමමුහුර්ත ආකාර දෙකෙන්ම සිසුන්ට ප්‍රවේශ වීමට ඉඩ සලසමින් සියලුම මාර්ගගත දේශන පටිගත කරන ලදී. UCSC මාර්ගගත ඉගෙනුම් පරිසරයට ප්‍රවේශ වන වී Zoom සේවාව හරහා මාර්ගගත දේශනවලට සහභාගී වන විට නොමිලේ අන්තර්ජාල ප්‍රවේශය ලබා දෙන ලදී. අධ්‍යයන වාරය තුළ නිතිපතා සිසුන්ගේ ප්‍රතිපෝෂණ රැස් කරන අතරම අධ්‍යාපනය ලබා දීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා 2021 තුළ තත්ත්ව සහතික කිරීමේ ක්‍රියාකාරකම් රැසක් සිදු කරන ලදී. UCSCහි විවෘත අධ්‍යාපනික සැලසුම්වල ගුණාත්මක භාවය ඉහළ නැංවීම සඳහා BIT සහ FIT වැඩසටහන්හි විෂයමාලා සංවර්ධනය සිදු කරන ලදී. සිසුන්ගේ ගැටලු සොයා බලා ඵලදායී ලෙස අධ්‍යාපනයේ යෙදීමට පහසුකම් සැලසීම සඳහා ශිෂ්‍ය සමීක්ෂණ කිහිපයක් සිදු කරන ලදී.	උසස් තත්ත්වයේ අධ්‍යාපනය සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සහතික කිරීම සඳහා UGC විසින් වරින් වර හඳුන්වා දෙන තත්ත්ව සහතික දර්ශක සපුරාලීම.

පස්වන අභිමතාර්ථය: ස්ත්‍රී-පුරුෂ සමානාත්මතාවය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
05	ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීම සහ සියලුම කාන්තාවන් සහ ගැහැනු ළමයින් සවිබල ගැන්වීම.	සිසුන් ඇතුළත් කර ගැනීමේදී ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති අතර උසස් අධ්‍යාපනය ලැබීමට හා අප ආයතනයෙහි සෑම පහසුකමක්ම භුක්ති විඳීමට සමාන අවස්ථාවක් ලබා දී ඇත. කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි පිරිමි ජනගහනය හා සමානව සියලුම කාන්තාවන් සවිබල ගැන්වීමට පියවර ගෙන ඇත.	කිසිදු උපාධියක් හෝ වෙනත් අධ්‍යයන වැඩසටහන් සඳහා ශිෂ්‍යයින් ඇතුළත් කිරීමේ දී ස්ත්‍රී පුරුෂ භාවය කිසි විටෙකත් නොසළකන ලදී. 2021 තුළ කාර්ය මණ්ඩල සාමාජිකයින් බඳවා ගැනීමේ දී හෝ උසස්වීම් කිරීමේදී ස්ත්‍රී පුරුෂ භාවය කිසිවිටෙකත් නොසළකනු ලැබිණි. සනීපාරක්ෂක පහසුකම් වැනි පහසුකම් සංවර්ධනය කිරීමේ දී පිරිමි සහ ගැහැනු අනුපාතය සලකා බලන ලදී. බාහිර පාර්ශ්වයන්ගේ සහය ඇතිව BIT වැඩසටහනේ ශිෂ්‍යාවන් සඳහා විශේෂ ශිෂ්‍යත්ව ලබා දෙන ලදී.	2030 වන විට පවතින පරිදි ස්ත්‍රී පුරුෂ සමානාත්මතා ප්‍රතිපත්තිය පවත්වාගෙන යාම.

හයවන අභිමතාර්ථය: පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
06	සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා ජලය සහ සනීපාරක්ෂාව ලබා ගත හැකි වීම සහ ඒවා තිරසාර ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීම.	සියලුම සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට පානීය ජල පහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් ලබා දීම අප ආයතනය විසින් පුනරාවර්තන වියදම් හා උපයන ලද ආදායම් මඟින් සිදු කරන ලදී.	සියලුම කාර්ය මණ්ඩලය සඳහා පානීය ජලය ලබා දෙන ලදී. නිතිපතා ජලයේ තත්ත්වය පරීක්ෂා කරනු ලැබිණි. නිතිපතා පිරිසිදු කිරීමේ කටයුතු සිදු කරන ලද අතර ඒවා දිනපතා වාර්තා කරන ලදී.	සියලුම සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා පානීය ජලය සහ ආබාධ සහිත සිසුන් ඇතුළු සියලු දෙනා සඳහා සනීපාරක්ෂක පහසුකම් සහතික කිරීම.

හත්වන අභිමතාර්ථය: දැරිය හැකි ලෙස පිරිසිදු බලශක්තිය සැපයීම

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
07	සැමට දැරිය හැකි, විශ්වාසනීය, තිරසාර සහ නවීන බලශක්තිය සඳහා ප්‍රවේශය සහතික කිරීම	බලශක්ති ඉතිරිකිරීමේ ක්‍රියාකාරකම් හඳුන්වාදීම සහ කාර්යක්ෂම බලශක්තිය භාවිත කිරීම. සිසුන් සහ කාර්ය මණ්ඩලය සඳහා නව පරිගණක සහ රසායනාගාර උපකරණ ලබා ගැනීමේදී බලශක්ති ඉතිරිකිරීම පිළිබඳ සලකා බැලීම	බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රතිපත්තියට අනුව, අවශ්‍ය විටදී ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අඩු පරිභෝජන බල්බ (LED) භාවිතා කරන ලදී. භාවිතය අවම කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට බලශක්ති භාවිතය නිරීක්ෂණය කිරීම බලශක්ති ඉතිරිකිරීම් පිළිබඳ විධිමත් ප්‍රතිපත්තියක් අනුමත කරන ලදී. විදුලිය අපතේ යෑම අවම කිරීම සඳහා විදුලි සැපයුම සම්බන්ධයෙන් අලුත්වැඩියා කටයුතු රැසක් සිදු කරන ලදී.	නව තාක්ෂණය හඳුන්වා දීමෙන් 15%කින් බලශක්තිය ඉතිරි කරන ලදී.

අටවන අභිමතාර්ථය: යහපත් වැඩ සහ ආර්ථික වර්ධනය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
08	තිරසාර මෙන්ම සියල්ල ඇතුළත් තිරසාර ආර්ථික වර්ධනයක් හා පූර්ණ මෙන්ම ඵලදායී ලෙස සේවා නියුක්තිය සහ සැමට යහපත් කාර්යයන් ප්‍රවර්ධනය කිරීම.	රටේ ජාතික සංවර්ධනයට දායක වීම සඳහා ගුණාත්මක උපාධිධාරීන් බිහි කිරීම. UCSC උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය 90%කට වඩා පවත්වා ගැනීම. සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ කාර්යය ප්‍රමිතිය වැඩි දියුණු කිරීම.	කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් වත්මන් උපාධිධාරීන්ගේ රැකියා ගැටලු ඇගයීමට ලක් කරන ලදී. විවිධ උපාධිධාරී කණ්ඩායම්වල රැකියා නියුක්තිය පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලදී. කොවිඩ්-19 හේතුවෙන් ආදායමට සිදුවන බලපෑම අවම කිරීම සඳහා බොහෝ ක්‍රියාමාර්ග ගෙන ඇත. සේවයට වාර්තා කිරීමේ නව යාන්ත්‍රණය අනුගමනය කරමින් "නිවසේ සිට වැඩ කිරීම"ට යොමු විය. UCSCහි සුභසාධක සමිතිය හරහා කාර්ය මණ්ඩල ප්‍රවර්ධන කටයුතු සිදු කරන ලදී.	100% සේවා නියුක්තිය පවත්වා ගැනීම සහ පර්යේෂණ සහ සංවර්ධන (R&D) හරහා තරඟකාරී, නව්‍ය, නිර්මාණශීලී සහ උසස් තත්ත්වයේ උපාධිධාරීන් බිහි කිරීම. රජයේ අරමුදල් නොසලකා අප විශ්වවිද්‍යාලයෙහි ස්ථාවර ආර්ථික වර්ධනයක් පවත්වාගෙන යාම.

නවවන අභිමතාර්ථය: කර්මාන්ත, නවෝත්පාදන හා යටිතල පහසුකම්

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
09	යටිතල පහසුකම් ඔරොත්තු දෙන ලෙස ගොඩනැගීම, සියල්ල ඇතුළත් සහ	කර්මාන්ත ඉල්ලුම මත තොරතුරු තාක්ෂණ උපාධිධාරීන් සඳහා උසස් තත්ත්වයේ අධ්‍යාපනයක් ලබා දීමට නවීන තාක්ෂණයන්ගෙන් යුත් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම	WFH ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වැඩිදියුණු කරන ලදී. Zoom සේවාව හරහා පවත්වන ලද මාර්ගගත රැස්වීම් කාර්ය මණ්ඩලය	සිසුන්ගේ කාර්යසාධනය මත පදනම් වූ ඇගයීම තක්සේරු කිරීමේදී නවෝත්පාද

	තිරසාර කාර්මීකරණය ප්‍රවර්ධනය කිරීම සහ නවීකරණයන් පෝෂණය කිරීම.	වර්තමාන පාඨමාලාවල විෂයමාලා සංවර්ධනය කිරීම සහ වෙළඳපොළ අවශ්‍යතාව මත නව පාඨමාලා ආරම්භ කිරීම. "නවෝත්පාදනය" විෂයමාලාවක් ලෙස මෙන්ම සිසුන් සහ කාර්ය මණ්ඩලය අතර විෂය බාහිර ක්‍රියාකාරකමක් ලෙස ප්‍රවර්ධනය කිරීම	සහ සිසුන් අතර අන්තර්ක්‍රියා ප්‍රවර්ධනය කිරීමේ පොදු ක්‍රමවේදයක් බවට පත් විය. යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා ශක්‍යතා සංවර්ධනයට අදාළ ක්‍රියාකාරකම් සිදු කරන ලදී. වර්තමාන කොවිඩ් - 19 තත්ත්වය සැලකිල්ලට ගනිමින් නව්‍ය සංකල්ප සංවර්ධනය වෙනුවෙන් ව්‍යාපෘති රැසකට සහාය ලබා දෙන ලදී. ICTer සම්මන්ත්‍රණය සහ සඟරාව කාර්මිකකරණය සහ නවෝත්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා දැනුම ව්‍යාප්ත කිරීමේ යාන්ත්‍රණය විය	නය සලකා බලනු ලැබේ. සංවිධානය තුළ පරිසර හිතකාමී තිරසාර භෞතික හා තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපිත කිරීම. ශ්‍රී ලංකාවේ ජාතික නවෝත්පාදනය සඳහා දායක වීම

දසවන අභිමතාර්ථය: අසමානතාවය අවම කිරීම

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
10	රටවල් තුළ සහ රටවල් අතර අසමානතාවය අඩු කිරීම.	ඉංග්‍රීසි භාෂාවට දුර්වල සිසුන් සඳහා ඉංග්‍රීසි පන්ති පැවැත්වීම අධ්‍යයන කටයුතුවලදී දුර්වල සිසුන් සඳහා නිබන්ධන පන්ති පැවැත්වීම	සංවිධානයේ අභිමානය මත කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගීත්වය ප්‍රවර්ධනය කිරීම සහ අසමානතාවය අවම කිරීම සඳහා සුහසාධක සංගමය සියලුම කාර්ය මණ්ඩලය එකම මට්ටමින් සලකා ක්‍රියාකාරකම් සිදු කරන ලදී. සිසුන්ට ඔවුන්ගේ මෘදු කුසලතා වැඩි දියුණු කිරීම සඳහා අමතර දැනුවත් වීම් ලබා ගැනීමට පහසුකම් සලසා ඇත	බහුතරයක් සිසුන් GPA 2.5 හෝ ඊට වැඩි ප්‍රමාණයක් ලබා ගන්නා පරිදි ශිෂ්‍ය කාර්යසාධනය ඉහළ නැංවීම

			වෘත්තීය සංවර්ධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත සම්මන්ත්‍රණ පවත්වන ලදී. සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගැනීම සඳහා පහසුකම් සලසන ලදී. ඔවුන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව සිදු කිරීමට කාර්ය මණ්ඩලය දිරිමත් කරන ලදී.	

එකොළොස්වන අභිමතාර්ථය: තිරසාර නගර සහ ප්‍රජාවන්

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
11	නගර සහ මානව ජනාවාස සියල්ල ඇතුළත් වන අයුරින් ආරක්ෂිත හා ඔරොත්තු දෙන ලෙස තිරසාර සංවර්ධනය සඳහා කටයුතු කිරීම.	වැඩ කරන පරිසරයේ ආරක්ෂාව සෑම අයුරකින්ම වැඩි දියුණු කිරීම. නේවාසිකාගාර සහ ශිෂ්‍යත්ව ලබා දීමෙන් ග්‍රාමීය ප්‍රදේශවල සිසුන්ට පහසුකම් සැලසීම. සිසුන් සහ කාර්ය මණ්ඩලය විසින් ග්‍රාමීය පාසල් සඳහා වැඩමුළු පැවැත්වීම.	සංවිධානයේ ආරක්ෂාව සහ තිරසාරභාවය වැඩිදියුණු කිරීම සඳහා UCSC තුළ ගිනි ආරක්ෂණ පද්ධතිය සංවර්ධනය කරන ලදී. BIT සහ FIT යන වැඩසටහන් ද්විත්වයම සෑමට දැරිය හැකි උපාධි වැඩසටහන් ලෙස අඩු ආදායම්ලාභී සිසුන් අතර ප්‍රවර්ධනය කරන ලදී.	BIT වැඩසටහන හරහා දුරස්ථ අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සඳහා විද්‍යුත් ඉගෙනුම් සහ මිශ්‍ර ඉගෙනුම් යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.

දොළොස්වන අභිමතාර්ථය: වගකිවයුතු පරිභෝජනය සහ නිෂ්පාදනය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
12	තිරසාර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	පරිගණක අධ්‍යයනායතනය විසින් අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලබන අතර ප්‍රතිචක්‍රීකරණය සඳහා අපද්‍රව්‍ය යවනු ලැබේ. UCSC විසින් පාරිසරික හානි අවම කිරීම සඳහා විද්‍යුත් -අපද්‍රව්‍ය බැහැර කිරීමේ ක්‍රියාවලිය සලකා බලනු ලැබේ.	කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් විදුලිය හා ජල පරිභෝජනය සැලකිය යුතු ප්‍රමාණයකින් අඩු විය. UCSC විසින් ද්‍රව්‍ය පරිභෝජනය අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. කබඩ් වැනි උපකරණ රැසක් නැවත නැවත භාවිතා කිරීමට අලුත්වැඩියා කරන ලදී. විද්‍යුත්-අපද්‍රව්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති අනුගමනය කරන ලදී.	බලශක්ති සහ අනෙකුත් සම්පත් පරිභෝජනය කළමනාකරණය කිරීම බැහැර කිරීමට පෙර භාණ්ඩ/වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය ලබා ගැනීම. පරිභෝජනය කළමනාකරණය කිරීම සඳහා ප්‍රතිපත්ති සකස් කර ඒවා අනුගමනය කිරීම. වඩාත් හොඳ කසළ කළමනාකරණ සහ ප්‍රතිචක්‍රීකරණ පද්ධතියක් පවත්වාගෙන යාම.

දහතුන්වන අභිමතාර්ථය: දේශගුණික ක්‍රියාකාරිත්වය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
13	දේශගුණික විපර්යාස සහ එහි බලපෑම්වලට එරෙහිව ක්‍රියා කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම	විවිධ විද්‍යුත් උපාංග, කඩදාසි සහ ප්ලාස්ටික් වැනි දේශගුණික විපර්යාස කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරන භාණ්ඩ භාවිතය පාලනය කිරීම	කොවිඩ් -19 තත්ත්වය සහ නිවසේ සිට වැඩ කිරීම හේතුවෙන් UCSC හට බලශක්ති පරිභෝජනය අවම කර ගැනීමට හැකි වූ අතර එය දේශගුණික සංවර්ධනයට දායක විය. බලශක්ති ඉතිරිකිරීමේ ප්‍රතිපත්තිය නිල වශයෙන් අනුමත කරන ලද අතර සියලුම විද්‍යුත් උපකරණ ප්‍රතිස්ථාපනය කිරීමේදී එය ක්‍රියාත්මක කරන ලදී. කඩදාසි පරිභෝජනය අවම කිරීම	හරිත සරසවිවල තත්ත්වය ළඟා කර ගැනීම.

දාහතරවන අභිමතාර්ථය: ජලජ ජීවිතය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
14	තිරසාර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සමුද්‍ර සම්පත් සංරක්ෂණය හා තිරසාර ලෙස භාවිත කිරීම	ජල පරිභෝජනය කළමනාකරණය ජලයේ ගුණාත්මකභාවය උපරිම කිරීම සඳහා අපද්‍රව්‍ය කළමනාකරණය	2021 දී ජල පරිභෝජනය අවම කිරීම ආයතනය තුළ කසළ කළමනාකරණය වැඩිදියුණු කිරීම	ජල පරිභෝජනය අඩු කිරීම සහ ජලයේ ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම මඟින් දායකත්වය සැපයීම

පහළොස්වන අභිමතාර්ථය: ගොඩබිම ජීවිතය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
15	භූගෝලීය පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, ප්‍රතිෂ්ඨාපනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, වනාන්තර තිරසාර ලෙස කළමනාකරණය කිරීම, කාන්තාරීකරණයට එරෙහිව සටන් කිරීම සහ ඉඩම් හායනය වැළැක්වීම සහ ආපසු හැරවීම සහ ජෛව විවිධත්ව හානිය නතර කිරීම.	මෙම අභිමතාර්ථය අප විශ්වවිද්‍යාලයේ උපායමාර්ගික සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම සමඟ සම්බන්ධ නොවේ.	අදාළ නොවේ	අදාළ නොවේ

දහසයවන අභිමතාර්ථය: සාමය සහ යුක්තිය ශක්තිමත් ආයතන

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
16	තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී මෙන්ම සියල්ල අන්තර්ගත වූ සමාජ ප්‍රවර්ධනය කිරීම, සැමට යුක්තිය සඳහා ප්‍රවේශය ලබා දීම සහ සියලු මට්ටම්වල ඵලදායී, වගවීම් සහිත මෙන්ම සියල්ල ඇතුළත් ආයතන ගොඩනැගීම	නවක වදය, ස්ත්‍රී පුරුෂ භාවය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය නොඉවසීම සහ කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍යයන් එවැනි සිදුවීම් වලට ගොදුරු වුවහොත් අවශ්‍ය පැමිණිලි කළ හැකි වීම.	විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ මෙන්ම අන්තර්ජාල පරිසරය තුළද සිදුවන ප්‍රචණ්ඩත්වය සහ නවක වදය පිළිබඳව සියලුම සිසුන් දැනුවත් කරන ලදී. කාර්ය මණ්ඩලය සහ ශිෂ්‍ය කණ්ඩායම් අතර සුහදතාවය සහ සහයෝගය වර්ධනය කිරීම සඳහා ක්‍රියාකාරකම් සිදු කරන ලදී.	සියලුම පාර්ශවකරුවන් නිසි පරිදි දැනුවත් කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණයක් හරහා ප්‍රචණ්ඩත්වයෙන් තොර හා මිත්‍රශීලී පරිසරයක් ඇති කිරීම

			ගැටලු අවම කර ගනිමින් වැඩකිරීමේ සහ ඉගෙනීමේ වඩා යහපත් පරිසරයක් සියල්ලන්ටම පිරිනැමීම සඳහා කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය පැමිණිලිවලට විසඳුම් ලබා දෙන ලදී.	

දාහත්වන අභිමතාර්ථය: අභිමතාර්ථය සපුරා ගැනීම සඳහා හවුල්කාරිත්වය

අභිමතාර්ථය	අභිමතාර්ථය පිළිබඳ විස්තරය	තිරසාර සංවර්ධන අභිමතාර්ථවලට අනුකූලව කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය ගත් ක්‍රියාමාර්ග	2021 වර්ෂයේ ප්‍රගතිය	2030 වර්ෂය වන විට ළඟා වීමට බලාපොරොත්තු වන ඉලක්කය
17	ක්‍රියාත්මක කිරීමේ මාධ්‍යයන් ශක්තිමත් කිරීම සහ තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය යළි ඇති කිරීම	UCSC සිය සිසුන්ගේ සහ කාර්ය මණ්ඩලයේ අභිවෘද්ධිය සඳහා දේශීය හා ගෝලීය වශයෙන් තොරතුරු තාක්ෂණ කර්මාන්තය/සංවිධාන සමඟ හවුල්කාරිත්වයන් පිහිටුවනු ලැබ ඇත. UCSC විසින් තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබේ.	අධ්‍යයනායතනය හා කර්මාන්ත අතර වඩා යහපත් සබඳතාවයක් ප්‍රවර්ධනය කිරීම සඳහා PDC විසින් එහි ක්‍රියාකාරකම් අඛණ්ඩව සිදු කරන ලදී. UCSC ජාතික ක්‍රියාමාර්ග සහ ව්‍යාපෘති රැසක් සඳහා ක්‍රියාකාරීව සහභාගී විය. හවුල්කාරිත්වය වැඩිදියුණු කිරීම සඳහා ජාතික සංවර්ධනයට සක්‍රීයව දායක වීමට UCSC විසින් කාර්ය මණ්ඩලය දිරිමත් කරන ලදී. හවුල්කාරිත්වයන් වැඩිදියුණු කර ගැනීම සඳහා UCSC විසින් ප්‍රධාන සරසවිය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අනෙකුත් විශ්ව විද්‍යාලවලට සක්‍රීයව දායකත්වය සපයන ලදී.	තිරසාර බව ජයග්‍රහණයේ ප්‍රධාන දර්ශකය බවට පත් කර ගනිමින් සංවර්ධනය යන තත්ත්වය සාක්ෂාත් කර ගැනීම

6. ශ්‍රේණිය පාලනය

6. මූල්‍ය පාලනය

මූල්‍ය රෙගුලාසි වලට අනුව, 2021 වර්ෂයෙහි අවසන් මූල්‍ය ප්‍රකාශ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු 2021 පළමු මාස දෙක ඇතුළත ඉදිරිපත් කළ යුතු වෙයි. විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ පසුව හඳුනාගත් වෙනස්කම් මත පදනම්ව මෙම කොටසේ පහත සඳහන් උපුටා ගැනීම් සකස් කරනු ලැබේ. කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නියමිත දිනට පෙර මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී. මෙම කොටසේ දී, අපි 2021 තුළ ආයතනයේ මූල්‍ය තත්ත්වය විශ්ලේෂණාත්මකව විස්තර කරමු.

6.1 පුනරාවර්තන වියදම්


ආයතනයන්හි එදිනෙදා කටයුතුවල අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩාගාර අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින්, උත්පාදනය කරන ලද ආදායම ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා අත්‍යවශ්‍ය ආදායම් මාර්ගයක් බවට පත්ව ඇත. ආයතනයේ ප්‍රධාන කාර්යය වන්නේ අභ්‍යන්තර උපාධි පාඨමාලාව කළමනාකරණය කිරීමයි. ඒ සඳහා සතියේ දින 7න් දින 5ක් වෙන් කරනු ලැබේ. එබැවින් පුනරාවර්තන වියදම්වලින් වැඩි ප්‍රමාණයක් උපාධි අපේක්ෂක වැඩසටහනට අදාළ ක්‍රියාකාරකම් සමඟ සෘජුවම සම්බන්ධ වේ. 2021 වර්ෂයේ දී ඒක ශිෂ්‍ය පදනම මත පුනරාවර්තන වියදම රුපියල් 386, 298/ = කි.

පොදුවේ ගත් කළ, පුනරාවර්තන වියදම මිලියන 550.56ක් වන අතර එයින් මිලියන 158.38ක් අප විශ්වවිද්‍යාලය මඟින් උපයන ලද ආදායම වෙයි. වෙනත් වචනවලින් කිවහොත්, සමස්ත පුනරාවර්තන වියදමෙන් 28.36%ක් අප පරිගණක අධ්‍යයනායතනයෙන් ජනනය කළ ආදායම වේ. පුනරාවර්තන වියදම්වල ප්‍රධාන වර්ගීකරණය පහත වගුවේ දක්වා ඇත (පුනරාවර්තන වියදම්).

6.1 වගුව අ:මුළු පුනරාවර්තන වියදම් රුපියල් 000'

විෂය	2021	2020	2019
පෞද්ගලික දීමනා	329,870	322,106	338,452
ගමනාගමන වියදම්	179	175	1,900
සැපයුම්	8,200	8,384	9,403
නඩත්තු කටයුතු	4,202	4,209	6,093
කොන්ත්‍රාත් සේවා	27,054	29,690	37,836
වෙනත්	181,052	155,044	191,415
එකතුව	**550,557**	**519,608**	**585,099**
රජයේ ප්‍රතිපාදන	**392,180**	**357,880**	**337,200**

රජය විසින්, පුනරාවර්තන වියදම් සඳහා කරන ලද වෙන් කිරීම පෞද්ගලික දීමනා ආවරණය කිරීම සඳහා ප්‍රමාණවත් නොවූ හෙයින්, අනෙකුත් සියලුම වියදම් කළමනාකරණය විසින් ඉතා හොඳින් පාලනය කිරීමට කටයුතු කළ බව පුනරාවර්තන වියදම් වගුවේ 2021 වර්ෂයෙහි සංඛ්‍යා 2020 වර්ෂය සමඟ සංසන්දනය කරන විට ඔබට වටහාගත හැකිය.




6.2 ප්‍රාග්ධන වියදම්

රජයේ ප්‍රාග්ධන ප්‍රදානය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් අප පරිගණක අධ්‍යයනායතනය විසින් උපයන ලද අරමුදල් සැලසුම් කරන ලද ක්‍රියාකාරකම් සිදු කිරීම සඳහා භාවිත කරන ලදී. වසර ඇතුළත ප්‍රාග්ධන වියදම මිලියන 73.17ක් වන අතර එයින් මිලියන 13.17ක් අප ආයතනය විසින් උපයා ගත් ආදායම විය. පොදුවේ ගත් කළ, එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම රුපියල් 73,317/= කි. ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර පහත වගුවේ දක්වා ඇත (ප්‍රාග්ධන වියදම්).

6.2 වගුව අ:ප්‍රාග්ධන වියදම් රුපියල් 000'

විෂය	2021	2020	2019	2018
ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ හා වෙනත් ස්ථාවර වත්කම් ලබා ගැනීම	23,059	14,445	68,939	61,579
ගොඩනැගිලි සහ ව්‍යුහයන් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම	50,112	27,140	33,091	85,628
එකතුව	**73,171**	**41,585**	**102,030**	**147,207**
රජයේ ප්‍රතිපාදන	**60,000**	**23,000**	**69,000**	**112,250**



6.3 උපදේශන සහ පර්යේෂණ ව්‍යාපෘති (බාහිරින් අරමුදල් ලද)

උපදේශන ව්‍යාපෘතිවලින් උපයා ගත් ආදායමෙන් 30%ක් අප ආයතනයේ සංවර්ධන කටයුතු සඳහා දායක වන අතර ඉතිරි අරමුදල් ව්‍යාපෘති වියදම් පියවා ගැනීම සඳහා භාවිත කරන ලදී. ව්‍යාපෘති මුදල විශාල වන්නේ නම්, කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් ව්‍යාපෘතියෙහි සාර්ථකත්වයට වන වක්‍ර දායකත්වය ආවරණය කිරීම සඳහා ව්‍යාපෘති අරමුදලින් 2-3%ක් සේවක සුභසාධන අරමුදල සඳහා සපයන ලෙස ප්‍රධාන විමර්ශකයාගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

එකඟ වූ අරමුණු මත පදනම්ව බාහිර පාර්ශවයන් විසින් අරමුදල් සපයනු ලබන පර්යේෂණ ව්‍යාපෘති සිදු කරනු ලැබේ. එමඟින් ලැබෙන ප්‍රතිඵල සාමාන්‍යයෙන් ආයතන දෙක විසින්ම බෙදා ගනු ලබන අතර ඒවා ඒකාබද්ධ පර්යේෂණවල පළ වේ. පර්යේෂණ ව්‍යාපෘතිවලින් 10% ක් පරිපාලන ගාස්තු ලෙස අය කෙරෙන අතර ඉතිරිය ප්‍රධාන විමර්ශක විසින් සකස් කරන ලද අයවැය අනුව භාවිත කරනු ලැබේ.

සියලුම මෘදුකාංග සංවර්ධන ව්‍යාපෘති උපදේශන ආකාරයේ ව්‍යාපෘති ලෙස සැලකේ. මෙම ව්‍යාපෘතිවලින් සමහරක් සෘජුවම සම්බන්ධීකරණය කරනු ලබන්නේ එම ව්‍යාපෘති සඳහා ප්‍රධාන උපදේශක ලෙස තනි ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල සාමාජිකයන් විසිනි. විශ්වවිද්‍යාලයෙහි ස්ථිර කාර්ය මණ්ඩල සාමාජිකයෙකු වන ප්‍රධාන උපදේශකවරයාට පූර්ණ කාලීන හෝ අර්ධ කාලීන පදනමක් මත ඕනෑම කෙනෙකුගේ සේවය ලබා ගත හැකි නමුත් එවැනි කාර්ය සඳහා මුදල් යෙදවිය යුත්තේ උපදේශන අයවැය මඟින් පමණි. විශ්වවිද්‍යාලයෙහි කළමනාකරණ මණ්ඩලයේ එකඟතාවට යටත්ව එම ප්‍රධානියා එම බාහිර පාර්ශ්වයන් සමඟ අදාළ සේවා ගිවිසුමට අත්සන් කරන බැවින් ප්‍රධාන උපදේශක විසින් එම උපදේශක ව්‍යාපෘතිවල සමස්ත සම්බන්ධීකාරක ලෙස කටයුතු කරන අධ්‍යක්ෂක වෙත ඒවායෙහි ප්‍රගතිය පිළිබඳව සෘජුවම වාර්තා කළ යුතුය. පරිගණක සේවා

මධ්‍යස්ථානය යටතේ ඇති මෘදුකාංග සංවර්ධන ඒකකය එවැනි ක්‍රියාකාරකම් සඳහා වෙන්වූ ස්ථානයයි.

වගුව 6.3. අ: ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය ***රුපියල් 000'***

ව්‍යාපෘති වර්ගය	අයවැය ගතකර ඇති මුදල	ලදුපත් ගත කළ මුදල	ලැබුණු මුදල	වියදම
පර්යේෂණ ව්‍යාපෘති (දේශීය අරමුදල් ලද)	-	-	632	182
පර්යේෂණ ව්‍යාපෘති (විදේශීය අරමුදල් ලද)	-	-	6,554	300
උපදේශන සහ මෘදුකාංග සංවර්ධන වර්ගයේ ව්‍යාපෘති	6,000	6,576	5,649	4,048
එකතුව	**6,000**	**6,576**	**12,835**	**4,530**

රජයේ බලධාරීන් විසින් ලබා දෙන සේවා පැවරුම්

විවිධ පාර්ලිමේන්තු පනත් හා රජයේ අවශ්‍යතාවන්ට අනුව වරින් වර සේවා ලබා දෙන ලෙස අප අධ්‍යයනායතනයෙන් ඉල්ලා සිටින ලදී. ඩිජිටල් අධිකරණ වෛද්‍ය මධ්‍යස්ථානය (සීඩීඑෆ්) විසින් අධිකරණ නියෝග හෝ වෙනත් පාර්ශ්වයන්ගෙන් ලැබුණු නියෝග මත පදනම්ව පරීක්ෂණ සිදු කිරීමට නියමිතව තිබුණි. ඇතැම් පැවරුම් සඳහා නාමික ගාස්තුවක් ගෙවනු ලබන නමුත් අප ආයතනය විසින් දරනු ලබන සත්‍ය පිරිවැය සේවා පැවරුම්වලින් ලබන ආදායමට වඩා වැඩිය.

6.4 මූල්‍ය ආධාර සහ උත්පාදනය කළ ආදායම් විශ්ලේෂණය

රජයෙහි සහය අභ්‍යයන්තර උපාධි අධ්‍යයනයන් සඳහා පමණක් ලැබෙන නමුත්, මෙම සහය උපාධි අපේක්ෂක වැඩසටහනෙහි සියළුම අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් නොවේ. ඒ අනුව අදාළ අධ්‍යයන කටයුතු සිදු කිරීම සඳහා පශ්චාත් උපාධි හා බාහිර උපාධි පාඨමාලා හදාරන සිසුන්ගෙන් සෘජුවම අරමුදල් රැස් කරනු ලැබේ. බාහිර පාර්ශ්වයන් විසින් ලබා දෙන උපදේශන, ව්‍යාපෘති සහ සේවා ආකාරයේ පැවරුම් ලදුපත් නිකුත් කිරීමෙන් අය කෙරේ. පහත වගුව මඟින් අධ්‍යයනායතනයෙහි සිදු කෙරුණු විවිධ කාර්යයන්හි අයවැය සහ ලැබුණු ආදායම විස්තර කෙරේ.

6.4 වගුව අ: මූල්‍ය ප්‍රගතිය (අයවැය, ලදුපත් ගතකළ ගනුදෙනු, ලැබීම්)
රුපියල් 000'

ප්‍රධාන ආදායම් ප්‍රභවයන්	අයවැය ගතකර ඇති මුදල	ලදුපත් ගත කළ මුදල	ලැබුණු මුදල	වෙනස
අභ්‍යයන්තර උපාධි අධ්‍යයන	6,526	6,526	6,526	-
පශ්චාත් උපාධි අධ්‍යයන	108,400	108,007	108,007	(393)
උපදේශන	6,580	6,576	5,649	(931)
බාහිර උපාධි	100,343	79,896	79,896	(20,447)
වෙනත්	100,000	91,457	91,457	(8,543)
එකතුව	**321,849**	**292,462**	**291,535**	**(30,314)**

6.4.1 මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය

6.4.1 වගුව අ: මූල්‍ය කාර්යසාධන විශ්ලේෂණය – 2021 රුපියල්000'

විෂය	සූත්‍රය	එක් ශිෂ්‍යයෙ කුගේ වියදම
එක් සිසුවෙකු සඳහා පුනරාවර්තන වියදම	පුනරාවර්තන වියදම / මුළු ශිෂ්‍ය ප්‍රමාණය	386,298
එක් සිසුවෙකු සඳහා ප්‍රාග්ධන වියදම	මුළු ප්‍රාග්ධන වියදම / මුළු ශිෂ්‍ය ප්‍රමාණය	73,317
	එක් සිසුවෙකු සඳහා මුළු වියදම	**459,615**

6.4.2 උපාධි අපේක්ෂක වැඩසටහනේ මූල්‍ය විස්තර විශ්ලේෂණය

රුපියල්000'

	2021	%	2020	%	2019	%	2018	%
පෞද්ගලික දීමනා	326,363		316,053		329,637		228,297	
වෙනත් පුනරාවර්තන	74,163		53,479		66,441		62,666	
මුළු පුනරාවර්තන වියදම	**400,526**		**369,532**		**396,078**		**290,963**	
පුනරාවර්තන ප්‍රදාන ලැබීම්	392,180	98	357,880	97	337,200	85	198,785	68
පුනරාවර්තන ක්‍රියාකාරකම් සඳහා ජනනය කරන ලද අරමුදල්	**8,346**	**2**	**11,652**	**3**	**58,878**	**15**	**92,178**	**32**
ප්‍රාග්ධන වියදම්	**73,171**		**41,585**		**102,030**		**146,829**	
ප්‍රාග්ධන ප්‍රදාන ලැබීම්	60,000	82	23,000	55	69,000	68	112,250	76

ප්‍රාග්ධන ක්‍රියාකාරකම් සඳහා ජනනය කරන ලද අරමුදල්	**13,171**	**18**	**18,585**	**45**	**33,030**	**32**	**34,579**	**24**
මුළු වියදම (පුනරාවර්තන + ප්‍රාග්ධන)	473,697		411,121		498,108		437,792	
මුළු රජයේ ප්‍රදානය	452,180	95	380,880	93	406,200	82	311,035	71
උපාධි අපේක්ෂක වැඩසටහන සඳහා අරමුදල් සම්පාදනය කිරීම	**21,517**		**30,241**		**91,908**		**126,757**	
ජනනය කරන ලද අරමුදල් මුළු වියදමෙන් ප්‍රතිශතයක් ලෙස භාවිත කිරීම		**5**		**7**		**18**		**29**

6.4.3 මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන	2021 රු.	2020 අදාළ රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමානතා	1	105,600,505	100,784,050
ලැබිය යුතු ණය - වසරක් ඇතුළත	2	4,918,068	4,708,464
ආයෝජන - වසරක් ඇතුළත කල් පිරුණු	1.1	1,318,618,278	1,083,916,289
වෙනත් ලැබිය යුතු දේ සහ පෙර ගෙවීම්	3	9,557,251	12,989,215
ලැබිය යුතු පොලී	4	66,042,291	84,799,936
තොග ලේඛන	5	3,026,788	1,933,662
මුළු ජංගම වත්කම්		**1,507,763,181**	**1,289,131,617**
ජංගම නොවන වත්කම්			
ලැබිය යුතු ණය - වසරකට වැඩි	2	12,940,474	13,203,458
ආයෝජන - වසරකට පසු කල් පිරුණු	1.1	43,742,158	43,742,158
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	6	40,765,012	39,410,551
සිදු කෙරෙමින් පවතින ඉදිකිරීම් කටයුතු	7	42,343,666	17,877,561
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	8	1,396,658	2,119,153
දේපල, පිරියත හා උපකරණ	9	679,756,392	638,043,775
අස්පෘශ්‍ය වත්කම්	10	8,329,464	14,580,323
මුළු ජංගම-නොවන වත්කම්		**829,273,825**	**768,976,980**
මුළු වත්කම්		**2,337,037,006**	**2,058,108,596**
කොටස් සහ වගකීම්			
ජංගම වගකීම්			
උපචිත සහ අනෙකුත් ගෙවීම්	11	29,963,020	42,123,569
ණය හිමියන්		6,539,879	2,566,100

රඳවා තබා ගැනීම		1,913,877	5,942,150
විලම්බිත ආදායම	**12.1**	116,987,025	120,935,336
මුළු ජංගම වගකීම්		**155,403,801**	**171,567,155**
ජංගම නොවන වගකීම්			
විලම්බිත ආදායම	**12.2**	15,062,500	19,391,667
විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම - පාරිතෝෂිකය	**13**	103,156,667	112,819,428
මුළු ජංගම නොවන වගකීම්		**118,219,167**	**132,211,095**
මුළු වගකීම්		**273,622,967**	**303,778,250**
මුළු ශුද්ධ වත්කම් / කොටස්		**2,063,414,038**	**1,754,330,346**
රැස් කරගත් සංචිත සහ අරමුදල්			
රැස් කරගත් අරමුදල - ප්‍රාග්ධන	**14**	706,160,342	726,439,363
රැස් කරගත් අරමුදල - ජංගම	**15**	913,867,791	703,379,156
ව්‍යාපෘති ප්‍රදාන	**16**	12,226,200	5,792,698
කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලද දායකත්වය		8,155,714	8,155,714
ප්‍රත්‍යාගණන සංචිතය	**17**	131,897,080	45,930,497
සීමිත අරමුදල්	**18**	291,106,911	264,632,918
මුළු ශුද්ධ වත්කම් / කොටස්		**2,063,414,038**	**1,754,330,346**

.....
නියෝජ්‍ය මූල්‍යාධිකාරී

අංක 12 – 27 පිටුවල ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අංක 28- 56 පිටුවල සටහන්, මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයක් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින් සතු වගකීමකි. මෙම මූල්‍ය ප්‍රකාශන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී

....

නියෝජ්‍ය
අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ
2022 පෙබරවාරි 25 වන දින

6.4.4 මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය

දෙසැම්බර් 31න් අවසන් වූ වසර සඳහා	සටහන්	2021 රු.	2020 නැවත සඳහන් කර ඇත රු.
ආදායම			
විනිමය නොවන ගනුදෙනු මඟින් ලැබෙන ආදායම- ජංගම			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		392,180,000	357,880,000
ශිෂ්‍ය ශිෂ්‍යාධාර සඳහා ප්‍රදානය		4,946,100	4,402,400
විනිමය නොවන ගනුදෙනු මඟින් ලැබෙන ආදායම්වල එකතුව- ජංගම		***397,126,100***	***362,282,400***
විනිමය ගනුදෙනු මඟින් ලැබෙන ආදායම- ජංගම			
ජනනය කරන ලද ආදායම		45,114,079	33,299,211
පොලී ආදායම	27	6,104,264	3,971,048
වෙනත් ආදායම්	28	6,526,299	4,884,758

සැබෑ ලාභය		13,419,164	-
බැහැර කිරීමේ ලාභය		417,164	138,498
විස්තාරිත වැඩසටහන් මඟින් ලැබෙන ශුද්ධ ආදායම	29	126,840,148	107,454,083
ව්‍යාපෘති මඟින් ලැබෙන ශුද්ධ ආදායම	30	2,082,828	3,361,113
විනිමය ගනුදෙනු මඟින් ලැබෙන ආදායම්වල එකතුව- ජංගම		***200,503,946***	***153,108,711***
ආදායම් එකතුව - ජංගම		**597,630,046**	**515,391,111**
විනිමය නොවන ගනුදෙනු මඟින් ලැබෙන ආදායම- ප්‍රාග්ධන			
ප්‍රාග්ධන වියදම් සඳහා රජයේ ප්‍රදානය		60,000,000	23,000,000
ප්‍රාග්ධන වියදම් සඳහා ව්‍යාපෘති ප්‍රදානය		-	9,500
විනිමය නොවන ගනුදෙනු මඟින් ලැබෙන ආදායම්වල එකතුව- ප්‍රාග්ධන		***60,000,000***	***23,009,500***
විනිමය ගනුදෙනු මඟින් ලැබෙන ආදායම- ප්‍රාග්ධන			
ජනනය කරන ලද ආදායම		12,000,000	19,371,000
විනිමය ගනුදෙනු මඟින් ලැබෙන ආදායම්වල එකතුව- ප්‍රාග්ධන		***12,000,000***	***19,371,000***
ආදායම්වල එකතුව- ප්‍රාග්ධන		**72,000,000**	**42,380,500**
ආදායම්වල එකතුව		**669,630,046**	**557,771,611**
මෙහෙයුම් වියදම් - ජංගම			
පෞද්ගලික දීමනා	31	269,779,146	263,199,576
ගමනාගමන වියදම්	32	173,702	126,512
සැපයුම්	33	6,408,431	6,558,788
කොන්ත්‍රාත් සේවා	34	29,719,386	32,630,031
විශ්‍රාමික ප්‍රතිලාභ	35	56,584,275	52,853,604
වෙනත් පුනරාවර්තන වියදම්	36	13,809,787	14,164,039
මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම්		4,946,100	4,402,400
භාවිතයට නොගත් භාණ්ඩ - බැහැර කිරීම		139,461	-
අඩු මුදලට විකිණීම - මෘදුකාංග		6,181,485	-
ස්ථාවර භාණ්ඩ බැහැර කිරීම		2,730,344	-
මෙහෙයුම් වියදම් එකතුව - ජංගම		***390,472,118***	***373,934,949***
මෙහෙයුම් නොවන වියදම්			
ක්ෂය වීම් සහ ක්‍රමක්ෂය වියදම්	37	95,787,728	101,274,049
මෙහෙයුම් නොවන වියදම්වල එකතුව		**95,787,728**	**101,274,049**
මුළු වියදම්		**486,259,847**	**475,208,998**
මුළු අතිරික්තය / වසර සඳහා (හිඟය)		***183,370,199***	**82,562,613**
ජංගම අතිරික්තය/ වසර සඳහා (හිඟය)		**207,157,928**	**141,456,162**
ප්‍රාග්ධන අතිරික්තය / වසර සඳහා (හිඟය)		**(23,787,728)**	**(58,893,549)**

"ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි."

6.4.5 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය

2021 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	වැය නොකළ ප්‍රාග්ධන ප්‍රදාන	වැය කළ ප්‍රාග්ධන ප්‍රදාන	වැය නොකළ ව්‍යාපෘති ප්‍රදාන	වැය කළ ව්‍යාපෘති ප්‍රදාන	කොළඹ විශ්වවිද්‍යාලයෙන් ලද දායකත්වය	පොදු සංචිත	සමුච්චිත අරමුදල - වත්මන්	සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිතය	සීමිත අරමුදල්	එකතුව
	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්	රුපියල්
2020 ජනවාරි 01 දිනට ශේෂය	**1,668,491**	**800,886,824**	**9,389,299**	**8,425,828**	**8,155,714**	**537,273,315**	**-**	**-**	**35,505,497**	**246,464,503**	**1,647,769,471**
SLPSAS11 අනුව නැවත වර්ගීකරණය කිරීම සමුච්චිත අරමුදල - ප්‍රාග්ධනය	(1,668,491)	(800,886,824)	-	(8,425,828)	-	-	25,648,230	785,332,912	-	-	-
SLPSAS11 අනුව නැවත වර්ගීකරණය කිරීම සමුච්චිත අරමුදල - පුනරාවර්තන	-	-	-	-	-	(537,273,315)	537,273,315	-	-	-	-
පොලී ගැලපීම ලැබිය යුතු මුදල 2019										1,185,480	**1,185,480**
											-
2020 ජනවාරි 01 දිනට ශේෂය සකස් කර ඇත	**-**	**-**	**9,389,299**	**-**	**8,155,714**	**-**	**562,921,545**	**785,332,912**	**35,505,497**	**247,649,983**	**1,648,954,951**
වසර තුළ අනිරික්තය /(හිඟය)	-	-	-	-	-		141,456,162	(58,893,549)	-	-	**82,562,613**
වසර තුළ ලැබුණු ප්‍රදාන	-	-	2,100,000	-	-	-	-	-	-	-	**2,100,000**
වසර තුළ වියදම් නොකළ ප්‍රදානයෙන් අදායමට මාරු කළ	-	-	(5,696,601)		-	-	-	-	-	-	**(5,696,601)**

පූර්ව වර්ෂ ගැලපීම්	-	-	-	-	-		(998,551)	-	-	-	**(998,551)**
වසර තුළ මාරු කර ඇත	-	-	-	-	-	-	-	-	10,425,000	16,982,935	**27,407,935**
2020 දෙසැම්බර් 31 **දිනට ශේෂය**	**-**	**-**	**5,792,698**	**-**	**8,155,714**	**-**	**703,379,156**	**726,439,363**	**45,930,497**	**264,632,918**	**1,754,330,346**
වර්ෂය තුළ අතිරික්තය/ (හිඟය) වසර තුළ	-	-	-	-	-	-	207,157,928	(23,787,728)	-	-	**183,370,201**
වසර තුළ ලැබුණු ප්‍රදාන	-	-	8,788,468	-	-	-	-	-	-	-	**8,788,468**
වසර තුළ වියදම් නොකළ ප්‍රදානයෙන් අදායමට මාරු කළ	-	-	(2,354,966)	-	-	-	-	-	-	-	**(2,354,966)**
වසර තුළ මාරු කළ	-	-	-	-	-	-	-	-	92,805,995	26,473,994	**119,279,989**
නැවත තක්සේරු කිරීමේ සංචිතයෙන් සමුච්චිත අරමුදලට මාරු කිරීම - වත්මන්	-	-	-	-	-	-	3,330,706	-	(3,330,706)	-	-
සමුච්චිත අරමුදල් ප්‍රාග්ධනයට වෙන් කළ	-	-	-	-	-	-	-	3,508,706	(3,508,706)	-	-
2021 දෙසැම්බර් 31 **දිනට ශේෂය**	**-**	**-**	**12,226,200**	**-**	**8,155,714**	**-**	**913,867,791**	**706,160,342**	**131,897,081**	**291,106,911**	**2,063,414,038**

"ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි."

6.4.6 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වසර සඳහා	සටහන	2021 රු.	2020 නැවත සඳහන් කර ඇත රු.
මුදල් ප්‍රවාහ මඟින්/ මෙහෙයුම් ක්‍රියාකාරකම් (භාවිතා කළ)			
වර්ෂය සඳහා අතිරික්ත / (හිඟ)		183,370,199	82,562,613
ගැලපීම:			
ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් සඳහා		95,787,728	101,354,551
පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සඳහා		15,558,047	12,893,778
බැහැර කළ		3,844,841	-
දේපල, පිරියත හා උපකරණ අලෙවියෙන් ලද (ලාභය) / පාඩුව		6,086,328	(138,498)
පොලී ආදායම		(64,205,222)	(87,011,494)
විනිමය ලාභය / (අලාභය)		171,732	(291,501)
සැබෑ ලාභය / (අලාභය)		(13,419,164)	-
විගණන ගාස්තු ප්‍රතිපාදන		500,000	-
FD ආපසු ගැනීම් සඳහා ගාස්තු ඉවත් කිරීම		-	284,343
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		**227,694,490**	**109,653,793**
තොග ලේඛනවල වැඩි වීම/(අඩු වීම)		(1,232,586)	150,369
අන්තර් ඒකක ජංගම ගිණුම්වල (වැඩි වීම) / අඩු වීම		53,558,775	20,642,589
ලැබිය යුතු සහ පෙරගෙවුම්වල (වැඩි වීම) /අඩු වීම		2,460,946	(369,079)
කාර්ය මණ්ඩල ණය ලැබීමේ දී වැඩිවන / (අඩුවන)		53,379	(320,190)
ඉපයුමෙන් සහ වෙනත් ගෙවිය යුතු වැඩිවන / (අඩුවන)		(12,711,236)	(2,049,975)
අන්තර් ඒකක ජංගම ගිණුම්වල වැඩි වීම/ (අඩු කළ)		(53,558,776)	(20,642,589)
විලම්බිත ආදායමහි වැඩි වීම / (අඩු වීම)		(8,277,479)	71,842,252
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලින් පසු මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය		**207,987,514**	**178,907,170**
පාරිතෝෂිත සඳහා ගෙවීම්		(11,801,644)	(2,492,166)
සණසඋ ව්‍යාපෘතිය මඟින් ගෙවන ලද		-	(437,178)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත / (භාවිත) ශුද්ධ මූල්‍ය		**196,185,870**	**175,977,825**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් වූ (භාවිතා කළ) මුදල් ප්‍රවාහ			
දේපල, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම		(22,958,530)	(14,445,280)
සිදු වෙමින් පවතින - ඉදි කිරීම්		(45,525,433)	(23,754,698)
දේපල, පිරියත හා උපකරණ අලෙවියෙන් ලැබෙන ආදායම		712,203	224,599
ප්‍රාග්ධන වත්කම් වැඩි දියුණු කිරීම සහ පුනරුත්ථාපනය කිරීම		(4,586,474)	(3,384,986)
පොලියෙන් ලැබුණු		87,983,996	92,690,079
ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කළ අරමුදල්		(252,034,233)	(228,725,717)

ස්ථාවර තැන්පතු ආපසු ගැනීම		17,325,493	27,641,193
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත/ (භාවිත) ශුද්ධ මූල්‍ය		**(219,082,978)**	**(149,754,809)**

මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත/ (භාවිත) ශුද්ධ මූල්‍ය

ලැබුණු ව්‍යාපෘති ප්‍රදානයෙන් ආදායමට මාරු කළ		(2,354,966)	(5,696,601)
ලැබුණු ව්‍යාපෘති ප්‍රදාන		8,788,468	2,100,000
සීමිත අරමුදල්වලින් ශුද්ධ ලැබීම්/ගෙවීම්		21,451,792	6,279,149
ශුද්ධ මූල්‍ය උත්පාදනය / මූල්‍ය ක්‍රියාකාරකම්වලින් (භාවිතා කරන ලද)		**27,885,294**	**2,682,548**
මුදල් සහ මුදල් සමාන අගයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම		**4,988,186**	**28,905,565**
වර්ෂ ආරම්භයේ දී මුදල් සහ මුදල් සමාන දෑ		100,784,050	71,586,986
ලාභ / (අලාභ) හුවමාරුව ගැලපීම		(171,732)	291,501
වර්ෂ අවසානයේ දී මුදල් සහ මුදල් සමාන දෑ	**1**	**105,600,505**	**100,784,050**

"ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය කොටසකි."

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ ප්‍රතිපත්ති

1. වාර්තා කිරීමේ හැකියාව

1.1 නෛතික හා පිහිටීමේ ආකෘතිය

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය (UCSC) යනු කොළඹ විශ්වවිද්‍යාලයේ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක් වන අතර එය 2002 අංක 01 දරන UCSC ආඥා පනත යටතේ පිහිටුවන ලදුව අංක 35, රීඩ් මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ ක්‍රියාකාරිත්වයේ ස්වභාවය

අභ්‍යන්තර උපාධි, බාහිර උපාධි සහ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා දායකත්වය සැපයීම මෙන්ම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ පරිගණක ක්ෂේත්‍රයේ උපදේශන සැපයීම.

1.3 මූල්‍ය කාල සීමාව

කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයෙහි මූල්‍ය කාලය 2021 ජනවාරි 01 සිට 2021 දෙසැම්බර් 31 දක්වා මාස දොළහක කාලයක් නියෝජනය කරයි.

1.4 නිකුත් කිරීම සඳහා අවසර ලද දිනය

2022 පෙබරවාරි 24 වන දින පැවති කළමනාකරණ මණ්ඩලය විසින් මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීමට අවසර දෙන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

1.5.1 අනුකූලතා ප්‍රකාශය

ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට (SLPSASs) අනුකූලව පරිගණක අධ්‍යයනායතනයෙහි මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල මූලික වශයෙන් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශය, කොටස් වෙනස්වීම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවල සටහන් ඇතුළත් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී හා ඉදිරිපත් කිරීමේදී අදාළ වන ප්‍රධාන ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. වෙනත් ආකාරයකින් ප්‍රකාශ කොට නොමැති නම් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇති සියලුම කාල පරිච්ඡේදයන් සඳහා මෙම ප්‍රතිපත්ති නිරන්තරයෙන් අදාළ වේ.

1.5.2 මිනුම් කිරීමේ පදනම

අදාළ සටහන් මඟින් පැහැදිලි කර ඇති සාධාරණ වටිනාකම සම්බන්ධයෙන් යෝග්‍ය හෙළිදරව් කිරීම් හැරුණු විට ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.5.3 සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන කාලපරිච්ඡේදයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අවබෝධය වැඩි දියුණු කිරීම සහ සංසන්දනාත්මක බව වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රකාශනවල වාර්තා වී ඇති සියලුම මුදල් සඳහා පෙර කාල පරිච්ඡේදයට අදාළව ප්‍රමාණාත්මක, ආඛ්‍යාන හා විස්තරාත්මක තොරතුරු ඇතුළුව සංසන්දනාත්මක තොරතුරු අනාවරණය වේ.

මූල්‍ය ප්‍රකාශනවල අයිතම ඉදිරිපත් කිරීම හෝ වර්ගීකරණය සංශෝධනය කරන විට, නැවත වර්ගීකරණය ප්‍රායෝගික නොවන්නේ නම්, සංසන්දනාත්මක ප්‍රමාණයන් නැවත වර්ගීකරණය කරනු ලැබේ.

1.5.4 ක්‍රියාකාරී සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී හා ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වේ.

1.5.5 වටැයීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් අවසර දී ඇති පරිදි වෙනත් ආකාරයකින් දක්වා නොමැති නම්, මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණ ආසන්නතම රුපියලට වටැයීම සිදු කර ඇත.

1.5.6 සැලකිය යුතු ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන් සහ උපකල්පන

එස්.එල්.පී.එස්.ඒ.එස් (SLPSASs) යන සංකල්පයට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීමට කළමනාකරණය අවශ්‍ය වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම සහ වියදම් ප්‍රමාණය භාවිතයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සැකසීමට ය. මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතතාවයේ ප්‍රතිඵලයක් ලෙස අනාගත කාල පරිච්ඡේදයන් තුළ බලපෑමට ලක් විය හැකි වත්කම් හෝ වගකීම් සඳහා ද්‍රව්‍යමය ගැලපීම් අවශ්‍ය වන ප්‍රතිඵල ඇති විය හැකිය.

ඇස්තමේන්තු සහ යටි පෙළ උපකල්පන අඛණ්ඩ පදනමක් මත සමාලෝචනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සංශෝධන එම කාල සීමාවට පමණක් බලපාන්නේ නම් ඇස්තමේන්තුව සංශෝධනය කරන කාල සීමාව තුළ හෝ සංශෝධනය වත්මන් සහ අනාගත කාල පරිච්ඡේද දෙකටම බලපාන්නේ නම් සංශෝධන කාල සීමාව සහ අනාගත කාලසීමාවන් තුළ පිළිගනු ලැබේ.

1.5.7 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ය.

1.5.8 ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ඇස්තමේන්තුවල වෙනස්වීම්

UCSC ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්වීම්වල ප්‍රතිවිපාක පසුකාලීනව හඳුනාගෙන ඇත. කෙසේ වෙතත්, අතීත භාවිතය ප්‍රායෝගික නොවේ නම් ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්හි බලපෑම් අනාගතයට යොදා ගැනේ.

2. සුවිශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

2.1. වත්කම් සහ ඒවා තක්සේරුකරණයේ පදනම

2.1.1 දේපල, පිරියත හා උපකරණ

a. හඳුනාගැනීම සහ මිනුම් කිරීම

(I) හඳුනාගැනීමේ පදනම

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ UCSC වෙත ගලා ඒමට සම්භාවිතාවක් තිබේ නම් දේපල, පිරියත සහ උපකරණ හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

(II) මිනුම් කිරීමේ පදනම

සියලු දේපල,පිරියත සහ උපකරණ මූලිකව පිරිවැයෙහි වාර්තා වේ. පසුව,එය අඩු සමුච්චිත ක්ෂයවීම් හා හානිය සඳහා මනිනු ලැබේ. වත්කම්වල සැලකිය යුතු සංරචක වෙන් වෙන් වශයෙන් හඳුනාගෙන ක්ෂය කරනු ලැබේ.

b. පිරිවැය

දේපල.පිරියත සහ අනෙකුත් උපකරණවල පිරිවැය එහි මිලදී ගැනීමේ මිල සහ වත්කම අපේක්ෂිත භාවිතය සඳහා යෙදවිය හැකි තත්ත්වයට ගෙන ඒමට සෘජුවම ආරෝපණය කළ හැකි පිරිවැයකින් සමන්විත වේ. කලින් සඳහන් කළ පරිදි, එදිනෙදා සේවා සඳහා වන පිරිවැය, අඩු සමුච්චිත ක්ෂයවීම් හැර, දේපල,පිරියත සහ උපකරණවල පිරිවැයෙහි දක්වා ඇත.

පිළිගැනීමේ නිර්ණායක සපුරා ඇත්නම්, එකී පිරිවැයට දේපළ,පිරියත සහ උපකරණවලින් කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැයද ඇතුළත් වේ. දේපළ,පිරියත සහ උපකරණවල සැලකිය යුතු කොටස් වරින් වර ප්‍රතිස්ථාපනය කිරීමට අවශ්‍ය වූ විට, එවැනි කොටස් ආයතනය විසින් නිශ්චිත ප්‍රයෝජනවත් ජීව කාලයක් සහිත තනි වත්කම් ලෙස හඳුනාගෙන ඒ අනුව ඒවා ක්ෂය කරයි.

c.පසුකාලීන වියදම්

වත්කම්වල ඉපැයීමේ ධාරිතාව ඉදිරියට ගෙනයාම හෝ වැඩි කිරීම සඳහා ස්ථීර ස්වභාවයක වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා කරන ලද පසුකාලීන වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. ප්‍රධාන පරීක්ෂණ සහ අලුත්වැඩියා වියදම් ඇතුළුව වෙන වෙනම ගිණුම්ගත කර ඇති දේපල,පිරියත සහ අනෙකුත් උපකරණවල අංගයක් ප්‍රතිස්ථාපනය කිරීම සඳහා දරන වියදම ප්‍රාග්ධනීකරණය වේ. වෙනත් පසුකාලීන වියදමක් ප්‍රාග්ධනීකරණය කරනු ලබන්නේ අනාගත ආර්ථික ප්‍රතිලාභ විශ්වවිද්‍යාලය වෙත ගලා ඒමට ඉඩ ඇති නම් හා එහි පිරිවැය විශ්වසනීයව මැනිය හැකි වන්නේ නම් පමණි.

යම්කිසි ආයතනයක් දේපල,පිරියත සහ උපකරණවල භාණ්ඩයක් ප්‍රතිගෙන යාමේදී එම භාණ්ඩයේ එදිනෙදා සේවා සඳහා වන පිරිවැය හඳුනා නොගනී. ඒ වෙනුවට, මෙම පිරිවැය අතිරික්ත හෝ හිඟය ලෙස හඳුනා ගැනේ.

d. සාධාරණ වටිනාකම

විවිධ ප්‍රදාන යටතේ ලැබෙන වත්කම් සාධාරණ වටිනාකමකින් හඳුනාගෙන ඇත.

2.1.2 දේපල, පිරියත සහ අනෙකුත් උපකරණ හඳුනා නොගැනීම

දේපල,පිරියත සහ උපකරණ අයිතමයක් බැහැර කිරීමේදී හෝ එය භාවිතා කිරීමෙන් හෝ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට එය හඳුනා නොගනී. වත්කම හඳුනා නොගැනීමෙන් ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක් ශුද්ධ බැහැර කිරීමේ ආදායම සහ ප්‍රතිගෙන යන මුදල අතර වෙනස ලෙස ගණනය කොට වර්ෂයේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ඇතුළත් කර ඇති අතර, වත්කම හඳුනා නොගනී.

2.1.3 පුස්තකාල පොත්

පුස්තකාල පොත්වල මිල වසර පහක කාලයක් තුළ සරල රේඛා පදනම මත කපා හරිනු ලැබේ.

2.1.4 දේපල, පිරියත සහ උපකරණ නැවත තක්සේරු කිරීම

නැවත තක්සේරු කිරීමක ප්‍රතිඵලයක් ලෙස වත්කම් කාණ්ඩයක ප්‍රතිගෙන යා හැකි ප්‍රමාණය වැඩි වුවහොත්, එම වැඩිවීම නැවත තක්සේරු කිරීමේ අතිරික්තයට සෘජුවම බැර කළ යුතුය. කෙසේ වෙතත්, අතිරික්තය හෝ හිඟය තුළ කලින් හඳුනාගෙන ඇති වත්කම් කාණ්ඩයේම නැවත තක්සේරු කිරීමේ අඩුවීමක් ප්‍රතිවර්තනය කරන ප්‍රමාණයට වැඩි වීම අතිරික්ත හෝ හිඟය ලෙස හඳුනාගත යුතුය.

ප්‍රති තක්සේරුවක ප්‍රතිඵලයක් ලෙස වත්කම් කාණ්ඩයක රැගෙන යා හැකි ප්‍රමාණය අඩු වුවහොත්, අඩුවීම අතිරික්තයක් හෝ හිඟයක් ලෙස හඳුනාගත යුතුය. කෙසේ වෙතත්, එම අඩුවීම එම වත්කම් කාණ්ඩයට අදාළව නැවත තක්සේරු කිරීමේ අතිරික්තයේ පවතින ඕනෑම ණය ශේෂයක ප්‍රමාණයට නැවත තක්සේරු කිරීමේ අතිරික්තයට සෘජුවම හර කරනු ලැබේ. බැහැර කිරීමෙන් පසු, විකුණනු ලබන නිශ්චිත වත්කමට අදාළ ඕනෑම ප්‍රති තක්සේරු සංචිතයක් රඳවා ගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

2.1.4.1 2021 වර්ෂය තුළ නැවත තක්සේරු කිරීම

2021 වර්ෂය තුළ UCSC අධ්‍යක්ෂතුමන් විසින් අභ්‍යන්තරව පත් කරන ලද නැවත ඇගයීම් කමිටු පහක් විසින් එහි විවිධ මාදිලියේ පරිගණක සහ ජාල උපකරණ, විද්‍යාගාර සහ ස්ටුඩියෝ උපකරණ, ගෘහ භාණ්ඩ සහ උපාංග, කාර්යාල උපකරණ, විදුලි සහ නඩත්තු උපකරණ නැවත ඇගයීමක් සිදු කරයි.

අදාළ කමිටු නැවත ඇගයීම සම්පූර්ණ කර, ඔවුන්ගේ වාර්තා ඉදිරිපත් කළ අතර, නැවත ඇගයීමේ බලපැවැත්වෙන දිනය 2021 දෙසැම්බර් 31 දින විය. 2021 වර්ෂය තුළ, දේපල සහ උපකරණ නැවත ඇගයීම මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගන්නා ලදී.

2.1.5 ක්ෂයවීම

සියලු දේපල,පිරියත සහ උපකරණ ක්ෂයවීම් එවැනි වත්කම්වල ඇස්තමේන්තුගත ප්‍රයෝජනවත් ආයු කාලය තුළ සරල රේඛීය පදනමක් මත හඳුනා ගැනේ. ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS7) අනුව, භාවිතය සඳහා පවතින විට සියලු වත්කම් ක්ෂය වීමත් වත්කම් හඳුනා නොගත් විට වත්කම් ක්ෂය වීම නතර වීමත් සිදු වේ. වත්කම් මිලදී ගත් දිනය නොදන්නේ නම්, අත්පත් කරගත් වත්කම්වල මුළු වසර සඳහා හෝ අත්පත් කරගත් වත්කම්වල මෑත මාසය මත පදනම්ව ක්ෂයවීම සපයනු ලැබේ. වාර්ෂික ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ. රජය හෝ වෙනත් අදාළ ප්‍රදාන අදාළ වත්කමේ ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්‍රමක්ෂ කර ඇත.

විස්තරය	වර්ෂයක් සඳහා වන අනුපාතය
ගොඩනැගිලි සහ පුනරුත්ථාපන	5%
කාර්යාල උපකරණ	20%
විද්‍යාගාර, මැදිරි සහ ඉගැන්වීමේ උපකරණ	20%
පරිගණක හා ජාල උපකරණ	20%
විදුලි සහ නඩත්තු උපකරණ	20%
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	10%
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	20%
මෝටර් වාහන	20%
විදුලිය	10%
ජලය	10%

2.1.6 ස්ථාවර වත්කම් ලේඛනය ප්‍රතිව්‍යුහගත කිරීම

UCSC අධ්‍යක්ෂ විසින් පත් කරන ලද අභ්‍යන්තර කමිටුවක් මඟින් කළමනාකරණ මණ්ඩලයෙහි අනුමැතිය සහිතව UCSC ස්ථාවර වත්කම් ලේඛනය (FAR) ප්‍රති ව්‍යුහගත කරන ලදි.කමිටුව පැවරුම සම්පූර්ණ කළ අතර එබැවින්, දේපල සැලැස්මෙහි යම් යම් කාණ්ඩ සහ උපකරණ වඩාත් විචක්ෂණශීලී වත්කම් වර්ගීකරණය සඳහා 2021 වර්ෂයෙහි සිට බලපැවැත්වෙන පරිදි වෙනස් කර ඇත.

එමනිසා, කාර්යාල උපකරණ, විද්‍යාගාර සහ ඉගැන්වීම් උපකරණ, ගෘහ භාණ්ඩ හා සවි කිරීම් යනාදියෙහි පූර්ව කාණ්ඩ කාර්යාල උපකරණ, විද්‍යාගාර, ස්ටූඩියෝ සහ ඉගැන්වීම් උපකරණ, ගෘහ භාණ්ඩ සහ සවි කිරීම්, පරිගණක හා ජාල උපකරණ සහ විදුලි සහ නඩත්තු උපකරණ පහත පරිදි වසර තුළ දී නැවත වර්ගීකරණය කර ඇති අතර අනිකුත් කාණ්ඩ වෙනස් නොවී එසේම පවති.

නැවත වර්ගීකරණයට පෙර කාණ්ඩ	නැවත වර්ගීකරණයට පසු කාණ්ඩ
කාර්යාල උපකරණ	කාර්යාල උපකරණ
විද්‍යාගාර සහ ඉගැන්වීමේ උපකරණ	විද්‍යාගාර, මැදිරි සහ ඉගැන්වීමේ උපකරණ
ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්
-	පරිගණක හා ජාල උපකරණ
-	විදුලි සහ නඩත්තු උපකරණ
ගොඩනැගිලි සහ පුනරුත්ථාපන	ගොඩනැගිලි සහ පුනරුත්ථාපන
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන
මෝටර් වාහන	මෝටර් වාහන
විදුලි සම්බන්ධතාවය	විදුලි සම්බන්ධතාව
ජල සැපයුම් පද්ධතිය	ජල සැපයුම් පද්ධතිය

2.1.7 ක්‍රියාත්මක වන ප්‍රාග්ධන කටයුතු

මේ වන විට සිදු කෙරෙන ප්‍රාග්ධන කටයුතු පිරිවැයෙන් දක්වා ඇත. මේවා ප්‍රාග්ධනීකරණය අපේක්ෂාවෙන් තිබෙන දේපල,පිරියත සහ උපකරණ ඉදිකිරීමේදී සෘජුවම දරන ලද ප්‍රාග්ධන ස්වභාවයේ වියදම් වේ. ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන කටයුතු, භාවිතය සඳහා සුදුසු විට, එනම් එය UCSC විසින් අදහස් කරන ආකාරයට ක්‍රියාත්මක වීමට අවශ්‍ය ස්ථානයේ සහ තත්වයේ පවතින විට, දේපල,පිරියත සහ උපකරණවල අදාළ වත්කම් කාණ්ඩයට මාරු කරනු ලැබේ.

2.1.8 අස්පෘශ්‍ය වත්කම්

අත්පත් කරගත් පරිගණක මෘදුකාංග අත්පත් කර ගැනීම සහ භාවිතයට ගෙන ඒම සඳහා දරන ලද පිරිවැය මත ප්‍රාග්ධනීකරණය කරනු ලැබේ. මෙම වියදම් ඔවුන්ගේ ඇස්තමේන්තුගත වසර පහක (05) ප්‍රයෝජනවත් ආයු කාලය මත ක්ෂය කරනු ලැබේ. පරිගණක මෘදුකාංග වැඩසටහන් නඩත්තු කිරීම හා සම්බන්ධ පිරිවැය දරනු ලබන වියදමක් ලෙස හඳුනා ගැනේ

විස්තරය	වර්ෂයක් සඳහා වන අනුපාතය
පරිගණක මෘදුකාංග	20%

UCSC විසින් පාලනය කරනු ලබන හඳුනාගත හැකි සහ අනන්‍ය මෘදුකාංග නිෂ්පාදන සමඟ සෘජුව සම්බන්ධ වන පිරිවැය පහත සඳහන් නිර්ණායක සපුරාලන විට අස්පෘශ්‍ය වත්කම් ලෙස පිළිගැනේ:

1. මෘදුකාංග නිෂ්පාදන සම්පූර්ණ කිරීම සඳහා එය තාක්ෂණික වශයෙන් ශක්‍ය වන බැවින් එය භාවිත කිරීමට හැකි වනු ඇත.

2. මෘදුකාංග නිෂ්පාදනය සම්පූර්ණ කර එය භාවිතා කිරීමට කළමනාකරණය අදහස් කරයි;

3.මෘදුකාංග නිෂ්පාදනය භාවිත කිරීමට හැකියාවක් ඇත;

4. මෘදුකාංග නිෂ්පාදනය අනාගත ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය කරන්නේ කෙසේද යන්න එමගින් නිරූපණය කළ හැකිය;

5.සංවර්ධනය සම්පූර්ණ කිරීමට සහ මෘදුකාංග නිෂ්පාදනය භාවිත කිරීමට ප්‍රමාණවත් තාක්ෂණික, මූල්‍ය සහ වෙනත් සම්පත් පවතින අතර;

6.. මෘදුකාංග නිෂ්පාදනයේ සංවර්ධනය අතරතුර එයට ආරෝපණය කළ හැකි වියදම් විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

මෘදුකාංග නිෂ්පාදනයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කරන ලද සෘජුව ආරෝපණය කළ හැකි පිරිවැයට මෘදුකාංග සංවර්ධන සේවක පිරිවැය සහ අදාළ පොදු කාර්යවල යෝග්ය කොටසක් ඇතුළත් වේ.

2.1.8.1 2021 වසර තුළ අස්පෘශ්‍ය වත්කම් සමාලෝචනය

2021 වර්ෂය තුළ දී, UCSC අධ්‍යක්ෂ විසින් UCSC අස්පෘශ්‍ය වත්කම් සමාලෝචනය සඳහා සහ ක්ෂය වීමේ කාලය සහ ඒවායේ ක්ෂය වීමේ

ක්‍රමය සමාලෝචනය කිරීම සඳහා අභ්‍යන්තර කමිටුවක් පත් කර ඇත. කමිටු සමාලෝචනය සිදු කර 2021 ජූලි මස 01 දින බලපැවැත්වන දිනය ලෙසට සඳහන් කරමින් එහි වාර්තාව ඉදිරිපත් කළේ ය. 2021 වර්ෂය තුළ, අස්පෘශ්‍ය වටිනාකම් සමාලෝචන කමිටු නිර්දේශ මූල්‍ය ප්‍රකාශනවල පිළිගෙන ඇත.

2.1.9. තොග

තොග, පිරිවැය අනුව තක්සේරු කර ඇති අතර පිරිවැය තීරණය කරනු ලබන්නේ ෆිෆෝ (FIFO) ක්‍රමය මතය. තොග අත්පත් කර ගැනීම සහ ඒවායේ පවතින ස්ථානයට සහ තත්ත්වයට ගෙන ඒම සඳහා දරන ලද වියදම් පිරිවැයට ඇතුළත් වේ. UCSC හි බඩු තොගයට ලිපි ද්‍රව්‍ය, පරිභෝජන ද්‍රව්‍ය සහ නඩත්තු අයිතම ඇතුළත් වේ. විනිමය නොවන ගනුදෙනුවක් හරහා තොග අත්පත් කර ගන්නා විට, ඒවායේ පිරිවැය අත්පත් කරගත් දිනට ඒවායේ සාධාරණ වටිනාකමින් මනිනු ලැබේ.

2.1.10 මුදල් සහ මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් සමාන දෑ අර්ථ දැක්වෙන්නේ දන්නා මුදල් ප්‍රමාණයන්ට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකම් වෙනස් වීමේ සුළු අවදානමකට යටත් වන අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහළ ද්‍රවශීල ආයෝජන ලෙසිනි. මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා මුදල් හා සමාන දෑ අතේ ඇති මුදල්, බැංකුවල තැන්පතු සහ බැංකු අයිරා වලින් සමන්විත වේ. කෙටි කල්පිරීම් සහිත ආයෝජන, එනම් අත්පත් කර ගත් දින සිට මාස තුනක් හෝ ඊට අඩු ආයෝජන මුදල් සමාන දෑ ලෙස සලකනු ලැබේ.

3. වගකීම් සහ ප්‍රතිපාදන

3.1.1 වගකීම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කරන දිනය වන විට දන්නා සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අතර පවතින බව දන්නා නමුත් එම ප්‍රමාණය නිවැරදිව තීරණය කළ නොහැකි වගකීම් සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන සලසා ඇත.

ඉල්ලුමට අනුව හෝ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය කළ දින සිට වසරක් ඇතුළත ගෙවිය යුතු බැඳීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ජංගම වගකීම් ලෙස සලකනු ලැබේ. මූල්‍ය තත්ත්වය ප්‍රකාශ කළ දින සිට වසරකට පසු ගෙවිය යුතු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම නොවන වගකීම් ලෙස සලකනු ලැබේ.

3.1.2 අනිශ්චිත වගකීම්

UCSC විසින් අවිනිශ්චිත වගකීම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා විභවයන් මූර්තිමත් කරන සම්පත් පිටතට ගලා යාමේ හැකියාව දුරස්ථ නොවේ නම් මිස, මූල්‍ය ප්‍රකාශන වෙත සටහන්වල ඇති කිසියම් හදිසි අවස්ථා හෙළි කරනු ලැබේ.

3.1.3 ප්‍රතිපාදන

අතීත කටයුත්තක ප්‍රතිඵලයක් ලෙස ආයතනයට වගකීමක් ඇති අවස්ථාවකදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ප්‍රතිපාදනයක් හඳුනාගනු ලැබේ. වගකීම පියවීම සඳහා වත්කම් පිටතට ගලා යාමක් අවශ්‍ය විය හැකි අතර වගකීම විශ්වසනීයව මැනිය හැකිය. එමෙන්ම ප්‍රතිඵලය අවිනිශ්චිත බැවින් නඩු පැවරීමෙන් පැන නගින වගකීම් සම්බන්ධයෙන් ගිණුම්වල කිසිදු ප්‍රතිපාදනයක් ලබා දී නොමැත.

3.1.4 විලම්බිත ආදායම

පාඨමාලා හා අධ්‍යයන වැඩසටහන්වලට අදාළ ආදායම ලැබුණු විට විලම්බිත ආදායම් ප්‍රතිඵල පාඨමාලා ආරම්භයේදීම ලබා ගන්නා අතර එහිදී පාඨමාලා ලබා දීම මාස කිහිපයක්/වසර ගණනාවක් පුරා සිදුවේ. කාර්තුමය පදනමින් පාඨමාලා ලබා දීමේ ප්‍රමාණයට මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය තුළ විලම්බිත ආදායම හඳුනාගෙන ඇති අතර ඉතිරි පාඨමාලා කාලසීමාවට ආරෝපණය කළ හැකි ශේෂය ආදායම හඳුනා ගන්නා තෙක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය මත වගකීමක් ලෙස පිළිගැනේ.

3.1.5 සේවක ප්‍රතිලාභ

a. සේවක අර්ථ දක්වා ඇති ප්‍රතිලාභ සැලැස්ම - පාරිතෝෂිකය

නිර්වචනය කරන ලද ප්‍රතිලාභ සැලැස්ම යනු නිර්වචනය කළ දායක සැලැස්මක් හැරුණු කොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. ප්‍රක්ෂේපිත ඒකක ක්‍රෙඩිට් (PUC) ක්‍රමය භාවිතයෙන් නිර්වචනය කරන ලද ප්‍රතිලාභ ස්වාධීන ක්‍රියාකාරකයක් මඟින් ගණනය කෙරේ.

අනුමත කරන ලද SLPSAS හේතුවෙන් රාජ්‍ය ප්‍රදාන ක්ෂය කිරීම් ඉවත් කිරීම	(63,775,210.77)
EDC ශුද්ධ අනිරික්තයෙන් BIT සංවර්ධන අරමුදලේ පොළී ආදායම ඉවත් කිරීම	(158,219.18)
eLC ශුද්ධ අනිරික්තයෙන් හොඳම ඉ-ලර්නර් අරමුදලේ පොළී ආදායම ඉවත් කිරීම	(6,768. 54)
අනුමත කරන ලද SLPSAS 11 හේතුවෙන් ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් ඉවත් කිරීම	101,274,049.03
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නැවත සඳහන් කිරීමෙන් පසු සකස් කරන ලද වර්තමාන අනිරික්තය	**141,456,162.49**
ලැබූ ප්‍රාග්ධන ප්‍රදාන	23,009,500.00
ප්‍රාග්ධනය සඳහා සාමාන්‍ය අරමුදල	19,371,000.00
ක්ෂයවීම් සහ ක්ෂය කිරීම් වියදම් සඳහා ගැලපීම	(101,274,049.03)
මුළු ශුද්ධ අනිරික්තය	**(58,893,549.03)**
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නැවත සඳහන් කිරීමෙන් පසු සකස් කරන ලද වර්තමාන අනිරික්තය	**141,456,162.49**
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වර්තමාන අනිරික්තය	**(58,893,549.03)**
2020.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුළු අනිරික්තය	**82,562,613.46**

2020 වර්ෂය සඳහා වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය යටතේ රු. 82,562,613.46 ලෙස වෙනස් කළ අතර ඉහත නැවත සඳහන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් රු. 63,775,211ක රාජ්‍ය ප්‍රදාන ක්ෂය කිරීම් ඉවත් කර ඇත. ඊට අමතරව, රු. (689,268)ක ලැබීම් සහ පෙර ගෙවීම් (වැඩි වීම්)/ අඩු වීම්, ලැබීම සහ පෙර ගෙවීම් (වැඩි වීම්)/ අඩු වීම් සහ කාර්ය මණ්ඩල

ණය ලැබීම් (වැඩි වීම්)/ අඩු වීම් පිළිවෙලින් (369,079) සහ (320,190) ලෙස බෙදා දැක්විණි. එමෙන්ම, රු. 30,000.00ක ශිෂ්‍යත්ව අරමුදල් දෝෂ නිවරදි කිරීමිහි ප්‍රතිඵලයක් ලෙස සීමා කරන ලද අරමුදල්වල ශුද්ධ ලැබීම් රු. 6,249,149 සිට රු. 6,279,149 දක්වා වැඩි විය.

මූල්‍ය ප්‍රකාශන සටහන්

සටහන 26 තිරසාර සංවර්ධන අභිමතාර්ථ හෙළිදරව් කිරීම

26.1 තිරසාර සංවර්ධන න්‍යාය පත්‍රය අභිමතාර්ථය අංක 01. දරිද්‍රතාවය තුරන් කොට මූලික අවශ්‍යතා සපුරාලයි. මෙම අභිමතාර්ථය සපුරා ගැනීම සඳහා මහපොළ භාරකාර අරමුදල මඟින් උපාධි අපේක්ෂකයින් 275 දෙනෙකු සඳහා රු. මිලියන 9.97ක ශිෂ්‍යත්ව පිරිනමනු ලැබිණි. 2021 වසරේ අඩු ආදායම් මට්ටමේ සිටි උපාධි අපේක්ෂකයින් 164 දෙනෙකු සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් මිලියන 4.9ක ශිෂ්‍යාධාර ප්‍රදානය කරන ලද අතර UCSC විසින් උපාධි අපේක්ෂකයින් සඳහා රුපියල් මිලියන 1.4ක ශිෂ්‍යත්ව 26ක් ප්‍රදානය කරන ලදී.

26.2 UCSC කාර්ය මණ්ඩලයට යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම ලබා දීම සඳහා රු. මිලියන 7.3ක වියදමින් 2021 වසරේ මෙම වැඩසටහන ආරම්භ කරන ලද අතර කාර්ය මණ්ඩල වෛද්‍ය සුඛසාධන යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ ලැබූ සේවක සංඛ්‍යාව 125 කි. මෙය තිරසාර සංවර්ධන න්‍යාය පත්‍ර අභිමතාර්ථ අංක 03, යහපත් සෞඛ්‍ය සහ යහපැවැත්ම ආවරණය කරයි. The staff

26.3 සාර්ථක තිරසාර සංවර්ධන න්‍යාය පත්‍ර අභිමතාර්ථය අංක 08 යහපත් වැඩ සහ ආර්ථික වර්ධනය වෙනුවෙන් ආර්ථිකය උත්තේජනය කිරීම සඳහා මිනිසුන්ට යහපත් රැකියා අවස්ථා අවශ්‍ය වේ. ඒ අනුව, 2021 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනය රටේ තරුණ තරුණියන් 998 දෙනෙකු සඳහා උසස් අධ්‍යාපනය ලබා දුන් අතර UCSC විසින් සිසුන් 13 දෙනෙකුට රුපියල් 459,615ක සාමාන්‍යයක් ආයෝජනය කර ඇත.

26.4 තරුණයින් සඳහා හොඳ ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ UCSC තිරසාරභාවය මඟින් ජාත්‍යන්තර සහය සහ සහයෝගීතාවය හරහා ගුරු පුහුණුව සඳහා පහසුකම් සැලසීමෙන් මනා සුදුසුකම් ලත් ගුරුවරුන් වැඩි දියුණු කිරීම. 2021 දී UCSC විසින් පර්යේෂණ කටයුතු සඳහා රු. මිලියන 7.39ක් වැය කොට තිබේ. මෙමඟින් තිරසර සංවර්ධන න්‍යාය පත්‍ර අභිමතාර්ථ අංක 04, ගුණාත්මක අධ්‍යාපනය ආවරණය කරයි.

26.5 තරුණයින් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීම සහ UCSC තිරසාරභාවය ලබා දීම සඳහා එහි යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම සහ දැනට පවතින ගොඩනැගිලි, පහසුකම් යනාදිය ප්‍රතිසංස්කරණය කිරීම. ඒ අනුව UCSC විසින් වර්ෂය තුළ රු. මිලියන 73.17 ප්‍රතිසංස්කරණය සහ අනෙකුත් යටිතල පහසුකම් සඳහා වැය කොට ඇත. මෙය තිරසාර සංවර්ධන න්‍යාය පත්‍ර අභිමතාර්ථය අංක 04, ගුණාත්මක අධ්‍යාපනය ද ආවරණය කරයි.

මූල්‍ය ප්‍රකාශන සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු.	2020 නැවත සඳහන් කරන ලද රු.
සටහන 27 පොලී ආදායම		
ණය සහ අත්තිකාරම් සඳහා පොලී	737,385	728,523
ආයෝජන සඳහා පොලී	2,562,548	1,032,542
එක රැයක රෙපෝ පොලී ආදායම	2,804,331	2,209,983
එකතුව	**6,104,264**	**3,971,048**
සටහන 28 වෙනත් ආදායම්		
වෙනත් විවිධ ලැබීම්	470,897	377,545
තේරීම් පරීක්ෂණ ගාස්තු	1,924,069	2,437,000
උපාධි අපේක්ෂක ලියාපදිංචිය සහ හැඳුනුම්පත් ගාස්තු	687,700	629,200
පුස්තකාල දඩය	1,984	5,913
සහතික ගාස්තුව	1,126,714	567,724
විභාග ගාස්තු	37,475	22,375
පුස්තකාල ගාස්තුව	519,000	438,000
පාඨමාලා ගාස්තුව - විදේශ	1,183,260	-
සැපයුම්කරු ලියාපදිංචි කිරීමේ ගාස්තුව	271,700	328,000
ආපසු නොගෙවන ලංසු තැන්පතු	303,500	79,000
එකතුව	**6,526,299**	**4,884,758**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු	2020 නැවත සඳහන් කරන ලද රු

සටහන 29 විස්තාරිත පාඨමාලාවලින් ලද ශුද්ධ ආදායම

පශ්චාත් උපාධි වැඩසටහන -(PG)	67,904,573	78,868,174
බාහිර උපාධි මධ්‍යස්ථානය -(EDC)	52,576,844	12,635,134
පරිගණක සේවා මධ්‍යස්ථානය-(CSC)	491,890	913,708
විද්‍යුත්-ඉගෙනුම් මධ්‍යස්ථානය -(eLC)	5,907,792	14,232,714
උසස් ඩිජිටල් මාධ්‍ය තාක්ෂණ මධ්‍යස්ථානය -(ADMTC)	(40,951)	804,353
විස්තාරිත පාඨමාලාවල අතිරික්තය	**126,840,148**	**107,454,083**

මූල්‍ය ප්‍රකාශන සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු.	2020 නැවත සඳහන් කරන ලද රු.

සටහන 30 ව්‍යාපෘතිවලින් ලද ශුද්ධ ආදායම

පොදු ව්‍යාපෘති	1,597,212	2,579,148
ICTer සම්මන්ත්‍රණය	485,616	781,965
ව්‍යාපෘතිවලින් ලද අතිරික්තය	**2,082,828**	**3,361,113**

F දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු	2020 රු

සටහන 31 පෞද්ගලික දීමනා

වැටුප් සහ වේතන	127,210,091	124,228,348
වෙනත් දීමනා	1,877,962	2,823,502
අධ්‍යයන දීමනා	72,910,264	68,873,964
විශේෂ දීමනා	16,671,927	15,984,994
පර්යේෂණ දීමනාව	16,892,109	17,831,886
ජීවන වියදම් දීමනාව	16,643,370	16,007,933
අතිකාල සහ නිවාඩු ගෙවීම්	**1,910,294**	2,346,230
මාසික වන්දි දීමනාව (MCA)	**15,663,129**	15,102,719
එකතුව	**269,779,146**	**263,199,576**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු.	2020 රු.

සටහන 32 ගමනාගමන වියදම්

ගමනාගමන වියදම් - දේශීය	173,702	126,512
ගමනාගමන වියදම් - විදේශීය	-	-
එකතුව	**173,702**	**126,512**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු	2020 රු

සටහන 33 සැපයුම්

ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා	5,622,319	5,987,937
ඉන්ධන සහ ලිහිසි තෙල්	674,302	425,462
නිල ඇඳුම් සහ මැහුම් ගාස්තු	10,800	5,400
යාන්ත්‍රික සහ විදුලි භාණ්ඩ	101,010	139,989
එකතුව	**6,408,431**	**6,558,788**

මූල්‍ය ප්‍රකාශන සටහන්

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු.	2020 රු.

සටහන 34 කොන්ත්‍රාත් සේවා

නඩත්තු - වාහන	442,872	356,704
නඩත්තු - දේපල, පිරියත හා උපකරණ	2,874,331	3,404,033
නඩත්තු - ගොඩනැගිලි සහ ව්‍යුහයන්	578,938	371,785
නඩත්තු - වෙනත්	150,809	43,585
සන්නිවේදන සේවා	9,238,842	9,327,182
විදුලි සේවා	7,892,107	9,618,889
මුද්‍රණය සහ ප්‍රචාරණය	998,449	1,411,052
පිරිසිදු කිරීමේ සේවා	5,089,954	6,068,672
ආරක්ෂක සේවා	2,256,693	1,782,274
ජලය	165,515	220,401
කුලී සහ කුලී ගාස්තු	14,750	5,000
රක්ෂණ සහ බලපත්‍රය	16,128	20,452
එකතුව	**29,719,386**	**32,630,031**

සටහන 35 විශ්‍රාමික ප්‍රතිලාභ

විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල	24,675,534	24,141,655
සේවක භාර අරමුදල	6,878,722	6,644,812
සේවක අර්ථසාධක අරමුදල	287,468	584,518
විශ්‍රාම වැටුප්	9,184,504	8,588,840
පාරිතෝෂික	15,558,047	12,893,778
එකතුව	**56,584,275**	**52,853,604**

දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 Rs	2020 Rs
දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වසර සඳහා	2021 රු.	2020 Rsරු.
නිවාඩු වරෙන්තුව සහ වාර ප්‍රවේශපත්‍ර	132,480	205,790
විශේෂ සේවා	1,443,427	1,018,178
කමිටුව සහ සභාව	1,260,500	782,655
පුවත්පත් සහ වාර සඟරා	23,190	70,150
ශිෂ්‍ය සුබසාධනය	196,000	-
සේවක සුබසාධනය	183,701	-
විගණන ගාස්තු	550,000	1,434,400
විනෝදාස්වාද වියදම්	495,230	955,107
නේවාසිකාගාරය - වියදම්	107,371	244,323
නේවාසිකාගාරය - කුලී	2,641,500	2,450,625
බාහිර කථිකාචාර්ය ගාස්තු	567,000	882,073
අනුපාත සහ බදු	69,724	147,396
අනුග්‍රහ, දායකත්ව, සහ සාමාජික ගාස්තු	140,000	147,522
කාර්ය මණ්ඩල සංවර්ධනය	547,000	181,200
ස්ථාවර නොවන වත්කම් බැහැර කිරීම	-	12,816

මූල්‍ය ප්‍රකාශන සටහන්

දේපල ණය පොලී	113,831	133,577
බැංකු ගාස්තු	12,150	8,453
බැංකු කොමිස් ගාස්තු	27,390	-
විභාග වියදම්	4,429,940	5,179,178
සම්මාන සහ වන්දි	89,600	15,000
වැඩමුළු සහ සම්මන්ත්‍රණ	627,385	17,500
උපදේශන ගාස්තුව	-	50,000
තැපැල් ගාස්තු	152,369	146,130
තත්ත්ව ආරක්ෂණ වියදම්	-	81,965
එකතුව	**13,809,787**	**14,164,039**

සටහන 37 ක්ෂයවීම් සහ ක්ෂය කිරීම්

ගෘහ භාණ්ඩ සහ සවිකිරීම්	5,045,995	5,789,092
විද්‍යාගාර, මැදිරි සහ ඉගැන්වීමේ උපකරණ	8,982,431	24,595,567
කාර්යාල උපකරණ	13,184,942	29,791,480
විදුලි සම්බන්ධතාව	2,402,336	2,402,336
ජල සැපයුම් පද්ධතිය	2,280,840	2,280,840
පරිගණක සහ ජාල උපකරණ	26,523,394	-
විදුලි සහ නඩත්තු උපකරණ	935,980	-
පුස්තකාල පොත් සහ වාර ප්‍රකාශන	723,995	713,708
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම	3,232,013	3,067,665
රථ වාහන	2,290,000	600,000
ගොඩනැගිලි	28,103,434	27,217,786
	93,705,361	**96,458,473**
මෘදුකාංග ක්ෂය කිරීම්	2,082,367	4,815,576
එකතුව	**95,787,728**	**101,274,049**

7. 2021 වසරේ කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ විශේෂ අවස්ථා – දෘශ්‍යතාව, සිදුවීම් සහ ක්‍රියාකාරකම්

7.2021 වසරේ UCSC ආයතනයේ විශේෂ අවස්ථා – දෘශ්‍යතාව, සිදුවීම් සහ ක්‍රියාකාරකම්

ආයතනයෙහි විශේෂ ක්‍රියාකාරකම් සන්නිවේදනයේ ප්‍රධාන ක්‍රමවේදය වන්නේ UCSC වෙබ් අඩවියයි. කොළඹ විශ්වවිද්‍යාලයේ ප්‍රධාන තේමාව සැලකිල්ලට ගනිමින් 2021 වර්ෂයේදී කොළඹ විශ්වවිද්‍යාලයීය පරිගණක අධ්‍යයනායතනයේ වෙබ් පිටුව තවදුරටත් වැඩි දියුණු වී තිබේ. එයට URL ද්විත්වයක් හඳුන්වා දී ඇත, එනම් http://www.ucsc.cmb.ac.lk සහ http://www.ucsc.lk වේ. ආයතනවල ප්‍රගතිය සහ ගැටලු පිළිබඳ පාරදෘශ්‍ය බව පවත්වා ගැනීම සඳහා මාසිකව සිදුවන සියලුම ප්‍රධාන ක්‍රියාකාරකම් හා සිදුවීම් කළමනාකරණ මණ්ඩලයට සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සෙනෙට් සභාවට දන්වනු ලැබේ. සංවිධානයේ ක්‍රියාකාරකම් මහජනයාට යාවත්කාලීන කිරීම සඳහා (UCSC) විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවිය සමාජ ජාල සමඟ සම්බන්ධ වේ. ගෝලීය වසංගත තත්ත්වය හේතුවෙන් UCSCහි බොහෝ රැස්වීම්, දේශන සහ අනෙකුත් අධ්‍යයන කටයුතු සිදු කරන ලද්දේ "zoom" තාක්ෂණය භාවිත කරමිනි. එක් එක් මාසයට අදාළව 2021 වර්ෂයේ සිදු වූ විශේෂ අවස්ථා පහත වගුවේ දැක්වේ.

7.1 මාසික විශේෂ අවස්ථා - ක්‍රියාකාරකම්, සිදුවීම්, සහ වැඩසටහන්

මාසය	ක්‍රියාකාරකම්
2021 ජනවාරි	• 1 වැනි දින - අලුත් අවුරුදු සැමරුම් (මාර්ගගතව) • 16 වැනි දින – ෆ්ලටර් (Flutter) සමඟ දෙමුහුම් දුරකථන යෙදවුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම • 21 වැනි දින - කොළඹ විශ්වවිද්‍යාලයෙහි විද්‍යා හා කලා පීඨයට වසර 100ක් පිරීම නිමිත්තෙන් කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක කෞතුකාගාරය විවෘත කිරීමේ උත්සවය • 24 වැනි දින - උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණ සහ සංවර්ධන තාක්ෂණය සහ ජාවා යෙදුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව අවසන් කළ පිරිස සඳහා JavaSE මාර්ගගත ක්‍රමය භාවිත කරමින් සහතික පත් ප්‍රදානය කරන ලදී. • 27 වැනි දින - කොළඹ විශ්වවිද්‍යාලයෙහි වෛද්‍ය පීඨය සඳහා භාවනා වැඩසටහනක් පැවැත්වීමට පහසුකම් සැලසීය.
2021 පෙබරවාරි	• 5 වැනි දින - පශ්චාත් උපාධි වැඩසටහන සඳහා හොඳම කාර්ය සාධන සම්මාන සහ උපාධි පාඨමාලාවන්හි හොඳම දක්ෂතා දැක්වූ සිසුන් සඳහා පීඨ සම්මාන සහ අධ්‍යක්ෂගේ ලැයිස්තු සම්මාන ප්‍රදානය සඳහා මාර්ගගත සම්මාන උළෙල පැවැත්විණි. • 6 වැනි දින - JAVA SE භාවිතයෙන් JAVA යෙදුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව නිම කොට සහභාගිවූවන්ට සහතික 24ක් පිරිනමන ලදී. • 10 වැනි දින - කෞතුකාගාර උපහාර උළෙල සහ කොළඹ විශ්වවිද්‍යාලයේ පරිගණක කෞතුකාගාරය පිහිටුවීම සඳහා කෙටි කාලයක් තුළ තම සේවයයෙන් දායක වූ කාර්ය මණ්ඩලය වෙත සහතික පත් ප්‍රදානය කිරීම.

	• 13 වැනි දින - දෙමුහුම් දුරකථන යෙදවුම් පිළිබඳ කෙටි පාඨමාලාව සාර්ථකව අවසන් කළ පිරිසට සහතික 19ක් ප්‍රදානය කරන ලදී. • 21 වැනි දින - පරීක්ෂණ ස්වයංක්‍රීයකරණ රාමු භාවිතා කරමින් මෘදුකාංග තත්ත්ව සහතික කිරීම පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කිරීම වෙනත් කටයුතු • බාහිර උපාධි පාඨමාලාවේ අධ්‍යයන වාර විභාග කොළඹ, මහනුවර, ගාල්ල සහ යාපනය යන ප්‍රදේශවල පැවැත්විණි. • සීමාවාසිකයින් සහ ඔවුන්ගේ අදාළ අධීක්ෂකවරුන් සමඟ Zoom හරහා සීමාවාසික අධීක්ෂණය • දුරස්ථ පරීක්ෂක ප්‍රවේශයක් භාවිතා කරමින් eLC මගින් පැරණි විෂය නිර්දේශය මත පදනම් වූ FIT විද්‍යුත් පරීක්ෂණ පැවැත්වීම
2021 මාර්තු	• 3 වැනි දින - නව PABX පද්ධතිය පිළිබඳ වැඩමුළුව කාර්ය මණ්ඩලය සඳහා සාමාන්‍ය පරිශීලක පුහුණුව • 10 වැනි දින - අධ්‍යක්ෂ/UCSC විසින් CVCD රැස්වීමේදී "විශ්වවිද්‍යාල ප්‍රවේශලාභීන් සඳහා මාර්ගගත වැඩසටහන්" පිළිබඳ ඉදිරිපත් කිරීමක් කරන ලදී. • 14 වැනි දින - පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා තේරීම් පරීක්ෂණය - 2020/ 2021 බඳවා ගැනීම • 29 වැනි දින - UCSC ආයතනයෙහි කාර්ය මණ්ඩලය වෙත ගිනි පැනල ක්‍රියාකාරිත්වය පිළිබඳ පුහුණු සැසිය • අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා දෙවන අධ්‍යයන වාර විභාග වෙනත් කටයුතු • eLC මගින් පැරණි විෂය නිර්දේශය II කොටස සඳහා FIT විද්‍යුත්-පරීක්ෂණය පවත්වන ලදී • eLC වෙතින් නව විෂය නිර්දේශය සඳහා FIT විද්‍යුත්-පරීක්ෂණය පවත්වන ලදී • කොළඹ, මහනුවර, ගාල්ල සහ යාපනයේ බාහිර උපාධි වැඩසටහනේ අධ්‍යයන වාර විභාග
2021 අප්‍රේල්	• 5 වැනි දින – 9 වැනි දින - අවසන් වසර ව්‍යාපෘති ඇගයීම (ප්‍රථම උපාධි) • 7 වැනි දින - පර්යේෂණ සහ සංවර්ධන සහයෝගීතාව සඳහා SLT-Mobitel සමඟ අවබෝධතා ගිවිසුම අත්සන් කරන ලදී • 8 වැනි දින & 9 වැනි දින - UGC වෙතින් නව බඳවා ගැනීම් සඳහා උපාධි අපේක්ෂක ලියාපදිංචිය සිදු කරන ලදී (සිසුන් 350) • 10 වැනි දින & 11 වැනි දින - පශ්චාත් උපාධි පළමු වාර විභාග • 20 වැනි දින – 22 වැනි දින - උපාධි අපේක්ෂකයින් සඳහා කාර්මික ස්ථානගත කිරීම් වාචික පරීක්ෂණය (PDC) - මාර්ගගතව • 23 වැනි දින - - BIT උපාධි වැඩසටහනේ අවසන් වසර ව්‍යාපෘති ඇගයීම් ආරම්භ කරන ලද අතර ස්ථානීය ඇගයීම අත්හිටුවන ලදී. • 27 වැනි දින - 2019/2020 උපාධි අපේක්ෂක වැඩසටහනේ සමාරම්භය (මාර්ගගතව) වෙනත් කටයුතු • නව ප්‍රථම උපාධි සිසුන් සඳහා දිශානති වැඩසටහන (මාර්ගගතව) පවත්වන ලදී • 2021 අධ්‍යයන වර්ෂය සඳහා BIT ලියාපදිංචිය

	• eLC වෙතින් නව විෂය නිර්දේශය සඳහා FIT විද්‍යුත්- පරීක්ෂණය පවත්වන ලදී
2021 මැයි	• 1 වැනි දින – මාර්ගගත කෙටි කාලීන පාඨමාලා ආරම්භ කිරීම - JavaSE භාවිතා කරමින් ග්‍රැෆික් නිර්මාණ සහ නිර්මාණාත්මක සංවර්ධනය සහ ජාවා යෙදුම් සංවර්ධනය • 10 වැනි දින - අභ්‍යන්තර උපාධි වැඩසටහන් සඳහා 2021 අධ්‍යයන වර්ෂය ආරම්භ කරන ලදී • 15 වැනි දින - 2021 වර්ෂය සඳහා තොරතුරු ආරක්ෂාව පිළිබඳ සහ ව්‍යාපාර විශ්ලේෂණ පිළිබඳ පශ්චාත් උපාධි සඳහා මාර්ගගත තේරීම් සම්මුඛ පරීක්ෂණ • 16 වැනි දින - 2021 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ පශ්චාත් උපාධි සඳහා මාර්ගගත තේරීම් සම්මුඛ පරීක්ෂණ • 22 වැනි දින - 2021 වර්ෂය සඳහා පරිගණක විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි සඳහා මාර්ගගත තේරීම් සම්මුඛ පරීක්ෂණ • 22 වැනි දින - BIT විභාගයේ 1 වන මට්ටමේ ප්‍රතිඵල නිකුත් කරන ලදී. • 22 වැනි දින - UCSC හි IEEE WIE ශිෂ්‍ය ශාඛා අනුබද්ධ සමූහයේ වාර්ෂික මහා සභා රැස්වීම පැවැත්විණි. • 24 වැනි දින - තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා (DIT) සඳහා සුදුසුකම් ලත් ලැයිස්තුව නිකුත් කරන ලදී. • 31 වැනි දින - UCSC හි අධ්‍යයන කටයුතු සඳහා Mobitel සහ Huawei සමාගම විසින් පරිත්‍යාග කරන ලද ගබඩා පද්ධතිය ලැබීම. වෙනත් කටයුතු • BIT අවසන් වසරේ ව්‍යාපෘති වාචික පරීක්ෂණය (මාර්ගගත) • නව කණ්ඩායම සඳහා දිශානති වැඩසටහන (මාර්ගගතව) ඉදිරියට පවත්වාගෙන යන ලදී.
2021 ජූනි	• 5 වැනි දින - පශ්චාත් උපාධි වැඩසටහන්වල 2වන/4වන අධ්‍යයන වාරයේ අධ්‍යයන කටයුතු නිල වශයෙන් අවසන් කරන ලදී. • 6 වැනි දින - 23 දෙනෙකු සඳහා උසස් බහුමාධ්‍ය වෙබ් නිර්මාණ සහ සංවර්ධන ක්‍රම පිළිබඳ සබැඳි කෙටි කාලීන පාඨමාලාව ආරම්භ කරන ලදී. • 12 වැනි දින - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 3 වැනි අධ්‍යයන වාරයේ මාර්ගගත විභාග පැවැත්වීම • 14 වැනි දින - UCSC උපාධි අපේක්ෂකයින් අතර ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණ නවෝත්පාදන සඳහා ලෝක සමුළු සම්මාන (WSA) පිළිබඳව පීසා (Piza) මෙනෙවිය සමඟ සාකච්ඡාවක් පවත්වන ලදී. • 19 වැනි දින - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 3 වැනි අධ්‍යයන වාරයේ මාර්ගගත විභාග පැවැත්වීම • 19 වැනි දින - ග්‍රැෆික් නිර්මාණ සහ නිර්මාණශීලීත්වය සංවර්ධනය පිළිබඳ කෙටි පාඨමාලාව සාර්ථකව නිම කළ 10 දෙනෙකුට සහතික පත් ප්‍රදානය කරන ලදී (මාර්ගගතව) • 23 වැනි දින - පුස්තකාලය, කොළඹ විශ්වවිද්‍යාලය – වෙබිනාර් වැඩසටහන් මාලාව 2021 – 4 “දෙමුහුන් ඉගෙනීම දෙසට උසස් අධ්‍යාපනයේ ඩිජිටල් පරිවර්තනය” UCSC අධ්‍යක්ෂ මහාචාර්ය K. P. හේවාගමගේ විසින් පවත්වන ලදී. https://lib.cmb.ac.lk/digital-transformation-in-higher-education-towards-hybrid-learning/

	• 25 වැනි දින - 5G දැනුවත් කිරීමේ සැසිය Dialog වෙතින් UCSC කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා පවත්වන ලදී. https://www.youtube.com/watch?v=_foQWni6tRY • 26 වැනි දින - කොළඹ ACM SIGCHI ශාඛාව විසින් සංවිධානය කරන ලද කොළඹ SIGCHI පර්යේෂණ ප්‍රදර්ශනයේ ප්‍රධාන දේශනයක් මහාචාර්ය K P හේවාගමගේ විසින් පවත්වන ලදී. • 26 වැනි දින - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 3 වැනි අධ්‍යයන වාරයේ විභාග මාර්ගගතව පවත්වන ලදී වෙනත් කටයුතු • IIOE මාධ්‍යය (https://www.iioe.org/) සඳහා "මිශ්‍ර සහ විද්‍යුත් ඉගෙනුම් පාඨමාලා සඳහා වීඩියෝ මත පදනම් වූ ඉගෙනුම් අන්තර්ගත සංවර්ධනය" යන නව පාඨමාලාව සඳහා ප්‍රචාරක වීඩියෝපටයක් (ප්‍රවර්ධන) සංවර්ධනය කරන ලදී. • UCSC ප්‍රවෘත්ති පත්‍රිකාව 2021 පළ කරන ලදී
2021 ජූලි	• කොළඹ විශ්වවිද්‍යාලයීය විද්‍යා පීඨයෙහි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති විසින් සංවිධානය කොට කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා සිදු කළ 'Turnitin' පිළිබඳ වැඩමුළුව • 3 වැනි දින - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 3 වන අධ්‍යයන වාරයේ මාර්ගගත විභාග සාර්ථකව නිම කරන ලදී • 7 වැනි දින - BIT අධ්‍යයන වාරය 4 - විෂය ප්‍රවීණයන්ගේ රැස්වීම පවත්වන ලදී • 12 වැනි දින - Dialog විසින් 5G නවෝත්පාදන මධ්‍යස්ථානය සඳහා 5G තාක්ෂණය පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය • 16 වැනි දින - සෙලාටා පුද්. සමාගම විසින් UCSC සමඟ සිදු කළ පර්යේෂණ සහයෝගීතාව ශක්‍යතාව පිළිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය පැවැත්වීම • 18 වැනි දින - JavaSE භාවිතයෙන් ජාවා යෙදුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාව සාර්ථකව නිම කළ පිරිස සඳහා සහතික 19ක් පිරිනමන ලදී. • 24 වැනි දින - ADMTC විසින් 11 දෙනෙකු සඳහා "ග්‍රැෆික් නිර්මාණ සහ නිර්මාණශීලීත්වය සංවර්ධනය" පිළිබඳ නව කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කරන ලදී. • 27 වැනි දින - UNESCO-ICHEI විසින් පවත්වන ලද 2021 ආසියා ශාන්තිකර මධ්‍ය වාර්ෂික රැස්වීම - 2021 හිදී "විද්‍යුත්-ඉගෙනුම් සහ මිශ්‍ර-ඉගෙනීම සඳහා වීඩියෝ මත පදනම් වූ ඉගෙනුම් අන්තර්ගත සංවර්ධන" ප්‍රවර්ධන වීඩියෝපටයක් ඉදිරිපත් කරන ලදී. • 30 වැනි දින - II මට්ටමේ (2 වන වසර) ප්‍රතිඵල නිකුත් කරන ලදී - BIT වැඩසටහන 2020 • 31 වැනි දින - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 4 වැනි වාරයේ (මාර්ගගත) විභාග ආරම්භ කරන ලදී වෙනත් කටයුතු • පරිගණකකරණය පිළිබඳ දර්ශනපති උපාධි නව අපේක්ෂකයින්ගේ මූලික යෝජනා ආරක්ෂක ඉදිරිපත් කිරීම් (මාර්ගගතව) • ප්‍රථම උපාධි සහ පශ්චාත් උපාධි පරීක්ෂණ සඳහා ආදර්ශ පරීක්ෂණ පැවැත්වීම

	• මාස්ටර් වැඩසටහනේ 3/4 වැනි අධ්‍යයන වාර සඳහා මාර්ගගත විභාග ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා මාර්ගගත වැඩමුළු මාලාව • BIT මාර්ගගත ලියාපදිංචි කිරීමේ සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී
2021 අගෝස්තු	• 5 වැනි දින - තොරතුරු තාක්ෂණ උසස් ඩිප්ලෝමා (HDIT) ප්‍රතිඵල නිකුත් කරන ලදී • 7 වැනි දින - - සිසුන් 20 දෙනෙකු සඳහා PHP සහ MySQL සමඟ ගතික වෙබ් යෙදුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කරන ලදී. • 17 වැනි දින - මාර්ගගත තොරතුරු පද්ධති (IS) යෝග්‍යතා තක්සේරුව - 1,2 සහ 3 කණ්ඩායම් සඳහා පවත්වන ලදී. • 21 වැනි දින - Make-Up II තොරතුරු පද්ධති (IS) මාර්ගගත අභියෝග්‍යතා ඇගයීම සහ දර්ශනපති/දර්ශනශූරී සාමාන්‍ය පරිගණන පරීක්ෂණ zoom භාවිතයෙන් මාර්ගගත පරීක්ෂක ක්‍රමයට පැවැත්වීම • 21 වැනි දින - - සයිබර් ආරක්ෂණ පශ්චාත් උපාධි වැඩසටහනේ 4 වැනි අධ්‍යයන වාරයේ මාර්ගගත විභාග සම්පූර්ණ කරන ලදී. • 22 වැනි දින - සිසුන් 22ක් සඳහා JavaSE භාවිතයෙන් ජාවා යෙදුම් සංවර්ධනය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවක් ආරම්භ කරන ලදී. • 25 වැනි දින – 27 වැනි දින - eLC මගින් Moodle පිළිබඳ කාර්ය මණ්ඩල පුහුණුවක් පැවැත්වීම • 27 වැනි දින - Make-Up II තොරතුරු පද්ධති (IS) මාර්ගගත අභියෝග්‍යතා ඇගයීම පැවැත්වීම • 27 වැනි දින - ඩිජිටල් ඉගෙනුම් සහ ඉගැන්වීම් තාක්ෂණවේදී, කැලණිය විශ්වවිද්‍යාලයෙහි පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශ ප්‍රධානී ආචාර්ය නාමලී සුරවීර මහත්මිය විසින් නිවසේ දී පොත් භාවිත කොට ලිවිය හැකි විභාග/ ප්‍රශ්න පත්‍ර සහ ක්‍රියා පටිපාටි පිළිබඳ මාර්ගගත අගයීම පැවැත්වීම වෙනත් කටයුතු • පශ්චාත් උපාධි වැඩසටහනේ 1 සහ 3 වැනි අධ්‍යයන වාරයේ මාර්ගගත විභාග සාර්ථකව නිම කරන ලදී.
2021 සැප්තැම්බර්	• 3 වැනි දින - කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ මහාචාර්ය රනිල් ජයවර්ධන විසින් අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා "පර්යේෂණ තුළින් UoC ශ්‍රේණිගත කිරීම ඉහළ නැංවීම" පිළිබඳ සම්මන්ත්‍රණයක් පවත්වන ලදී. (https://youtu.be/tyZpdqGwDd8) • 8 වැනි දින - UCSCහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (https://youtu.be/jCGJxv-HA-U) ඵලදායී විද්‍යුත් තැපැල් සන්නිවේදනය (I කොටස) පිළිබඳ මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී. • 15 වැනි දින - UCSCහි අනධ්‍යයන කාර්ය මණ්ඩලයට (https://youtu.be/JIJP-X8vBXk) ඵලදායී විද්‍යුත් තැපැල් සන්නිවේදනය (II කොටස) පිළිබඳ මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී. • 16 සහ 17 දෙදින - 2021 තරුණ පරිගණක විද්‍යාඥයින්ගේ දෙවන වටයේ ව්‍යාපෘති ඇගයීම පැවැත්විණි • 19 වැනි දින - නව බඳවා ගැනීම් සඳහා වන මාස්ටර් වැඩසටහන්වල සමාරම්භක උත්සවය zoom හරහා පැවැත්විණි. • මාස්ටර් අත්පොත 2020/2021 උත්සවයේ දී එළිදැක්විණි. URL: https://ucsc.cmb.ac.lk/downloads/Masters_Handbook_2021.pdf

	• 21 වැනි දින - 2020 තොරතුරු තාක්ෂණ උපාධියේ (BIT) සිසුන් 350ක් සඳහා සුදුසුකම් ලත් ලැයිස්තුව සහ සිසුන් 1151ක් සඳහා BIT මට්ටමේ III (V සහ VI අධ්‍යයන වාරයේ) ප්‍රතිඵල නිකුත් කරන ලදී. • 22 වැනි දින - UCSCහි අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා Google දින දර්ශනය පිළිබඳව මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී (https://youtu.be/hj2sYH3HXJ4) • 24 වැනි දින- 1 සහ 3 අධ්‍යයන වාරයේ ප්‍රධාන වැඩසටහන් දේශන ආරම්භ කරන ලදී. • 27 වැනි දින - දෙවන අධ්‍යයන වාරයේ උපාධි අපේක්ෂක දේශන ආරම්භ කරන ලදී. වෙනත් කටයුතු • MIT, MCS, MSc in CS, MB-ANALYTICS පාඨමාලාවල තනි ව්‍යාපෘතිවල අවසාන ඇගයීම් සිදු කරන ලදී • විද්‍යාපති පාඨමාලාවල 2 වන වසර සඳහා ශිෂ්‍ය ලියාපදිංචිය මාර්ගගත ක්‍රමය ඔස්සේ සිදු කරන ලදී
2021 ඔක්තෝබර්	• 1 වැනි දින - අභ්‍යන්තර උපාධි අපේක්ෂකයින් සඳහා වෘත්තීයමය ස්ථානගත කිරීමේ වැඩසටහන ආරම්භ කිරීම • 4 වැනි දින - සම්පත් දායකයින් සමඟ පූර්ව විශ්වවිද්‍යාල දිශානතිය පිළිබඳ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. • 4 වැනි දින - Itelasoft සමාගම විසින් UCSC උපාධි අපේක්ෂකයින් සඳහා "ඔබේ විකුණුම් බලකායේ වෘත්තිය ඇරඹුම" පිළිබඳ තාක්ෂණික සාකච්ඡා සැසිය • 7 වැනි දින - පරිගණක විද්‍යාව සහ තොරතුරු පද්ධති පිළිබඳ උපාධි පාඨමාලාවල අවසාන ප්‍රතිඵල නිකුත් කරන ලදී • 8 වැනි දින - UCSCහි කාර්ය මණ්ඩලය සඳහා Google දින දර්ශනය පිළිබඳ මාර්ගගත වැඩමුළුව https://youtu.be/M5uXEb5jYbU • 9 සහ 10 දෙදින- විද්‍යාපති පාඨමාලාවේ 4 වැනි අධ්‍යයන වාර විභාග (මාර්ගගතව) පවත්වන ලදී • 13 වැනි දින - UCSCහි කාර්ය මණ්ඩලය සඳහා Google Drive පිළිබඳ මාර්ගගත වැඩමුළුව https://youtu.be/GGBHv3dRHvA • 15 වැනි දින - GAPSTARS විසින් UCSC අභ්‍යන්තර/බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා "පුද්ගලික වෙළඳ නාමකරණය" පිළිබඳ තාක්ෂණික සාකච්ඡා සැසිය • 16 - 17 සහ 23 – 24 දිනවල - විද්‍යාපති පාඨමාලාවේ 4 වැනි අධ්‍යයන වාර විභාග (මාර්ගගතව) පවත්වන ලදී • 27 වැනි දින - UCSC කාර්ය මණ්ඩලය සඳහා Google Drive සහ Docs පිළිබඳ මාර්ගගත වැඩමුළුව (2 කොටස) https://youtu.be/oJ_HdD7oDJo • 27 වැනි දින - විශ්වවිද්‍යාල සිසුන්ට පර්යේෂණ ක්‍රියාකාරකම් සිදුකිරීමට හැකිවන පරිදි පර්යේෂණාගාරයක් (5G නවෝත්පාදන මධ්‍යස්ථානය) පිහිටුවීම සඳහා UCSC සහ Dialog Axiata PLC අතර ගිවිසුමක් අත්සන් කිරීම. • 29 වැනි දින - Huawei ජංගම සේවා (HMS) විසින් UCSC අභ්‍යන්තර/බාහිර උපාධි අපේක්ෂකයින් සඳහා "ජංගම යෙදුම් සංවර්ධන පුහුණුව සහ සහතික කිරීමේ පාඨමාලාව" පිළිබඳ වැඩමුළුව

	වෙනත් කටයුතු ● ICTer2021 පර්යේෂණ පත්‍රිකා සමාලෝචන වැඩමුළු
2021 නොවැම්බර්	● 10 වැනි දින - UCSCහි කාර්ය මණ්ඩලය සඳහා Google DOCs පිළිබඳ මාර්ගගත වැඩමුළුවක් පවත්වන ලදී (https://youtu.be/KlxHW5J_OMI) ● 13 වැනි දින - ADMTC විසින් ග්‍රැෆික් නිර්මාණ සහ නිර්මාණශීලීත්වය සංවර්ධනය පිළිබඳ කෙටි පුහුණු පාඨමාලාවක් ආරම්භ කිරීම ● 15 වැනි දින - 2021 UCSC වෘත්තීය ප්‍රදර්ශනය සමාරම්භය (https://youtu.be/9xEGOuxlSbk) ● 25 වැනි දින - UCSC උපාධි අපේක්ෂකයින් (අභ්‍යන්තර/බාහිර) සහ කාර්ය මණ්ඩලය සඳහා ජංගම යෙදුම් සංවර්ධන පුහුණු සහ සහතික කිරීමේ පාඨමාලාව පිළිබඳ සම්මන්ත්‍රණය HUAWEI ජංගම සේවා (HMS) විසින් පවත්වන ලදී. (https://drive.google.com/file/d/1zyguBVdzCWGlm-YwZm4DD67mSdKCNhJx/view?usp=sharing) ● 29 වැනි දින - 5 වන SLCB CHAIRPERSON's FORUM ON MICE - ශ්‍රී ලංකාවට ජාත්‍යන්තර සම්මන්ත්‍රණ දිනාගැනීම අත්දැකීම් බෙදා ගැනීම සහ ගොඩනැගීම පිළිබඳ පිළිබඳ UCSC අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ විසින් දෙසුමක් පැවැත්වීම වෙනත් කටයුතු ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ වැඩසටහන අවසන් කර ඇත
2021 දෙසැම්බර්	● 1 වැනි දින - UCSC පර්යේෂණාගාරය (4 වන මහල) සහ බහුකාර්ය පරිගණක විද්‍යාගාරය (පහළ මහල) උත්සවාකාරයෙන් විවෘත කිරීම සහ නැගී එන කලාප සඳහා තොරතුරු තාක්ෂණයෙහි දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - ICTer 2021හි සමාරම්භය ● 2 වැනි දින - නැගී එන කලාප සඳහා තොරතුරු තාක්ෂණයෙහි දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - ICTer 2021හි 1 වන දිනය ● 3 වැනි දින - නැගී එන කලාප සඳහා තොරතුරු තාක්ෂණයෙහි දියුණුව පිළිබඳ ජාත්‍යන්තර සමුළුව - ICTer 2021හි 2 වන දිනය ● 4 වැනි 5 වැනි දින - ICTer2021 සම්මන්ත්‍රණයෙහි චාරිකාව ● 9 වැනි දින - UCSC අධ්‍යක්ෂ මහාචාර්ය කේ.පී. හේවාගමගේ විසින් "අනාගත පුස්තකාල සේවාවන්හි ඩිජිටල් පරිවර්තනය: උසස් අධ්‍යාපන ක්‍රමයේ ශාස්ත්‍රීය පුස්තකාලවල නව කාර්යභාරයක්" පිළිබඳව ප්‍රධාන දේශනයක් පැවැත්වීම ● 9 වැනි සහ 10 වැනි දින - UCSC සිසුන් සඳහා CodeGen International (Pvt) Ltd විසින් "වෘත්තීය මාර්ගෝපදේශන සහ දැනුවත් කිරීමේ වැඩමුළුව" පැවැත්වීම ● 9 වැනි, 16 වැනි සහ 23 වැනි දින - UCSC සිසුන් සඳහා HUAWEI ජංගම සේවා (HMS) විසින් "ජංගම යෙදුම් සංවර්ධන පුහුණු සහ සහතික කිරීමේ පාඨමාලාව" පැවැත්වීම ● 27 වැනි සහ 29 වැනි දින - FIT ප්‍රායෝගික පරීක්ෂණ (මාර්ගගතව) පැවැත්විණි

෪. විඥාන වාර්තාව

8. විගණන වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එවිවිඩි/බි/යූසිඑස්සි/2021/එෆ්ස්/04

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 15 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොතීක හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

යටෝක්ත වාර්තාව මේ සමඟ ඒවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති.

පිටපත් 01. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
02.ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය
03.උපකුලපති, කොළඹ විශ්වවිද්‍යාලය

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්ටීඩී/බී/යූසීඑස්ඕ/2021/එෆ්ඒ/04

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 ජූනි 15 දින

අධ්‍යක්ෂ,

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනය.

කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තොරතුරු හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උපවගන්තිය සහ 18 වන වගන්තිය යටතේ පනවා ඇති 2002 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතන නියමාවලියේ 17 වගන්තිය හා විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යරා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 1 හි 48 ඡේදය ප්‍රකාරව ආදායම හා වියදම එකිනෙක හිලව් නොකළ යුතු වුවද, ආයතනයේ බාහිර පාඨමාලාවලින් හා ව්‍යාපෘතිවලින් ඉපයූ එකතුව රු.293,954,234 ක්වූ මුලු ආදායමෙන් එකතුව රු.165,031,257 ක්වූ මුලු වියදම හිලව් කර එකතුව රු.128,922,977 ක් වූ ශුද්ධ ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 65 ඡේදය ප්‍රකාරව, වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.6,913,358 ක් වූ ප්‍රස්තකාල පොත් හා ප්‍රකාශන (Library Books & Periodicals) සම්පූර්ණයෙන්ම ක්ෂය කර නිබුණු නමුත් තවදුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු රු.8,788,468 ක ව්‍යාපෘති ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම හා මැනීම සිදුකර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ නන්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මාගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ විගණනයට අදාළව, මාගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මාගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන භාර්ගවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම්

නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණනා මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක්

ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරවිකිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අබාධිත පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්ව ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ආ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) 1994 අප්‍රේල් 20 දිනැති අංක 30/94 දරන රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය	විදේශාධාර සම්බන්ධ සියලු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හරහා සිදුකළ යුතු වුවද, ආයතනය විසින් ක්‍රියාත්මක කරන ව්‍යාපෘති 04 ක් වෙනුවෙන් 2018, 2019 හා 2021 වර්ෂ තුළදී ලැබී තිබුණු එකතුව රු.26,399,881 ක් වූ විදේශ ප්‍රදාන සෘජුව ලබා ගැනීමට කටයුතු කර නිබුණි.
(ආ) 2009 පෙබරවාරි 05 දිනැති අංක 2009/2 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වක්‍රලේඛය	වක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ආපදා ණය ගෙවිය හැකි උපරිම සීමාව ඉක්මවා නිලධාරීන් 41 දෙනෙකු වෙත එකතුව රු.11,305,700 ක් ආපදා ණය ලෙස වැඩිපුර ගෙවා නිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ) වසර 01 සිට වසර 17 ක් දක්වා අතර කාලපරිච්ඡේදයක් තුළදී බැඳුම්කර කඩකළ ආචාර්යවරුන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.19,488,865 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී නිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 01 සිට වසර 07 දක්වා පැරණි එකතුව රු.1,229,330 ක් වූ ණයගැතියන්ගෙන් මුදල් අයකරගැනීමට අපොහොසත්වී නිබුණි.

ඩබ්ලිව්.ඕ.සී. වික්‍රමරත්න

විගණකාධිපති.

2022.06.16

ඇමුණුම III

විගණකාධිපති,
ජාතික විගණන කාර්යාලය,
අංක 306/72,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

මහත්මයාණනි,

කොළඹ විශ්ව විද්‍යාලීය පරිගණක අධ්‍යයන ආයතනයේ **2021** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **12** වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1.මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සටහන් කර ගනිමි.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

විගණන නිරීක්ෂණය	පිළිතුර
(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 48 ඡේදය ප්‍රකාරව ආදායම් හා වියදම් එකිනෙක හිලවී නොකළ යුතු වුවද ආයතනයේ බාහිර පාඨමාලාවලින් හා ව්‍යාපෘති වලින් ඉපයූ එකතුව රු. 293,954.234 ක්වූ මුළු ආදායමෙන් එකතුව රු. 165,031,257 ක්වූ මුළු වියදම් හිලවී කර එකතුව රු. 128.922.977 ක්වූ ශුද්ධ ආදායම් මූල්ය කාර්ය සාධන ප්රකාශයේ දක්වා තිබුණි.	ආයතනයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයේ බාහිර පාඨමාලාවලින් සහ ව්‍යාපෘති වලින් ඉපයූ ශුද්ධ ආදායම දක්වා ඇති නමුත් මූල්ය ප්රකාශන වල සටහන් අංක 20 ඛණ්ඩ තොරතුරු යටතේ විස්තරාත්මකව ආදායම් වියදම් ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා යොමුව මූල්ය කාර්ය සාධන ප්රකාශයේ ඇතුලත් කර ඇත. එබැවින් ආදායම් වියදම් හිලවී වීමක් සිදු වී නොමැති නමුත් විගණන නිර්දේශ ප්රකාරව 2022 වර්ෂයේ සිට මූල්ය කාර්ය සාධන ප්රකාශයේ ආයතනයේ සියලු ආදායම් වියදම් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.
(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත **07** හි **65** ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අඩුකරමින් සෑම වාර්ෂික	ශ්‍රී ලංකා රාජ්ය අංශ ගිණුම්කරණ ප්රමිත 07 ප්රකාරව ආයතනයේ පුස්තකාල පොත් හා ප්‍රකාශන ප්‍රත්‍යාගණනය කිරීම ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසන් වන දිනයේ දී සමාටලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. **6,913,358** ක් වූ පුස්තකාල පොත් හා ප්‍රකාශන සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු නමුත් තව දුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොනිබුණි.	වුවද 2021 වසර තුල එම ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කිරීමට නොහැකි වූ නමුත් එම කටයුතු **2022** වසර තුල නිම කිරීම සහ අදාල ප්‍රත්‍යාගණිත අගයන් ගිණුම් වාර්තා වලට ඇලපීම 2022 වසර තුළ සිදුකරනු ලැබේ.
(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයට ලැබී තිබුණු රු. 8,788,468 ක විශ්‍යාපෘති ප්‍රදාන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල හඳුනා ගැනීම හා මැනීම සිදුකර නොනිබුණි.	මෙම විගණන විමසුම පිළිබඳව ආයතනයේ පිළිතුරු ලබාදීමට සහ ආයතනයේ විගණන කමිටුවේ සාකච්ඡා කිරීමට නො හැකි වූයේ මෙම විගණන නිරීක්ෂය අවසන් විගණන වාර්තාවට පමණක් ඇතුලත් කිරීම නිසාය. ආයතනය විසින් **2021** වසර තුල ආයතනයට ලැබූ රු. 8,788,468 ක විශ්‍යාපෘති ආදායමෙන් **2021** වසරට අදාල ආදායම මූල්‍ය ප්‍රකාශයේ හඳුනාගෙන ඉතිරිය ඉදිරියට ලැබූ විශ්‍යාපෘති ආදායමක් ලෙස ගිණුම්ගත කර ඇත. එනමුත් විගණන නිර්දේශයන් හා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 ප්‍රකාරව විශ්‍යාපෘති කටයුතු ප්‍රදාන හඳුනා ගැනීම හා මැනීම 2022 වසරේ සිට සිදු කරනු ලැබේ.

1.3 ආයතනයේ **2021** වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

සටහන් කර ඇත්ම්.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමණාකරනයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ, වගකීම්

සටහන් කර ඇත්ම්.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සටහන් කර ඇත්ම්.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

විගණන නිරීක්ෂණය	පිළිතුර
2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.	සටහන් කර ගනිමි.
2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද අතර මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන ගොස් තිබුණි.	සටහන් කර ගනිමි.
2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුයෝජ්‍ය වේ.	සටහන් කර ගනිමි.
2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා සිදු කරන ලද නිර්දේශයන් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත්ව ඇත.	සටහන් කර ගනිමි.
2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණු වලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට කරුණු කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.	සටහන් කර ගනිමි.
2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව	සටහන් කර ගනිමි.
2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇතිබව.	

(ඇ) 1994 අප්‍රෙල් 20 දිනැති අංක 30/94 දරණ රාජ්‍ය ඕෂුම් චක්‍රලේඛය නිරීක්ෂණය විදේශාධාර සම්බන්ධ සියලු ගනුදෙනු මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවෙ අධ්‍යක්ෂ ජනරාල් හරහා සිදු කළයුතු වුවද ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති **04**ක් වෙනුවෙන් **2018 2019** හා **2021** වර්ෂ තුලදී ලැබී තිබුණු එකතුව රු. **26,399,881** ක් වූ විදේශ ප්‍රධාන සෘජුව ලබා ගැනීමට කටයුතු කර තිබුණි.	කොළඹ විශ්ව විද්‍යාලයිය පරිගණක අධ්‍යයන ආයතනය සහ එහි අධ්‍යයන කාර්යමණ්ඩලය ජාත්‍යන්තර වශයෙන් පර්යේෂණ යෝජනා ඉදිරිපත් කර පරියේෂණ මූල්‍ය ප්‍රධාන ලබාගැනීමට කැපවීමෙන් කටයුතු සිදුකරනු ලබයි.එවැනි ආයතන වලට ඉදිරිපත් කරන පර්යේෂණ යෝජනා සඳහා අනුමැතිය ලද පසු අදාල මූල්‍ය ප්‍රධාන සෘජුවම අප ආයතනය වෙත ලබාදෙනු ලැබේ. එවැනි ව්‍යාපෘති සඳහා අප ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ලබාගෙන කටයුතු කරනු ලැබේ.අදාල මූල්‍ය වර්ෂය අවසානයේදී මෙම පරියේෂණ ව්‍යාපෘති පිළිබඳව විස්තර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ අදාල අනෙකුත් රාජ්‍ය ආයතන වෙත ලබාදෙනු ලබයි. ආයතනයට ලැබෙන සියලු පර්යේෂණ ප්‍රධාන කළමනාකරණ මණ්ඩලය විසින් අනුමතකරණ ලද අයවැය ලේඛන මත පමණක් වැය කිරීම සිදුකරනු ලබයි.
(ආ)**2009** පෙබරවාරි **05** දිනැති අංක 2009/2 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍ර ලේඛය නිරීක්ෂණය චක්‍රලේඛයට පටහැනිව ආපදා ණය ගෙවිය හැකි උපරිම සීමාව ඉක්මවා නිලධාරීන් **41** දෙනෙකු වෙත එකතුව රු. **11,305,700** ක් ආපදා ණය ලෙස වැඩිපුර ගෙවා තිබුණි.	ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබුයේ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රල්ඛන **2009/02** හි සඳහන් සාමාන්‍ය ආපදා ණය යෝජනා ක්‍රමය නොව ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව **100%** ක්ම ආයතනයේ ඉපයූ අරමුදල් භාවිතා කර ක්‍රියාත්මක කරනු ලැබූ විශේෂ ආපදා ණය ක්‍රමයකි. තවද මෙම ණය ක්‍රමය පිළිබඳව **2020** විගණකාධිපතිතුමාගේ වාර්තාවේ ඇතුළත් විගණන විමසුම පිළිබඳව ආයතනයේ විගණන කමිටුවේ හා කළමනාකරණ මණ්ඩලයේ සාකච්ඡා කර, මෙම විශේෂ ආපදා ණය ක්‍රමය සඳහා තිසි අනුමැතිය ලබා ගන්නා තෙක් තාවකාලිකව අත්හිටුවීමට තීරණය කරන ලදී. ඒ අනුව **2022** අප්‍රේල් මස සිට විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන්සභා චක්‍රල්ඛන **2009/02** ප්‍රකාරව ආපදා ණය නිකුත්කිරීම සිදුකරනු ලබයි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව	සටහන් කර ගනිමි.
2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත්සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර නොමැති බව	සටහන් කර ගනිමි.

2.3 වෙනත් නිරීක්ෂණ

විගණන විමසුම	පිළිතුර
අ) වසර 01 සිට 17 දක්වා අතර කාලච්ඡේදයක් තුළදී බැඳීමකර කඩතල ආචාර්යවරුන් පස් දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.19,488,865 ක් 2021 දෙසැම්බර් 31දින වන විටත් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	විගණන විමසුමේ සඳහන් බැඳුම්කර කඩකිරීම නිසා අයවිය යුතු මුදල සහ එම මුදලින් 2022 වසර තුළදී අයකර ගත්තා ලද මුදල් පිළිබඳව පහත උපලේඛනයේ දක්වා ඇත.

ආචාර්යවරයාගේ නම	2021/12/31 දිනට අයවිය යුතුව තිබූ මුදල	2022 අගෝස්තු මස දක්වා අයකර ගත් මුදල	නවදුරටත් අයවිය යුතු මුදල
1. එස්.ජේ.පතිරනත්	1,276,862.41	-	1,276,862.41
2. රුක්මත් සේනානායක	1,823,126.13	-	1,823,126.13
3. එම්.එම්.සිරිවර්ධන	5,484,435.15	-	5,484,435.15
4. ආර්.එම්.ඩී.එන්.සෝමරත්න	607,192.96	-	607,192.96
5. ආර්.ඒ.එම්.ඩී.පෙරේරා	10,297,248.10	9,134,000.39	1,163,247.71
	19,488,864.75	9,134,000.39	10,354,864.36

ඉහත අංක **1** සඳහන් එස්.ජේ.පතිරනත් මහතාගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා කොළඹ දිසා අධිකරණයේ නඩු පවරා ඇත.

	රුක්මන් සේනානායක මහතාගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඔහුගේ ඇපකරුවන්ට Letter of Demand යොමුකර ඇතත් රුක්මන් සේනානායක මහතා දැනට පදිංචි ස්ථානය පිළිබඳව කිසිදු තොරතුරක් සොයාගත නොහැකි නිසාය. එච්.එම්. සිරිවර්ධන මහතාගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා ඔහු දැනට පදිංචි රටේ ශ්‍රී ලංකා කානාපති කාර්යාලයට අදාල මුදල අයකරදෙන ලෙස ඉල්ලීම් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ඇතිව යොමුකරනු ලැබේ. ආර්.එම්.පී.එන්.සෝමරත්න මහත්මියගෙන් අයවිය යුතු මුදල අයකර ගැනීම සඳහා අදාල ලේඛන විශ්ව විද්‍යාලයීය විශ්‍රාම අරමුදල වෙත යොමුකර ඇත. ආර්.ඒ.එච්.ඩී.පෙරේරා මහතාගෙන් අයවිය යුතු ඉතිරි මුදල විශ්ව විද්‍යාල අර්ථසාධක අරමුදලින් අයකර ගැනීමට අදාල ලිපිලේඛන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමුකර ඇත.
ආ) 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 01 සිට 07 දක්වා පැරණි එකතුව රු.1,229,330ක් වූ ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.	විමසුමේ සඳහන් අයවිය යුතු මුදලෙන් රු.**709,390.00** ක මුදලක් ලැබිය යුතුව ඇත්තේ විවිධ අධිකරණ නියෝග යටතේ (Digital Forensic Services) පර්යේෂණ වාර්තා සඳහා ආයතනයට ලැබිය යුතු මුදල්ය. මෙම මුදල් අයකර ගැනීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ආයතනය විසින් ගෙන ඇත. I. අයවිය යුතු මුදල පිළිබඳව අදාල පාර්ශව, උසාවි සහ පොලිස් ස්ථාන වෙත සිහිකැඳවීමේ ලිපි යොමුකිරීම. II. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත මේ පිළිබඳව ලිඛිතව දැනුම්දීම. III. 2022 වසරේ සිට පර්යේෂණ වාර්තා නිකුත් කිරීම අදාල මුදල් ගෙවීමෙන් පසුව පමණක් සිදුකිරීම

ආචාර්ය අජන්ත අතුකෝරාළ
අධ්‍යක්ෂ